# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2020.05.19

වර්ෂ 2020 ක් වූ මැයි මස 19 වන අඟහරුවාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ මැයි මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
05. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
07. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
11. ගරු මන්ත්‍රිනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
12. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
14. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
15. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
16. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
17. ගරු මන්ත්‍රිනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
18. ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
19. ගරු මන්ත්‍රිනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
20. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
21. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
22. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

මීට අමතරව ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

(ගරු මන්ත්‍රිනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**<u>01) 2020-03-17 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020-03-17 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2020-03-17 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** 2020-03-17 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සංශෝධන ලිඛිතව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. ලිඛිතව ලබා දෙන්න අවස්ථාව දෙන්නේ නෑ. එහෙම කවදාවත් දීලා නෑ. මට පෙන්වන්න දීලා නම්. හොඳට පැහැදිලියි. මෙතුමාලා සභාව කරන්න නෙමෙයි එන්නේ. මේ කිසිම සූදානමක් නැතුව මේක අවුල් කරන්න විතරක් ඇවිල්ලා තියෙනවා. ලිඛිතව ලබා දෙන්න බැහැ. සංශෝධන තියෙනවා නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම ඉල්ලීමක් කරලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභා වාර්තාව සම්මත කිරීම ඉවර කරන්න ඕන ඉක්මනට මාධ්‍යවේදීන්ටයි අනිත් අයටයි වාර්තාව ලබා දෙන්න ඕන. ලිඛිතව දෙන්න බෑ. සංශෝධන තියෙනවා නම් දැන් ඉදිරිපත් කරන්න. තවත් විනාඩි පහක කාලසීමාවක් ලබා දෙන්නම්. ලිඛිත සංශෝධන දෙන්න කියලා කොහේවත් නැහැ. දැන් දෙන්න ලිඛිතව දෙනවානම්. එහෙම දෙන්න කියලා කොහේවත් නෑ. දැන් විනාඩි පහක් දෙන්නම් සංශෝධන ඉදිරිපත් කරන්න. සභාව ඉවර වෙලා සතියකින් දෙකකින් දෙන්න අවස්ථාවක් නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම ඉල්ලීමක් කරලා තියෙනවා. ඒක දෙන්නේ නැත්නම් ඒක සභා වාර්තාවට යන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක හරි.

2020-03-17 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා අපේ සහෝදර මන්ත්‍රී විශ්වජිත් මැතිතුමාට උසාවි කටයුත්තකට යන්න වෙනවා. ඒ නිසා නිවාඩු අනුමත කරන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මටත් එතුමා දුරකථනයෙන් දැනුම් දුන්නා. ඒ නිවාඩු අනුමත කරනවා.

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද දින ඓතිහාසික දිනයක්,වැදගත් දිනයක් වෙනවා. අවුරුදු එකොලහක් වෙනවා අද දිනය වනවිට රට පුරා පැවති තිස් අවුරුදු කුරිරු ත්‍රස්තවාදය නිමා කරලා.

තවත් දෙයක් සඳහන් කරන්න ඕන. ඇත්තටම අපිට පහුගිය මාසයේ මහා සභා රැස්වීම පැවැත්වීමේ හැකියාවක් තිබුණේ නැහැ මේ කොරෝනා හෙවත් කොවිඩ් 19 තත්ත්වය යටතේ. ඒ වගේම අද වෙනතුරු අපිට උපදෙස් ලැබිලත් නෑ මැයි මාසයේ මහා සභා රැස්වීම පවත්වන්න කියලා. නමුත් මාස දෙකක් රැස්වීම නොපවත්වන එක සදාචාරාත්මක නැති හින්දත්, ඒ වගේම දැන් ක්‍රම ක්‍රමයෙන් මේ තත්ත්වය පහව යන හින්දත් තමයි අද දින අපිට පුළුවන් උපරිම දුරස්ථභාවය ඇති කර ගෙන අවම නිලධාරි සංඛ්‍යාවක් සහභාගි කර ගෙන අද මාධ්‍යවේදීන්ටත් ආරාධනා කරන්නේ නැතිව මහා සභාව රැස්කරේ එකම පරමාර්ථයක් අනුව. මොකද අපේ මන්ත්‍රීවරුන්ට අදහස් දක්වන්න. තමන්ගේ බල ප්‍රදේශවල තියෙන ගැටළු සාකච්ඡා කරන්න. ඒ ආකාරයෙන් තමයි අද මේ මහා සභාව රැස්කෙරුවේ කියන එක මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න ඕන.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එතනදී සභාපතිතුමා පොඩි ප්‍රකාශයක් කරන්න තියෙනවා මාධ්‍යවේදීන් සහභාගිවීම ගැන. මාධ්‍යයෙන් තමයි ඕනම දෙයක් ප්‍රසිද්ධියට පත් වෙන්නේ. මාධ්‍ය කියන්නේ අත්‍යාවශ්‍ය දෙයක්. පහුගිය දවස්වල මේ සභාවේදී මාධ්‍යවේදීන් නැති එක ගැන ඔබතුමාම කිව්වා මාධ්‍යවේදීන්ට ලියුම් යවන්න කියලා. මාධ්‍යවේදීන් ගෙන්වන්න කිව්වා. එතකොට මේ මාධ්‍යවේදීන් කොරෝනා ප්‍රශ්නයට හේතුවක් වෙනවා කියලා මම පිළිගන්නේ නෑ. හේතුව මෙතන ඉඩ තියෙනවා. මාධ්‍යවලින් එක්කෙනයි එන්නේ. දෙතුන් දෙනෙක් එන්නේ නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හතර පස් දෙනෙක් එනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මාධ්‍ය හතරකින් ආවොත් හතර දෙනයි. ඒ අයට පුළුවන් ඇවිල්ලා එක තැනක ඉඳගෙන වාර්තා කර ගන්න. ඒක මහ ලොකු දෙයක් නෙමෙයි. ඒකනම් අපි පිළිගන්නේ නැහැ.

(ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා, ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි දූරස්ථභාවය ඇති කරන්න ඕන. ඒ අයගේ වගකීම අපිට ගන්න බැහැ. අපිට මන්ත්‍රීවරුන්ගේ වගකීම ගන්න පුළුවන්. අපිට ඒ අයගේ වගකීම ගන්න බැහැ. අන්තිමට ප්‍රශ්නයක් ඇති වුණොත් ඔබතුමා නෙමෙයි වගකීම ගන්න ඕන මම. ඒකත් වැරදි අර්ථකථනයක් වෙනවා. සභාපතිවරයා අනවශ්‍ය විදියට සභාව කරලා මාධ්‍යවේදීන් ගෙනල්ලා මේ තත්ත්වය ඇති කළා කියලා. ඉතිං ඒකේ වගකීම ගන්න ඕන මම. ඔබතුමාලා පිළිගන්නවානේ සභා වාර්තාවේ සියලු කරුණු සඳහන් වෙනවා. න්‍යාය පත්‍රය තියෙනවා. අපිට ඒ වගේ දේවල් මාධ්‍යවලට ඉතා ඉක්මනින් ලබා දෙන්න පුළුවන්. මම අහන්නේ මන්ත්‍රීවරුන්ගෙන් මෙච්චරයි. අද මන්ත්‍රීවරුන්ට අවශ්‍යතාවයක් තියෙනවාද සභාව පවත්වා ගෙන යන්න. එහෙම නැත්නම් මාධ්‍ය සංදර්ශනයකටද අවශ්‍යතාවය තියෙන්නේ. ඔය දෙකෙන් එකක් තීරණය කරලා කියන්න. ඔබතුමාලා හිතනවානම් මේක අවශ්‍ය නැහැ මිනිස්සු වෙනුවෙන් නෙමෙයි කතා කරන්න ඕන මාධ්‍ය වෙනුවෙන් විතරයි කියලා අපි මේ මහා සභාව කල් දාලා, අඩාලව කල් තියලා මේ මාසේ අන්තිමේ හරි එක්කෝ ලබන මාසේ හරි මේ ප්‍රශ්නය ඉවර වුණාට පස්සේ අපි සභාව පවත්වමු. කිසි ගැටළුවක් නැහැ. ඔබතුමන්ලාට ඇත්තටම ප්‍රශ්නය වෙලා තියෙන්නේ මේ මාස දෙකක් තිස්සේ මිනිස්සු වෙනුවෙන්, බෝපෙ පෝද්දල ජනතාවගේ ප්‍රශ්න වලට මැදිහත් වෙලා මිනිස්සු වෙනුවෙන් කතා කිරීමට එහා පරිබාහිරව මාධ්‍ය ගැන හිතලා කතා කරන්න නම් ඔබතුමන්ලා කොහොමද සාකච්ඡා කරන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔබතුමා කියන විදියට බෝපෙ පෝද්දල ජනතාව වෙනුවෙන් කාර්යයක් සභාවෙන් කෙරෙනවා. සභාවෙන් කෙරෙන කාර්යය ජනතාව දැන ගන්නත් ඕන. ජනතාව දැන ගන්නේ කොහොමද, සභා වාර්තාව හැමෝම ගිහින් බලන්නේ නැහැනේ. සභාවේ සිදු වෙන දේවල් ජනතාවත් දැන ගන්න ඕන සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ජනතාවට දැන ගන්න අපි ප්‍රසිද්ධ කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක මාධ්‍යයෙන් තමයි කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අන්තර්ජාලයෙන් බලන්න පුළුවන් ඕන වෙලාවක.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** වැරදියිනේ ඔබතුමා. මාධ්‍යයට බයවෙන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බය නැහැ. මම තරම් මාධ්‍යයට මුහුණ දීපු කෙනෙක් නැහැ. මම මාධ්‍යයට බය නැහැ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒ අතින් අපේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා කොච්චර වර්ණනා කරන්න පුළුවන් නායකයෙක්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම මාධ්‍යයට බය නැහැ. මාධ්‍යවලට මොකටද බය වෙන්න ඕන.

(ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපිට ඉදිරිපත් කරන කාරණා මාධ්‍ය පිළිබඳව සම්පූර්ණයෙන් වැරදියි. මේ සභාව තීන්දු කරලා තියෙනවා බොහොම පැහැදිලිව මාධ්‍ය කැඳවන්න කියලා. ඒ විතරක් නෙමෙයි ලිඛිතව දන්වන්න කියලා තීන්දු කරලා තියෙනවා. ඔබතුමා ඒ සභා තීන්දු කඩාගෙන ඔබතුමාට ඕන ඕන විදියේ තීන්දු ගන්නවා නම් මේ සභාවක් අවශ්‍ය නැහැ ඇත්තටම. සභාවක් අවශ්‍ය නැහැ මේ මට්ටමේ යනවානම්.

ඊළඟට ඔබතුමා මේ සභාව පිළිබඳව කතා කරනවා. මේ සභාව ඕන නම් තියන්නද, නැත්නම් නිකං ඉන්න කියලා. ඔබතුමාගේ දැනුමේ, තේරුමේ තරම තමයි ඒක. සභාවක් තියන්න ඕන කියන එක පිළිබඳව ඉතාම පැහැදිලිව පනතේ තියෙනවා මාසිකව තියන්න ඕන කියලා. ඉතාම පැහැදිලිව ඒක තියෙනවා. එතනින් ගියහම ඊළඟට එකක් තියෙනවා කොතනකවත් කියලා නැහැ සභාවක් තියන්න එපා කියලා. එහෙම චක්‍රලේඛනයක් එවලා නැහැ කොහේවත්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තියෙනවා. සභාව පවත්වන්න කියලා නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එහෙම කොහේවත් එවලා නැහැ. සභාවක් තියන්න එපා කියලා චක්‍රලේඛනයක් කොහේවත් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තියන්න කියලා එවපු එක මට පෙන්වන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මට කතා කරන්න දීලා ඉවසීම තියා ගන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි හැම වෙලාවේම ඔබතුමත් ඒ ඉවසීම තියා ගන්න. ඔබතුමා පුළුවන් තරම් එක පාර ඉවර කරන්න. මම අනිත් අයටත් සාධාරණ අවස්ථාවක් දෙන්න ඕන. ඔබතුමාට විතරක් නෙමෙයි අනිත් අයටත් සාධාරණ අවස්ථාවක් දෙන්න ඕන. මට සභාව පාලනය කිරීමේ අයිතියක් තියෙනවා. කාලය පාලනය කිරීමේ අයිතියක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ පහුගිය කාලය තුල වෙච්ච දේවල් වහන්න තමයි මේ මාධ්‍යය ගෙන්වන්නේ නැත්තේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. මම මාධ්‍යයට වෙනම දෙන්නම්. මම මාධ්‍යයට ඔය සියලු කාරණා වෙනම දෙන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මාධ්‍ය තහනම් කරලා මේ වගේ ජරා විදියට සභාවක් ගෙනියපු සභාපතිවරයෙක් නැහැ. මෙච්චරකල් ඉඳපු හැම සභාපතිවරයාටම ප්‍රශ්න තියෙන්න පුළුවන්. හැබැයි සභාව කරගෙන ගියා. මන්ත්‍රීවරුන්ගේ ගෞරවය තිබ්බා. තමුන්නාන්සේ ඒ ඔක්කොම විනාශ කරනවා. ඒක වෙනවා මේ සභාව යනකොට. සභාව යනකොට තමුන්නාන්සේගේ හිත දන්නවා මේක ඇතුළේ මොනවද තියෙන්නේ කියලා. ඒ නිසා තමයි අද මාධ්‍ය තහනම් කරලා තියෙන්නේ. සංදර්ශන ඕන නැහැ ජනතාව දැන ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් මෙහෙම කරමු මන්ත්‍රීතුමා අද සභාව තියන්නේ නැහැ. අපි සභාව කල් දාමු. ඊළඟට මාධ්‍ය ගෙනල්ලා කරමු ප්‍රශ්නය නිරාකරණය වුණාම. ඔබතුමා එහෙම කියනවා නම් අපි එහෙම කරමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ කොරෝනා ප්‍රශ්නය ගැන ඔබතුමා මතක තියා ගන්න වෙන දේවල් වගේ නෙමෙයි තව අවුරුදු ගාණක් මේක පවතිනවා. දුරස්ථභාවය තියාගෙන යන්න ඕන. ඉතිං ඒක නිසා මතක තියා ගන්න ඔබතුමා කියන විදියට නම් සභාවක් තියන්න වෙන්නේ නැහැ. ඒක තමයි ඇත්ත. ඔබතුමා කියන්න බලන්න පාර්ලිමේන්තුව නොතියා ඇරියට කැබිනට් එක රැස්වුණේ නැද්ද, පළාත් සභාවල් නැහැනේ. මොනවද මේ කතා කරන්නේ ඔබතුමා. ඉතිං ඒක හින්දා සභාව තියන්න, ඕන නම් කල් තියන්න හැකියි. මේකේ කතා කරන්න ඉඩක් නැහැනේ. මේ ප්‍රදේශයේ ජනතාවට වැඩ කරන්න තියෙන කිට්ටුම ආයතනය මේක. මේකේ කොච්චර දේවල් කරන්න තියෙනවාද, ඉතිං ඒවා කරන්නේ නැතුව ඒවා විනාශ කර ගන්න ඕන වෙලා. අපි කියනවා මාධ්‍ය ඇවිල්ලා ඉන්නවා මාධ්‍ය කැඳවන්න කියලා. මාධ්‍ය කැඳවනවාට කවුරුහරි විරුද්ධව ඉන්නවාද, ඇත්තම කියන්න බලන්න මේ මාධ්‍යයට විරුද්ධ කවුද.

(ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා අපිව අපහසුතාවයට පත් කරන්න එපා. අපිට මාධ්‍යයට විරුද්ධ වෙන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එහෙමනම් අපි ගෙන්වමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි අද පොදුවේ මාධ්‍ය කැඳෙව්වේ නැහැ. ඒක සියලු මන්ත්‍රීවරු දැන ගන්න ඕන. නමුත් අද ඔබතුමා කැඳවපු මාධ්‍යයත් එක්ක අපි මේක කරගෙන යන්න සූදානම් නැහැ. එහෙමනම් සියලු මාධ්‍යය වෙනදා වගේ කැඳවන්න ඕන. අපි නෙමෙයිනේ අද මාධ්‍ය කැඳෙව්වේ අද ඔබතුමානේ මාධ්‍ය කැඳවලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කවදද මේ සභාවෙන් මාධ්‍ය කැඳවලා තියෙන්නේ. මේ සභා ඉතිහාසයේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇයි අපි පහුගිය කාලේ කැඳෙව්වේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එකම එක පාරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පහුගිය ඒවාට අපි කැඳෙව්වානේ. අපි ලියුම් දාලා කැඳවලා තියෙනවානේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපි වැරැද්දක් නොකර තියෙනවානම් අපි මාධ්‍යයට බය වෙන්න ඕන නැහැ. මම පැහැදිලිව කියනවා අපි වැරැද්දක් කරලා නැහැ. ඒ නිසා මාධ්‍යයට එන්න කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ සුගත් මන්ත්‍රීතුමා. මම කියන්නේ ඒක නෙමෙයි. ඔබතුමාට මම කියන්නම්. අපි මේ භූමියේ තමයි රැස් වෙන්න ඕන. මාධ්‍යය අතන වාඩි වෙන්න ඕන. ඔය ප්‍රශ්නයනේ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** වෙනම දාන්න පුළුවන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ඉන්නකෝ. එහෙම ඕන ඕන තැන්වලට මාධ්‍ය දාන්න බැහැ. දානවානම් මාධ්‍යයට තියෙන තැනට දාන්න ඕන. ඔබතුමා ඒක ඔබතුමාට කරන්න පුළුවන් කාලෙක කරන්න. බංකොලොත් දේශපාලනය. ඔබතුමා විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමාගෙන් මන්ත්‍රී ධූරය අර ගත්තේ. ඔබතුමා බංකොලොත් දේශපාලනය කරන්නේ. පුළුවන්නම් මිනිස්සු අතර, ඡන්දයකට එන්නකෝ. ඔබතුමාගේ බංකොලොත්භාවය වහගන්න හදන්නේ. මම කියන්නේ මෙච්චරයි අද අපි තීරණය කරේ මේක. මන්ත්‍රීවරු 22 ක් මේ සුළු කොටසේ ඉන්න ඕන.

(ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි කියන්නේ කවුද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි කියන්නේ මමයි, ලේකම්තුමයි. අපි ඔබතුමන්ලාව කැඳවලා ඒකත් තීරණය කරන්නද කියන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අද මේ මාධ්‍යයට ආරාධනා කරලා තියෙන්නේ කවුද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා, අපි නෙමෙයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එතුමා දන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද උදේ මාධ්‍යවේදීන් මට කතා කරලා කිවුවනේ අබේසේකර මන්ත්‍රීතුමා කතා කරලා කරදර කරනවා කියලා. මම ඒ අයට තේරුම් කරලා කිවුවා. මම කිවුවා සභාවේ න්‍යාය පත්‍රය ඔක්කොම දෙන්නම්, සභා වාර්තා ඔක්කොම දෙන්නම් කියලා. කිසි ප්‍රශ්නයක් නැහැ මාධ්‍යවේදීන්ට. කැඳෙව්වේ අබේසේකර මන්ත්‍රීතුමා. එතුමාගේ මාධ්‍යයත් එක්ක මේක කරගෙන යන්න අපි එකඟ නැහැ. එහෙමනම් අද සභාව කල් දාලා අපි වෙන දවසක කරමු.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** සභාපතිතුමා, අබේසේකර මන්ත්‍රීතුමා නෙමෙයිනේ වෙනදට මාධ්‍ය කැඳවන්නේ. සභාවනේ කැඳවන්නේ. ඉතිං සභාවට ප්‍රශ්නයක් නැත්නම් අබේසේකර මන්ත්‍රීතුමත් ගෙන්වලා තියෙනවා නම් මාධ්‍ය ගෙන්වන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පොදු මාධ්‍ය සියලු දේවල් නැහැනේ. එයාට ඕන මාධ්‍ය, "සිරස" විතරයිනේ ගෙන්වලා තියෙන්නේ. එයාට ඕන මාධ්‍ය විතරයිනේ ගෙන්වලා තියෙන්නේ. අපිට මේ සීමාවේ දුරස්ථභාවය තියාගෙන කරන්න බැහැ. ඒක තේරුම් ගන්න. අපි මාධ්‍ය කැඳෙව්වානම් ඒ අය ප්‍රධාන වශයෙන් කියන දේ තමයි බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව සෞඛ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය නොකොට සභාව පවත්වනවයි කියන එක. අනිවාර්යයෙන්ම මේ අය ප්ලෑන් කරේ ඒක. ඒක කියනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මේකේ දුරස්ථභාවය තියෙනවාද, නැද්ද කියලා එන මාධ්‍යවේදීන්ට පේනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට මාධ්‍යවේදීන්ට අතන දීලා කලින් කියපු විදියට තමයි මේක තියන්න වෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ ඉඩ තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මාධ්‍යවේදීන් ඉන්නේ අතනනේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා** :- මේ රටේ වෙච්ච ප්‍රශ්නය හින්දා මාධ්‍යවේදීන්ට අපි මුල්ලක ඉන්න දුන්නා කියන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- එහෙම කරානම් කියාවි මාධ්‍යවේදීන් ගෙන්වලා අරගේ දැම්මා, ඔන්න මාධ්‍යවේදීන්ට මේ සභාව සලකන විදිය කියලා. ඔබතුමා ඒ වගේ වැඩ කරන මන්ත්‍රීවරයෙක්. ඔබතුමා ඕන දෙයක් කරන්න ඒ වගේ. මම වගකීමෙන් කියනවා සභා වාර්තාව සියලුම මාධ්‍යවේදීන්ට දෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** :- ඔබතුමා මාධ්‍ය ගැන දන්නේ නැහැ. මාධ්‍ය කියන්නේ ඇවිල්ලා බලාගෙන ඉඳලා වාර්තා කරන එක. නැතුව ඔබතුමා දෙන එකයි, ඊළඟ එකේ එන සංශෝධනත් බලන්න ඕන. සංශෝධන රහිතව දෙනවා නම් ඒක නියම වාර්තාව නෙමෙයිනේ. එතකොට සංශෝධන ගියාට පස්සේ දෙන්න ඕන. මාධ්‍ය නෙමෙයි මට පේන්නේ මොකක්වත් ඔළුවේ නෑ ඒකයි වැඩේ තියෙන්නේ.

(ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- ඔළුවේ තියෙන්නේ ඔබතුමාගේ කුණු ගොඩවල් විතරයි. ඔබතුමාගේ ඔළුවේ තියෙන කුණු ගොඩවල් තමයි ඔළුවේ තියෙන්නේ. ඔබතුමා තරම් බංකොලොත් මන්ත්‍රීවරයෙක් ඉන්නවාද,

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** :- ඔබතුමයි, මමයි තමයි කරේ. ඔබතුමන්ලා මන්ත්‍රීවරු 25 ටම මම මේ සභාවේ සභාගත කරා ලියුම් 25 ක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- කීයක්ද, ඉන්න මන්ත්‍රීවරු ගාණ දන්නේ නැති මන්ත්‍රීවරයෙක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** :- සභාපතිට විරුද්ධව අත්සන් කරලා නැද්ද කියලා අහන්න වැරදි කරහම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- අද මම අහන්නේ මෙච්චරයි. අනිත් මන්ත්‍රීවරුන්ගෙන්. බංකොලොත් මන්ත්‍රීවරුන්ගෙන් නෙමෙයි අනිත් අයගෙන් අහන්න. අද සභාව තියන්න ඕනද, නැද්ද, අද සභාව කැඳෙව්වේ මන්ත්‍රීවරු වෙනුවෙන්. මම කල් තියනවා සභාව මේ විදියට කරගෙන යන්න බෑනේ.

න්‍යාය පත්‍රයට යනවා.

පළමුවෙන්ම ඔබ සියලු දෙනාම දන්නවා කොරෝනා හෙවත් කොවිඩ් 19 වසංගතය චීනයෙන් ආරම්භ වෙලා අද ලංකාව ඇතුළු මුළු මහත් ලෝකය පුරාවටම දැවැන්ත අර්බුදයක් බවට පත්වෙලා තියෙනවා. ලක්ෂ සංඛ්‍යාත ජීවිත සංඛ්‍යාවක් හානි වෙන තත්ත්වයක් පෙනීමට තියෙනවා. ඒක නිසා ඒකෙදි ජීවිත හානි වුණ සියලු දෙනාටම බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විදියට උපසභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාගේ සංවේගය ප්‍රථමයෙන්ම පුද කරනවා. අඳුරු වලා අතර රිදී රේඛාවක් වගේ අපි යම් තරමක් දුරට සතුටු වෙනවා වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඒ වගේම ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රධාන වර්තමානයේ කැබිනට් මණ්ඩලය ඒ වගේම සෞඛ්‍ය අමාත්‍යාංශය, ඒ වගේම ත්‍රිවිධ හමුදාව හා පොලීසිය එකතු වෙලා මේ තරම් දුරට ඉවරකිරීම පිළිබඳව අපි ස්තුති වන්ත වෙනවා. ඒ පිළිබඳව ඇත්තටම වර්තමාන ජනාධිපතිතුමා, අගමැතිතුමා ප්‍රධාන කැබිනට් මණ්ඩලයට අපේ ප්‍රාදේශීය සභාවේ ස්තුතිය පළ කරනවා. මොකද ඇමෙරිකාව වගේ එච්චර දියුණු රටකත් ලක්ෂයකට ආසන්න සංඛ්‍යාවක් ජීවිත හානි වෙනකොට අපේ රටේ ජීවිත හානි අවම කර ගනිමින්, ආසාදිතයින් සංඛ්‍යාව අවම කර ගනිමින් අපිට ඒ කොරෝනා වසංගතය පාලනය කර ගන්න දැනට හැකියාව ලැබිලා තියෙනවා. පොකුරු 14 ක් තිබුණ එක අද නාවික හමුදා පොකුරට පමණක් සීමා වෙලා යන තත්ත්වයක් තියෙන්නේ. ඒකෙදි ඇත්තටම සියලුම රෝහල්වල සෞඛ්‍ය කාර්ය මණ්ඩලවලට ඒ වගේම කැපවීමෙන් කටයුතු කරන ත්‍රිවිධ හමුදාව ඇතුළු පොලීසියට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ ගෞරවය මේ අවස්ථාවේදී පුද කරන්න ඕන. ඒක පළවෙනි කාරාණාව.

ඊට පස්සේ දෙවැනි කාරණය වශයෙන් ගත්තහම අපිට පුළුවන්කම ලැබුණා, මොකද බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කියන්නේ එච්චරම විශාල ආදායමක් ලැබෙන ආයතනයක් නෙමෙයි. නමුත් මම හිතන්නේ ගාල්ල දිස්ත්‍රික්කයේ එකම ප්‍රාදේශීය සභාව තමයි කොරෝනා වසංගතයෙන් පීඩාවට පත්වෙච්ච ඒ අඩු ආදායම්ලාභී පවුල් සඳහා ලක්ෂ 40කට අධික මුදලක් වැය කරලා පවුල් 8000කට ඒ වියළි ආහාර ද්‍රව්‍ය එවෙලේම, ඒ ක්ෂණයෙන් අපිට උපසභාපතිතුමා, මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාගේ විශේෂයෙන්ම ලේකම්තුමා ඇතුළු අපේ කාර්ය මණ්ඩලයට බොහොම ස්තුති

වන්ත වෙනවා. එතුමන්ලා, එතුමියන්ලා ඇඳිරිනීතිය පැවති දිනයක් හෝ රාජ්‍ය නිවාඩු දිනයක්වත් සලකන්නේ නැතුව තමන්ගේ පවුල්වල අය පවා ඇවිල්ලා ඒ ඇසිරීම් කටයුතු කරා. ඒ ආකාරයෙන් ගත්තම සියලු කටයුතුවලට මැදිහත් වෙලා තමන් සද්භාවයෙන් කරන සේවයක් විදියට සලකලා ඒ කටයුත්ත ඉෂ්ඨ කිරීම පිළිබඳව ඇත්තටම අපේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ, උප සභාපතිවරයාගේ, මන්ත්‍රීතුමන්ලාගේ, මන්ත්‍රීතුමියන්ලාගේ ගෞරවණීය ස්තුතිය අපි ලේකම්තුමා ප්‍රධාන කාර්ය මණ්ඩලයට, පවුල් වල අයට යොමු කරන්න ඕන.

ඒ වගේම අපි දන්නවා විපක්ෂයේ වුණත් ආණ්ඩු පක්ෂයේ වුණත් මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා කොටසක් සද්භාවයෙන් මැදිහත් වෙලා මේ කරන කාර්යය පිළිබඳව තමන්ගේ ඇස් දෙකෙන් දැකලා ඒ වගේම ඒ භාණ්ඩ මිලදී ගැනීමේ කමිටුව විදියට ගිහිල්ලා සද්භාවයෙන් රුපියලද, රුපියල් දෙකද අඩු කර ගන්න පුළුවන්, ඒකට උපරිම තරගයක් දීලා ප්‍රාදේශීය සභාව වෙනුවෙන් මැදිහත් වීම පිළිබඳව ඒ භාණ්ඩ මිලදී ගැනීමේ කමිටුව ඇතුළු සද්භාවයෙන් මැදිහත් වෙච්ච උපසභාපතිතුමා ප්‍රධාන පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීතුමන්ලාට හා මන්ත්‍රීතුමියන්ලාට සභාපතිවරයා විදියට මගේ ගෞරවණීය කෘතවේදී ස්තුතිය බෝපෙ පෝද්දල ජනතාව වෙනුවෙන් මේ අවස්ථාවේදී පළ කරන්න කැමතියි. එතනදී අපි දැන ගත්තා භාණ්ඩ විනිවිදභාවයෙන් බෙදනකොට විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු සාධාරණ වුණා. සමහරු අපේ වසම්වල, අපේ කොට්ඨාශවල මෙන්න මේ අයට ලබා දෙන්න කියලා ලේඛන ඉදිරිපත් කරා. බොහොම සද්භාවයෙන් ඒ අය මැදිහත්වීම ඇත්තටම අගය කරන්න ඕන කාරණාවක් කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕන.

ඉතිං ඊළඟ කාරණාව තමයි බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවට දීර්ඝ කාලයක පටන් පවතින අඩුපාඩුව තමයි ආදාහනාගාරයක්. අනිත් සියලු සභාවලට ආදාහනාගාර තියෙද්දි අපි කීප තැනක උත්සහ දැරුවා ආදාහනාගාර හදන්න. නමුත් නොයෙකුත් හේතු මත අපිට ඒ කාරණාව ඉෂ්ඨ කර ගන්න බැරි වුණා. ඉතිං ඒකෙදි අපේ සභාව තුළ චමින්ද ගමගේ ගරු මන්ත්‍රීතුමා විශාල උත්සාහයක් දැරුවා එතුමාගේ කොටසේ, පෝද්දල කන්ද ප්‍රදේශයේ ආදාහනාගාරයක් හදන්න. අපි දැනටත් ඒක සුසාන භූමියක් විදියට ඉදිරියට පවත්වාගෙන යන්න කටයුතු කරනවා. අපේ භූමියක් ඒක. ඉතිං ඒ වගේම අපේ වැවිලි කර්මාන්ත හා අපනයන කෘෂිකර්ම ගරු අමාත්‍ය රමේෂ් පතිරණ මැතිතුමාගේ මැදිහත්වීම යටතේ අපේ ඉල්ලීමක් මත නරාවල සිට්ටුස් වත්ත ඉඩමේ අක්කර භාගයක කොටසක් මේ වන විට අපේ සභාවට ලබා දීමට කටයුතු කරගෙන යනවා. මේ වෙන කොට මූලික කටයුතු ඉවරයි. ඒ මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්න විතරයි දැන් තියෙන්නේ. ඒක ලබා ගන්නත් කලින් ආවරණ අනුමැතියට යටත්ව මට ලිපියක් ලබා දෙන්නම් කිවුවා. මේ කාර්ය ඉදිරියට කරගෙන යන්න අදාළ ආයතන වලට අපේ සැලසුම් ඉදිරිපත් කරලා තියෙන්නේ අපිට ණය පහසුකම් ලබා ගන්නයි, ඒකට අවශ්‍ය මිල ගණන් කැඳවීමේ කටයුතු වලටයි. ඒවා දැනුම් දීලා තියෙන්නේ මේ කාරණය ඉස්සෙල්ලම ඉෂ්ඨ කර ගන්න ඕන කාරණයක් නිසා. ඔය කාරණා තුන ප්‍රධාන වශයෙන්ම සඳහන් කරන්න ඕන. මොකද හේතුව අද මහා සභාව ඇත්තටම කැඳෙව්වේ මාස දෙකක කාලයක් තිස්සේ මහජන නියෝජිතවරුන්ට තමන්ගේ කොට්ඨාශවල අඩුපාඩුකම්, අදහස් කොරෝනා වසංගතය පිළිබඳව අදහස් දැක්වීමට. ඒකට තමයි සද්භාවයෙන් මේ සභාව කැඳෙව්වේ. ඒ වගේම මම ඉතාම වගකීමෙන් කියනවා මේ මාසයේ සභාව කැඳවන්න කියන එක කොහේවත් සඳහන් වෙලා නෑ. ඒකෙදි ගිය මාසේ සභාව කැඳවන්න එපා කියලා ආපු එකම තමයි මේ මාසයටත් තියෙන්නේ. සභාපතිවරයාගේ තියෙන බලතල අනුව අද මම මේ සභාව කැඳවීමට කටයුතු කරේ. අපේ මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාට තියෙන ප්‍රශ්න, ගැටලු ඉදිරිපත් කිරීමේ අවස්ථාව ලබා දෙන්න ඕන නිසා කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕන.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මට පොඩි අවස්ථාවක් ලබා දෙන්න. ගරු සභාපතිතුමනි, සහෝදර මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, ලේකම්තුමා ප්‍රධාන සියලුදෙනාගෙන් අවසරයි. ඇත්ත වශයෙන්ම පහුගිය දින කිහිපය, මාස එක හමාරක දෙකක කාලය තුළ විශේෂයෙන්ම කොරෝනා වසංගතයෙන් මුළු ලොවක් තැතිගද්දි ශ්‍රී ලංකාව හැටියට අපි එක පැත්තකින් ආඩම්බර විය යුතුයි වත්මන් රාජ්‍ය නායකත්වය දරන ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා, ඒ වගේම අගමැති මහින්ද රාජපක්ෂ මැතිතුමා, සෞඛ්‍ය ඇමතිතුමිය වන පවිත්‍රා වන්නිආරච්චි මැතිණිය ඇතුළුව සෞඛ්‍ය අධ්‍යක්ෂක ජනරාල්තුමා, පොලිස්පතිතුමා ඒ වගේම යුධහමුදාපතිතුමා ඇතුළු සෞඛ්‍ය සේවයේ නියුතු සියලුමදෙනාත්, ආරක්ෂක සේවයේ නියුතු සියලුදෙනාත් කාර්යක්ෂම ලෙසත්, ඉතා දක්ෂ ලෙසත් ලොවක් පුදුමයට පත් කරන විදියට අද මේ වසංගතය පාලනය කරලා තියෙනවා. ඒ වගේම එයට ශක්තිය ලබා දුන්නු සියලු රාජ්‍ය නිලධාරීන්, උස් පහත් නොතකා සියලුදෙනාගේම කැපවීම සභාවක් හැටියට අපි අගය කරනවා. ඒ වගේම සෞඛ්‍ය රෙගුලාසි වලට අනුව ඒ අදාළ ඇඳිරිනීති දිනයන්හිදි විශේෂයෙන්ම බෝපෙ පෝද්දල ජනතාව ඉතාමත්ම සන්සුන්ව

හික්මීමෙන් ඒ කටයුතු වලට සහයෝගය දීම ගැන බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයා හැටියටත්, මහජන නියෝජිතවරයෙක් හැටියටත්, මා ඉතාම ස්තුතිවන්ත වෙනවා බෝපෙ පෝද්දල ජනතාවට සියලු කටයුතු වලට සහයෝගය ලබා දෙමින් කටයුතු කිරීම ගැන. ඒ වගේම බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු අපි සාකච්ඡා කරා මුල්ම සාකච්ඡාවේදී පක්ෂ විපක්ෂ සියලු මන්ත්‍රීවරුන් රැස්ව සභාවක් හැටියට අපි දෛනික වැටුප් ලබන, සමෘද්ධි පවුල් ඒ වගේම සියලු රාජ්‍ය සහ විශ්‍රාම වැටුප් නොලබන සියලුදෙනාටම සහන මල්ලක් ලබා දිය යුතුයි කියන එක. මතභේද තිබුණත් ඒක නොමිලේ ලබා දීම කළයුතුයි කියන ස්ථාවරයේ අපි ඉඳලා සියලු කොට්ඨාශ නියෝජනය කරමින් ඒ මන්ත්‍රීවරු පක්ෂ භේදයකින් තොරව ඒවා ජනතාවට ලබා දුන්නා. සභාපතිතුමනි, ජනතාවගේ මහා ප්‍රසාදයක් තියෙනවා ඒකට. ඒ බඩු මල්ලේ තියෙන වටිනාකම නෙමෙයි සභාවක් හැටියට අපි අසරණ වුණ වෙලාවට අපි ගාවට ඇවිල්ලා මේ සහනය ලබා දුන්න එක ලොකු ගෞරවයක් සභාවට. බදු මුදලින් නඩත්තු වන අපේ ආයතනය, ජනතාවගේ බදු මුදල සෘජුවම අපි සභාවට ලබා ගෙන පෙරළා ජනතාව අසරණ වුණ වෙලාවට ඒ මුදලේ වටිනාකම නොතකා ලබා දීම ජනතාව අගය කරලා තියෙනවා. ඒ නිසා සභාවක් හැටියට අපි සතුටු වෙනවා ඒ කාර්ය කිරීමට ශක්තිය ලැබීම පිළිබඳව.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මේ සඳහා මහා පරිශ්‍රමයක් දරපු ලේකම් මහත්තයා ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයට අපගේ ගෞරවණීය ස්තුතිය පිරිනමනවා. සභාපතිතුමා කිවුවා වගේ සියලු කාර්යයන් පසෙකලා සභාව තුළ මම හිතන්නේ මහා කාලයක්, රාත්‍රී කාලයේත් මේ ස්ථානයේ රැඳී සිටිමින් ඒ කරපු මෙහෙයට ගෞරවනීය ස්තුතිය පුද කරන්න ඕන. ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, මේ කාලය තුළ ධාරාණිපාත වර්ෂාව නිසා නැවත ඩෙංගු අවධානම මතු වෙමින් පවතිනවා. අද උදෙත් අඹගහවත්ත ප්‍රදේශයේ කොස් ගසක් කඩන් වැටිලා නිවසකට හානි වෙලා තියෙනවා. මීට පෙරත් එහෙම සිද්ධියක් වුණා. ඒ නිසා එයට මූලික සැලසුම් සකස් කර ගනිමින් කළ යුතුයි කියන එක මගේ අදහස. විශේෂයෙන්ම අවහිර වූ කාණු ටික ශුද්ධ පවිත්‍ර කර ගන්න ඕන. කපුහෙම්පල විශේෂයෙන්ම කිහිපයක් තියෙනවා. කීපවතාවක්ම කිවුවා ඒ දේ සිද්ධ වුණේ නැහැ. ඒ කරුණු කාරණා ගැනත් අවධානය යොමු කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමා පෙර කිවුවා, වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් කාලයක සිට අඩුපාඩුවක්ව පැවතුණ ආදාහනාගාරය සෑදීමේ කටයුත්ත ගැන සාකච්ඡා කරා. ගරු සභාපතිතුමනි, ඒ අදාහනාගාරය ද්විත්ව ආදාහනාගාරයක්ද, කොහොම එකක්ද කියලා මම දැන ගන්න කැමතියි. තනි ආදාහනාගාරයකට වඩා මළ සිරුරු දෙකක් එක අවස්ථාවේ ආදාහනය කරන්න පුළුවන් විදියට ආදාහනාගාරයක් හදන එක කොට්ඨාශයේ හැටියට වටිනාකමක් තියෙනවා. පොඩි මුදලක් වැඩි වුණත් ඒක එහෙම කිරීම සුදුසුයි කියන එක තමයි මගේ අදහස. අපි ඒක කරමු. සියලුදෙනාටම බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, කොරෝනා වෛරසය පැතිරීමෙන් පසු පැවැත්වෙන්නේ මේ සභාව. ඇත්තටම කොරෝනා උවදුර මේ ලංකාවේ විතරක් නෙමෙයි මුළු ලෝකයේම පැතිරිච්ච වසංගතයක්. නමුත් සමහර මාධ්‍ය පසුගිය කාලවලදී මේක මුස්ලිම් කොරෝනාවක් බවටත් පත්කර ගත්තා. ඒ කියන එක ඔබතුමන්ලා දැකලා ඇති. මම කණගාටු වෙනවා ඇත්තටම අපේ සිංහල බෞද්ධ ජනතාවට අවුරුදු කන්න බැරිවුණේ මුස්ලිම් ජනතාව නිසා කියලා ප්‍රකාශයට පත් වුණ එකට. ඇත්තටම අපි මුස්ලිම් ජනතාව හැටියට ඉතාමත් අසීරුවට පත් වුණා. සමහර මාධ්‍ය හැසිරෙන ආකාරය, ඒ කරපු ප්‍රකාශ මේ කොරෝනාව හරියට මුස්ලිම් ජනතාව ලංකාවට ගෙනත් දැම්මා වගේ තමයි සමහර මාධ්‍යවල ප්‍රකාශයට පත් වුණේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාම ඕක කියන එක හොඳයි. මාධ්‍යවල තත්ත්වය ගැන.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සමහර මාධ්‍ය ගැන මම කියන්නේ. සියලුම මාධ්‍ය නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමන්ලාට හිතවත් මාධ්‍ය එහෙමයි අනිත් මාධ්‍ය අරහෙමයි. ඒක හරි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒ වගේම අපි මුස්ලිම් ජනතාව හැටියට මේකට උපරිම සහයෝගය ලබා දීලා තියෙනවා. අපි ඉල්ලීමකුත් කරලා තියෙනවා. ඇත්තටම සිංහල බෞද්ධ ජනතාව අවුරුදු කෑවේ නැහැ. අවුරුද්දට ගෙවල්වල හිටියේ. වෙසක් පෝය සැමරුවෙත් නැහැ. ද්‍රවිඩ ජනතාවත් එහෙමයි. ඒ නිසා කොරෝනාව දැන් මදකට හරි පාලනය වුණ මොහොතේදී අපි

ඉල්ලීමක් කරනවා. අපේ අවුරුද්ද තියෙනවා ලබන සතියේ, ආණ්ඩුවට දැඩි ඉල්ලීමක් කරා. අපේ නායකතුමත් ඒ ඉල්ලීම කරා. ඇඳිරිනීතිය දාන්න. අපිට හැමෝම ජනතාවගේ අත්වැල් බැඳලා ගෙවල්වල තියා ගන්න බැහැ. ඕනම ජාතියක මිනිස්සුන්ගේ පාලනය කරන්න පුළුවන් කට්ටියකුත් ඉන්නවා, බැරි කට්ටියකුත් ඉන්නවා. මෙම අවස්ථාවේදී අපේ මුස්ලිම් ජනතාව, අපේ මුස්ලිම් ඇමතිවරු දැඩි ඉල්ලීමක් කරලා තියෙනවා මේ අන්තිම සතියේ දවස් තුන හතරට ඇඳිරිනීතිය දාන්න අවුරුදු සමරන්න බැරි වෙන්න අපේ මුස්ලිම් ජනතාවට. ඒක ඒ තත්ත්වයට පත් කරන්න කියලා අපි ඉල්ලීමක් කරලා තියෙනවා. මේ අන්තිම සතියේ දවස් තුන හතරක් ඇඳිරිනීතිය දාන්න. මේ සභාවෙනුත් අපි ඉල්ලීමක් කරලා තියෙනවා. ඒක පාලනය කරන්න ඉල්ලීමක් කරනවා අපි ඇඳිරිනීතිය දාන්න කියලා. නැත්නම් අන්තිමට මේ ඇඳිරිනීතිය අස්සේ අපේ මිනිස්සු ඇඳුම් ගන්න ගිහිල්ලා අයේ කියයි මුස්ලිම් ජනතාව කොරෝනා පැතිරුවයි කියලා. රජයට පුළුවන් මේක කරන්න. ඉල්ලීමක් කරනවා සභාවෙන් ආරක්ෂක අමාත්‍යාංශය දැනුවත් කරන්න අන්තිම දවස් තුන සිකුරාදා, සෙනසුරාද, ඉරිදා ඇඳිරිනීතිය දාන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට ඔබතුමන්ලා පක්ෂ නායක හමුවේදී ඉල්ලීමක් කරන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒකට ඉල්ලීමක් කරලා තියෙනවා. මෙහෙනුත් ඉල්ලීමක් කරන්න. කොරෝනා වෛරසය සමාන්‍යයෙන් රටේ ඕනම තැනක ඇති වෙන්න පුළුවන්. ඒක ස්වාභාවිකයි. කවුරුවත් මට කොරෝනා ඕන කියලා බෝකර ගන්නේ නෑනේ. නමුත් රටේ එහෙම නෙමෙයි කළේ. ඒ කාලය අපේ ජනතාව අපහසුතාවයට පත් වුණා. ඒ ගැන කණගාටුවට පත් වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ යෝජනාව කවුරු හරි ස්ථිර කරන්න. ඒක සම්මත යෝජනාවක් විදියට යවන්න.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒකට වහාම ලියුමක් යවන්න. අනිත් එක තමයි ගරු සභාපතිතුමනි, කොරෝනාව ලෝකයේ රටවල් 182 ක තිබුණා. දැන් රටවල් 232 ක් දක්වා බෝ වෙලා තියෙනවා. නමුත් ඒ හැම රටකම සාමාන්‍යයෙන් මරණයක් වුණාම ආදාහනය කරන්න, භූමදානය කරන්න අවස්ථාව ලබා දීලා තියෙනවා. නමුත් අපි කණගාටුවට පත් වෙනවා මුස්ලිම් ජනතාව හැටියට, මගේ විරෝධතාවය ප්‍රකාශ කරනවා මෙතනදී. අපේ ආගම අනුව සාමාන්‍යයෙන් මරණයකට පත් වුණහම මරණයක් හෝදන කොටත් හෙමින් හෝදන්න කියලා තියෙන්නේ රිදෙන්නේ නැතුව. මරණයකට පත්වුණහම ඒ මරණය හෙමින් අල්ලගෙන තමයි හෝදන්නේ. ඒ මරණයට දැනෙනවා. අල්ලන කොටත් රිදෙනවා කියලා තමයි එහෙම කරන්නේ. එවැනි අවස්ථාවක ආදාහනය කරන්න කියනවා. භූමදානය කරන්න අවස්ථාව තියෙද්දිත් ආදාහනය කරන්න තීන්දුවක් ගැනීම සම්බන්ධව විරෝධය දක්වනවා. මේක රජයෙන් ගනිපු තීන්දුවක්ද, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ගනිපු තීන්දුවක්ද කියලා දන්නේ නැහැ. මේ සම්බන්ධව රජයේ පාර්ශවයේ අලි සබ්රි වගේ ඒක පාර්ශවික කට්ටියත් මේකට විරෝධතාවය ප්‍රකාශ කරලා තියෙනවා. මොන හේතුව මතද කියලා දන්නේ නැහැ. ඒකට අපේ කණගාටුව ප්‍රකාශයට පත්කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ජාත්‍යන්තර නීතියට අනුව සෞඛ්‍ය දෙපාර්තමේන්තුවත් එක්ක සාකච්ඡා කරලා ගත්ත තීන්දුවක් මන්ත්‍රීතුමා. මේ සභාවේ අපි ඒක කතා කිරීම අනවශ්‍යයයි. ඒක ජාතික තීන්දුවක්. ඒක අපේ සභාවේ කතා කරා කියලා වැඩක් නෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක මේ රටේ විතරයි තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක හරියට පැතිරී යාම වැළකුණෙත් ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග ගනිපු හින්දා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අඩි 17 ක් වුණත් හාරලා භූමදානය කරන්න පුළුවන් තැන් තියෙනවා. නමුත් එහෙම තියෙද්දිත් මෙහෙම තීන්දුවක් ගැනීම සම්බන්ධව මගේ විරෝධතාවය මම ප්‍රකාශයට පත් කරනවා. ඒකෙදි ඇත්තටම මම මුස්ලිම් ජනතාව වශයෙන් අපේ දැඩි කණගාටුව ප්‍රකාශයට පත් කරනවා. ඒ වගේම බඩු බෙදීම සම්බන්ධව අපි ඒ අවස්ථාවේදී ඒකට අදාළව උත්තර ලබා දෙන්නම්.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපේ කියාස් මන්ත්‍රීතුමා විරෝධය දැක්වීම පිළිබඳව පොඩි අදහසක් දක්වන්න ඕන. ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ඒ

සෞඛ්‍ය ආරක්ෂණ වැඩපිළිවෙලට අනුව තමයි ඒ කටයුත්ත සිදු වුණේ. ඒක ලෝකයේ හැමතැනම සිදු වුණා. ඒ හින්දා ඔබතුමා ඒ දේ ගැන අප්‍රසාදය පළ කරන්න එපා. මේක මේ ආකාරයෙන් ආරක්ෂා කර ගනිපු එක ගැන සතුටු වෙන්න එපැයි. මියගිය තැනැත්තා ගැන නෙමෙයි ජීවත් වෙන මිනිස්සු ගැන හිතලා තමයි ගන්න පුළුවන් උපරිම සෞඛ්‍ය ආරක්ෂණ වැඩපිළිවෙල ක්‍රියාත්මක කරේ. ඒ නිසා ඔබතුමන්ලා ඔහොම හිතන එක ඇත්තටම වැරදියි. අපේ බුද්ධාගමට අනුව පාංශුකූලය නොදී ආදාහනය කරන කොට අපේ මිනිස්සුන්ටත් ඒ හැඟීම තිබුණා. ඔබතුමන්ලාගේ ඒ සිද්ධිය ඒ විදියට වෙන කොට ඒකට පොඩි ඉවසීමකින් ඉන්න වෙනවා. මියගිය තැනැත්තාට නෙමෙයි ජීවත් වෙලා ඉන්න තැනැත්තා ආරක්ෂා කර ගන්න තමයි මේ තීන්දුව ගත්තේ. හැබැයි සහරාන්ලා ඇවිල්ලා බෝම්බ ගහන කොට ඔහොම ප්‍රශ්නයක් වුණේ නැහැනේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එතනට යන්න එපා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** සහරාන් ඇවිල්ලා පල්ලිවල සිය ගණන් දරුවෝ, ගීතිකා කියන දරුවෝ එකතැන මැරෙන කොට කවුද කතා කරේ. ඉතිං ඒ නිසා ඒ විදියට කතා කරන්න එපා. ඒක සෞඛ්‍ය ආරක්ෂිත වැඩපිළිවෙල අනුව කරේ. බුද්ධාගමට අනුව පාංශුකූලය ලබා දුන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි මෙච්චරයි මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ලෝකේ ක්‍රම දෙකක් දීලා තියෙනවා. ඒ ක්‍රම දෙකටම කරන්න පුළුවන්. නමුත් දැන් මෙතුමා කියනවා සෞඛ්‍ය අංශය කිවුවා කියලා. නමුත් දැන් පහුගිය දවසක මරණයක් වුණාට පස්සේ ඒ මරණයට පොසිටිව් කිවුවා. පස්සේ ඒක නෙගටිව් කියලා කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි ඒ වගේ දේවල් සිදු වුණ අවස්ථා ඕන තරම් ඇති.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මරණයක් වුණාට පස්සේ විෂබීජ නැති වෙනවා කියලා කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙතන ඔය තර්කය නෙමෙයිනේ ආවේ. කියාස් මන්ත්‍රීතුමා මෙහෙමයි. ඔය කාරණය මෙතනින් එහාට කතා කරන්න ඕන නැහැ. කෙටියෙන් ගත්තොත් ඔබතුමන්ලාගේ ආගමානුකූලව මේක කරන්න විදියකුත් නැහැ අපේ බුද්ධාගම අනුව කරන්න විදියකුත් නැහැ. පාංශුකූලය දුන්නේ නැහැ. අපේ ආගම අනුව පාංශුකූලය නැතුව වළලන එකත් මිනිහෙකුට කරන අගෞරවයක්. මේක අපේ ආගම අනුව කරෙත් නැහැ. ඔබතුමන්ලාගේ ආගම අනුව කරෙත් නැහැ. කොරෝනා මරණයක් වුණොත් ජීවිත ආරක්ෂාව සඳහා අදාළ සෞඛ්‍ය අංශ ඒ ක්‍රියාමාර්ග ගත්තා. එච්චරයි. අපි න්‍යාය පත්‍රයට යමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, විනාඩියක් ලබා දෙන්න. පැහැදිලි කිරීමක් කරන්න ඕන හින්දා විතරයි. මේවා ගැන නෙමෙයි. ඇත්තටම අපේ උප සභාපතිතුමත්, සභාපතිතුමත් බොහොම ආඩම්බරයෙන් කිවුවා. අපි බොහොම ආඩම්බරයෙන් කිවුවා. පැය භාගයක කල් දීමකින් ඔබතුමා මන්ත්‍රීවරු කැඳෙව්වා මේ කොරෝනා වසංගතයත් එක්ක සහනයක් දෙන්න ඕන කියලා ජනතාවට. මම විශ්වාස කරනවා මට මතක හැටියට මගේ ළඟ තියෙනවා සම්පූර්ණයෙන් ගනිපු තීන්දු තීරණ පිළිබඳ කැසට් පටය. මන්ත්‍රීවරු දෙදෙනයි නාවේ. මම හිතන්නේ ශ්‍යාමිකා මන්ත්‍රීතුමියත්, චමින්ද මන්ත්‍රීතුමත් විතරයි මොකක් හරි වැඩක් නිසා නාවේ. හැබැයි එදා දවසේ අපි ඇවිල්ලා බොහොම පැහැදිලි තීන්දු ටිකක් ගත්තා. කවුරුවත් බාධා කරේ නැහැ. අත් දෙකම උස්සලා තමයි සහයෝගය දෙනවා කියලා කිවුවේ. ඒක කරන්න ඕන කොච්චර වියදම් වුණත් අපි අනුමත කරනවා කියලා තමයි කරේ. හැබැයි අපි නිර්ණායකයන් ගණනාවක් ගරු සභාපතිතුමනි, ඉදිරිපත් කරා. ඒ තමයි මේ පළවෙනි එකේ සංවාදයකට ආවා දෙන්නේ කොපමණ ප්‍රමාණයක්ද කියලා. හාල් කිලෝ 05 බොහොම පැහැදිලිවම දෙන්න ඕන කියලා කිවුවා සංවාදයකට ගිහිල්ලා ඉවර වෙලා. වැඩියෙන්ම අවශ්‍ය ඒක ඊළඟට සැමන් ටින් එකයි, පරිප්පු කිලෝ දෙකයි දෙන්න ඕන කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා අපි මෙහෙම කරමුද, මේක දැන් නැවත සාකච්ඡා කරන්න වෙනවා. මගේ යෝජනා වල පළවෙනි එක තියෙන්නේ මේ ටික. ඒකෙදි කරමු ප්‍රශ්නයක් නැහැ.

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම. ඃ- නැත**

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඃ- නැත**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** කොරෝනා වෛරසය ව්‍යාප්තවීම නිසා ඇඳිරි නීතිය පැනවීම හේතුවෙන් අසරණ වූ බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී ජනතාවට වියළි ආහාර නොමිලේ බෙදා දී සහන සැලසීම සඳහා සහ බල ප්‍රදේශය හා කාර්යාල පරිශ්‍රය විෂබීජහරණ කටයුතු සඳහා මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව පහත කාර්යයන් සිදුකර තිබීම අනුමත කරන මෙන් යෝජනා කරමි.

**I.** මේ සඳහා රු. 4,050,000.00 උපරිමයක් දක්වා මුදලක් සභා අරමුදලින් වියදම් දැරීම සඳහා ලේකම් වෙත බලය පැවරීම. (වියළි ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම, ඇසිරීම, බෙදා හැරීම සඳහා හා විෂබීජහරණ කටයුතු සඳහා)

**II.** මේ සඳහා වියළි අහාර ද්‍රව්‍ය හා ඇසුරුම් මිලදී ගැනීමේ කටයුතු සඳහා ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා හා ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද ඇතුළත්ව විශේෂ කමිටුවක් පත්කර තිබීම.

ගයාන් ගීතික මන්ත්‍රීතුමාගේ නමත් මෙතන සඳහන් වෙන්න ඕන. ඒ නම සඳහන් කරනවා එම කමිටුවට. එතුමාගේ නමත් කමිටුවේ තියෙනවා ඒක සංශෝධනය විය යුතුයි.

**III.** නාගරික සංවර්ධන ගිණුමෙන් (ගි.අ 0075833867) පොදු ගිණුමට (ගි.අ 000400935) රු. 1,950,000.00ක මුදලක් මාරු කර තිබීම.

**IV.** වියළි ආහාර ද්‍රව්‍ය හා ඇසුරුම් මිලදී ගැනීම වෙනුවෙන් අබේවික්‍රම සුපර් සිටි ආයතනය වෙත රු. 244,080.00ක මුදලක් ගෙවීම, විජිත ෆුඩ්සිටි (පුද්) සමාගම වෙත රු. 2,000,000.00ක අත්තිකාරම් මුදලක් ගෙවීම, විජිත ෆුඩ්සිටි (පුද්) සමාගම වෙත රු. 1,703,352.00ක් වන ඉතිරි මුදල් ගෙවීම, ඇසුරුම් මිලදී ගැනීම වෙනුවෙන් විජිත ෆුඩ්සිටි (පුද්) සමාගම වෙත රු. 41,700.00ක මුදලක් ගෙවීම.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම කතා කරලා නවත්වපු තැන ඉඳන් කතා කරන්නම්. අපි බොහොම පැහැදිලිවම ගත්තා තීන්දු තීරණ කිහිපයක් සංවාද කරලා මන්ත්‍රීවරු බොහොම සුහදව. මන්ත්‍රීවරු කාගේවත් විරෝධතාවයක් තිබුණේ නැහැ. රු. 1500/- ක බඩු මල්ලක් දෙන්න තීරණය වුණා. ඊට පස්සේ ඒක රු. 1100/- කට වගේ බැස්සා. ඒ බඩු මල්ලට ඇතුළත් වෙන්න ඕන දේවල් ගැන ඉතාම පැහැදිලි තීන්දුවක් ගත්තා. ඒ තමයි හාල් කිලෝ පහයි, සැමන් ටින් එකයි, රතු ලූණු කිලෝ එකයි, පරිප්පු කිලෝ දෙකයි, තුනපහ, කැලි මිරිස් පිළිබඳව සංවාදයක් ආවා. ඒවා ඇවිල්ලා එහෙම තීන්දු කළා. හැබැයි එකක් තියෙනවා මේ සභාවේ ඒ රැස්වීමට මන්ත්‍රීවරු දෙදෙනයි ආවේ නැත්තේ. වැඩ අධික නිසා වෙන්න ඇති. බොහොම කෙටි කාලයකදී ආවේ. බොහොම ලොකු උනන්දුවක් අපිටත් තිබුණා ජනතාවට මොකක් හරි කරන්න ඕන කියලා. නමුත් එකක් තියෙනවා ඉන් පස්සේවත් කිසිම වෙලාවක අපිව දැනුවත් කරේ නැහැ මොනවද කරන්නේ කියලා. ඒ බඩු මල්ල වෙනස් කරලා තිබුණා. වෙනස් කරලා තිබුණා ඉතාම නරක විදියට. ඉතා පැහැදිලි නිර්ණායක ගෙනාවා ගන්න අඩු ආදායම්ලාභීන්ගේ නාම ලේඛනය, සමෘද්ධිලාභීන්ගේ නාම ලේඛනය ප්‍රාදේශීය ලේකම් එකෙන්. ඒ අරගෙන ඉවර වෙලා බොහොම විනිවිද තියෙන විදියට කරන්න. මේවා පෞද්ගලික කිසිම තැනක තියන්නේ නැතුව ග්‍රාම සේවක නිල නිවාස, එහෙම නැත්නම් පන්සල්, පල්ලි, කෝවිල්වල තියන්න කියලා කිවුවා. අපි දන්නවා මන්ත්‍රීවරු කීප දෙනෙක් නිවැරදිවම ඒ දේ කරා. අපි එකක් කියන්න ඕන. හැබැයි එකක් තියෙනවා මේවා කරන කොට සාධාරණ, යුක්තිසහගත දෙයක් තියෙනවා නේද, මන්ත්‍රීවරුන් කැඳවලා මේවා වෙනස් කරන්න තීන්දු ගන්න ඕන. ඊළඟට මේ කමිටුවක් දාලා තියෙනවා. කවදාද මේක දැම්මේ. එදා කමිටුවක් දැම්මේ නෑ. දානවා නම් එදානේ දාන්න ඕන. එහෙම නැත්නම් මොකක්ද මේකේ තේරුම. ඊළඟට එකක් තියෙනවා මේකේ අනිත් මන්ත්‍රීවරු කතා කරයි. අපි විරුද්ධ පක්ෂය විදියට මේකට විරුද්ධයි. පරීක්ෂණයක් ඉල්ලනවා. ඒක ගැන කතාවක් නැහැ. මේ මුදල් වියදම් කිරීම සම්පූර්ණයෙන්ම දූෂණයක්. බොහොම පැහැදිලි එක දෙයක් විතරක් මම අහනවා ගරු සභාපතිතුමා. දැන් මේ මොකක්වත් නැතුව අර විජිත ෆුඩ් සිටි එකට දුන්නා නම් ගණින් මිමි දීලා පැක් කරලා දෙන්න කියලා මේ පැකින් වලට ශත පහක් යන්නේ නෑ. හරියට තියෙනවා. දැන් මේ බඩු මල්ල මගේ ළඟ තියෙනවා. මම පෙන්වන්නම් වීඩියෝ කරපුවා. සමහර ඒවායේ රට ලූණු ගෙඩි තුනයි හතරයි. සමහර ඒවායේ පොඩි ඒවා පහයි. පරිප්පු ග්‍රෑම් 350 ඉඳලා 500 වෙනකම් තියෙනවා. මේ තමයි ඇත්ත. හාල් කිලෝ දෙකයි. දෙකහමාරට අඩුයි. මේ විදියට තමයි කරේ. පැකින් වලට දාලා තියෙනවා. උපන් දිනයකට දෙනකොට රැපින් පේපර් එකක ඔතලා දෙනවා වගේ නෙමෙයි. එහෙම

දීලා නැහේ. එතකොට දාලා තියෙනවා රු. 41,100/- ක්. දෙයිහාමුදුරුවනේ අර ලොකු බෑග් එකකට කීයද යන්නේ. ඕවර් සේල් ගියොත් කීයද යන්නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** බෑග් එකක් පහයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හොඳ ගැහිල්ලක් ගහලා තියෙනවා. කඩ තියෙන මිනිස්සු ඉන්නවානේ. කොහෙන්ද ගත්තේ. කොහෙන්ද මිල ගණන් කැඳෙව්වේ. ඇත්තටම මෙතන ඉන්න අහිංසක මන්ත්‍රීවරු කීපදෙනෙක්ගෙන් කමිටුවක් කියලා දාලා ඉවර වෙලා මොකක්ද එකක් දාපු එක තමයි කරේ. කමිටුවක් දානවා නම් එදා දවසේ දාන්න තිබුණා. එහෙම දැම්මේ නැහැ. ඊට පස්සේ වෙනස් කරන්නවත් ගත්තේ නැහැ. මේ පිළිබඳව අනිත් මන්ත්‍රීවරුත් කතා කරයි. ඇත්තටම එකක් තියෙනවා අපි මේකට සම්පූර්ණයෙන්ම විරුද්ධයි. සමහර මන්ත්‍රීවරු ඉතාම ගෞරවණීය විදියට මේ වැඩේ කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලොකු ෂොපින් බෑග් 01ක් රු.2.80 බැගින් වෙන්නත් පොඩි ෂොපින් බෑග් එකක් ශත 90ක් වෙන්නත් මිලදී ගෙන තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊළඟට අපි ඉල්ලා සිටිනවා කරුණාකරලා මේ බඩු බෙදන ලද ලැයිස්තුව සභාගත කරන්න කියලා ඊළඟ සභාව වෙනකොට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ තියෙන්නේ එක එක්කෙනාට තියෙන ෂොපින් බෑග් ටික ප්‍රධාන මල්ල සහ අතුරුමළු එක්ක. ඕවා සම්බන්ධව ඔක්කොම කියන්න ඔක්කොටම උත්තර දෙන්නම්. ලොරියට බඩු ටික පැටෙව්වේ නැහැ. අපේ මිනිස්සු දාලා බඩු ටික පැටෙව්වේ. ඒ මිනිස්සුන්ගේ ඒ දවස්වල වෙළඳාම අනුව අපේ එක ඕනනම් ගන්න, නැත්නම් නිකං ඉන්න වගේ ඒ අය හැසිරුනේ. පැක් කරලා දෙන්න බැහැයි කිව්වා. බැහැයි කිව්වට පස්සේ බලෙන් ගිහින් දෙන්නද.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා අපිට දැනුම් දීමක් කරලා පැය භාගයක් යන්නත් කලින් ක්ෂණිකව රැස්වීමක් කැඳවලා සභාවේදී මේ බෝපෙ පෝද්දල ජනතාව ලක් වෙලා තියෙන අපහසුතාවය සඳහා යම් කිසි සහනයක් ලබා දෙනවා කියලා තීන්දුවක් අර ගත්තා. අබේසේකර මන්ත්‍රීතුමා කිව්වා වගේ හැමෝම සහභාගි වුණා. දෙන්නෙක් විතරයි සහභාගි වුණේ නැත්තේ. තීන්දු තීරණ කීපයක් එතනදී ගත්තා. ඒ සම්බන්ධව කතා කරා. නමුත් ඒකට හාත්පසින්ම වෙනස් විදියට තමයි මේ බඩු මල්ල බෙදලා තිබුණේ. මම අපේක්ෂයෙක් නිසා මට නොදුන්නා කියලා හිතමුකෝ. මම අපේක්ෂකයෙක්. ඒ නිසා මට දුන්නේ නැහැ. නමුත් අපි එතනදී තීන්දුවක් ගත්තේ සභාපතිතුමනි අර කමිටුවේදී බඩු බෙදනකොට සමෘද්ධි නිලධාරීන්, ග්‍රාම නිලධාරීන්, පන්සල්, පල්ලි සම්බන්ධ කර ගෙන කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එකම දේනේ ඔබතුමත්, නැවත නැවත කියවන්නේ. ඔය ඔක්කොටම උත්තර දෙන්නම්. ඔය උත්තර ටික මම දුන්නට පස්සේ තව අඩු පාඩු තියෙනවානම් එකින් එක අහන්නකෝ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මගේ කොට්ඨාශයේ බෙදනකොට ඒක බෙදලා තිබුණේ පන්සල්, පල්ලි මොකටවත් නෙමෙයි. ග්‍රාම නිලධාරීන් දන්නෙත් නැහැ. සමෘද්ධි නිලධාරීන් දන්නෙත් නැහැ. කවුරුවත් දන්නේ නැහැ. ගෙනල්ලා බෑවා කුරුඳුවත්ත පැත්තේ ගෙවල් දෙකකට. හොඳ ශ්‍රී ලංකා පාක්ෂිකයෝ ඒ වගේම මහ හපුගලටත් බාලා තිබුණා. ගෙවල් වලට ගිහින් බඩු ටික බෑවා. ඒ අයට අවශ්‍ය විදියට බඩු ටික බෙදුවා. ඒක තමයි සත්‍යය. අනිත් එක අපි තීන්දුවක් ගත්තා මේ සභාවේදී මේක රජයේ නිලධාරීන්ට දෙන්න බැහැ කියලා. නමුත් රජයේ නිලධාරීන්ට දීලා තියෙනවා. ඔප්පු කරන්නම් අපි. විශ්‍රාමිකයන්ට දෙන්න බැහැ කිව්වා. නමුත් මගේ කොට්ඨාශයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිතුමිය මට කතා කරලා එතුමියටත් ලැබුණා කියලා කිව්වා. රජයේ නිලධාරිනියක්. එතකොට මේ වගේ කිසි වැඩපිළිවෙලක් නැතුව කරේ. ඒක විතරක් නෙමෙයි තව ගොඩක් තියෙනවා. රජයේ නිලධාරීන් ගොඩක් ගත්තා. මේ බඩු ගත්තා. ඊට වඩා අන්ත අසරණ අයට ලැබුණේ නැහැ. මට කීප දෙනෙක් ඇවිල්ලා කිව්වා. නමුත් මට මේකට සම්බන්ධ වෙන්න එපා කියලා තියෙනවා. ඒ නිසා මම සම්බන්ධ වුණේ නැහැ. මට මේක අදාළ නැහැ. නමුත් බෙදද්දි සාධාරණ වෙන්න ඕන. සමෘද්ධි නිලධාරිනියගේ ළඟ ලැයිස්තුවක් තියෙනවා. ඒකට දෙන්න පුළුවන්. එහෙම නැත්නම් බලන්න අපේ මහ හපුගල පල්ලියෙන් ජාති භේදයක් නැතුව හැම ගෙදරකටම දුන්නා. ගිංතොට ප්‍රදේශයේ තියෙන පල්ලිවලින් බඩු බෙදුවා. කුරුඳුවත්ත, මහ හපුගල, ගොඩවත්ත කියලා පල්ලි වෙන්කර ගත්තා. පල්ලිවලට බඩු ගෙනාවා. සිංහල දෙමළ භේදයක් නැතුව හැම ගෙදරකටම බඩු දුන්නා. ඒක තමයි කරේ. රජයේ සේවකයෝ ඔක්කොටම දුන්නා. සිංහල, මුස්ලිම්, රජයේ සේවකයෝ භේදයක් නැතුව හැමෝටම දුන්නා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ මන්ත්‍රීතුමා ඔය ටිකට මම උත්තර දෙන්නම්. ඊට පස්සේ තව උත්තර දෙන්න ඕන ඒවා තියෙනවා නම් අහන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක රජයෙන් දීපු දෙයක් නෙමෙයි. පෞද්ගලික දානපතියෝ දීපු දෙයක්. ඒක හැමෝටම දුන්නා. මේක රජයේ දෙයක්. අපි තීන්දුවක් ගත්තා. කමිටුවේදී රජයේ නිලධාරීන්ට ලැබෙන්න සලස්වන්නේ නැතුව අපි කරමු කියලා. නමුත් ඒක නෙමෙයිනේ වුණේ. ඒක සාක්ෂි ඇතිව අපි ගාව තියෙනවා. රජයේ නිලධාරීන්ට දීලා තියෙනවා. මේක විනිවිදභාවයකින් තොරව තමයි බෙදුවේ. අනිත් එක අපි දෙන්න කියපු ප්‍රමාණ නෙමෙයි දුන්නේ. අපි දෙන්න කියපු එකට හාත්පසින්ම වෙනස් එකක් දුන්නේ. සභාපතිතුමනි, ඔබතුමාට තිබුණා මෙවැනි අවස්ථාවකදී මෙහෙම දෙයක් සිද්ධ වෙනවා නම් අර කමිටුව පැය භාගෙන් රැස්වුණා වගේ අපිව ආපහු රැස්කරා නම් අපි එන්නේ නැද්ද. එහෙම වෙනස්කමක් කරන්න තියෙනවා නම් ඔබතුමාට තිබුණා මන්ත්‍රීතුමා මෙන්න මෙහෙම දෙයක් තියෙනවා පොඩ්ඩක් එන්න කියලා. එහෙම නැත්නම් ඔබතුමාට තිබුණා නේද විපක්ෂ නායකතුමා ඔබතුමා පක්ෂය නියෝජනය කරමින් එන්න කියන්න, ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් එක්කෙනෙක් එන්න පොඩ්ඩක් මේක කතා කරන්න කියලා. එහෙමනම් විනිවිදභාවයක් තියෙනවා මෙතන. කමිටුවට දාගන්න තිබුණා ඒ කට්ටියවත්. එක එක පක්ෂ වලින් කමිටුවට දා ගන්න තිබුණා. ඒ කමිටුවේ කවුද ඉන්නේ. දැන් විනිවිදභාවයක් තියෙනවද මෙතනදී. මේක සම්පූර්ණයෙන්ම ඒකපාර්ශවිකව ගියපු දෙයක්. මේ කමිටුවේ ඉන්නේ කවුද, දැන් මෙතන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඉන්නවා. එක්සත් ජාතික පක්ෂය ඉන්නවා. ජනතා විමුක්ති පෙරමුණ ඉන්නවා. මේ නියෝජිතයෝ කවුරුවත් නැනේ කමිටුවේ. එතකොට ඔබතුමා මුලින්ම රැස් කරද්දි අපි පැය භාගෙන් ආවා. ඔබතුමා දුරකථන ඇමතුමක් දුන්නා නම් අපි එන්නේ නැතුව ඉන්නවාද. එනවනේ. ඒ ගරුකිරිල්ල කරානම් එන්න කියලා අපි එනවා. එහෙම කරන්නේ නැතුව සම්පූර්ණයෙන්ම වෙනස් කිරීමක් කරේ කොහොමද ඔබතුමා. මෙන්න මේකයි අපිට සැකයට තුඩු දෙන කාරණය. ඔබතුමා මේකෙදි මේකට නොයෙකුත් කාරණා කියයි. හේතු දක්වයි. නමුත් අපි මේකට සම්පූර්ණයෙන්ම විරුද්ධයි. මේක කරමු කියලා එකමුතුව සද්භාවයෙන් අපි කිව්වා. මුදල් ගැන පස්සේ කතා කරලා තීන්දු ගමු කිව්වා. සද්භාවයෙන් අපි මෙතනදී තීන්දුවක් ගත්තා. නමුත් ඔබතුමාලා ඒක කරේ හාත්පසින්ම වෙනස් විදියකට. මේකට අපේ විරෝධතාවය ප්‍රකාශ කරනවා. මේ ගෙවීම් වලට අපි සම්පූර්ණයෙන්ම විරුද්ධයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම උත්තර දෙන්නම්. උත්තර දුන්නට පස්සේ තියෙන ප්‍රශ්න අහන්න. දැන් මම මේ අහපු ඒවාට උත්තර දෙන්නම්. උත්තර දුන්නට පස්සේ අහන්න. එකක් ඉවර කරන්න එපැයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම මෙච්චර වෙලා බලන් හිටියා. ඔබතුමා මෙතන මූලාසනය හොබවනවා. සභාව මෙහෙයවනවා. න්‍යාය පත්‍රයක් දීලා තියෙනවා. ඒ අනුව කටයුතු කරා. විශේෂ අවස්ථාවක් අරන් තුන්දෙනෙක් කතා කරා. ඒක ප්‍රශ්නයක් නැහැ. නමුත් දැන් අවස්ථාව ලබා ගන්නේ ඔබතුමාගේ යෝජනාවට අදාළවයි. ඒ නිසා එම අවසරය මම බලාපොරොත්තු වෙනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ පළමු යෝජනාවම තියෙන්නේ මේ රටේ මතුවුණ තත්ත්වයත් එක්ක පහුගිය කාලයේ සභාවක් හැටියට අපි ගනිපු ක්‍රියාමාර්ග, තීන්දු තීරණ සම්බන්ධව අනුමැතිය ලබා ගැනීම සඳහා. මේක ගැන පැහැදිලි කිරීම් ගොඩක් කරා. මේ තියෙන කාරණා මටත් අදාළයි. අපි තීන්දුවක් ගත්තා තමයි. ඒ ඔබතුමා සියලුදෙනාම හදිසියේ කැඳෙව්වා. කැඳවලා බොහොම පැහැදිලිවම එකතු වෙලා ඒකට අදාළ සෞඛ්‍ය අංශය කැඳවාගෙන තීන්දු තීරණ අරගෙන අපි යම් මුදල් ප්‍රමාණයක් වෙන් කරන්න තීන්දු කරා. ලක්ෂ 65ක එකක් තමයි අපේ බලාපොරොත්තුව තිබුණේ. ඒකට අපි යෝජනා කර ගත්තා. අනුමත කර ගත්තා රු. 1500/- ක වටිනාකමකින් යුතු සහන මල්ලක් ප්‍රදේශයේ මේ තත්ත්වය හමුවේ අසරණභාවයට පත්වුණ, අඩු ආදායම්ලාභී සහ ආදායම් අහිමි වූ අනෙක් පුද්ගලයන් සඳහා මේක දිය යුතුයි කියන පදනම මත. ඒ නිර්ණායකය මත තමයි අපි තීන්දු කරේ. ඒ තීන්දු කරලා ඒ ක්ෂණයෙන්ම ඔබතුමා ආයතනවලටත්, දුරකථන ඇමතුම් ලබා දුන්නා. මිල ගණන් දැන ගත්තා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි යන්නත් කලින් සමහරු ගිහින් හිටියා ඒ ආයතනවලට. ඒවත් කියන්න ඕන. අපි යන්න කලින් සමහරු ඒ ආයතනවලට ගිහිල්ලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ඔබතුමා පිළිතුරු දෙනකොට ඒවා මතු කරලා කියන්න. අපිත් කැමතියි ඒවා දැන ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි කමිටුව විදියට යනකොට සමහරු ගිහිල්ලා කතා කරලත් ඉවරයි. අපිට ඉස්සෙල්ලම හම්බ වුණේ ඔබතුමන්ලා දෙපළනේ. ඔබතුමයි, යසරත්න මන්ත්‍රීතුමයි. ඔබතුමන්ලා දෙපළ ගියානේ. ගිහිල්ලා එළියට එනවානේ අපි යනකොට. මෙන්න සද්භාවය. මම අබේවික්‍රම එකට කෝල් කරලා මිල ගණන් අහන කොට මේ මන්ත්‍රීවරු දෙන්නා

අබේවික්‍රම එකේ. මෙන්න සද්භාවය. එතකොට මෙතුමා ගියේ බඩු ගන්නද, මෙන්න ගේම්. ඔන්න ඕවා ගේම්.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මගේ කඩේට හැමදාම බඩු ගන්නේ අබේවික්‍රම එකෙන්. මම කඩේට බඩු ගන්න තැන ඒ. ඔබතුමන්ලා එනකොට ලූණු ගෝනි හයක් වාහනයට පටවලත් ඉවරයි. මම ගියේ ඔබතුමන්ලාට මේවා කරන්න නෙමෙයි. ඔබතුමන්ලා විජිත ෆුඩ් සිටියට ලක්ෂ 20 චෙක් එක දෙනකොටත් මම දන්නවා. ඒ කතා මට වැඩක් නැහැ. මම ඒවා හොයන්න ගියෙත් නැහැ. මම ව්‍යාපාරිකයෙක්. මම මිල ගණනුත් දන්නවා. ඔක්කොමත් දන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට ඒක හරිනේ. ගනිපු මිල ගණන් බලන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම මෙතුමාගේ වාහනේ ආවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි කියන්න ඉතිං.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** මම මිල ගණන් විවේචනය කරේ නැහැනේ. මම එතනට ගියේ කඩේට බඩු ගෙනියන්න. මම ලූණු ගෝනි හයයි, පරිප්පු ගෝනියයි, අල ගෝනි දෙකයි පටව ගෙන ගියේ. එතකොට ඔය ගොල්ලෝ ගිහිල්ලා කතා කරන තැන මම හිටියේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාගේ කාගේත් හෘද සාක්ෂිය දන්නවා ඇති.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමන්ලාගේ පෞද්ගලික කාරණා එක්ක ඒවා වෙනම සාකච්ඡා කරන්න. මේ සභාවට අදාළ කාරණය සාකච්ඡා කරන්න මම මේ වෙලාව ගත්තේ. කරුණාකරලා ඒකට ඉඩ දීලා ඔබතුමා ඒක සාකච්ඡා කරන්න. ඒක ඔබතුමා මතු කරපු අවස්ථාවේම නම් ගම් හරියට කිවුවා නම් ඉවරයි මේක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කිවුවේ නම් ගම් සහිතවමනේ. ඉතිං මම නම් දෙක කිවුවානේ. මම දන්නේ නෑ හේතුව මොකක්ද කියලා. අපි යනකොට යසරත්න මන්ත්‍රීතුමයි, අබේසේකර මන්ත්‍රීතුමයි අබේවික්‍රම ෆුඩ් සිටි එකේ ඉඳලා එළියට බහිනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම එළියෙනේ හිටියේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** මෙයා ඇතුළට ගියේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං අබේවික්‍රම එක ඉස්සරහ හිටියනේ. අපි යනකොට එළියට බහිනවානේ. හරි මම වැරදියි. කියන්න. මම පිළිගත්තා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** කාලය යනවා අපරාදේ. මම කතාව අවසන් කරේ නැහැ. අපි තීන්දුවක් ගත්තා මේක සම්බන්ධව. මේකේ මූල්‍ය වටිනාකම කොච්චරද, ඒකට අඩංගුව මොකක්ද, ඒ ඒ කාරණා සම්බන්ධව නිශ්චිතවම අපි සාකච්ඡා කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඕකට උත්තරයක් දෙන්නද,

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එපා. පොඩ්ඩක් ඉන්න ඔබතුමා. මම කියන එක අහන් ඉඳලා උත්තර දෙන්න ඔබතුමා. තව ප්‍රශ්න තියෙනවානේ. ඒ ඔක්කොම පෙළ ගස්සවා ගෙන මම මේ සභාව ඉස්සරහ මතු කරන්න ඕන කාරණා ටික මතු කරන්න ඕන. ගරු සභාපතිතුමනි, ඊළඟට ඔබතුමා හදිසි සභාවක් කැඳෙව්වා, කමිටුවක් නෙමෙයි ඒක. මන්ත්‍රීවරු දෙන්නෙක් හැර ඉතිරි මන්ත්‍රීවරු මේකට සම්බන්ධ වුණා. එතකොට ඒ සභාවේ මූලාසනයේ ඉන්න කොටම ඔබතුමා දුරකථනය මාර්ගයෙන් අබේවික්‍රම ෆුඩ් සිටි එකට කතා කරලා ගණන් හිලවු ඇහුවා. ලූණුවල ගණන් ඇහුවහම එතකොට පාලන මිලක් දාලා තිබුණට එයා රු. 120/- ට දෙන්නම් කියලා එවෙලේ කිවුවා. පාලන මිලක් තියෙනවා රු. 120/- ට දෙන්නම් කිවුවා. මම ළඟ හිටියේ ඔබතුමා අහනකොට. එවෙලේ අපි ඒකට ගණන් හැදුවා. අපි ඒකට ඇස්තමේන්තුගත කළා මේ මුදල මේකට යනවා කියලා. මට විනාඩියක් මේ කාරණය ඉවර කරන්න දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට ඔබතුමා එදා ලූණු ගත්තද, කීයටද ගත්තේ,

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ලූණු රු. 120/- ට ගත්තේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ කාරණය මතු කරන්න දෙන්නකෝ. ආයේ ගොඩක් වෙලා ගියොත් අපිට කාලය යනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** මම ගමනක් ආවොතින් මගේ වාහනයේ අවශ්‍ය බඩු අරගෙන යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි මම පිළිගන්නවා. දැන් හරිනේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ගණන් වෙනස් කිවුවේ නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඊළඟට ගරු සභාපතිතුමනි, ඒ තීන්දු තීරණ ගැනීමට යාමේදී සමහර වෙලාවට ප්‍රායෝගික ප්‍රශ්න මතුවෙන්න පුළුවන්. ඒ ප්‍රශ්නවලට අපි ගනිපු තීන්දුව වෙනස් කරන කොට ඒ අදාළ තීන්දුව ගැනීමට සහභාගි වෙච්ච අයට, අනුමැතිය දීපු අයට දැනුවත් කිරීමක් හෝ කිරීම වටිනවා. ඒක එක කාරණයක්. ඊට පස්සේ ඒකට අදාළව ඔබතුමා දැන් ඒ කරපු වියදම් සඳහා ආවරණ අනුමැතියට යටත්ව කරපු වියදම් සඳහා අනුමැතිය ඉල්ලනවා. ඒ අනුමැතිය ඉල්ලන කොට ගිය වියදම්වල ලේඛන සභාගත කරලා, සභාවට ඉදිරිපත් කරලා ගිණුම් සාරාංශ අපිට ඉදිරිපත් කරලා ඒ සම්බන්ධව අපිට අධ්‍යයනයකට ඉඩ දීලා ඕන මේකට අනුමැතිය ඉල්ලන්න. අපි මුකුත් නොදැන කොහොමද මේ අනුමැතිය දෙන්නේ. ඉලක්කම් ටිකකට අනුමැතිය ඉල්ලන්න ඔබතුමාට සාදාචාරයක් තියෙනවාද. පොඩ්ඩක් කල්පනා කරලා බලන්න. මේ රජයේ මහජන මුදල්. මේ අපේ බදු ආදායම්වලින් හා වෙනත් ආදායම්වලින් එන මහජන මුදල්. මේ මුදල් වියදම් කිරීම සඳහා අපි වෙන්කරන්න තීන්දුව ගත්තහම වියදම් කරේ මොනවටද, කොයි ආකාරයෙන්ද, සාධාරණද, යුක්ති සහගතද, අදාළද, නීත්‍යානුකූලද හා ඒ සියලු කාරණා සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් නොකර මෙතන ඔබතුමා ඉලක්කම් ටිකක් දාලා අනුමැතිය ඉල්ලන කොට කොහොමද ගරු සභාපතිතුමනි මේකට අනුමැතිය ලබා දෙන්නේ. මේ මොහොතේ ඒ ක්‍රියාවලියට නොගිහින් මේක අනුමැතිය සඳහා ඉදිරිපත් කරන්නේ නම් නිසැකවම අපි අපේ විරෝධතාවය ප්‍රකාශ කරනවා. මේක අපි පක්ෂයක් හැටියට තීන්දුව ගන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ ඒ කාරණය සම්බන්ධව මම 100% ක් එකඟයි. ඔබතුමා දැන් කරපු ප්‍රකාශය අනුව මම ඒ කාරණයට 100% ක් එකඟයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක තේරුම් ගත්තානම් ලොකු දෙයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතන වැරැද්දක් වෙලා තියෙනවා. අද මේක අනුමත කරන්න ඕන නැහැ. ඒ පිළිබඳව මම එකඟයි. මන්ත්‍රීවරු දැනුවත් වෙන්න ඕන මෙන්න මෙච්චර ප්‍රමාණයක් වියදම් වුණා, මෙච්චර පවුල් සංඛ්‍යාවකට මේක බෙදුවා කියන එක ගැන මන්ත්‍රීවරු දැනුවත් වෙන්න ඕන. මමත් එකඟ නෑ. එහෙම නැතුව ඔබතුමන්ලා ලවා මේක අනුමත කර ගන්න. මම හිතුවා මේක මන්ත්‍රීවරුන්ට දීලා ඇති කියලා. මේ යෝජනාව මම අද සභාවෙන් ඉල්ලා අස්කර ගන්නවා. ඊළඟ සභාවේදී අපි මේක පිළිවෙලකට මන්ත්‍රීවරුන්ව දැනුවත් කරලා අනුමත කර ගන්න කටයුතු කරන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ස්තුතියි ඒ කාරණාව සම්බන්ධව. මට මතු කරන්න ඕන වුණෙත් ඒක.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒ කමිටුවේ සාමාජිකයෙක් විදියට මම මේකට කතා කරන්න ඕන ගරු සභාපතිතුමනි,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සුගත් මන්ත්‍රීතුමා වුට්ටක් ඉන්නකෝ. මම මේ කාරණා වලට උත්තර දෙන්නම්. මොකද දන්නවාද මම මේ කාරණා වලට උත්තර දීලා එන ගැටලු තියෙනවානම් ඒවාට ඔබතුමා කතා කරලා ඉවර කරන්න. මොකද අපි මෙතන තීන්දු ගනිපු ඒවා ගැනත් කියන්න ඕන නේ. මේ තත්ත්වය පිළිබඳව තීන්දු ගන්න එපැයි. වුට්ටක් ඉන්න මන්ත්‍රීතුමිය. මම දන්නවා ඔබතුමිය ඉදිරිපත් කරන්නේ මේ මතුවෙච්ච කාරණා පිළිබඳවම කියලා. මම කෙටියෙන් කියන්නම් සිද්ධ වෙච්ච කාරණා ටික.

පළමු කාරණාව මගේ අදහස තිබුණේ මුලින් කොට්ඨාශ මන්ත්‍රීවරු කැඳවන්න. මොකද මේක අපි ඉක්මනින් කළ යුතුව තිබුණා. ඉතිං ඒක හින්දා එදා උදේ වෙනකම්ම මගේ ඔළුවේ තිබුණේ මේක අපි ඉක්මනට කරන්න ඕන. කොට්ඨාශ 12 මන්ත්‍රීවරු 12දෙනා විතරක් කැඳවලා මේ පිළිබඳව තීන්දුවක් ගන්න. ඒක තමයි මුලින් අදහස තිබුණේ. එදා උදේ මට හිතුණා කොට්ඨාශ නියෝජනය ගත්තොත් පක්ෂ නියෝජනය අතහැරෙනවා එතකොට ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ වෙන්න බැරි වෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සම්බන්ධ වෙන්න බැරි වෙනවා. ඒක හින්දා මම හිතුවා කමක්

නෑ හදිසියේ හරි හැමෝටම දුරකථන ඇමතුම් ලබා දීලා පණිවිඩ ඇරලා සියලුදෙනා කැඳවන්න තීන්දුවක් ගත්තා. ඒක පළවෙනි කාරණය.

ඔබතුමාලා කියන එක ඇත්ත. මුලින් තීරණය කරේ රු. 1500/- ක් එක්කෙනෙකුට. ඊට පස්සේ ඒක මිල ගණන් හදලා බලන කොට රුපියල් ලක්ෂ හැට පහක් විතර වෙනවා. පවුල් 4000 කට ඒකත්. පවුල් 5000ක් බැලුවා. 5000 ක් වැඩියි. ඊට පස්සේ පවුල් 4000කට තමයි රු. 1500/- ගාණේ දෙන්න තීරණය කරේ. ඊට පස්සේ තියෙන මුදල් ප්‍රමාණය සලකා බැලුවා. එතකොට ලක්ෂ විස්සක් හම්බ වෙන්න තිබුණා. තව රුපියල් ලක්ෂ විසි තුනක මුදලක් තමයි ඒ වෙනකොට තිබුණේ. එතනදී ඔක්කොම 1000 වෙන්න පවුල් 4000කට දෙන්න රුපියල් ලක්ෂ හතළිහකට යන්න තමයි අපි තීරණය කරේ. ඒ කාරණාව බොහොම සද්භාවයෙන් පිළිගන්නවා. ඒ තැන තමයි අපි හිටියේ.

ඊට පස්සේ අපි බඩු ගන්න ගියා. මේ පිළිබඳව සඳහන් කරන්න ඕන. මම ඉතාමත්ම වගකීමෙන් කියනවා කමිටුව විදියට ලේකම්තුමා ප්‍රධානව ඉතාමත්ම වගකීමෙන් කියනවා එක රුපියලක් අසරණ මිනිස්සුන්ගේ සල්ලිවලින් අවභාවිතා කරා කියලා හැඟීමක් මගේ නැහැ. අපි තේ එකක් බීලා නැහැ ඒ මුදල් වලින්. සමහර මන්ත්‍රීවරු කුණු හොය හොය, අවුස්ස අවුස්ස හැම දේටම ජරා විදියට බලන, මිනිස්සුන්ගෙන් හැමදේම ගසා කන සමහරු මේක කියලා තිබුණා. මම අද ස්තුතිවන්ත වෙනවා මෙතනදි මේක මතුවීම සම්බන්ධව. මම හිතුවා මෙතනදිත් මේක මතුවෙන්නේ නැහැ කියලා. සුමිත් උපසභාපතිතුමාටත් මේක කතා කරන්න දුන්නේ මතු කරන්න ඕන හින්දා. නැත්නම් තැන් තැන්වල කිය කිය යනවා. මට සමහරු කතා කරලා අහනවා "සභාපතිතුමා අහවලා කියනවා මේ සභාව මෙච්චර අනුමත කරලා තියෙනවා රුපියල් දාහක බඩු මල්ලක් අනුමත කරලා තියෙනවා නමුත් දීලා තියෙන්නේ ලූණු ග්‍රෑම් 500 යි, ලූණු ගෙඩි 03 යි කියලා." මිනිස්සු මට කතා කර කර ඇහුවා. මම ඉතාමත්ම කණගාටු වුණා. ගාල්ල දිස්ත්‍රික්කයේ එකම සභාව විදියට මහජනතාවට අපි සද්භාවයෙන් වැඩ කරේ. මහජනතාවගේ මුදල් අපි කොයි වෙලෙත් සලකන්නේ දේව මුදල් විදියට. ඒකෙදි එක ශත පහක් අවභාවිතා වුණේ නැහැ. මම ඉල්ලා සිටිනවා යසරත්න මන්ත්‍රීතුමාගෙන් පරීක්ෂා කරලා බලන්න කියලා.

ඊළඟට අපි සාකච්ඡා කරපු බඩු වර්ග කිහිපයක් තිබුණා. නමුත් රුපියල් සියයේ සැමන් ටින් තිබුණේ නැහැ. රුපියල් හැට පහේ පරිප්පු තිබුණෙත් නැහැ. තිබුණේ රුපියල් එකසිය විසි හතේ පරිප්පු විතරයි. ඕන වෙලාවක අහන්න පුළුවන් ඔය ආයතනවලින්. රුපියල් හැට පහට පරිප්පු, රුපියල් සියයට සැමන් තිබුණේ නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමාට රුපියල් හැට පහට පරිප්පු නොතිබුණාට තෙවරප්පෙරුම මන්ත්‍රීතුමාට නම් ගෝනි ගණන් ගෙනියන්න තිබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කිවුවේ ඒ වෙලාවේ ගන්න තිබුණේ නැහැ. අපිට තිබුණේ එවලේ මේක බෙදන්න. ඒ ක්ෂණයෙන් මේක බෙදන්න ඕන මේ ප්‍රශ්නයත් එක්ක. ඔබතුමා මම කිවුවට පස්සේ උත්තර දෙන්න. ප්‍රශ්න තියෙනවා නම් අහන්න. මේක කියාගෙන යන එක අවුල් කරන්න එපා මන්ත්‍රීතුමා. ඔබතුමා හැමදාම කරේ ඒක. මේ කියන එක අහලා ඉවර වෙලා කතා කරන්න.

ඉතිං එතනදී අපි එදාම අබේවික්‍රම ෆුඩ්සිටි එකෙන් බඩු ප්‍රමාණයක් ගත්තා. රුපියල් එකසිය විස්සට ලූණු ගත්තේ. ලූණු කිලෝ 2100 ගාණක් එදා ගත්තා රුපියල් එකසිය විස්ස ගානේ. නමුත් ඊට පස්සේ අපි ඇණවුම් කරා ඉතුරු එක ඊට පස්සේ ගේන්න කියලා. නමුත් ඊට පස්සේ මිල රුපියල් එකසිය පනහයි කිවුවා. නමුත් අපි දෙවැනි ලූණු කිලෝ 2000 ගත්තේ විජිත ෆුඩ්සිටි එකෙන්. විජිත එකෙන් රුපියල් එකසිය හතලිහට ගත්තේ. එහෙමනම් අපිට අබේවික්‍රම එකෙන් ඉතුරු ලූණු කිලෝ 2000 ත් ගන්න තිබුණා රුපියල් දහයක් තියා ගෙන. අපි එහෙම කරේ නැහැ. එකසිය හතලිහට දෙන්නම් කිවුවා විජිත ෆුඩ්සිටි එකෙන්. මේ මිල ගණන් ගැන නම් අපි ඉතාමත්ම වගකීම ගන්නවා. ඒ වගේම මම ඉතාමත්ම සතුටු වෙනවා මේකට සද්භාවයෙන් මැදිහත් වෙලා තමන්ගේ කාරණාවක් විදියට සලකලා මේ කාරණය ඉෂ්ඨ කරන්න මැදිහත් වුණාට.

තව කාරණා කිහිපයක් කියන්න තියෙනවා. එකක් තමයි කොහොමද බඩු මල්ල අඩු වුණේ කියන කාරණාව. මේ වැඩේ ගියා. එක පවුලකට රුපියල් දාහ ගාණේ පාර්සල් ටික දැන් මෙතන ලේස්ති වෙලා වැඩේ යනවා. නමුත් ඊට පස්සේ මන්ත්‍රීවරු ආවා ගියා. සද්භාවයක් තිබුණා නම් ගෙවල් වල ඉඳලා කුණු හොය හොය ඉන්න එක නෙමෙයි කරන්න තිබුණේ. නිලධාරීන් මහන්සි වෙලා වැඩ කරන කොට මන්ත්‍රීවරුන්ට එන්න තිබුණා. අපි මූලික ආරම්භය ඇති කරලා තිබුණේ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු ආවානේ. අනිල් බන්දුතිලක මන්ත්‍රීතුමා ආවා. ඉන්දික මන්ත්‍රීතුමා ආවා. මේ කාරණය කතා කරන්න අරින්න. ඒ පාර ඒ වෙන කොට පාර්සල් ගොඩක් හදලත් ඉවරයි, දාහක් විතර හදලා ඉවරයි. ඒ පාර කොට්ඨාශවල මන්ත්‍රීවරු ඇවිල්ලා කිවුවා. විශේෂයෙන්ම චනක මන්ත්‍රීතුමා කිවුවා එතුමාගේ කොට්ඨාශයේ ඉන්නවා කියලා පවුල් 1000 ක් විතර දෙන්න ඕන අය. මම පාර්සල් තුන්සිය විසි පහක් අරගෙන කොහොමද ඇහුවා පවුල් 1000 කට බෙදන්නේ. අනිත් මන්ත්‍රීවරු කිවුවා එතුමන්ලාගේ කොට්ඨාශ වලත් පවුල් 600 ක් 700 ක් ඉන්නවා කියලා. ඒ අය ඇහුවා පවුල් 325 කට මේක බෙදලා තව පවුල් 300 ක් අපි අමනාප කර ගන්නේ කොහොමද කියලා. එතකොට අපිට තීරණයක් ගන්න ඕන වුණා. එවෙලේ මෙතන පාර්සල් ගහ ගෙන යනවා. ක්ෂණිකව තීන්දුවක් ගත්තා. සද්භාවයෙන් අපි කරේ. උත්තර දෙන්න පුළුවන් ඕන විදියකට. ඒ වෙන කොට පාර්සල් 2000 ක් විතර හදලා ඉවරයි මෙතන. නමුත් අපිට එවෙලේ තීන්දුවක් ගන්න ඕන වුණා. පාර්සල් කරන එක නවත්වලා දෙකට කඩන්න කියලා කිවුවා. මිනිස්සුන්ට රුපියල් දාහක, දෙදාහක දෙයක් දුන්නත් එකයි. රුපියල් පන්සීයක, හයසීයක දෙයක් දුන්නත් එකයි. භාණ්ඩ ප්‍රමාණය භාගයකින් අඩු වෙනවා. මම කියන්නේ නෑ පවුල් 8000 කට බෙදලා ඔය කිවුවා වගේ අඩුපාඩුකම් සිද්ධ වුණා කියලා. මම කොයි වෙලාවකවත් කියන්නේ නැහැ මෙතන 100% ක් හරියි කියලා. වැඩක් කරන කොට අඩුපාඩුකම් සිද්ධ වෙනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අර වගේම ආයෙම කැඳවන්න තිබුණනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කැඳවන්න වෙලාවක් නැහැ මන්ත්‍රීතුමා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාලා කැඳවලා කරත් ඔය චෝදනාව කරනවා. මෙතන ඔබතුමාලට වුවමනාවක් තිබුණේ නැහැ ඇවිත් සද්භාවයෙන් වැඩ කරන්න. ඒ ආපු වෙලාවෙත් වෙන බාල්දියක් ඇද්දේ. මතක ඇති මන්ත්‍රීවරුන්ට. අබේසේකර මන්ත්‍රීතුමා වෙන කුණු ගොඩක් ඇදලා මේක ඉවර කරන්න හැදුවා. මෙතන ඇවිත් නිරෝධායනයට බෙහෙත් ගහපු එකක් ගැන කතා කරලා කුණු ගොඩක් ඇදලා මට යනකොට කියනවා ලේකම් ඒකෙනුත් ගහලා කියලා. කිවුවේ නැද්ද. රුපියල් පන්දාහයි වියදම් වෙලා තිබුණේ. මෙතුමා මෙතනින් බැහැලා යනකොට කියනවා " සභාපතිතුමා, ලේකම් ඒකෙනුත් කෙළලනේ.", ඒකයි මම කිවුවේ අර වෙලාවේ. එහෙම මන්ත්‍රීවරයෙක් මේ. ලේකම්ට එකක් කියනවා, මට එකක් කියනවා.

අදටත් මම කොට්ඨාශ 11 මන්ත්‍රීවරුන්ට ගෞරවණීය ස්තුතිය පළ කරනවා. මොකද මම හිටියේ වෙනත් මතයක. අපි පවුල් 4000කට බෙදන මතයේ තමයි මම හිටියේ. අදටත් ස්තුතිවන්ත වෙනවා කොට්ඨාශ 11 මන්ත්‍රීවරු ඒ දේ හරියටම කරා. බනින්න ආපු එක අඩු කරා. 8000 කට බෙදලත් අපි බැනුම් අහනවා. නමුත් 4000කට බෙදුවා නම් බැනුම් නෙමෙයි කුණු බැනුම්. ඒ පිළිබඳව මම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන්ටයි, ප්‍රියන්ත මන්ත්‍රීතුමාටයි ස්තුතිවන්ත වෙනවා. ඔවුන් සද්භාවයෙන් ඇවිත් මෙතන බැලුවා. ටෙක්ලා ගීගනගේ මන්ත්‍රීතුමියට මම ස්තුතිවන්ත වෙනවා. මගේ කොට්ඨාශයේ මට පුළුවන් සාධාරණය කරා. මම එතුමියට කිවුවා බෙදන හැම තැන් වලටම එන්න කියලා. එතුමියට මම ස්තුතිවන්ත වෙනවා. ඒ හැම තැනකටම ආවට. මේක හම්බ වෙන්නේ නැත්නම් ඕන කෙනෙකුට කියන්න තිබුණා. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු නම් ලැයිස්තු පවා ලබා දුන්නා. එතුමන්ලා ඒ වෙලාවේ සද්භාවයෙන් මැදිහත්වීම පිළිබඳව මම ගෞරවයෙන් ස්තුතිය පළ කරනවා. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු, ටෙක්ලා මන්ත්‍රීතුමිය ඔබතුමන්ලා ඒක දැක්කා. ගේන ඕන විවේචනයක් මම ඔලුව නවලා අනුමත කරනවා. කුණු ගොඩවල් අවුස්ස අවුස්ස හැම තැනම කුණු බෙද බෙද බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව විනාශ කරපු අබේසේකර වගේ මන්ත්‍රීවරු කරන ප්‍රකාශ මම ශත පහකට භාර ගන්නේ නැහැ.

ඊළඟට තව කාරණයක්. මම ප්‍රාදේශීය ලේකම්තුමියලා දෙන්නටම කතා කරා. අපි බඩු බෙදන්න පාර්සල් කරන අතරේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකෙන්ම කිවුවා සභාපතිතුමා අපිත් බෙදනවා කියලා. බඩු බෙදන්න පාර්සල් කරන්න පටන් අරගෙන එතකොට. සමෘද්ධි පවුල් වලට එයාලා බෙදනවා කිවුවා. අපිට ඉතුරු 4000 කළමනාකරණය කරගන්න පුළුවන්. ගොඩක් යන්නේ සමෘද්ධි පවුල්වලට. අපිට එතකොට 4000න් බෙදන්න පුළුවන්. එතකොට තමයි මේ මන්ත්‍රීවරු ටික ආවේ. අන්තිම වෙනකොට ප්‍රාදේශීය ලේකම්වරු දෙන්නම කිවුවා සභාපතිතුමා මේ වෙලාවේ අපිට බෙදන්න හැකියාවක් නැහැ. මොකද මේක මැතිවරණය යන වෙලාවක් කියලා. ඒක හින්දා අපිට මේක බෙදන්නත් බැහැ. ලැයිස්තුව දෙන්නත් බැහැ කිවුවා. ඉතිං ඒක හින්දා තමයි අපි පවුල් 8000කට බෙදන්න ගියේ. සමෘද්ධිලාභීන්ට බෙදන්නේ නැතුව අනිත් මිනිස්සුන්ට බෙදලා වැඩක් නැහැ. ඒකයි ඒ තත්ත්වය. ඊළඟට අපි ඉල්ලීමක් කරා ඔබතුමියන්ලාගේ ග්‍රාම නිලධාරීන් සම්බන්ධ කරලා දෙන්න

කියලා මේ වැඩසටහන කරන්න. ඒකත් ප්‍රතික්ෂේප කරා. ග්‍රාම නිලධාරීන්ට කියලා තිබුණා ලැයිස්තු දෙන්නත් එපා. මේකට සම්බන්ධ වෙන්නත් එපා කියලා. හෙට වුණත් සම්බන්ධීකරණ කමිටුවේදී මේවා කතා කරලා බේරගන්න පුළුවන් ප්‍රශ්න. මේක බොහොම විනිවිදභාවයෙන් අපි කියන්නේ. එහෙම සද්භාවයෙන්, ක්ෂණයෙන් මේක කරේ. ආඩම්බර වෙන්න ඕන අපේ බෝපෙ පෝද්දල මන්ත්‍රීවරු. අනිත් සභාවල මන්ත්‍රීවරු අඬනවා. සභාපතිතුමා, ඔබතුමා, උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරු කණ්ඩායම මේක කරා කියලා කියනවා. ගාල්ල දිස්ත්‍රික්කයේ බෝපෙ පෝද්දල විතරයි මේක කරේ. ඒක හින්දා අද අපි අමාරුවේ වැටිලා තියෙනවා. අපේ ගම්වල මිනිස්සුන්ගෙන් අහන්න බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවෙන් මෙහෙම දෙයක් කරලා තියෙනවා එයාලට නොලැබුණාද කියලා. එහෙම තියෙද්දි මේ වගේ කුණු ගොඩවල් හොය හොය යනවා. ඒ ගැන ඉතාමත්ම කණගාටු වෙනවා. මම ඉතාමත්ම සතුටු වෙනවා අද මේ සාකච්ඡාව මේ තැනට ආපු එක ගැන. අපේ සමහරු කතා කරලා ඇහුවා ඇයි සභාපතිතුමා මිනිස්සුන්ට රුපියල් දාහක් වෙන් කරලා තියෙද්දි ඔබතුමා රුපියල් පන්සීයක විතර බඩු බෙදලා මිනිස්සුන්ගේ සල්ලි ගසා කෑවේ කියලා. අහවලා කිවුවා කියලා කිවුවේ. වෙන කිසි කෙනෙක්ගේ නම් සඳහන් කරේ නෑ. අහවල් මන්ත්‍රීතුමා අපිට කිවුවා කියලා කිවුවේ. එහෙම කුජීතයෙක් ඉන්නවා. එහෙම දේශපාලනයෙන් බංකොලොත් වෙච්ච කුජීතයෙක් ඉන්නවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** අහවල් මන්ත්‍රීවරයෙක් කිවුවට, අබේසේකර මන්ත්‍රීතුමා නම් කියලා තිබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය කියන්නේ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඕපාත ගමේ උදේ පාන්දර ගිහිල්ලා අබේසේකර මන්ත්‍රීතුමා මුළු ගමටම බෙදනවා කියලා හැමෝටම ඉල්ල ගන්න කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කරේ මේක කඩාකප්පල් කරන්න. මම ඉල්ලීමක් කරනවා අද සභාව තියෙන නිසා මේක සම්මත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම කරන්න වෙනවා. ඒක හින්දා මන්ත්‍රීවරුන්ට සියලු තොරතුරු ඡායාපිටපත් කරලා ලබා දෙන්නම්. ඒක බලලා අඩුපාඩුකම් තියෙනවානම් කියන්න. මේ යෝජනාව අන්තිමට තියලා මේ පිළිබඳව සාකච්ඡාවක් කරමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ඔබතුමාට විශේෂයෙන්ම එකක් තියෙන්නේ ලේකම්තුමා ඉන්නවා. ලේකම්තුමා මුදල් පිළිබඳව පරිපාලනය පිළිබඳව සභාපතිතුමා මන්ත්‍රීවරු දන්නේ නැත්නම් දැනුවත් කරන්න ඕන. මේ ලේකම්තුමා ගැන නම් අපි කතා කරන්න ඕන. ඒක වෙන කිසිම දෙයක් නිසා නොවේ. මොකද හේතුව මේ සභාවේ තමුන්නාන්සේ සද්භාවයෙන් කැඳවන කොට පැය භාගයක් ඇතුළත අපි ආවා. වෙනදට මේ ටෙල්සි මහත්මියට තමයි කතා කරන්න දෙන්නේ. මන්ත්‍රීවරුන්ට එන්න කියන්න තිබුණා අද කමිටුවක් තියෙනවා කියලා. ඒකට වෙලාව නැහැ. තමුන්නාන්සේලාට ඕන ඕන විදියට මේවා මාරු කරලා ගහ ගෙන කෑම කෑවා නම් ගහගෙන කෑවා කියන එක තමයි කියන්න තියෙන්නේ. නැතුව මොන එකක්ද කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා එහෙම නොකියපු එකක් මට කියන්නකෝ. ඔබතුමා මේකේ වෙච්ච මුදල් ගණුදෙනුවලින් නොකියපු එකක් මට කියන්න මම ගහන් කෑවා කියලා. මේ ලේකම්වත්, කවුරුවත් ඒ මට්ටමට වැටිලා නෑ. ඔබතුමා තරම් අහිංසක මිනිස්සුන්ගේ සල්ලි වලින් ගසා කන නිලධාරීන්, මන්ත්‍රීවරු මේවගේ නැහැ. ඔබතුමා තමයි එහෙම කරලා තියෙන්නේ. ඔබතුමා තමයි එහෙම ගහන් කාලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මට කතා කරන්න දීලා කතා කරන්න. මම අහගෙන හිටියනේ ඕන තරම්.

මතක තියා ගන්න මේ සභාවේ රීතියක්, විනයක් මොකක්වත් නැහැ. හැමදාම මුදල් රෙගුලාසි කඩලා තියෙනවා. මේකට තමුන්නාන්සේට ඕන විදියට වියදම් කරන්න, ඕන ඕන තීන්දු ගන්න මේ සභාවේ මුදල් එක්ක බැහැ. මේ මහජනතාවගේ මුදල්. ඒක හින්දා අපි මේකට කොහොමත් විරුද්ධයි. කවුරු විරුද්ධ වුණත්, නැතත් මම විරුද්ධයි. අපි මේකට විරුද්ධව අනිවාර්යයෙන්ම පරීක්ෂණයක් කරන්න ඕන. සියලුම බෙදපු ලිස්ට් ටික සභාගත කරන්න ඕන. බිල් විතරක් නෙමෙයි කාටද බෙදුවේ කියලා සියලු දේවල් ඕන. ඒ වගේ ලිස්ට් අරගෙන ඇතිනේ. මන්ත්‍රීවරු විස්සක් ඉන්න තැන කතා කරලා කරපු දේවල් කඩ කරමින් තමයි ඔබතුමා වැඩ කරේ. මේක අවංකව හරියට කරපු මන්ත්‍රීවරු ටික දෙනෙක් හිටියා. එතුමන්ලාගේ කුණු ගාන්න තමයි කමිටු දා ගත්තා කියන්නේ. මොන සභාවක් කැඳවලද කමිටුවක් දැම්මේ. ලේකම්තුමාට උපදෙස් දෙන්න බැරි වුණාද, වගකීමක් නැද්ද මුදල් රෙගුලාසි එක්ක. මුදල් එක්ක මෙහෙම සෙල්ලම් කරන්න බැහැ කියන්න ඒ ගැන දැනුවත් නැද්ද. එකක් තියෙනවා ඔබතුමා දන්නවා. අපි මේවා කතා කරේ නැහැ. මේ සභාවේ අත්සන් ගහලා

ගිහිල්ලා ඉවර වෙලා බැංකුවලට දුන්නා. දීලා ඉවර වෙලා මේවා කරා. මොකද ඔබතුමාට අපි දිගටම කියලා තියෙනවා මුදල් රෙගුලාසි පිළිබඳව ඔබතුමා වගකියන්න ඕන. මෙහෙම තීන්දු ගන්න බැහැ. මෙහෙම තීන්දු ගන්න පුළුවන්ද රජයේ මුදල්, මහජනතාවගේ මුදල්වලට. අපි මේකට විරුද්ධයි කොහොමත්. ඔයිට වැඩිය කතා කරන්න දෙයක් නැහැ මේක ගැන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමා දැන් මේ න්‍යායපත්‍රානුකූලව මේ සභාවට, මේ අවස්ථාවට ඉදිරිපත් කරපු කාරාණාව ලබන සභාවට කල් තියනවා කිව්වා. එහෙමනම් මම මේක සම්බන්ධව මූල්‍යමය කාරණා හෝ මූල්‍යමය රෙගුලාසි ගැන කතා කරන්න යන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා මේකටත් එක්ක පිළිතුරු දෙන්න. මුදල් එහෙම පරිහරණය කරන්න හැකියාවක් තියෙනවාද, නැද්ද,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම උත්තර දෙන්නම්. එතුමා නෙමෙයිනේ මේකේ මූලාසනය. මම ඉන්නේ මූලාසනයේ. මම උත්තර දෙන්නම්. මන්ත්‍රීවරයෙක්ගෙන් එහෙම අහන්න අයිතියක් නැහැ. ඔබතුමා ජ්‍යෙෂ්ඨයි කියලා කියා ගන්නවා හැම තිස්සෙම. ඔබතුමාට එහෙම අයිතියක් නැහැ. මම මේකේ සභාපතිවරයා විදියට කොයි වෙලාවෙත් ලේකම්තුමා ප්‍රධාන අනිත් නිලධාරීන්ගේ වගකීම ගන්නවා. මම ඒක මඟඅරින සභාපතිවරයෙක් නෙමෙයි. මේකේ රුපියලක හරි අවභාවිතාවක් වෙලා තියෙනවානම් මම ඒ වගකීම ගන්නවා. අපේ පළාත් පාලන කොමසාරිස්තුමා එක්ක එදිනෙදා විනාඩියෙන් විනාඩිය, පැයෙන් පැය කතා කර කර තමයි මේ තීන්දුව ගත්තේ. කිසි තැනක කමිටුවක් පත් කරන්න කියලාවත් නැහැ. ඒ තිබුණ ඇඳිරි නීති තත්ත්වය උඩ දැඩි විනිවිදභාවයක් හදන්න තමයි කමිටුවක් පත් කරේ. කමිටුවේ මන්ත්‍රීවරු ඔක්කොම ගියා. අඩු කරන්න පුළුවන් ඒවා අපි අඩු කරා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම මතුකරන්න උත්සාහ කරේ නැවත මේක ලබන සභාවට කල් දාමු කියපු නිසා මූල්‍යමය රෙගුලාසි සම්බන්ධ කාරණා මම මෙතන කතා කරේ නැහැ. මම මතු කරේ ඒ වෙලාවේ අනුමැතියට ඉදිරිපත් කරන කොට මතු වුණ ප්‍රශ්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා සාධාරණයි. මම 100% ක් එකඟයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේකට අදාළ අපි යම් තීන්දුවක් ගනිපු එක ඇත්ත. ප්‍රායෝගිකව ඒ තීන්දු ක්‍රියාත්මක කිරීමට ප්‍රශ්න මතුවෙන්න පුළුවන්. ඒ ප්‍රශ්න වලදී ඔබතුමා සභාවේ අනෙකුත් මන්ත්‍රීවරු දැනුවත් කරන්න පුළුවන්කමක් තිබුණද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම දැනුවත් කරේ නැහැ. මම ඒකත් කියන්න ඕන මන්ත්‍රීතුමා. ඔය ප්‍රාදේශීය ලේකම් කියන කොට සමෘද්ධිලාභීන්ට බෙදන්නේ නැහැ කියලා මේ මන්ත්‍රීවරු මෙතනට කතා කර ගෙන ආවා. ඒ ආවේ මෙතන නිලධාරීන් කරන වැඩ ටික කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** බෙදීමේදී ලේඛන සම්බන්ධ ක්‍රමවේදයේ ප්‍රශ්නයක් ඇහුවහම ඔබතුමා උත්තරයක් දුන්නා ප්‍රාදේශීය ලේකම්වරු ලේඛන ලබා නොදුන් බවට. ඒ තත්ත්වය එහෙමනම් මේ ආකාරයෙන් බෙදීමේ ප්‍රශ්නයක් තියෙනවා. අපි යෝජනා කරේ ග්‍රාම නිලධාරි සන්තකයේ ඒ තොරතුරු ක්‍රමවත්ව හදලා තිබුණා ඒවා ගන්න. අපි දන්නවා ග්‍රාම නිලධාරීන්ට උපදෙස් දීලා තිබුණා ඒවා ලේස්ති කරන්න කියලා. අපිත් යෝජනා කරා ඔබතුමාට ඒ ලේඛන ගමු කියලා. නැත්නම් මේක ද්විත්ව වෙන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිත් එක මන්ත්‍රීතුමා මම ඉතාමත්ම වගකීමෙන් කියනවා අපේ සියලු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා, උප සභාපතිතුමා ඇතුළුව මේ දේ හරියටම ඉෂ්ඨ කරා බෙදීමේ කටයුතු. සමහර දේවල් වෙන්න ඇති. මම කියන්නේ නැහැ එහෙම නැහැ කියලා. බඩු මලු 650ක් බෙදන කොට, මිනිස්සු ඇඳිරිනීතිය වෙලාවෙත් ඇවිල්ලා පිරෙන කොට එහෙම වෙන්න ඇති. අක්‍රමිකතාවයක් නම් වෙලා නැහැ. සමහරුන්ට නොලැබෙන්න ඇති.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** කවුරුවත් වංචාවක් කරා කියන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි රටේ මෙහෙම තත්ත්වයක් තියෙද්දි ගහන් කන මට්ටමේ, කුණු ගොඩවල් හොයන මට්ටමේ මන්ත්‍රීවරු ඉන්න එක ගැනත් මම කණගාටු වෙනවා. මට මන්ත්‍රීවරු ගැන හිතාගන්නත් බැහැ ඇත්තටම.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මෙවැනි ආපදා තත්ත්වයක් ඇතුළේ තමන් වගකියන බල ප්‍රදේශයේ තමන් දන්න අඳුරන මිනිස්සුන්ගේ මූණ දිහා බලාගෙනනේ මේවා කරන්නේ. හැබැයි ඒවා නොකරපු බවට අපිට ලේඛන අනුව ඔප්පු කරලා මෙතනට ඉදිරිපත් කරන්න පුළුවන්කම තියෙනවා.

ඔබතුමාට ඒක කරන්න පුළුවන්කම තියෙනවානේ. ඔබතුමා ඒක ඉදිරිපත් කරන්න ඕන. අපිට මතුවෙන ගැටලු තියෙනවා. අපි යොදවන්නේ මහජන මුදල්. මහජන මුදල්වල වගකීම තියෙනවා. ඒ නිවැරදිභාවය, නීත්‍යානුකූලභාවය, ඒවා සඳහා විනිවිදභාවය, ඒ සියලු කාරණා සම්බන්ධයෙන් වගකීමක් තියෙනවා සභාවට. අන්න ඒ කොන්දේසි සපුරලා මේක ඉදිරිපත් කරන්න. එතකොට අපි සාකච්ඡා කරමු. අපේ පැත්තෙන් අපි කියන්නේ නැහැ ඔබතුමාලා පෞද්ගලිකව හොරකම් කරා කියලා මේක ඇතුළේ 8000ක් බෙදන කොට. බෙදන කොටත් ප්‍රශ්න ඇතිවෙන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- බෙදීමේදී අඩුපාඩුකම් වෙන්න ඇති. ඒක මම නැහැයි කියන්නේ නැහැ. ඒක මම කොයි වෙලාවකවත් නැහැයි කියන්නේ නැහැ. හැබැයි මෙහෙමයි මගේ කොට්ඨාශයේ ටෙක්ලා මන්ත්‍රීතුමිය ඉන්නේ. මම මෙතුමිය පිළිබඳව මේක දාන්න යන්නේ නැහැ. එතුමියටත් පුළුවන් මේක විවේචනය කරන්න. ඒක වෙන කතාවක්. හැබැයි මම මෙතුමියට කිවුවා. මන්ත්‍රීධූරයේ නැතත් හිටපු මන්ත්‍රී හර්ෂ ලියනගේ මැතිතුමාට කිවුවා. ඔබතුමාලට කිවුවා. මිනිස්සුන්ව පෝලිම් ගස්සවලා ප්‍රසිද්ධියේ බෙදුවේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** ඃ- අපිත් ලේඛන ඉදිරිපත් කරා. තාක්ෂණිකව ඉදිරිපත් කරේ නැහැ. සුදුසුයි කියලා හිතෙන අය ඉදිරිපත් කරේ. පාක්ෂිකයෝ බැලුවේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒවාට ලැබුණනේ. නොලැබුණේ නැනේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** ඃ- සමහර අඩු පාඩු සිද්ධ වෙන්න පුළුවන්. ඔබතුමාට මම දවසක් කතා කරා. ඔබතුමා කිවුවා නැවත වාරයක් කරන්න හැකියාව තිබුණොත් බලමු කියලා. එහෙම අතපසුවීම් වුණානම් කණගාටු වෙනවා කියලා ඔබතුමා මට පෞද්ගලිකව කතා කරලා කිවුවා. ඔබතුමාට ඒ අදාළ ගෞරවය තබමින් තමයි මේ මොහොතේ මේ සිද්ධියට මැදිහත් වෙන්නේ. මේකේ තියෙන නිවැරදිභාවය, නීත්‍යානුකූලභාවය පිළිබඳව මට විවේචනයක් තියෙනවා. ඔබතුමාට මම ඒ විවේචනය පෞද්ගලිකව කිවුවා. බෙදාහැරීමේ ක්‍රමවේදය සම්බන්ධව සියලු මන්ත්‍රීවරු තමයි මේ තීන්දුව ගත්තේ. සභාවේ සියලු මන්ත්‍රීවරුන්ගේ අනුමැතියෙන් තමයි මේ තීන්දුවට ගියේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මටත් පොඩි හිතේ අමාරුවක් තිබුණා මන්ත්‍රීතුමා. අපි වැඩේ පටන් ගත්තානේ එවෙලෙම. බඩු ටික ගේන්න ගියා. නමුත් ඇත්තටම සද්භාවයෙන් මේකට මැදිහත් වෙන්න ඕනකම තිබුණානම් මෙතනට ඇවිල්ලා අඩුපාඩු කියන්න තිබුණා සභාපතිතුමා මේක වැරදියි කියලා. මට කවුරුවත් කිවුවේ නැහැ මේ අබේසේකර මන්ත්‍රීතුමා දැන් මෙතනදි මේක කියනකම්. අබේසේකර මන්ත්‍රීතුමා හනුමා වගේ වලිගේ ගිනි තියා ගෙන ඔක්කොම ගිනි තියෙනකොට සභාපතිවරයා විදියට මට කතා කරේ නැහැ. අද මේ දැන් වෙනකම් මේ කාරණා පිළිබඳව සඳහන් කරලා නැහැ. ඒ කියන්නේ මම දන්නවා මිනිහා ඇඳේට යන්නේ කියලා. අපිත් ඒවාට ලෑස්තියි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමා, මට තිබුණා මේක බෙදාහැරීමට ගනිපු ක්‍රියාමාර්ගයේ ක්‍රමවේදයන්ට භාවිතා කරපු ක්‍රමවේදයන් පිළිබඳ ප්‍රශ්නයක්. මම ඒක ඔබතුමාට පුද්ගලිකවත් කතා කරා. මට ඒ සම්බන්ධව මේ සභාවේත් ඒ විවේචනය තියෙනවා. මුදල් රෙගුලාසි අනුව ගෙවීමට තියෙන නීත්‍යානුකූලභාවය පිළිබඳව ඔබතුමා සැලකිලිමත් වෙන්න. ඒ සඳහා ඒකට නිවැරදි අනුමැතිය ලබා ගෙන ඉදිරිපත් කරන්න. නැවත ප්‍රශ්න මතුවෙන්න පුළුවන්. ඒවා කියන්න බැහැනේ. මහජන මුදල් ලක්ෂ ගාණක් වියදම් කරලා අපිට පෞද්ගලිකව වගකියන්න බැහැ. ඒ නිසා ඒකට අවශ්‍ය නිවැරදි අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරයි කියලා මම විශ්වාස කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමනි, ඔබතුමා කිවුවා ලේකම්තුමා දන්නවා. බඩු ගන්න යනකොට මමත් ආවා. මමත් ඇතුළට ගියා. අපි සද්භාවයෙන් ඉදිරිපත් වුණේ. මම එතනට ගිහිල්ලා බඩු ගන්න ඒ අය එක්කත් කතා කරා. ඊට පස්සේ මම සභාවටත් ආවා. සභාවේ බඩු ඇසුරුම් කරන කොට මම කවුරුහරි එවන්න ඕනද, කට්ටිය එවන්න ඕනද කියලා ඇහුවා. අපේ ගමේ ස්වෙච්ඡා සංවිධාන තියෙනවා. මම එවන්නම් කිවුවා ඕනනම් කට්ටිය. ඒ දවස්වල අපේ ගමේ බඩු බෙදන කොට ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වුණ කට්ටිය ඉන්නවා. මම කතා කරලා කිවුවා. ඊට පස්සේ මම ලේකම්තුමාටත් ඇවිල්ලා කිවුවා. බඩු බෙදන කොට පොඩි ප්‍රශ්නයක් තියෙනවා. උදාහරණයක් මම අරගෙන පෙන්නුවා. කොට්ඨාශ 12 ගත්තහම ලොකුම කොට්ඨාශය මගේ කොට්ඨාශය. ජනගහනය වැඩිම කොට්ඨාශය. සමහර කොට්ඨාශවල ඡන්ද 1500ක් 2000ක් තියෙන කොට මගේ කොට්ඨාශයේ ඡන්ද 5000ක් තියෙනවා කියලා කිවුවා. 650ක් බෙදනවානම් මගේ කොට්ඨාශයට ටිකක් වැඩිපුර දෙන්න කියලා මම කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- හරි හරි මන්ත්‍රීතුමා. ඕක දිගින් දිගට කතා කරන්න දෙයක් නැහැ. ඇත්තටම ඔබතුමා කියන එක මම පිළිගන්නවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මම ලේකම්තුමාට කිව්වා බඩු මලු හදන්න සම්බන්ධ වෙන්නම් කියලා. එපා කිව්වා. ඒ පාර මම කිව්වා පල්ලියට ගිහින් දෙන්න නැත්නම් ග්‍රාම නිලධාරීන්ට භාර දෙන්න කියලා. මට අවශ්‍ය නැහැ කියලා කිව්වා. ග්‍රාම නිලධාරි ළඟ ලැයිස්තු තියෙනවා. ඒවා අරන් බඩු බෙදන්න කියලා මම කිව්වා. ඒ විදියට මම උපදෙස් දුන්නා. ඒ කිසිම දෙයක් කරන්නේ නැතුව බඩු ටික ගෙනල්ලා දේශපාලඥයෝ දෙපළකගේ ගෙවල්වල බෑවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන කාරණයට මම 100% ක් එකඟයි. ඒක මම පිළිගන්නවා. ඔබතුමාගේ කොට්ඨාශයේ ඔබතුමත් එක්ක තමයි අපි බෙදන්න හිටියේ. නමුත් ඔබතුමා අපේක්ෂකයෙක් වුණා. ඇත්ත කතාව වුණේ ඒකයි මන්ත්‍රීතුමා. කවදාවත් ලයිට් හයිකරන්න යනකොට ඔබතුමාගේ කොට්ඨාශයේ මම වෙන කෙනෙක් සම්බන්ධ කර ගෙන තියෙනවාද. එහෙම කරලා නෑ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක තමයි මම කිව්වේ. මම මේකට සහභාගි වෙන්න අවශ්‍යතාවයකුත් නැහැ. මම මේ වගේ දේවල් ඡන්දය බලාපොරොත්තුවෙන් කරන්නේ නැහැ. එතකොට මම කිව්වා සමෘද්ධි මිස් ගාව ලැයිස්තුව තියෙනවා කියලා. කුරුඳුවත්තේ පවුල් මෙච්චර ඉන්නවා, මහ හපුගල පවුල් මෙච්චර ඉන්නවා කිව්වා. ඊට අමතරව පල්ලියෙත් ලැයිස්තු තියෙනවා. ඒවා අනුව බෙදන්න කිව්වා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම පිළිගන්නවා කුරුඳුවත්ත කොට්ඨාශයේ අඩුපාඩු වෙන්න ඇති.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, මේ භාණ්ඩ මිලදීගැනීම, බෙදීම ගැන, ගොඩක් කතා කරා සභාව තුළ. මේක අසරණභාවයට පත් ජනතාව වෙනුවෙන් ඒ වෙලාවේ කරේ. මම ඔබතුමාට දැඩි බලපෑමක් කරා. සංවිධායකතුමා හරහාත් බලපෑම් කරා මේ දේ කරන්න ඕන තැන ඉඳගෙන. ඒ වෙලාවේ අපි මේ වැඩපිළිවෙල යොදාගෙන කරන වෙලාවේ ගැටලුවක් ආවා. මම ඒ වෙලාවේත් කමිටුවේදී යෝජනා කරා තෝරාගෙන අඩු අදායම්ලාභීන්ට පස්සේ කරමු කියලා. දැන් ඒ පාර කණ්ඩායමේ හැඟීමක් ඇතිවෙලා මෙහෙම බෙදමු කියලා ආවා. දැන් මේක මිලදී ගැනීමේ කමිටුවක් පත් කරා කියන්නේ සභාවේ ලේකම්වරයයි, තව කීපදෙනෙක් හිටියා ඇරෙන්න කිසිම කෙනෙක් මේ සභාවේ හිටියේ නැහැ. මම ආවා හැමදාම. මන්ත්‍රීවරු අඩු ප්‍රමාණයක් හිටියේ සභාව තුළ. සුගත් මන්ත්‍රීතුමා ඉන්නවා මම දැක්කා. ඉතින් ඒ වෙලාවේ දැඩි අපහසුතාවයට පත්වෙලා තිබුණේ. ලේකම්තුමත් මේකට විරුද්ධ වුණා. මේක කරන්න බැහැ කියන තැන හිටියේ. අපි දැඩි බලපෑම් කරා මේක කරමු කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වැඩේට බැස්සට පස්සේ එතුමා ඉහළින් වැඩකරා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒ පාර මේ වැඩේ කරගෙන ගිහිල්ලා එතුමා තමයි අවසානයේ කමිටුවක් පත් කරන්න මටත් කතා කරේ. එවලේ හිටපු මන්ත්‍රීවරුන්ගෙන් ගත්තේ කමිටුව. සභාවට ආපු, එවලේ හිටපු මන්ත්‍රීවරුන්ට කිව්වා මේක කරන්න ඕන නම් අත්සන් කරන්න කියලා. ඉතින් එවෙලේදී ඒ මිලදී ගැනීම් කිසිම දේකට නොගියත් මම දෙපාරක් හිතුවේ නැහැ අසරණ ජනතාව වෙනුවෙන් ඒ දේ කරන්න ඕන කියන මතයේ ඉඳගෙන එකතුවුණා. මොනම හේතුවක් නිසා හරි මගේ නම යෝජනාවට නැහැ. ඒ නැති වුණත් මම සියලු දේවල් අධීක්ෂණය කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකේ අඩුපාඩුවක් වෙලා තියෙනවා. ඒකනේ මම සඳහන් කරද්දිම කිව්වේ නම සඳහන් වෙලා නෑ කියලා. එතන වැරැද්දක් වෙලා නිසා. මම ඒක සංශෝධනය කරා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මෙතන යෝජනාවේ නැති වුණත් ඒ අත්සන් කරපු බිල්වල මගේ නම තියෙනවා. ඒ වගකීම මට පැවරෙනවා. ඒ අනුව තමයි කරේ. මිලදී ගැනීම් කරන්න යනකොටත් සමහර ආයතන අපි වෙනස් කෙරෙව්වා. කතා කරලා වෙනස් කරා. චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමා ඒ තැන් වලට ගියා. මෙතන ආපු අයගෙන් කමිටුවක් පත් කරා ඇරෙන්න ඒ දේවල් එහෙම තමයි වුණේ. දැන් වෙලාව 11.10 යි. සභාව පටන්ගෙන මේ වෙනකම්ම භාණ්ඩ මිලදී ගැනීම සම්බන්ධව කතා කරේ. තව සභාවක් පැවැත්වූවත් මේක මේ ආකාරයෙන්ම යනවා. ඒ නිසා මම යෝජනා කරනවා ඡන්ද විමසීමක් තියලා මේක ඉවර කරන්න කියලා. මේක තවදුරටත් ඇදගෙන යන්න ලෑස්තිවෙන්න එපා. ලබන සභාවකත් වෙන්නේ මේක. පරීක්ෂණවලට යනවා නම් ඒ පරීක්ෂණවලට යන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇත්තටම ඡන්ද විමසීමකට ගියොත් මේක දිනනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** විරුද්ධ වෙන්න ඕන අය විරුද්ධ වෙනවා. මමත් කමිටුවේ සාමාජිකයෙක් හැටියට මේකේ පරීක්ෂණ වලට උත්තර දෙන්න හැකියාව තියෙනවා. මේක නැතුව ඉවරයක් කරන්න බැහැ.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ලියනගේ මන්ත්‍රීතුමා කියන කතාව සම්පූර්ණ සත්‍යයයි. එදා ඉඳලා විරුද්ධ වුණ අය විරුද්ධ වෙනවා. ඔබතුමා අද මේක ඉවරයක් කරලා ඊට පස්සේ ඒ අයට පැමිණිලි කරලා පරීක්ෂණයකට යන්න කියන්න. ඕන පරීක්ෂණයක් කර ගන්න කියන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මේක විනිවිදභාවයෙන් වුණා මේ ආයතන එක්ක ගනුදෙනු කරලා. නැතුව මේක ලබන සභාවටත් යන්න බැහැ. ඡන්ද විමසීමකට යන්න. මේක ඉවර කරලා පරීක්ෂණවලට උත්තර දෙන්න. කමිටුවේ ලිපිවලට අත්සන් කරපු නිසා මටත් ඒකට උත්තර දීලා ඒ විදියට යන්න වෙනවා නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් මෙහෙම කරමු. අපි දැන් තොරතුරු ටික ලබා දෙන්නම්. ඊට පස්සේ මේ සභාවේ අන්තිමේ යෝජනා ඉවර වෙනකම් ඒක නිරීක්ෂණය කරන්න. අන්තිම යෝජනාව එන කොට අපි ඒ පිළිබඳව තීන්දුවක් ගමු.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** තීන්දුවක් අරගෙන මේක ඉවර කරන්න. දිගට අරන් යන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකේ යෝජනා ස්ථිර කිරීම පස්සට දාමු. මන්ත්‍රීවරුන්ට දෙන්නම් මේකේ වියදම් කිරීම පිළිබඳ විස්තර.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** බෙදීම පිළිබඳව මම මගේ කොට්ඨාශයේ විතරයි වගකීම අර ගන්නේ. මම වෙන කිසි තැනක ගියෙත් නැහැ.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** පොදුවේ හැම මන්ත්‍රීවරයෙක්ම වගකීම ගන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට මේකට බෙදීමකට ගිහිල්ලා ඡන්ද විමසීම දැන් තියන්න පුළුවන්. ඒක නෙමෙයි දැන් ප්‍රශ්නය. ඇත්තටම ජනතා විමුක්ති පෙරමුණේ ඉන්දික මන්ත්‍රීතුමා, අනිල් මන්ත්‍රීතුමා මේ වෙනුවෙන් මැදිහත් වුණා. ඒකට එතුමන්ලාගේ සාධනීය දායකත්වය ලබා දුන්නා. එතුමා මේක බකල් කරන්න නෙමෙයි සද්භාවයෙන් ඉල්ලීම කරේ මේක ගැන දැනුවත් නෑ කියලා. සිදුවෙච්ච ආකාරය අපි දෙන්නම් දැන් විනාඩි 05ක් ඇතුළත සියලු දෙනාට. අපි යෝජනාව අන්තිම වාරයට අරගෙන විරුද්ධ නම් බෙදීමකට යමු.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මම ඒ වෙලාවේ බලාගෙන හිටියා සභාවේ සේවක මණ්ඩලය විශාල කැපවීමක් කරා. ඒ කැපවීමට මන්ත්‍රීවරු විදියට සභාවට ඇවිල්ලා මෙතන මේක මෙහෙම වුණා කියන්න මම සූදානම් නෑ. මිනිස්සුන්ට සේවයක් වුණා නේ එතනදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා ලියනගේ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මම එතන රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා ඉන්න වෙලාවේදී ඒක කිව්වා. මම හැමදාම සභාව විවේචනය කරාට එතනදී කිව්වා ඒ වචන ටික. වැඩ කරපු මිනිහෙක්ට ගහන්න එපා. ඒ කරපු කැප කිරීම අගයන්න ඕන.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මම ගොඩක් වෙලා ඉඳන් බලන් හිටියා සභාපතිතුමා කාරණා කිහිපයක් ඉදිරිපත් කරන්න. මුලින්ම මම සුභ පතනවා නිදුක් නිරෝගීමත් සුභ නව වසරක් වේවා කියලා සභාපතිතුමා ඇතුළු අපේ සභික මන්ත්‍රීතුමන්ලාටත්, කාර්ය මණ්ඩලයටත්. සභාපතිතුමා ඊළඟ කාරණාව තමයි දැන් කතා කරන්න අවස්ථාව හම්බ වුණේ මට වෙන මාතෘකාවක් තියෙන වෙලාවක. නමුත් පටන් ගත් වෙලාවේ ඉඳලම කාරණා කිහිපයක් එක්රැස් වෙලා තිබුණා. ඒ නිසා මම එකින් එකට කෙටියෙන් සඳහන් කරන්නම්. මේ කොරෝනා වෛරසය සම්බන්ධයෙන් මේක පටන් ගන්න මොහොතේම මම කියන්න කැමතියි මාර්තු 12 වෙනිදා වෙනකොට ලංකාවේ කොරෝනා ආසාදිතයින් 11 දෙනෙක් හිටියා. මාර්තු 19 වෙනකම්ම රටේ කිසිදු තීරණයක් ගත්තේ නැහැ මේ සම්බන්ධව. මාර්තු 19 නාම යෝජනා භාරගෙන ඉවර වුණාට පස්සේ තමයි ඇඳිරිනීතිය දැම්මේ. අනාරක්ෂිත තත්ත්වයේ තිබුණා මේ රට අපේ සභාව තියපු දවස වෙනකොටත්. මේ රටේ

කොරෝනා වෛරසය ව්‍යාප්ත වෙමින් පැවතුණා. ඒ සම්බන්ධව කණගාටුව ප්‍රකාශ කරනවා මම. රජය මේක ගැන ඒ වෙලාවේ කිසිදු තීරණයක් ගන්නේ නැතුව දේශපාලන වශයෙන් තීන්දු ගත්තා වගේ හැඟීමක් මට තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 12 වෙනිදා වෙනකොට කී දෙනෙක් හිටියද,

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** 11 දෙනෙක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පළවෙනි එක්කෙනා වාර්තා වුණේ 11 වෙනිදා.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මම ඔප්පු කරලා පෙන්වන්නම් මේ සම්බන්ධ සියලු කාරණා. මේ රජය ගෙනියපු වැඩපිළිවෙල ගැන සාක්ෂි එකතු කරගෙන තමයි කතා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පළවෙනි කොරෝනා ආසාදිතයා හමු වුණේ මාර්තු 11 වෙනිදා.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මාර්තු 12 වෙනකොට 11 දෙනෙක් ඉඳලා තියෙනවා. අයි. ඩී. එච්. එකේ 8 දෙනෙක් ඉඳලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමිය කියන එක මම කිසිසේත්ම පිළිගන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** පිළිගන්නේ නැති නිසා මම ලිඛිතව ඉදිරිපත් කරනවා දින වකවානු එක්ක මේ සම්බන්ධ කාරාණා ඊළඟ සභාවට. සභාපතිතුමා ඒකයි මම එහෙම කිව්වේ. කණගාටුවට කාරණයක් තමයි මේක. නමුත් මම විවේචනය කරන්නවත්, පසුගිය දේ ගැන කතා කරන්නවත් නෙමෙයි සිද්ධ වෙච්ච සිදුවීම්වල සමහර දේවල් සම්බන්ධයෙන් කතා කරන්න තමයි මම අවස්ථාව උදාකර ගත්තේ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** මේක සිරිකොතේ වාර්තාවක්ද?.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** සිරිකොතේ වාර්තාවක් නෙමෙයි. මම සිරිකොතට සම්බන්ධ නැහැ. මගේ අවස්ථාවේ හැටියට, රටේ පුරවැසියෙක් හැටියට මහජන නියෝජිතත්වය පැත්තකින් තියලා පොදු විදියට තමයි කතා කරේ. ඔබතුමා ඒක ගැන කතා කරන්න එපා මේක මගේ අවස්ථාව නිසා. මේ කොරෝනා සම්බන්ධයෙන් සභාපතිතුමාට දෝෂාරෝපණය කරද්දි මම කල්පනා කරේ අපි ඔක්කොම කැඳවලා මෙතනදී එක තීරණයකට ආවා භාණ්ඩ බෙදා දීම සම්බන්ධව. ඒක ගැන දිගින් දිගටම කතා කරන්න අවශ්‍ය නැහැ කතා කරපු නිසා. නමුත් එක දෙයක් හැමෝටම අමතක වුණා. අපි ඇහුවා ඒ වෙලාවේ මේ භාණ්ඩ බෙදා දීමේදී අපිව දැනුවත් කරනවාද, නැත්නම් අපි එන්නද කියලා. නෑ කොට්ඨාශ මන්ත්‍රීවරුන්ව දැනුවත් කරනවා කිව්වා. එකගයි අපි එන්නම් කිව්වා. ඕන දේකට අපි කැමතියි. ජනතාව වෙනුවෙන් මේ වගේ දෙයක් කරන එකට. කිසිම විරෝධයක් තිබුණේ නැහැ. මම දන්නේ නැහැ මතකද කියලා. මම කිව්වා මේ හාල් ප්‍රමාණය වැඩිපුර දෙන්න කියලා මිනිස්සුන්ට. අල, ලූණු, තුනපහ දෙන එක අඩු කරන්න කිව්වා. මොකද හාල් කිලෝ 10 ගාණේ ගෙවල් වලට බෙදුවත් ඒ මිනිස්සුන්ට ඒකේ වැදගත් කමක් තිබුණා ඒ වෙලාවේ. අනිත් දේවල් නැති වුණත් හාල් කිලෝ 10 ගාණේ හැම ගෙදරකටම දුන්නනම් ඒක සභාවක් හැටියට සුදුසුයි කියලා මම ඒ වෙලාවේ කිව්වා. මම දැනුත් කියනවා. මොකද අත්‍යාවශ්‍ය භාණ්ඩ හරියට නොදුන්න නිසා.

ඊළඟ කාරණාව තමයි ගරු සභාපතිතුමා අපේ පන්සලේ ස්වාමීන් වහන්සේ සැහෙන්න වෙහෙසක් දරලා ගමේ ගෙයින් ගෙට ගිහින් අඩු අදායම්ලාභී නිවාස හොයාගෙන කුඩා ස්වාමීන් වහන්සේලා භාණ්ඩ ලබා දුන්නා. පන්සලට එක් රැස් කරේ නැහැ. ඒ අවස්ථාවේත් රටේ ඇඳිරිනීතිය තිබුණා. ප්‍රදේශයේ ප්‍රධාන පුරවැසියා විදියට ඔබතුමා මේ සම්බන්ධව අදහස් හුවමාරු කර ගත්තා සිද්ධ වෙච්ච දේවල් ගැන. දෝෂාරෝපණය කරනවා නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙන්න ඔබතුමියගේ ප්‍රශ්න වලට උත්තර. හිරු මාධ්‍යයේ මාර්තු 11 දිනය බලන්න පුලුවන්. "කොරෝනා වෛරසය ආසාදිත පළමු ශ්‍රී ලාංකිකයා හදුනා ගැනේ. ඔහු දැනට අයි. ඩී. එච්. රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටී."

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මම ඔබතුමාට ප්‍රකාශ කරේ මාධ්‍ය ප්‍රකාශනයකින් සඳහන් කරපු දේ. මම ඔබතුමාට ඉදිරිපත් කරන්නම් ඇත්ත වශයෙන්ම ඊළඟ සභාවේදී. සෞඛ්‍ය සේවා අංශය විසින් අයි. ඩී. එච්. රෝහලේ සිටිය රෝගීන් ප්‍රමාණය කොච්චරද කියලා මම ඉදිරිපත් කරන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කියන්නේ මාර්තු 11 නෙමෙයිද, පළවෙනි රෝගියා හඳුනා ගත්තේ.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** පළවෙනි රෝගියා ගැන නෙමෙයි මම කිවුවේ. මාර්තු 11 ගැන මම සඳහන් කරේ නැහැ සභාපතිතුමා. මම කිවුවේ මාර්තු 12 වෙනකොට ලංකාවේ රෝගීන් 11 දෙනෙක් හිටියා කියන එක. මම සඳහන් කරේ එහෙමයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මම කිසිසේත්ම පිළිගන්නේ නැහැ. ඒක වැඩක් නැති කාරණයක්. මම ඔබතුමියට තව එකක් කියන්නම්. ඔබතුමිය කියන කාරණාව නෙමෙයි ලංකාවේ තියෙන්නේ. ඔබතුමිය බාල බොලඳ තැනක් අල්ලගෙන දඟලන්න හැදුවට අද එක්සත් ජාතික පක්ෂ පාක්ෂිකයෝ පවා කියන්නේ රනිල් වික්‍රමසිංහ, මෛත්‍රීපාල සිරිසේන, සජිත් ප්‍රේමදාස හිටියානම් අද කියන්නේ ඕක නෙමෙයි කියලා කියනවා. ඇමරිකාවේ ලක්ෂයක් මැරිලා. අපේ දහදාහක් වුණත් මහලොකු ගාණක් නෙමෙයි. ඇමරිකාව බේර ගන්න බැරිව ඉන්නවා. ලංකාව ගැන කවර කතාද, අද එක්සත් ජාතික පක්ෂයේ පාක්ෂිකයන්ගේ මතය ඒක.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ඔබතුමා මම කතා කරපු දේට ප්‍රවෘත්තියක කොටසක් ගෙනල්ලා මට පෙන්නුවට මම ඉදිරිපත් කරන්නේ මෙපමණ ප්‍රමාණයක් ඉන්නවා කියන එක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් තව උඩට ගිහින් බලන්න දෙවැනි වාර්තාවත් ඇති. දෙවැනි ආසාදිතයා වාර්තා වුණ දවස ඇති.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මම කිවුවේ සෞඛ්‍ය සේවා වලින්. මම ඒක සභාපතිතුමාට ඔප්පු කරලා පෙන්වන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමිය අභියෝගයක් කරනවද,

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මාර්තු 12 වෙනිදා වෙනකොට ලංකාවේ 11 දෙනෙක් හිටියා කියලා මම පෙන්වනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නොවෙනවානම් ඉල්ලා අස්වෙනවාද,

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** නෑ. මම ඉල්ලා අස් වෙන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමිය කියන්න දේවල් නැත්නම් බොලඳ දේවල් කියන්න එපා. කියන්න දේවල් නැතුව බොරු කියන්න එපා. අපි දෙයක් කතා කරන කොට සාරාංශ බලල නෙමෙයි කතා කරන්නේ. ඒ විදියට චෝදනා කරන එක වැරදියි. හරි ඊළඟ එක කියන්නකෝ.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මම සභාපතිතුමාට භාණ්ඩ බෙදාදීම ගැන කතා කරගෙන යද්දි අර අවස්ථාවේ ප්‍රවෘත්තියක කොටසක් ගෙනල්ලා පෙන්වලා ඒක වෙනත් අතකට යොමු කරා. ඒ සම්බන්ධව තමයි ආපහු කතා කරේ. නමුත් සභාපතිතුමා මම කතා කරන්න ආපු කාරණය කතා කරන්න නොදී දීර්ඝ කරේ ඔබතුමාගේ තර්ක කිරීමෙන් හා අනිත් මන්ත්‍රීවරු මැදිහත් වෙලා කතා කරපු නිසා. නමුත් මම අහන්නේ සභාපතිතුමා මගේ ගම් ප්‍රදේශයේ භාණ්ඩ බෙදා දීමේදී කතා කරලා කිවුවා වෙන මන්ත්‍රීලා නැතත් ඔබතුමා හරි ඇවිල්ලා මේ භාණ්ඩ ටික හරියාකාරව ගමේ බෙදලා දෙන්න කියලා. මේක සභාවේ වාහනයක් හරි යොදවලා ගෙයින් ගෙට ගිහින් හරි බෙදන්න ගමේ පන්සලෙනුත් බෙදුවේ මේ ආකාරයට. එක්කෝ කොට්ඨාශ මන්ත්‍රීතුමා ලවා හරි මේක ගෙයින් ගෙට බෙදලා දෙන්න. මිනිස්සු එක් රැස් කරන්න එපා. ඇඳිරිනීතිය වෙලාවක්, අනාරක්ෂිත වෙලාවක්, අපි වගකීමක් ගන්න ඕන වෙලාවක්. සභාපතිතුමා ඇත්තට මේ වෙලාවේ ඔබතුමා මාත් එක්ක එකඟතාවයකට ආවා ඒ කරණු කාරණා වැරදියි කියලා මිනිස්සු එක්රැස් කරා නම්. පොලීසියේ නිලධාරී මහත්වරු ඇවිල්ලා ඒ මිනිස්සුන්ව යවලා තියෙනවා. මගේ ගෙදරටත් ඇවිල්ලා කිවුවා. අපි එකතු වුණා කිවුවා 50ක් විතර. නමුත් පොලීසියෙන් ඇවිත් අපිව ගෙවල්වලට යැව්වා කිවුවා. ප්‍රශ්නයක් වුණා කිවුවා එතන. හිටපු පළාත් සභා මන්ත්‍රී මාදුගොඩ මැතිතුමත්, එතනට පැමිණිලා තියෙනවා. අපේ සභාවේ සභාපතිතුමා එතන ඉඳලා නැහැ. එතන ඉන්න ඕන ඔබතුමා. නමුත් ආවේ වෙන කෙනෙක්. මට හිතුනා මොකද මේ කියලා ඒ අවස්ථාවේදී. ගමේ මිනිස්සු එක්රැස් කිරීම අනුමත කරනවාද මේ අවස්ථාවේ භාණ්ඩ ලබා ගැනීම සඳහා. සමහරු මුඛ ආවරණයක්වත් පැළඳලා නැහැ. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා දැනුම් දීලා තිබුණා රටේ ආරක්ෂාව ගැන. මිනිස්සු මීට වඩා සැලකිලිමත් වෙන්න ඕන. මුඛ ආවරණයක් පළඳින්න කියලා තියෙනවා ඒ වෙලාවේ නීතියේ වචනයට ගරු කරලාවත්. අපේ මිනිස්සු අනාරක්ෂිත තත්ත්වයට පත් කිරීම සම්බන්ධයෙන් මම

කණගාටුවට පත් වෙනවා. අන්න ඒකයි මම ඔබතුමාට කිවුවේ. දුර ප්‍රමාණය නැහැ. මුඛ ආවරණ නැහැ. තැන් තැන් වල කතා කර කර හිටියේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමියට මේක අලුත් දෙයක් හින්දා මේක මහා ලොකු දෙයක්. මිනිස්සු එහෙමයි. මම වැරැද්දක් කියන්නේ නැහැ මන්ත්‍රීතුමිය. මිනිස්සුන්ට නොමිලේ දෙයක් දෙනවා කියලා ආරංචි වුණ ගමන් ඔය නීති ගැන බලන්නේ නැහැ. ඔබතුමිය බලන්න සල්ලිවලට ගන්න තිබුණ තැන්වල පෝලිම තිබුණේ කොහොමද කියලා,

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ඔබතුමා හරි, නිවැරදියි. මිනිස්සුන්ට දෙයක් නිකං දෙනවා කිවුවහම එහෙමයි. අපි එදා සභාවට රැස් වුණ වෙලාවේත් කතා කරේ ඒක. මිනිස්සුන්ට දෙයක් දෙනවා කිවුවහම එන මනුස්සයත් එනවා. අල්ලපු ගෙදර මනුස්සයත් එනවා ආරංචි වෙච්ච මනුස්සයත් එනවා. ඒක බේරගන්න බැහැ මොන ආකාරයටවත්.

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ-** පොලීසිය දැනුවත් කිරීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. පෝද්දල පොලීසිය දැනුවත් කිරීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ඇයි මෙහෙම කෑ ගහන්නේ කියලා අහන්න. මම එතුමා කතා කරන කොට කෑ ගහන්නේ නෑනේ. මොකද අයිතියක් තියෙනවා කතා කරන්න. ඒක නිසා වැරදි දෙයක් නෙමෙයි මම කතා කරේ. ඔබතුමා නිවැරදියි එතනදී. ඔබතුමා, අපි එකට එකතු වෙලා දෙයක් කරන කොට අපි කිවුවා, මිනිස්සුන්ට දෙයක් නොමිලේ දෙයක් දෙනවා කිවුවහම දෙමළ පත්තරේ ගන්න හරි එක්රැස් වෙනවා අනවශ්‍ය මනුස්සයොත්. රජයේ සේවකයෝද කවුද කින්ද මන්ද නැහැ අන්තිමට. දෙන්න ඕන මනුස්සයට දී ගන්න බැරි වෙනවා. ඒක ඇත්ත කතාවක්. ඒක නිවැරදියි. මම කියන්නේ ඒකයි. අපේ කොට්ඨාශයේ මන්ත්‍රීවරු තුන්දෙනෙක් ඉන්නවා. මම සන්තෝෂ වෙනවා ටෙක්ලා මන්ත්‍රීතුමිය ගැන. එතුමියට මම කතා කරලා විස්තර දැන ගත්තා. මම සතුටු වුණා ඇත්තටම. ඒක ලස්සනට බෙදලා තියෙනවා. අඩුපාඩු නැහැ. ඒක හරි. අපේ කොට්ඨාශවල ඒ දුර්වලතාවය තියෙනවා. පවුල් තියෙනවා ලැබිච්ච නැති. මම සභාවට ආවා මගේ ඉන්ධන දීමනාව ලබා ගන්න. එදා මට හම්බ වුණා සභාවෙන් හාල් පාර්සලයක්. ඇත්තටම මම ඒක එවෙලෙම ගෙනිහින් ඒ ගෙදරට භාර දුන්නා. මම කණගාටුව ප්‍රකාශ කරනවා සභාපතිතුමා. සභාපතිතුමාගේ වැරැද්ද නෙමෙයි මෙතන තියෙන්නේ. මේක ක්‍රියාත්මක වීමේදී සිද්ධ වෙච්ච දෝෂයක්. ඔබතුමා ඒක ගැන සැලකිලිමත් වෙලා බලන්න මේ වගේ ව්‍යසන අවස්ථාවලදී. ඔබතුමා මට පැවසූ විදියට මම ඒකට ආධුනික වුණාට ඔබතුමාටත් ඒක ආධුනිකයි. මොකද මීට කලින් ලංකාවට කොරෝනා තියා ඒ වගේ වෛරසයක්වත් ඇවිත් නැහැ. අපි මුහුණ දීලා නැහැ. අපි ඔක්කොම මේකට ආධුනිකයෝ. අපි පුරුදු විය යුතුයි. මේ වගේ අවස්ථා තව ඉස්සරහට අපිට එන්න පුළුවන්. මොන වගේ ව්‍යසනයක් අපිට වේවිද දන්නේ නැහැ. ගංවතුර පීඩාවට අනන්තවත් ලක් වෙලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තව ඕනනම් සාධකයක් දෙන්නම්. මේ තියෙන්නේ 2020 මාර්තු 14 සෙනසුරාදා වාර්තාව. ඔබතුමිය කියලා තිබුණේ මාර්තු 12. මේ තියෙන්නේ මාර්තු 14 සෙනසුරාදා එක. "කොරෝනා ආසාධිතයන් තවත් තුන් දෙනෙකු හදුනා ගැනේ. රෝගීන් ගණන 05 ට නගී." මේවත් බොරුයි කියලද කියන්නේ. මම අහන්නේ මේවත් බොරුයි කියලද කියන්නේ.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ඒක ඇත්ත වෙන්න ඇති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමිය කොහොමද එහෙමනම් කියන්නේ මාර්තු 12 වෙනකොට 11 දෙනෙක් හිටියා කියලා. ඔබතුමිය ගෙනාපු තර්කයේ හැටි මෙන්න. බොරුනේ. ලංකාදීප පුවත්පත වාර්තා කරනවා මාර්තු 14 සෙනසුරාදා වෙනකොට 05 දෙනෙක් ඉන්නවා කියලා.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මම 100% ක් හරියි කියන්නේ නැහැ. 100% ක් වැරදියි කියන්නෙත් නැහැ. දැන් වැඩක් නෑ ඒක. මම කිවුවේ රටේ ඒ වෙලාවේ ගනිපු තීරණය සම්බන්ධව. මම කිවුවේ සභාපතිතුමා මේකේ ඇත්ත කතාව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමිය කියන එක බොරු. ඔප්පු කරන්නේ කොහොමද ඔබතුමිය. මෙච්චර සාධක තියෙද්දි මේවා බොරුයි කියනවා නම් මට තේරෙන්නේ නෑ ඔබතුමිය කියන එක ගැන.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** සභාපතිතුමා සැරින් සැරේ විරුද්ධ වෙන නිසා මම කියන්නේ. කොරෝනා රෝගීන් ප්‍රමාණය ගැන නෙමෙයි කතා කරේ. රට අනාරක්ෂිත තත්ත්වයට

පත් කරා. නාම යෝජනා දෙන කොට රටේ කොරෝනා රෝගීන් ප්‍රමාණයක් හිටියා කියලා මම කියන්නේ. ඔබතුමා ඒක වෙන වෙන කාරණා හරහා වෙන පැත්තකට අදිනවා. ඒකයි මම කිවුවේ. ලංකාවේ අවදානමක් තිබුණා කියලා ඒ වෙලාවේ. අපේ කලින් සභාව වෙලාවේදීත් ලංකාවේ කොරෝනා රෝගීන් හිටියා. නමුත් ඇඳිරිනීතිය ලංකාවේ ක්‍රියාත්මක වුණේ නැහැ. අන්න ඒකයි මම සඳහන් කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමිය ඒක නෙමෙයි කරේ. ඔබතුමිය කරේ වැරදි අර්ථකථනයක් දක්වලා ආණ්ඩුව අසමත්, 12 වෙනිදා වෙන කොට කොරෝනා රෝගීන් 11 ක් ඉන්නවා කියලා කිවුවා.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මගේ වචන වෙනස් කරන්න හදන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ආණ්ඩුව අසමත් 12 වෙනිදා වෙනකොට කොරෝනා රෝගීන් 11 ක් හිටියා කියලා.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ඔබතුමාට මම පැහැදිලිව කියපු දේ ගැන ඔබතුමාගේ තේරුම් ගැනීමේ හැකියාව තමයි ඒක.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** 19 වෙනිදා වෙනකොට කොරෝනා රෝගීන් 26ක් හිටියා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක නෙමෙයි මම අහන්නේ. 12 වෙනිදා වෙනකොට රෝගීන් 11ක් කොහෙද හිටියේ.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** කිසිම ඇඳිරිනීතියක්, කිසිම දෙයක් රටේ නොදා මෙච්චර කොරෝනා රෝගීන් ප්‍රමාණයක් රටේ වැඩි වුණා කියන එක තමයි සභාපතිතුමා මගේ අදහස වුණේ. ඒක සඳහන් කරගෙන මම මෙතනට ආවේ ඒක ගැන දැනුවත් කරන්න. මගේ අතින් වැරැද්දක් වුණා වෙන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමිය ඊළඟ දේවල් ගැන කතා කරන්න. ඔබතුමිය කරපු පළවෙනි ප්‍රකාශය ෆේල්. ඒක පිළිඅරගෙන ඉතුරු ටික කරන්න.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** කරුණාකරලා සභාපතිතුමා ඒ ෆේල් කියන වචනය සභා වාර්තාවටත් ඇතුළත් කරන්න. ඒ ෆේල් කියන එක ඇතුළත් කරන්න. ඊළඟට මම ඔබතුමාට සඳහන් කරද්දි මැදින් පැනගෙන ආවා. ඊළඟට දූරකථනයක් පෙන්න ගෙන ආවා කමක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම තමයි අපේ සභාව කොයි තරම් දියුණුද කියලා බලන්න. ඔබතුමිය අවශ්‍ය දේ විතරක් කතා කරන්න.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මේ ආණ්ඩුව ගෙන යන වැඩපිළිවෙල ගැන ඔබතුමිය සතුටු නැද්ද.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** සතුටුයි. මම කියන්නේ මම කියපු කාරණය ඔබතුමාලා හරියට තේරුම් නොගත්ත එක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමිය කියන ඔක්කොම හරි. කියන්නකෝ. එකින් එකට උත්තර දෙන්නම්. ඔබතුමිය කියන්නකෝ.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** සභාපතිතුමා කණගාටුවට කාරණය නම් දැනට කතා කරේ භාණ්ඩ බෙදා දීම සම්බන්ධව. ටෙක්ලා මන්ත්‍රීතුමිය, ඔබතුමත් ඉන්න හපුගල කොට්ඨාශය ගැන මම සතුටු වෙනවා. වක්වැල්ල කොට්ඨාශය ගැන කණගාටුවට පත් වෙනවා. ඔබතුමාට මම ඊට කලින් දවසෙත් කතා කරලා කිවුවහම සභාපතිතුමා කිවුවා මට කතා කරන්නම් කියලා.

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ-** අපි සතුටුයි පොලීසියට පැමිණිලි කරපු එක ගැන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ මන්ත්‍රීතුමිය මෙහෙමයි. මම ඇත්තටම කොට්ඨාශ දෙකක් පිළිබඳව කණගාටු වෙනවා. ඒ කොට්ඨාශවල මන්ත්‍රීවරුන්ට ඒ චෝදනාව එල්ල කරන්න එපා. එකක් නරාවල කොට්ඨාශය. අනෙක් එක කිතුලම්පිටිය කොට්ඨාශය. ඒ මන්ත්‍රීවරු දෙන්නාගෙන් අඩුපාඩුවක් වුණානම් ඒක ඒ මන්ත්‍රීවරු දෙන්නාගේ අඩුපාඩුවක් නෙමෙයි. ඒ වගේම තමයි සුගත් මන්ත්‍රීතුමාගේ වැලිපිටිමෝදර කොට්ඨාශය. ඒ මන්ත්‍රීවරු තුන්දෙනාම බොහොම

අපහසුතාවයට පත් වුණා පාර්සල් 650 බෙදන්න. අඩුපාඩුවක් වුණානම් ඒක හිතාමතා කරපු අඩුපාඩුවක් නෙමෙයි. ඒක ඒ මන්ත්‍රීවරු තුන්දෙනාගේ අඩුපාඩුවකුත් නෙමෙයි කියලා ප්‍රකාශ කරන්න ඕන.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මම කිවුවේ මගේ කොට්ඨාශය ගැන. ඇත්තටම හැම කොට්ඨාශයකටම මහජන නියෝජිතවරයෙක් ඉන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම හිතනවා වක්වැල්ල කොට්ඨාශයේ දෙන්න ඕන සියලු දෙනාට ලැබුණා කියලා. එහෙම නොවුණානම් ඔබතුමිය මට ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ඒක මම සභාපතිතුමාට අනිවාර්යයෙන් ලබා දෙන්නම්. අඩු ආදායම්ලාභී, සමෘද්ධි හිමි පවුල් තියෙන නිසා. මට මේ අවස්ථාවේ තව දෙයක් සඳහන් කරන්න ඕන. මෙම භාණ්ඩ අඩු ආදායම්ලාභී නැති, සමෘද්ධි නැති ව්‍යාපාර කරන පුද්ගලයන්ටත් ලැබිලා තියෙනවා කියන එකත් මම සඳහන් කරලා ඔබතුමාට ලබා දෙන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මගේ කොට්ඨාශයේ බෙදපු එක ගැන මම 100% ක් සහතික වෙනවා ඒක නිසි ආකාරයෙන් බෙදුණා කියලා. මම හිතනවා අනෙක් මන්ත්‍රීවරුත් එහෙම කරන්න ඇති කියලා. අඩුපාඩුවක් නොවුණා කියලා අපි හිතන්න හොඳ නැහැ. සමහර විට මගේ කොට්ඨාශයේ වුණත් වෙන්න පුළුවන්. මොකද රාජ්‍ය නිලධාරීන් මේකට සම්බන්ධ නොවන කොට, රාජ්‍ය නිලධාරීන් මඟ අරින කොට, මටවත් ටෙක්ලා මන්ත්‍රීතුමියටත් දැනුමක් නෑ සියලු රජයේ සේවයෝ ගැන. මුළු බෝපෙ පෝද්දලම ඒ වෙන කොට කොරෝනා ව්‍යසනයට මුහුණ දීලා හිටියේ. එතනදී රාජ්‍ය සේවකයන් පවා මේක ගන්න මට්ටමට ආවානම් අපිට පරීක්ෂා කර ගන්න ක්‍රමයකුත් නෑ.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ඔබතුමා එතනදී නිවැරදියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මගේ අදහස මේ බලප්‍රදේශයේ පවුල් 17,000 ක් ඉන්නවා. පවුල් 17,000ම කොරෝනා ව්‍යසනයට ලක්වෙලා හිටියේ. ඒ පවුල් 17,000 ටම දෙන්න ඕන.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ඇත්තටම කියනවානම් කාරණය මගේ මහත්තයා සෞඛ්‍ය සේවා එකේ අත්‍යාවශ්‍ය නිලධාරියෙක් විදියට කොරෝනා ආව දවසේ ඉඳලා අද වෙනකම් වැඩ කරනවා. අපිට ඇඳිරිනීතිය දාපු වෙලාවේ ගෙදරට බඩු ටික ගේන්න විදියක් නැහැ මොකද දිගටම වැඩ නිසා කඩේට යන්න විදියක් නැහැ. ඔබතුමාට මම තව කාරණයක් පෙන්නුවේ. ග්‍රාම නිලධාරීන් අපිට නැහැ. සමෘද්ධි නියාමකවරු අපිට නැහැ. කිසිම කෙනෙක් අපිට නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලූණු ටික කුණු වෙනවා බෑග් වල දාලා නිසා. ඒ නිසා මට ක්ෂණයෙන් ඒ ටික බෙදන්න වුණා.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ඔබතුමාගේ වරද නෙමෙයි මම කියන්නේ. අපේ කොට්ඨාශයේ මන්ත්‍රීතුමාට කෝල් කරා. දිගින් දිගට වෙලාව ඇහුවා. මොකක්ද අවශ්‍ය ඇහුවා. හරි කියන්නම් කියලා ෆෝන් එක තිබ්බා. නමුත් කිසිම වෙලාවක තොරතුරක් ලබා දුන්නේ නැහැ මට. මම ඒක ගැන සභාපතිතුමාට දැනුවත් කරා මෙන්න මෙහෙම කරා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** උක්වත්තට මම ගියා. උක්වත්තේ බෙදන කොට ප්‍රියන්ත මන්ත්‍රීතුමා හිටියා.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මම සභාපතිතුමාට කී පාරක් කතා කරාද, ඒ සම්බන්ධයෙන්. කිසි කෙනෙක් ප්‍රතිචාරයක් දැක්වූයේ නැහැ.

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ලැබිය යුතු අයට ලැබිලා තියෙනවා. නැති කට්ටිය ඉන්නවා නම් කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා වගකීමෙන් කියනවා සියලුදෙනාට දුන්නා කියලා. ලැයිස්තු තියෙනවා කියනවා. ඔබතුමියගේ විශේෂ අවධානය යොමු කර ගන්න කියනවා ඇති නොලැබුණා කියලා. නොලැබිච්ච කෙනෙක් ඉන්නවානම් කියන්න.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** උක්වත්ත ප්‍රදේශය නම් මම දන්නේ නැහැ. මම කියන්නේ වක්වැල්ල ප්‍රදේශය ගැන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- හැබැයි මේක ප්‍රකාශ කරන්න ඕන. මම කියනවා මා ඇතුළු සියලු මන්ත්‍රීවරු මේක පක්ෂ පාට භේදයකින් තොරව සද්භාවයෙන් කරා කියලා. ඒකට කොයි වෙලාවකවත් පක්ෂයක් බැලුවේ නැහැ.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය** ඃ- අපිට ඒ දේ බෙදුවේ නැහැ කියන එක නෙමෙයි කියන්නේ. නැති මිනිහට ඒ වෙලාවේ ඒ දේ ලබා දිය යුතුයි සභාපතිතුමා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමනි, දැන් මේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහනාධාර බෙදීම ගැන දිගින් දිගටම කතා කරා. නමුත් ඔබතුමා පළවෙනි රැස්වීමේදී අපි සියලුදෙනා කැඳවලා එතන ඒකමතික තීන්දුවක් ගත්තා. ඒක ඉතාම හොඳයි. අපි සතුටු වුණා ඒ පිළිබඳව. නමුත් ඔබතුමා දෙවැනි සැරේ ගනිපු තීන්දුවලදී යම් යම් අඩුපාඩු සිද්ධ වෙලා තියෙනවා. කලේගාන දකුණ ප්‍රදේශයේ මේවා බෙදාගෙන යනකොට මට සමහර අය කතා කරලා කිව්වා මේක අපිට ලැබෙන්නේ නැහැ මේ විදියේ තත්ත්වයක් මෙතන ඇති වෙලා තියෙන්නේ කියලා. ඒ කියන කොට ඔබතුමන්ලා බඩු ගෙනල්ලා ඉවරයි. එතකොට මම එවෙලේම කතා කරා අක්මීමණ සමුපකාර සංගමයේ සභාපතිතුමාට. කතාකරලා මම කිව්වා මට පෞද්ගලිකව බඩු ටිකක් බෙදන්න ඕන ඒ නිසා මට අහවල් අහවල් බඩුත් එක්ක බඩු මලු ඕන කියලා. මට බඩු මලු ටික පාර්සල් කරලා දුන්නේ සැමන් හා පරිප්පු සමඟ මම කියපු බඩු ටිකත් එක්ක. ඒ පාර්සල් ටික මම ගෙදර වාහනයෙන් අරගෙන ඇවිල්ලා ඒක ලැබුණේ නැහැ කියපු පිරිසට ඒ ටික බෙදලා දුන්නා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඔබතුමා හොඳ සේවයක් කරලා තියෙනවා ඒකට ස්තුතියි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා** ඃ- ඒ වෙලාවේ කහ කොහේවත් තිබුණේ නෑ. කහ තිබුණා අක්මීමණ සමුපකාර සමිතියේ. මම කහ ග්‍රෑම් 50 ගාණේ දැම්මා හැම මල්ලටම. මෙන්න මෙතන වැරැද්ද වුණේ. දෙවැනි සැරේ බඩු ගේන්න යනකොට කලින් කැඳවපු කණ්ඩායමේ යම් කොටසක් ගෙන්වා ගත්තානම් මේ අදහස් හුවමාරු වීම තුළින් මීට වැඩිය ඵලදායි දෙයක්, ඵලදායි විදියට කර ගන්න තිබුණා. මේ දෝෂාරෝපණය එතකොට 70% කින් විතර අඩු වෙනවා. ඒ නිසා මෙතන පොඩි අඩුපාඩුවක් වෙලා තියෙනවා. ඒ අඩුපාඩුව මේක කියලා තමයි මම දකින්නේ. ඒක නොදැනුවත් වීම නිසා වෙන්න ඇති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඇත්තටම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා ඔබතුමාගේ පුද්ගලික මුදලින් 25 දෙනෙකුට හරි බඩු බෙදීම ගැන. නමුත් සඳහන් කරන්න ඕන මම අක්මීමන විවිධ සේවා සමූපකාර සමිතියේ සභාපතිතුමාට කතා කරා. එතුමා කිව්වා එච්චර බඩු ප්‍රමාණයක් ලබා දීමේ හැකියාවක් නැහැ කියලා. ඕන නම් අහන්න පුළුවන්. එතුමා කිව්වේ පොඩි ප්‍රමාණයක් නම් පුළුවන් ඔච්චර ප්‍රමාණයක් නම් බැහැයි කියලා එතුමා සඳහන් කරා. තව කරුණක්, ඔබතුමාලා එක්ක තියෙන සම්බන්ධතාවය, ඔබතුමාලාගේ දේශපාලන මතවාදය ක්‍රියාත්මක වෙන නිසා ඔබතුමාලාට කරන එක අපිට කරන්නේ නැහැ ඔබතුමා කරපු කාර්ය පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමනි, මම මේ කාරණාව මතු කරන්න බලාපොරොත්තු වෙනවා යෝජනාව නැවත ගන්නවා කියපු නිසා. මට මෙහෙම කාරණයක් කියන්න තියෙනවා. ඒක මූල්‍යමය රෙගුලාසි සම්බන්ධ කාරණාවක්. මේ මුදල් වියදම් කළ යුතු රාමුවක් තියෙනවා. රාජ්‍ය යාන්ත්‍රණය තුළින් මුදල් වියදම් කළ යුතු ක්‍රමවේදයක් තියෙනවා. ඒ ක්‍රමවේදය ඇතුලේ වියදම් කළ යුතුයි. නැත්නම් මේකේ යම් අවස්ථාවක විගණනයට ලක් වුණොත් සභාවේ මේකට සම්බන්ධ වුණ මන්ත්‍රීවරුන්ට බලපානවා. අනුමැතිය දීපු අයට බලපානවා. අපි අපේ වැටුපවත් පෞද්ගලික ප්‍රයෝජනයට ගන්නේ නැතුව වැඩ කරන මිනිස්සු. මේකට මගේ රස්සාවේ පඩියෙන් හරි ගෙවන්න වෙනවා මේ අනුමැතිය නිවැරදි නොවුණොත්. ඒ නිසා මේකේ නිවැරදිභාවය සඳහන් කරගෙන යන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මන්ත්‍රීතුමා මම ඒකට උත්තරයක් දෙන්නම්. අපි මුලින්ම ඇත්තටම ස්තුතිවන්ත වෙන්න ඕනේ මේ අදහස ලියනගේ මන්ත්‍රීතුමාගේ. ඒකත් මම කියන්න ඕන. කොච්චර පහුගිය කාලේ මත ගැටුම් තිබුණත් ලියනගේ මන්ත්‍රීතුමා තමයි මේක කරමු කිව්වේ. මම එවෙලේ කිව්වා මන්ත්‍රීතුමා අපිට මේක නිකං බෙදීමේ හැකියාවක් නැහැ කියලා. එතුමා කිව්වා පවුල් දහයකට, පහළොවකට හරි අපි මැදිහත් වීමෙන් දෙනවා කියලා. ඊට පස්සේ තමයි අනෙක් මන්ත්‍රීවරු මේක මතු කරේ. මගෙත් ඔළුවේ තිබුණේ නෑ මෙහෙම දෙයක් අපේ සභාවෙන් කරන්න. මේක අන්තිමට නරක නාමයක් විතරයි. මම කොමසාරිස්තුමාට දුරකථනයෙන් කතා කරලා කිව්වා මෙහෙම අදහසක් තියෙනවා අපේ මන්ත්‍රීවරුන්ගේ. මේකට මොකද කරන්නේ කියලා. කිසි ප්‍රශ්නයක් නැහැ සභාපතිතුමා පනතේ අහවල් වගන්තියේ මේක තියෙනවා වසංගතයක් ආපු

වෙලාවේ ඔබතුමාට ඒ බලය තියෙනවා මේකට ඉක්මනින් ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්න කිවුවා. අපි මේ දේවල් කරන කොට එකින් එක ගණකාධිකාරිතුමාගෙන් ඇහුවා. මේකේ ඉන්න සමහර මන්ත්‍රීවරු ගැන මම හොඳට දන්නවා. මේකේ හිටපු සභාපති ඩික්සන් රාජා මැතිතුමා ගැන මම හැම වෙලාවෙම කියනවා. ළඟ ඉඳලා රු. 50,000/- චෙක් එක ලියලා ඒ මිනිහට කෙලියා මේකේ ඉන්න සමහර මන්ත්‍රීවරු. එහෙම සභාවක්නේ මේක. ළඟ ඉඳන් රු.50,000/- චෙක් එක ලියලා හේමකුමාර මැතිතුමාගේ වප් මඟුල් උත්සවයට, අන්තිමට ඒ මිනිහට ගැහුවා රු. 50,000/- ක් සභාවෙන් ගත්තා කියලා නමට. එහෙම සභාවක්. මේක නොදැන යනවා නම් මන්ත්‍රීවරු, උප සභාපතිතුමා මම අඥබාලයෙක් වෙන්න ඕන. මම දන්නවා මේකේ සද්භාවයෙන් මොනවා කරත් පෙත්සම නවතිනවා ගිහිල්ලා අතන. ඒක මම නොදන්නවා නෙමෙයි මන්ත්‍රීතුමා. අදටත් මගේ හෘද සාක්ෂිය අනුව සතුටු වෙනවා ගාල්ල දිස්ත්‍රික්කයේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව විතරයි අඩු ආදායම්ලාභීන් 8000ක් වෙනුවෙන් ඒ වගේ අපිට පුළුවන් සහනයක් දුන්නේ. ඒක ගැන මම ඇත්තටම සතුටු වෙනවා. මම දන්නවා මේකෙන් කුණු ගොඩක් එන බව. ඒක හින්දා මම දැනටත් කියන්නේ මේක ගැන වගකීම මම ගන්නවා. කොයි වෙලාවකවත් නිලධාරීන් පිට දාලා ලේකම් අමාරුවේ දාලා පැනලා යන මිනිහෙක් නෙමෙයි. එතුමා මේකට මුලින් අකමැති වුණා ලියනගේ මන්ත්‍රීතුමා කියපු විදියට. නමුත් එතුමා මේකේ වැඩේ කරගෙන යද්දි එතුමා කරපු කැප කිරීම මේ තරම් හැල්ලුවට ලක් කිරීම පිළිබඳව මම කණගාටු වෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මට මතු කරන්න ඕන මේ කාරණය. රජයේ මුදල් වියදම් කිරීමේ නීත්‍යානුකූලභාවය, නිවැරදිභාවය සම්බන්ධව හා මුදල් රෙගුලාසි වලට අනුකූලද කියලා වගකියන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිත් එක අනෙකුත් මන්ත්‍රීවරු සියලු දෙනා දැන ගන්න ඕන. මේකත් කියන්න ඕන. දැන් කියනවා ලේකම්තුමා කිවුවා කියලා සභාපතිතුමා හොරකම් කරා කියලා. මම ඒක හොඳටම දන්නවා. අබේසේකර මන්ත්‍රීතුමා, ලේකම්තුමාට කතා කරලා එකක් කියනවා. මට කතා කරලා කියනවා ලේකම් හොරකම් කරනවා කියලා. ලේකම්ට කතා කරලා කියනවා මම හොරකම් කරනවා කියලා. මම මේක නොදැන ඉන්නේ නෑ මන්ත්‍රීතුමන්ලා. මේකේ අපි දෙන්නා කොටවලා සභාව ගෙනියන වැඩපිළිවෙල කඩාකප්පල් කරන්න තමයි අබේසේකර මන්ත්‍රීතුමා කොයි වෙලෙත් උත්සාහ දරන්නේ. එහෙමනම් මෙච්චර බනිනවා, ලේකම්තුමාට කෝල් කරනවා. මෙච්චර මට බනිනවා මට කෝල් කරනවා. මට කෝල් කරලා කියනවා ලේකම් හොරා කියලා. ලේකම්ට කෝල් කරලා කියනවා සභාපති හොරා කියලා. කිවුවේ නැද්ද ඔබතුමා. ඔබතුමා ඒ වගේ කසඩ මන්ත්‍රීවරයෙක්.

**(තේ පානය සඳහා සභාව කල් තබන ලදී.)**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** න්‍යාය පත්‍රයට යමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** න්‍යාය පත්‍රයට ගිහින් කතා කරන්නේ මේ. ඔබතුමා වෙන වෙන ඒවාට ගිහින් වටේ ගියා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට නවත්වපු වෙලාවේ දුන්නානේ. අනේ මන්ත්‍රීතුමා ඇති.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** නවත්වපු වෙලාවක් නැනේ. ඔබතුමා විස්තර කරගෙන එනකොට තේ බොන්න නැවැත්තුවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද වැඩිම වෙලාවක් කතා කරේ ඔබතුමා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** නැහැ. බලන්න අරගෙන. මට වැඩිම වෙලාවක් වුණත් කතා කරන්න පුළුවන් අදාළ කාරණය සම්බන්ධව. මේ ගෙවීම සම්බන්ධ මූල්‍ය කාරණා තියෙනවානේ. ඒවා කතා කරන්න අවසර මම ඉල්ලන්නේ. මම බෙදා හැරීම සම්බන්ධව විවේචන නෙමෙයි කරන්නේ. අපිට හැමදේටම විරුද්ධ වෙන්න බැහැ. ඒක නෙමෙයි ප්‍රශ්නය තියෙන්නේ. මේ කාරණා නිවැරදි වෙන්න ඕන කියන එක. දැන් මට මතු වෙලා තියෙන කාරණය තමයි ගරු සභාපතිතුමා, ලේකම්තුමත්, අවදානයෙන් ඉන්න මේකට අදාළව. මේක නිවැරදි කර ගන්නේ නැතුව අනුමත කරන්න බැහැ. අපි යම් මිලදී ගැනීමක් කරනකොට අදාළ සම්බන්ධ කාරණා කිහිපයක් තියෙනවා. ඒ මිලදී ගැනීමේ ක්‍රමයන් 100% ක් හදිසි අවස්ථා තත්ත්වයකදී බලන්නේ නෑ. ටෙන්ඩර් කමිටු ඒවා. ඒවා සමහර විට බැරි වෙනවා. එතකොට අපිට මිල ගණන් කැඳවලා වහාම කරන්න පුළුවන් ක්‍රමවේද තියෙනවා. මේක කරලා ඉවර වෙලා තියෙනවා. බරපතල නීතිමය කාරණයක් මම මතු කරන්නේ. රටේ සමහර අයිතමයන් සම්බන්ධයෙන් පාලන මිලක් ක්‍රියාත්මක වුණා. ඒ පාලන මිල ක්‍රියාත්මක නොකරපු කට්ටියට නීතිමය ක්‍රියාමාර්ග ගත්තා. උසාවි ගෙනිච්චා. නඩු දැම්මා. එතකොට දැන් මේ

පාලන මිලට යටත් නොවන සීමාවන් ඇතුළේ මිලදී ගැනීම් කරලා තියෙනවා නම් ඒක සම්බන්ධව යම් ප්‍රශ්නයක් ආවොත් වග කියන්න අපිට පෞද්ගලිකව බැහැ. ඒකයි මම මේ කියන්නේ. එතකොට ඒ පාලන මිල සම්බන්ධව තියෙන ඒවාට අනුමැතිය ගන්න ඕන. ඒක අරගෙන ඕන මේ අනුමැතියට දාන්න. නැත්නම් කොහෙමද අපි මේකට වග කියන්නේ. රටේ පාලන මිලක් ක්‍රියාත්මක වුණා. ඒ අයිතමයක් අපේ බෙදාහැරීමට ඇතුළත් කරලා තියෙනවා. එතකොට ඒ පාලන මිලට ගන්න බැරි වුණා. ඒක ගැසට් කරලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ඔය කියන සිල්ලර තත්ත්වය එදා තිබුණේ නැහැ. එහෙමනම් ඉතිං මේක නොකර ඉන්න ඕන. පාලන මිලට කොහේවත් තිබුණේ නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒවා නැත්නම් ඒක අනුමත කර ගන්න අපේ අනුමැතිය ගන්න ඉස්සර වෙලා. මම කියන්නේ ඒ කාරණාව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට දැන් තේරෙනවා ඔබතුමා ලියනගේ මන්ත්‍රීතුමා කියපු තැනට තමයි දැන් වටෙන් වටෙන් ඇවිත් තියෙන්නේ. ඔය තියෙන මට්ටම කරන්න තිබුණේ නැහැ. පාලන මිල කීයද, එහෙම නම් ඉතිං අබේවික්‍රම ෆුඩ්සිටියේ, විජිත ෆුඩ්සිටියේ ගණන්වලට නොගෙන මේ වැඩේ අත ඇරලා දාන්න ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මට ප්‍රශ්නය තියෙන්නේ ඒක නෙමෙයි. එවැනි ක්‍රියාමාර්ගයකට අපි යන කොට ගත යුතු ක්‍රමවේදයක් තියෙනවා. එහෙමනම් ඒකට අවසර ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද එහෙමනම් ඔබතුමා දැන් කියන්නේ. අපි ගන්න තීරණය කරේ විජිත ෆුඩ්සිටි එකයි, අබේවික්‍රම ෆුඩ් සිටි එකයි. ඒ දෙකේම පාලන මිල නැහැ. ඔබතුමා හරි. කරන්න ඕන දේ කියන්න. එතකොට මේ ඇඳිරිනීතිය අස්සේ ක්‍රියාමාර්ග ගැන ගැන ඉන්නවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක පාලන මිලට ගන්න ක්‍රියාමාර්ග ගන්න ඕන. මම මොකක්ද කරන්නේ. මම වගකීම ගන්නද පෞද්ගලිකව.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** විජිත ෆුඩ් සිටි එකෙන් අපිට දුන්නා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කිලෝ මෙච්චර ගාණක් ගන්න තිබුණේ නැහැ. රුපියල් හැටපහේ පරිප්පු නෙමෙයි මේ දුන්නේ. මේ දුන්නේ ලීෆ් පරිප්පු. රුපියල් හැටපහට තිබුණේ මේ පරිප්පු නෙමෙයි. මේ දුන්නේ ලීෆ් පරිප්පු. ලීෆ් පරිප්පු රුපියල් හැටපහට නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඕක වෙන කාරණයක්. මම ඔබතුමාට කියන්නේ වෙන කාරණයක්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මේක තව කතා කරන්න ඕන නැහැ. දැන් 12 යි වෙලාව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම දෙයක් තියෙනවා මන්ත්‍රීතුමා. මේ පිළිබඳව මෙතනින් එහාට යන්න බැහැ. ඔබතුමාලා ඕන කෙනෙක් මේකට එකඟ නම් අනුමත කරන්න. විරුද්ධ නම්, විරුද්ධව ඡන්දය දෙන්න. එච්චරයි යන්න පුලුවන්. අනිත් කාරණය තමයි තව අඩුපාඩුවක් වෙන්න තිබුණ තැනක් මම කියන්නම්. අබේසේකර මන්ත්‍රීතුමා මතු කරා බර ග්‍රෑම් 350 - 500 තිබුණා කියලා සමහර දේවල්. ලූණු ගෙඩි 04ක් තිබුණා, 03ක් තිබුණා කිව්වා. එහෙම වැරැද්දක් වුණා නම් ඒ වැරැද්ද හිතාමතා කරපු වැරැද්දක් නෙමෙයි. ඒවා මැනලා තරාදියෙන් කිරලා දුන්නේ නැහැ. මේ නිලධාරීන් කරේ සියලු දේ අයිස්ක්‍රීම් පෙට්ටියක් අරගෙන ඒකට කිරලා බලලා හදාගෙන ඒකෙන් බෑග් වලට දැම්මා. ඉස්සෙල්ලා කතාව තමයි කියන්න තියෙන්නේ. ඒ වගේ මට්ටමක්. මට කියන්න තියෙන්නේ මෙච්චරයි මන්ත්‍රීතුමා. දැන් 12 යි වෙලාව.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා මතුකරපු කාරණයට මම උත්තර දෙන්න එපැයි. මම මතු කරන්නේ නීත්‍යානුකූල කාරණාවක් සම්බන්ධයෙන්. ඒක සම්බන්ධව වන වගකීම ඔබතුමා පෞද්ගලිකව ගන්නවාද, ඒකයි මම අහන්නේ. මේ ප්‍රශ්නයට අදාළව වගකිව යුතු උත්තරයක් ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හදිසි මිල ගණන් යටතේ ඒ කාරණය හදිසියේ කරන්න වුණා. ඒ කාරණයට මම එකඟයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම නීත්‍යානුකූලභාවය ගැන අහන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට කොළඹින් ගේන්න බැහැනේ. ඔබතුමාලා කියාවි. මේ ඉන්න සමහරු කියාවි කොළඹ රු.110/- කොළඹින් ගිහිල්ලා ගේන්න කියලා. අපිට ණයට ගන්න පුළුවන් ආයතනත් බලන්න එපැයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** රජය ගැසට් එකක් ගහලා නිවේදනයක් නිකුත් කරලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට උත්තරයක් දෙන්න ඕන. ඒක බලන්න පුළුවන් තත්වයක් ඒ වෙලාවේ තිබුණේ නැහැ. ඒකට ඔබතුමා එකඟ නම් එකඟ වෙන්න. නැත්නම් එකඟ නොවී ඉන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අදාළ අනුමැතිය අරගෙන තියෙනවා නම් ප්‍රශ්නයක් නැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** දැන් මේ සම්බන්ධව ඇත්තටම ලියනගේ මන්ත්‍රීතුමා, සභාපතිතුමා අපි හිටියා. නමුත් අන්තිමට මේ වැඩේ නොකරන තත්ත්වයකට තමයි පත්වෙන්න ඉඩ තිබුණේ. බඩුවල මිල ඇහුවම නොකරන තත්ත්වයකට තිබුණේ. එක තැනක ලූණු දෙන්නම් කිව්වා රු. 120/- වෙන්න. එතනින් දෙන්න පුළුවන් කිව්වේ කිලෝ 2,000යි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අදටත් අපි සතුටු වෙනවා ලූණු කිලෝ එකකින් රු. 20/-ක් ඉතුරු කරපු නිසා එදා ගනිපු හින්දා. රු. 20/- ගාණේ 2,000ක්. එතන ගාණ කීයද රු. 40,000/-

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** සාරාංශය කියලා මම ඉවර කරනවා. මේක දිගට යන්න බැහැ ඇත්තටම. පැහැදිලිව එතනදි අපිට බඩු ටික ගන්න බැරි තත්වයකට ආවා. අපි ආපහු ගියා විජිත එකට. චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමා හිටියා. අබේසේකර මන්ත්‍රීතුමත් හිටියා මම හිතන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පසුපෙළින් ඉන්න ඇති සමහර විට මොකද වෙන්නේ කියලා බලාගෙන.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** බඩු ටික ගත්තානේ අපි. ඒ ගැන කතා කරානේ. ඊට පස්සේ අපි බඩු පාර්සල් 4000ක් බෙදන්න හිටියේ. පවුල් 4000කට බෙදන්න යනකොට මට ආපු ප්‍රශ්නය චනක මන්ත්‍රීතුමාට ආවා. චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමාට ආවා. වැලිපිටිමෝදර ග්‍රාමසේවා වසමේ විතරක් සමෘද්ධිලාභීන් 520ක් ඉන්නවා. පියදිගම වසමේ 360 ක් ඉන්නවා. බෝපෙ උතුර වසමේ යන්තම් 60යි හිටියේ. ඒකෙන් අරගෙන පියදිගමට දැම්මා. ඒත් මට වැලිපිටිමෝදරට යනකොට මදි වුණා. ඔබතුමාලා දන්නවානේ ආරංචිය. මදි වුණාට පස්සේ මට තෑගිත් දුන්නා යම් මට්ටමකින්. තුසිත මන්ත්‍රීතුමා පාර්සල් 10 ක් එවලා තිබුණා මට මදියි කියන කොට. ඒවගේ මට්ටමක තමයි තිබුණේ. එහෙම කරද්දි ඊට අමතරව තව දෙයකින් අපහසුතාවයට පත් කරන්න හැදුවා. මේක බෙදා ගන්න බැහැයි කියලා හැම තැනම මෙතුමා මේක විකුණලා සල්ලි කරලා කරන්න කිව්වා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම කරානම් කොහොමද ආතල් එක නේ. ඔන්න විකිණුවා. අපි නිකං දෙන්න හදපු එක විකිණුවා කියයි.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** එහෙම කරන්න හැදුවා. එහෙම කරන්න හදනකොට අපි ගමට පණිවිඩය දීලා ඉවරයි අපි මෙහෙම බඩු මලු හදනවා මේක දැන් ඔයගොල්ලන්ට බෙදනවා කියලා. ඒ නිසා එම කටයුත්ත අපිට කරන්න බැරි වුණා. ඒක කරලා අපි බලාපොරොත්තු වුණේ ඒක. විකුණලා ආපහු සභාවට මුදල් අරගෙන ඊළඟ තීන්දුව ගන්න කතා කරේ. මේක කරත් ප්‍රශ්නයක් ඇති වෙනවානේ. දැන් ඇති වෙලානේ තියෙන්නේ ඇත්තටම. ඉතිං ඒ අනුව ඊට පස්සේ කමිටු සාමාජිකයන් හැටියට දැන් මුදල් සම්බන්ධව මටයි, ලියනගේ මන්ත්‍රීතුමාටයි, තිස්ස මන්ත්‍රීතුමාටයි, චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමාටයි අත්සන් කරන්න සිද්ධ වුණා. ඒ සිද්ධ වෙන කොට ලේකම්තුමා අපෙන් ඇවිල්ලා ඇහුවහම මේ බඩු ටික බෙදන කොට මේකට අත්සන් කරන්න කියලා බැහැ කිව්වහම මොකද වෙන්නේ. එතකොට අපි බලාපොරොත්තු වුණ වැඩේ කරන්න බැරි වෙනවා. අපි ඒ වෙලාවේ මුදල් සම්බන්ධ ප්‍රශ්නයේදී, ඇහුවහම කිව්වා කොමසාරිස්තුමාගෙන් අනුමැතිය අරගෙන තමයි අපි මේ කටයුත්ත කරන්නේ. එම නිසා මෙම කටයුත්ත කිරීමේදී අපට අපහසුතාවයක් ඇති වෙන්නේ නැහැ කිව්වා. ඒ වචනයේ විශ්වාසය තියලා තමයි අපි ඒ කමිටුවට අත්සන් කරලා වැඩේ කරේ. වගකීමෙන් කියනවා මිලදී ගැනීමේදී රුපියලකවත් මුකුත් වුණේ නැහැ. ඒක එහෙම වුණේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇයි දැන් මේ නැගිටලා කිව්වේ ගහගෙන කාලා කියලා.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** ඉන්දික මන්ත්‍රීතුමා මතු කරපු ප්‍රශ්නය තමයි මේ මුදල් වලට වගකියන්නේ කොහොමද කියන එක. ඔබතුමාලට වැඩිය කමිටු සාමාජිකයෝ විදියට අපිට බලපෑමක් තියෙනවානේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේකේ නීත්‍යානුකූලභාවය සම්බන්ධයෙන් හරි තහවුරුවක් නැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** අපි මේක සද්භාවයෙන් කරා කියලා තමයි වගකීමෙන් කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊළඟ එකට යනවා. ඒක තාම සම්මත කරේ නෑ. ඔබතුමාට මිල ගණන් සම්බන්ධ විස්තර ටික දීලා අන්තිමට මේක අරගෙන ඡන්ද විමසීමට යමු ගැටලුවක් නෑ. මගේ පළවෙනි යෝජනාවේ කරුණු හතරට අදාළව මිලදී ගැනීම් පිළිබඳ විස්තර ලබා දීලා අවසානයේදී මම ඒ යෝජනාව නැවත ඉදිරිපත් කරනවා.

**02.** කොරෝනා වෛරසය ව්‍යාප්තවීම නිසා ඇඳිරි නීතිය පැනවීම හේතුවෙන් සභාව විසින් මාසික බදු පදනම මත ලබා දී ඇති කඩ කාමර සහ කලේගාන පොළ භූමිය සඳහාත්, තාවකාලික බලපත්‍ර ලබාදී ඇති මස් කඩ සඳහාත් 2020 මාර්තු මස හා අප්‍රේල් මස සඳහා බදු මුදල් අය නොකර සිටීමටත්, එම මාස දෙක සඳහා ගෙවා ඇත්නම්, එම බදු මුදල් ඉදිරි මාස සඳහා හිලව් කිරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රිනී එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙන් මම අදහස් කරේ ලබුදූව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර වේවා, පෝද්දල වෙළඳ සංකීර්ණයේ කඩ කාමර වේවා, ගවමස් විකුණන තැන් වේවා, ඒ සියලු බදු ගෙවන ආයතන සඳහා කොරෝනා වසංගතයත් සමඟ ඔවුන්ට වෙළඳාමක් කරන්න ලැබුණේ නැහැ. ඒ මාස දෙක ගෙවීම් වලින් නිදහස් කරන්න මම යෝජනා කරේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එතනදී ලබුදූව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සමහර අය වෙනම බදු දීලා තියෙනවා. එතනදී බලන්න ඕන බදු අරගතිපු අයට බදු සහනයක් යනවද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අපිට අදාළ නැහැ. අපි දැනුවත් කරනවා ඒ අයව. ඒක ඒ අය බේර ගන්න ඕන. ඒවා අත යටවෙන දේවල් නේ. අපි දන්නේ නෑ කාගේ යටතේද මේක තියෙන්නේ කියලා.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** එහෙම දීලා තියෙනවා කියලා හැගෙනවානම් සභාව තීන්දුවක් ගන්න ඕන කඩ කාමර ගිවිසුම අත්හිටුවන්න.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** සභාපතිතුමා අපි දැනට කඩවල් ටික දැනුවත් කිරීමක් හරි කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙට ගෙවන්න ආපු අයට අපි පණිවිඩය දීලා තියෙන්නේ. මේක අය නොකර ඉන්න සභා තීන්දුවක් ගන්නවා කියලා දැනුම් දීලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒක ප්‍රසිද්ධ කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අයටත් අනෙකුත් සහන රජය මඟින් ලැබිලා තියෙනවා. සභාව වශයෙන් කරන්න පුළුවන් දේ තමයි මේ කරන්නේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** කොරෝනා වෛරසය ව්‍යාප්තවීම නිසා ඇඳිරි නීතිය පැනවූ කාලසීමාව තුළ කසළ එක් රැස් කිරීමේ කටයුතු වල නිරත වූ සේවකයින් සහ විෂබීජහරණ කටයුතුවල නිරත වූ සේවකයන් ඇගයීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඇගයීමක් වැඩක් නැහැ. මම යෝජනා කරනවා ඒ අයට දීමනාවක් දෙන්න. අඩු ගාණේ රුපියල් පන්දාහක දීමනාවක් දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට දීමනාවක් දෙන්න විදියක් නැහැ. ඒ අයට අතිකාල දීමනා දෙනවා. සමහරු ඒකවත් ගත්තේ නැහැ. ඒක තමයි මම ඇගයීමට ලක් කරේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** රිස්ක් අලවන්ස් එකක් දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා මේකෙන් අදහස් කරන්නේ ඒක නෙමෙයි. ඔබතුමාලා හැම වෙලාවේම මේක මුදලට ලක් කරන්න එපා. ඒ මිනිස්සු අතිකාල දීමනාත් ප්‍රතික්ෂේප කරා. ඉතිං ඒක හින්දා මම ඇත්තටම යෝජනාවක් කරනවා මේ අයටත්, ඒ වගේම ඇඳිරිනීතිය පවතින අවස්ථාවල කසළ එකතු කරා. අනෙකුත් සියලුම සෞඛ්‍ය ආරක්ෂණ කටයුතු වලට සම්බන්ධ වුණා. ඒ වගේම කාර්යාල කටයුතුවලට සම්බන්ධ වුණ තාක්ෂණ නිලධාරීන් ඇතුළුව ලේකම්තුමා ප්‍රධානව. සමහර අපි හොඳටම දන්නවා මේ අහල පහළ අය අපි නිවාඩුයි, ඇඳිරිනීතිය කියලා වැඩට ආවේ නැහැ. ඒක හින්දා ඒ ඇඳිරිනීතිය අස්සේ, රජයේ නිවාඩු දින වල ඇවිල්ලා සභාවේ කාර්යය කෙරෙන්න ඕන කියලා තමන්ගේ පුද්ගලික හැඟීම් මත කටයුතු කරපු සියලුදෙනාටම මගේ කෘතවේදී ගෞරවය පුද කරනවා. ඒ වගේම සියලු දෙනාටම තමන්ගේ පුද්ගලික ලිපිගොනුවට මගේ අත්සනින් ලිපියක් සකස් කරලා ලබා දෙන්න කියන එක මම මේ අවස්ථාවේදී යෝජනාවක් වශයෙන් කරනවා. නමුත් අපිට අතිකාල දීමනාව හැරුණහම වෙනත් දීමනාවක් ගෙවීමේ හැකියාවක් නැහැ. මේ සමහරු ඒකත් එපා කියනවා. ඒ අය අගය කිරීම අපිට කරන්න පුළුවන්. පුද්ගලිකව ලිපිගොනුවට ලිපියක් යොමු කිරීමෙන්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** කොරෝනා වෛරසය ව්‍යාප්තවීම නිසා ඇඳිරි නීතිය පැනවීම හේතුවෙන් අසරණ වූ බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී ජනතාවට වියළි ආහාර නොමිලේ බෙදාදී සහන සැලසීම සඳහා සහභාගි වූ ප්‍රාදේශීය සභාවේ සියළුම සේවකයන් හා නිලධාරීන් ඇගයීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අපි කලිනුත්, මන්ත්‍රීවරුත් සඳහන් කරා මමත් සඳහන් කරා. නැවත වරක් ලේකම්තුමා ප්‍රධානව සහභාගි වෙච්ච සියලුම අයට, පවුල්වල අයට මම ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම ඒ වෙලාවේ මඟ ඇරපු කොටසකුත් හිටියා. ඒ පිළිබඳවත් මම ලේකම්තුමාට කියලා තියෙන්නේ. ඒ අය පිළිබඳවත් විමර්ශනයෙන් සිටින්න. අපිටත් කරන්න පුළුවන් වෙලාවල ඒ දේවල් ඒ අය වෙනුවෙන් කරන්න ඕන. ඉතිං ඒකට සභාවක් විදියට සියලුදෙනා එකඟ වෙන්න ඕන. ඒ ව්‍යසනය පැවති අවස්ථාවේ තම තමන්ගේ පුද්ගලික කාලය, වේලාව කැප කරලා රාජකාරියෙන් පරිබාහිරට ඒ අය ජනතාව වෙනුවෙන් සේවාවක් සපයන වෙලාවේ සහභාගි වෙච්ච අයටත් පුද්ගලික ලිපිගොනුවට ලිපියක් දැමීම අදාළ වෙනවා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** ගාල්ල, මාම්පිටිය, ඉසුරු පෙදෙසේ පළමු පටුමඟ, එස්.ඒ.බී කොඩිතුවක්කු මාවත යනුවෙන් නම් කිරීමට යෝජනා කරමි.

ඒක අදාළ ක්‍රියාමාර්ග ඒ විදියට යන්න ඕන. යෝජනා කරාට. විරෝධතා කැඳවලා ඒ ආකාරයෙන් යන්න ඕන. ඒ අදාළ ක්‍රියාපටිපාටිය ඒ විදියටම යන්න ඕන කියන එක උඩ තමයි මම යෝජනා කරේ.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ ඉල්ලීම කරන්න ඇත්තේ ඒ තියෙන සමිතියකින්. මම නම් දකින විදියට මිනිස්සු මිය යන තරමට ඔහොම පාරවල් වල බෝඩ් ගහන්න ගියෝතින් බෝඩ් වැලක් විතර ගහන්න වෙනවා. ඒක දැනට මහ වත්ත පළමු පටුමඟ විදියට නම් කරලා තියෙන්නේ. දෙවැනි කාරණාව තමයි ඉස්කෝලේ හාමිනෙයි, දුවලා දෙන්නයි ලිඛිතව ලබා දීලා තියෙනවා සමිතියට මේක නම් කරන්න එපා කියලා. එයාලාගේ විරෝධතාවය තියෙනවා. ඒ නිසා නම් කරන්න එපා කියලා එයාලා විරෝධතාවයක් දක්වලා තියෙනවා. මම මේකට ලිපියක් හදලා සභාවට භාර දෙන්න සූදානම් වෙන කොට මේ දැනුම් දීම කරා කියලා කිවුවා අපේ තාත්තාගේ නම මේකට දාන්න එපා කියලා ඒ අදාළ අය. කොඩිතුවක්කු මහතාගේ භාර්යාව සහ දරුවෝ කරපු ඉල්ලීමක් ඒ සමිතියට භාර දීලා තියෙනවා. ඒ උදවියගේ අනුමැතියක් නැතිව මේක කරන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට භාර දීලා නැහැ හැබැයි. අපිට සමිතියෙන් භාර දීලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** අදාළ පුද්ගලයොන්ගේ කැමැත්ත පරිදි කටයුතු කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි කොහොමත් අදාළ ක්‍රමවේදයට තමයි යන්නේ. අපිට සමිතියෙන් ඉල්ලීමක් කරලා තියෙනවා. අපිට පවුලේ අය සමිතියෙන් ඉල්ලීමක් කරාට විරුද්ධයි කියලා අපිට ඉල්ලීමක් කරලා නැහැ විරුද්ධයි කියලා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** සභාවෙන් කවුරුහරි ඉල්ලීම කරලා තිබුණොත් එපා කියලා විරෝධතා කැඳවන්න අවශ්‍ය නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එහෙම ඉල්ලීමක් කරලා තියෙනවානම් මම දන්නේ නැහැ. නැත්නම් ඇත්තට මේ සමහර පාරවල් නම් කරලා තියෙන ඒවා බැලුවහම වටිනා ගුරු නායකයෙක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි. ඔබතුමාලා කියන එක හරි. සමිතියේ ඉල්ලීම අනුව තමයි යෝජනාව දැම්මේ. නමුත් විරෝධතාවයක් තියෙනවා පවුලේ අයගෙන්.

- ❖ ගාල්ල, මාම්පිටිය, වක්වැල්ල පාර, අඹගහ වත්ත, 79/3 යන ලිපිනයේ පදිංචි ජී. ආර්. කේ. කොඩිතුවක්කු මිය විසින් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා වෙත යොමු කරන ලද ගාල්ල, මාම්පිටිය, ඉසුරු පෙදෙසේ, පළමු පටුමඟ එස්. ඒ. බී. කොඩිතුවක්කු මාවත යනුවෙන් නම් කිරීමේ යෝජනාවට විරෝධය පාන ලද ලිපිය සභාගත කරන ලදී.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, හැබැයි ඒ පවුලේ අයට බයක් වෙන්න ඕන නැහැ. මොකද සභාවට දැම්මට මේවා කෙරෙන්නනේ නැති නිසා. මගේ කොට්ඨාශයේ මාර්ගයක් මම නම් කරන්න යෝජනා කරා. මේ වාර්තාවට විතරයි ආවේ. විරෝධතා ගත්තේ නැහැ. දැන් මාස 04ක් වෙනවා. අර රණවිරු මාවත කියලා නම් කරන්න යෝජනා කරේ. ඉතින් සභාපතිතුමා ඔබතුමා මෙහෙම යෝජනා කරනවා. ඔබතුමා දන්නේ නැහැ කෙරෙන්නේ නැද්ද කියලාවත්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කිවුවනේ එදා. මෙහෙට දකුණු පළාත් සභාවේ තීන්දුවක් අරගෙන එවලා තියෙනවා. ඒක මම කිවුවනේ එදා. බෝපෙ පෝද්දලට එක මාවතක් රණවිරු මාවත කියලා නම් කරන්න පුළුවන්. ඒ ඇරෙන්න කරන්න එපා කියලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** අපි කිවුවා රණවිරු මාවත නෙමෙයි, රණධීර මාවත කියලා නම් කරලා දෙන්න කියලා. ඒ මාසේ සභා වාර්තාව අරගෙන බලන්න. ඒ වාර්තාවේ අපි සාකච්ඡා කරපු කරුණු කාරණා කොහොමද තියෙන්නේ බලන්න. රණවිරු කියන එකට විරුද්ධ වුණා. ලේකම්තුමා තමයි විරුද්ධවුණේ ඒ නිර්ණායක එක්ක කරන්න බැහැ කියලා. ඊට පස්සේ මම කිවුවා ඒ ගෙදර ඉල්ලීම නිසා, ගමේ ඉල්ලීම නිසා රණධීර මාවත කියලා නම් කරමු කියලා. ඒක සභාව සම්මත කරා. ඒක අඩුගානේ ඒ මිනිස්සුන්ටවත් දැනුම්දීම කරන්න ඕන. කරන්න බැරිනම් ඒ මිනිස්සුන්ට ලියුමක් යවන්න ඕන මේ හේතු නිසා, මේ චක්‍රලේඛය නිසා කරන්න බැහැයි කියලා. අඩුගානේ මම යෝජනාව ගෙනාවම මාව දැනුවත් වෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය මට්ටමෙන් බැහැ. එක මාවතක් රණවිරු මාවත කියලා නම් කරන්න පුළුවන් කියලා එදා කිවුවා. බලන්න මෙතුමා වෙනත් යෝජනා ගෙනැල්ලා තියෙනවද කියලා.

**ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ගරු සභාපතිතුමනි, මගෙනුත් ලබුදූවේ සමිතියක් ඉල්ලීමක් කරලා තිබුණා. අපිට ඒක ක්‍රියාත්මක කරන්න නොහැකියාවක් තියෙනවා නම් ඒ අයව දැනුවත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ අය අපෙන් අහනවා ඇයි මේක නොකරෙන්නේ කියලා. ඒක සභාව හරහා දැනුම් දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. රණවිරුවන් තුන් දෙනෙක්ගේ නම් දාල කරන්න කියපු එක.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, අපි කිතුලම්පිටිය, එගොඩහවත්ත මාර්ගයක් නම් කරන්න කියලා අවුරුද්දක් විතර වෙනවා. විරෝධතා කැඳෙව්වේ නැහැ. කිසි දෙයක් නැහැ. ඒක ගැනත් පොඩ්ඩක් අවධානය යොමු කරවන්න.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිමනි, මේ පාරක් නම් කරන්න නීත්‍යානුකුලව යෝජනාව දාලා එලකය සවිකරන්න කොයි තරම් කල් යනවද. විරෝධතා කැඳවලා නැවත දැනුම්දීම කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කොට්ඨාශයේ ඇමතිවරුන්ගෙන් ගන්න ඕන, මන්ත්‍රීවරුන්ගෙන් ගන්න ඕන. මාස 06කට වැඩි කාලයක් යනවා.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මම 2011 දී ප්‍රදේශීය සභාවට ආවේ. දෙපාරක්ම මම යෝජනාව දැම්මා ගම්පති ෆැන්සිස් අප්පුහාමි මාවත නම් කරන්න. කපුහෙම්පල හිටපු මන්ත්‍රී කෙනෙක්ගේ නමක්. දෙපාරක් දැම්මා යෝජනාව. හැමදාම සභාවට එනවා. යෝජනාව පැත්තකට යනවා. මොකක්ද මේ වැඩේ.

සම්බුද්ධ ජයන්ති වෙසක් පෝයට එක පාරක් නම් කරන්න ආවා. සම්බුද්ධත්ව ජයන්ති මාවත කියලා බැදිපාර නම් කරා. යෝජනාව විතරයි. ඉන් එහාට මුකුත් නැහැ. එක පාරකද කොහෙද දැන්වීමක් ගහලා තිබුණා විරෝධතා කැඳවීමක්. එච්චරයි. මම හැම වෙලාවේම සභාවේ කතා කරා මේ ගැන. කවදාවත් ඉන් එහාට ගියේ නැහැ. චනක මන්ත්‍රීතුමාගේ කතාව කවර කතාද. යෝජනාව ආව එක හරි. මම දන්නවා කොහොමත් මේකට නම වැටෙන්නේ නැහැ. ඒක තමයි ඇත්ත කතාව. ඉතින් ඒ හින්දා මේවා ගැන හොයලා බලලා කතා කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම දැන් ඉල්ලීමක් කරනවා. ඊළඟ සභාව වෙනකොට සියලු මන්ත්‍රීතුමන්ලාගේ කරපු යෝජනා, ඒ වගේම සමිතිවලින් කරපු යෝජනා සහ සියලුම යෝජනා ඊළඟ සභාවට දාන්න. ඊට පස්සේ කියන්න මේක කරනවාද, නැද්ද මොකක්ද හේතුව කියලා. ඊළඟ සභාවේ මේ සියලු පාරවල් නම් කිරීම් දාලා නොකරෙන හේතුව මොකක්ද කියලා කියන්න.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ඒ හේතු ඉල්ලීම කරපු ආයතනවලට දැනුම් දෙන්න කියලා ඉල්ලනවා.

<u>ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 06.** තොටගොඩ, අඹගහවත්ත, රණවිරු ප්‍රියංකර මාවත (ලංසිගේවත්ත මාර්ගය) මදනායක මාවත දක්වා සුදුසු පරිදි සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 07.** කපුහෙම්පල, බැදි පාර ආරම්භයේ ඇති බෝක්කුව සඳහා යොදා ඇති සිලින්ඩර් කැඩී ඇති බැවින් ඒ සඳහා පෙට්ටි බෝක්කුවක් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඉතාම දරුණු තත්ත්වයක් ගරු සභාපතිතුමනි තියෙන්නේ. පෙට්ටි බෝක්කුව පරක්කු වෙනවා නම් සිලින්ඩර් දාලා හරි මේක සකස්කර ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මගේ 08 වෙනි යෝජනාව මම ඉල්ලා අස්කර ගන්නවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් මෙම මාර්ගය සංවර්ධනය වෙනවා කියලා දැනුම් දීම කරා.

<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, යෝජනා ඉදිරිපත් කරන්න කලින් චෝදනාවක් කරනවා. අර මහමෝදර රෝහල හදන තැන කරාපිටියේ සෙනොක් ආයතනය නිසා ප්‍රශ්නයක් තියෙනවා. දැන් මට වෛද්‍යවරයෙක් කතා කරලා කිවුවා එයාලගේ ගෙදර පේමන්ට් එක ගාවට වතුර ඇවිල්ලා කියලා. අපි කපපු කාණුව මැදින් රෝහල පිටිපස්සේ ගේට්ටුව දාන තැන වහලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපේ බැකෝ යන්ත්‍රය දාලා සුද්ද කරන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒ අයට බැකෝ තියෙනවා. ඒ අය වහලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ කමක් නෑ. හෙට ඔබතුමා අපේ බැකෝ යන්ත්‍රය අරන් ගිහින් කපලා වැඩේ ඉවර කරන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒ සෙනොක් ආයතනයට කියන්න අද පාදලා දාන්න කියලා. හෙට වෙනකොට ඉන්න හම්බ වෙන එකක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දිනූෂ මහත්තයා තාක්ෂණ නිලධාරි ඉන්නේ. ඒක අහලා දැන් ගිහින් ඒකට ක්‍රියාමාර්ගයක් ගන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 09.** කොරෝනා වෛරසය ව්‍යාප්තවීම නිසා රටේ ආර්ථිකයේ දැඩි අර්බුදකාරී තත්වයකට පත්ව ඇත. අතිගරු ජනාධිපතිතුමා, සෞඛ්‍ය අංශ, ආරක්ෂක අංශ ඒ වෙනුවෙන් කරනු ලබන මෙහෙවර ප්‍රශංසනීය බැවින් එයට ශක්තියක් වශයෙන් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතයින් ලෙස ආදර්ශවත් වෙමින් කොරෝනා අරමුදල වෙනුවෙන් මැයි මස දීමනාව හෝ ඉන් අඩක් ලබාදීමට යෝජනා කරමි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක ඉතා වැදගත්ම යෝජනාවක්. මේ වෙලාවේ මාධ්‍යවේදීන් හිටියානම් කියලා මට හිතෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, කොරෝනා වෛරසය ව්‍යාප්ත වීම නිසා කියලා තියෙන්නේ. ඒක ව්‍යාප්ත වුණේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා වචන පිළිබඳව නෙමෙයි කෙළින් කියනවා නම් යෝජනා කරලා තියෙන්නේ මාසික වැටුප හෝ අඩ වැටුප් කොරෝනා අරමුදලට පරිත්‍යාග කරන්න කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපේ මන්ත්‍රී වැටුප පෞද්ගලිකව පරිහරණය නොකර මන්ත්‍රී වැටුප් අරමුදලට යවන්නේ. ඒකෙන් රුපියල් මිලියන 6.5 ක් අපි අයි. ඩී. එච්. රෝහලට දීලා තියෙන්නේ රෝහල් උපකරණ හා වෙනත් ද්‍රව්‍ය මිලදී ගන්න. අපේ මන්ත්‍රී වැටුප් වලින් අපේ මෙහෙවර කොරෝනා වැළැක්වීම වෙනුවෙන් රට පුරාම දායකත්වය දක්වලා තියෙනවා. අමුතුවෙන් අපි ආපහු මෙතන දෙන්න ඕන නැහැ. අපි ඒකෙන් ඉදිරියටත් ඒ වැඩේ කරනවා. ඒ නිසා අපේ වැටුපෙන් දෙන්න ඕන කියලා අපි හිතන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ අදහස ඒක.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, හොඳ යෝජනාවක් ගෙනාවා රජයේ සේවකයන්ගේ වැටුපෙන් අඩක් හෝ සම්පූර්ණ මුදල දෙන්න කියලා. ඒක හොඳ යෝජනාවක්. ආදර්ශයක් අරගෙන අපේ සභාවේ සියලු රාජ්‍ය නිලධාරීන් තමන්ගේ වැටුප සම්පූර්ණයෙන් හෝ කොටසක් ලබා දෙන්න. අපිට හම්බ වෙන්නේ දීමනාවක්, පඩියක් හම්බ වෙන්නේ නෑ. පඩියෙන් දෙන්න කියලා තියෙන්නේ. අපිට හම්බ වෙන්නේ දීමනාවක්, දීමනාවෙන් දෙන්න පුළුවන් කමක් නෑ ඇත්තටම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ජනාධිපති ලේකම්තුමා කරේ ඉල්ලීමක්. නැත්නම් නීතියක් ගේන්න එපැයි පඩි භාගයක් හරි, මාසික පඩිය හරි දෙන්න ඕන කියලා. එතුමා ඉල්ලීමක් කරේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එතුමා පෞද්ගලික ඉල්ලීමක් කරා ජනාධිපති ලේකම් කාර්යාලයේ ලෙටර්හෙඩ් එකෙන්. ඒක ඔඩිට් එකටත් යැව්වා. ඒක හොඳ යෝජනාවක්. අපි ආදර්ශයක් දෙමු අපේ සභාවේ ඉන්න සේවකයන්ගෙන්. ඒක අපේ සභාවෙන් ආරම්භ කරමු. ඒක හොඳයි. අපේ දීමනාවෙන් නම් අපිට දෙන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හොඳ යෝජනාවක් ලියනගේ මන්ත්‍රීතුමා ගෙනාවේ. අඩුම තරමේ ඒ යෝජනාව ස්ථිර කරන්න කියලාවත් කියනවා ගරු මන්ත්‍රීවරුන්ට.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාවට සංශෝධනයක් කරනවා මාස හයකවත් දීමනාව අපි ලබා දෙමු කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කිවුවට ස්ථිර වෙන්නේ නැහැනේ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මෙච්චර වෙලාවක් අපේ මන්ත්‍රීවරු සභාවෙන් කරපු වැඩ පිළිබඳව, බෙදාදීම් පිළිබඳව දැඩි විවේචන කරා. අප්‍රේල් මාසයේ සභාව තිබ්බේවත් නැහැ. ඒ ගැන හිතලාවත් මේ මුදල දෙමු කියලා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** කරන්දෙණිය ප්‍රාදේශීය සභාව මම හිතන්නේ උදාහරණයක් විදියට කොටසක් ලබා දුන්නා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් යෝජනාව ස්ථිර වෙලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සංශෝධන ඇතුලත්වද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** විරෝධතා තියෙනවාද?.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපි විරුද්ධයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම සංශෝධනයක් ඉදිරිපත් කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ නෑ සංශෝධන නෑ මන්ත්‍රීතුමා. යෝජනාව නම් යෝජනාව. සංශෝධන නැහැ. යෝජනාව ගැන අහන්නේ. යෝජනාව සම්මත වෙලා තියෙනවා. ආණ්ඩු පක්ෂය විදියට සම්මත කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම ඉදිරිපත් කරනවා සංශෝධනයක් විදියට මේක රටේම ප්‍රාදේශීය සභාවල මේ තීන්දුව අරගෙන ක්‍රියාත්මක කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය පිළිබඳව මම අදහස් දක්වන්නම්. ඇත්තටම මම බොහොම ස්තුති වෙනවා, සතුටු වෙනවා ලියනගේ මන්ත්‍රීතුමාගේ ඔය යෝජනාව පිළිබඳව. මහජන නියෝජිතයෙක් විදියට එතුමා ගෙනාපු යෝජනාව ඉතාමත්ම හොඳ කාලීන යෝජනාවක් කියලා මම කියා සිටිනවා. ඒ වගේම අපිට වඩා හොඳ අවස්ථාවක් ලබා ගන්න තිබුණා මාධ්‍යවේදීන් හිටියානම් මෙතනදී. ඒ අවස්ථාව නොලැබීම පිළිබඳවත් මම කණගාටු වෙනවා. ඒ වගේම මම කණගාටු වෙනවා විපක්ෂ මන්ත්‍රීවරු විශේෂයෙන් මේ පිළිබඳව තමන්ගේ විරෝධතාවය මෙවන් අවස්ථාවක ඉදිරිපත් කිරීම ගැන. මෙච්චර කතා කරන මන්ත්‍රීවරු විදියට විරුද්ධ වීම පිළිබඳව මම කණගාටු වෙනවා. නමුත් මම ලියනගේ මන්ත්‍රීතුමාගේ යෝජනාව පිළිබඳව යම් කිසි අදහසක් දක්වන්න කැමතියි. මොකද හොඳ යෝජනාවක් කියනවා. මම දන්නවා අපේ සභාවෙන් පවුල් 8000 කට ආධාර බෙදන අතර, ඩඩ්ලි මන්ත්‍රීතුමා පුද්ගලිකව බෙදුවා කිව්වා. මන්ත්‍රීවරු තමන් පුද්ගලිකව තමන්ට හැකි ආකාරයෙන් ජනතාවට සේවය කරා. පුද්ගලික ධනය පවා වියදම් කරගෙන ඒ අයට අවශ්‍ය වියළි සලාක, අනෙකුත් ද්‍රව්‍ය ලබා දීමට කටයුතු කරා. සියලු මන්ත්‍රීවරු තම තමන්ට හැකි පමණින් ඒක කරා. ඒක එක කාරණයක්.

දෙවැනි කාරණාව රජයට ස්තුතිවන්ත වෙන්න ඕන අඩු ආදායම්ලාභීන්ට, එදිනෙදා ජීවන වෘත්තිය අහිමි වෙච්ච සියලු අයට මාස තුනක් යනකම් රුපියල් පන්දාහ බැගින්, දීමනාවක් ගෙවීම පිළිබඳව. රජයේ සේවකයෝ ඇරෙන්න අනෙකුත් සියලුම දෙනාට ලැබෙනවා. එක ගෙදරට හතර පහ පවා ගියා. ආබාධිත අයට වෙනම, සමෘද්ධිලාභීන්ට වෙනම, වකුගඩු රෝගීන්ට වෙනම දුන්නා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනුවත් වෙන්න මම කියන්නේ. නොදැනුවත්කම නැතිකර ගන්න. ඕනනම් හොයන්න පුළුවන්. අපි හිතමු එක ගෙදරක ඉන්නවා සමෘද්ධිලාභියෙක්. සමෘද්ධිලාභියාට එකක් යනවා. ඊට පස්සේ වැඩිහිටි දීමනාව ලබන කෙනෙක් ඉන්නවා ඒ ගෙදරම, එයාට තව රුපියල් පන්දාහක් යනවා. ඊට පස්සේ ඒ ගෙදරම ඉන්නවා වකුගඩු රෝගය තියෙන කෙනෙක්. මේ තුනම හම්බ වුණා ටෙක්ලාට. රුපියල් පහළොස් දාහක් හම්බ වුණා. ගොවි විශ්‍රාම වැටුප තියෙනවානම් තව රුපියල් පන්දාහක් හම්බ වෙනවා. තව ආබාධිත කෙනෙක් ඉන්නවානම් රුපියල් පන්දාහක් යනවා. රුපියල් විසිපන්දාහක් ගියපු ගෙවල් තියෙනවා. ඉතිං මම මේ වෙලාවේ වර්තමාන රජයට ඇත්තටම ස්තුතිවන්ත වෙනවා ඒක මාස තුනක් යනකම් ගෙවීම පිළිබඳව. මම සඳහන් කරන්න ගියේ ඒක නෙමෙයි ඇත්තටම. මේ සියලු මන්ත්‍රීවරුන්ට ඔය රුපියල් පන්දාහ පවා නොලැබුණේ මේ දීමනාව ගන්න හින්දා. මේ සභා දීමනාව රුපියල් පහළොස්දාහක් ගෙවන හින්දා තමයි ඒක නොදුන්නේ. ඉතිං ඒ යෝජනාව හොඳ අතරම, මන්ත්‍රීවරු කැපකිරීමක් මේ වෙලාවේ කරලා තියෙනවා කියන එක සිහිපත් කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔබතුමා කියපු එකට නිවැරදිකිරීමක් කරන්නම්. මගේ ගෙදර මමයි, අම්මයි එක ගෘහමූලිකය යටතේ ඉන්නේ. අම්මට හම්බ වුණේ නැහැ. මම දන්නේ නැහැ හේතුව මොකක්ද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක දෙන්න ඕන. ඒක දේශපාලන ප්‍රශ්නයක් නෙමෙයි. ඒක එහෙම වෙලා තියෙනවානම් වැරදියි. ඒක අදාළ නිලධාරීන් එක්ක බේර ගන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** ඔබතුමාගේ නෝනා කොහෙද ඉන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා :-** මගේ නෝනා ඉන්නේ හිරිඹුර. නෝනා අදාළ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔබතුමා කියන එක වැරදියිනම් ඒක නිලධාරීන් එක්ක බේර ගන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා :-** සභාපතිතුමාට පුළුවන්නම් අරන් දෙන්න කියලා මම ඉල්ලීම කරනවා. ලැජ්ජ වෙන්නේ නෑ මම. මම හොරකම් කරන්නේ නැහැ. කාගේවත් සල්ලි මම ගාව නැහැ. මම තමයි අම්මට බෙහෙත් අරන් දුන්නේ සල්ලි නැති නිසා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එක ගෘහමූලික අංකය යටතේ හිටියත් දෙන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා :-** අම්මයි මමයි එක ගෘහ මූලිකය යටතේ ඉන්නේ. අම්මට හම්බ වුණේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒක ග්‍රාම නිලධාරීටයි, ප්‍රාදේශීය ලේකම්ටයි කතා කරලා බේර ගන්න පුළුවන්.

මම කියන්න ගියේ ඔය කාරණා දෙක. ලියනගේ මන්ත්‍රීතුමාගේ යෝජනාව එක්ක මම කියන්න ගියේ ඔය කාරණා දෙක. මන්ත්‍රීවරු කැපකිරීමක් කරලා තියෙනවා. ඒක සිහිපත් කරන්න ඕන. ඉතිං එතනදී මම ඉල්ලීමක් කරනවා යෝජනාව හොඳයි. මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන් තම තමන් කැමති විදියට මේක ලිඛිතව දෙන්න. අපි සභා තීන්දුවක් ගත්තත් මේක ක්‍රියාත්මක කරන්න බැහැ. ලිඛිතව දෙන්න අපි මේ අරමුදලට මේ මේ ගණන් දෙන්න එකඟයි කියන එක. මන්ත්‍රීවරු ලිඛිතව ලබා දෙන්න. ඒක තමයි අපිට ගන්න පුළුවන් ක්‍රියාමාර්ගය. නමුත් ඇත්තටම දෙයක් කියන්න ඕන. මගේ ගැන මොන වැරදි හිතුවත් සමහර විට ඔබතුමන්ලාගේ ඔළුවේ තියෙන්න ඇති බඩු මිලදී ගැනීමේදී වංචාවක් කරලා තියෙනවා. ඒක නිසයි අද මාධ්‍යවේදීන් කැඳෙව්වේ නැත්තේ කියලා. ඒක නෙමෙයි ප්‍රධානම කාරණය තිබුණේ මේ ප්‍රශ්නය. මොකද අපේ මන්ත්‍රීවරු අපහසුතාවයට පත් කරන්න මම කොයි වෙලාවකවත් කැමති නැහැ. ලියනගේ මන්ත්‍රීතුමාගේ යෝජනාව හොඳ වගේම අද මාධ්‍යවේදීන් කැඳෙව්වානම් ප්‍රධානම මාතෘකාව යන්නේ වෙන දෙයක් නෙමෙයි කොරෝනා මර්දනයට ලියනගේ මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඒකමතිකව සභා සම්මත වුණා. නමුත් මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවය මත මේක තමයි අද යන්නේ මාධ්‍යයට හෙඩ් ලයින් එක විදියට. ඔයගොල්ලෝ මොන චෝදනාව කරත්, මම මගේ හෘද සාක්ෂියට අනුව සතුටු වෙනවා මාධ්‍යවේදීන් නොකැඳවීම පිළිබඳව.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා :-** අපේ විරෝධතාවයක් නැහැ ඒකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** විරුද්ධ වුණත් නැතත් ඒක යනවා මන්ත්‍රීතුමා. ඔබතුමා ඔය කියන කතාව නෙමෙයි යන්නේ. බෝපෙ පෝද්දල සියලු මන්ත්‍රීවරුන්ට ඒ කැළල යනවා සදාකල්. ඒක ගැන කියන්න ඕන. ඔය කතා කියන්නේ නැහැ. හෙඩ් ලයින් එකට බෝපෙ පෝද්දල ගියාම මටත් බලපානවා. මන්ත්‍රීවරු කැමැත්තෙන් දෙන්න අපි මෙච්චර ගාණක් දෙන්න කැමතියි කියලා. නමුත් යෝජනාව හොඳයි. ඒකට මේ අවස්ථාවේ ස්තූතිවන්ත වෙනවා ලියනගේ මන්ත්‍රීතුමා.

ඒක සංශෝධිත යෝජනාවක් කොහෙත්ම අපිට බැහැ සභා තීන්දුවක් ගන්නත්, සියලුම මන්ත්‍රීවරුන්ගෙන් කැපීමේ හැකියාවකුත් නැහැ. තමන් ලිඛිතව එකඟතාවය පළ කරන්න ඕන.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** කැමති වෙලා දුන්නයි කියමු. දෙන්නෙක් තුන්දෙනෙක් නොදුන්නොත් ඒ අයගේ නම් යනවා එතකොට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** යෝජනාව යන්නේ ඒ විදියට. ලියනගේ මන්ත්‍රීතුමා එහෙම යෝජනාවක් ගෙනාවා. නමුත් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය ඒක. මේක සංශෝධිත යෝජනාවක් වෙනවා. කොහෙත්ම අපිට සභා තීන්දුවක් අරගෙන කරන්න බැහැ. මන්ත්‍රීවරුන් තමන්ගේ දීමනාවෙන් කැපෙන ප්‍රමාණය ලිඛිතව දැනුම් දෙන්න ඕන. බොහොම ස්තූතියි සියලු දෙනාගේ එකඟතාවය මේකට පළ වීම පිළිබඳව. ඒ විදියට මෙම යෝජනාව සංශෝධනය විය යුතුයි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** එම සංශෝධනය මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 10.** කරාපිටිය වේල්ලගාවවත්ත (හල්පැන්දල වත්ත) මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** පහුගිය දවසක අපි කාණුව සුද්ධ කිරීමත් සමග ඒ පැති බැම්ම කැඩිලා ගිහිල්ලා තියෙනවා වරුසාවත් එක්ක. ඒක පොඩ්ඩක් ඉදිකරලා දෙන්න මාර්ගයේ පැති බැම්ම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 11.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය හා උප කාර්යාලය මූලික කරගෙන පොහොර, බීජ වර්ග, පැල වර්ග අලෙවිසැල් ආරම්භ කරගෙන පවත්වාගෙන යාමටත්, කාර්යාල දෙකෙන් තෝරාගත් සේවක මහතුන් දෙදෙනෙකු ඒ වෙනුවෙන් වෙන්කර එහි පාලනය හා නඩත්තුව භාරදීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, මෙතනදී මම යෝජනා කරේ සභාවට ආදායමක් ලැබෙන දෙයක් හැටියට මේක කරමු කියලා. මොකද පොහොර ටික එහෙම අපිට මොන්රෝවියා වත්තෙන් ගන්න පුළුවන්. මම හිතන්නේ උප කාර්යාලයට ගෙනල්ලා තිබුණා පහුගිය දවස්වල. ඒ එක්කම බීජ වර්ග, පැළ වර්ග තියලා ලොකු පැළ වුණොත් මේ භූමියේම හිටවලා අලංකාර භූමියක් පවත්වාගෙන යන්න පුළුවන් වෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ යෝජනාව හොඳයි. මම ඕකට තව ඌන පූර්ණයක් එකතු කරන්නම්. ගොවිජන සේවා එකෙන් සම්බන්ධ කර ගන්න ඕන උපදෙස් සඳහා. කෘෂිකර්ම නිලධාරි සම්බන්ධ කර ගන්න ඕන. පැළ මිලදී ගන්න කොට අපිට කියන්න බැහැ මේ පැළය හොඳද, මේ වර්ගය හොඳද කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** බීජ වලින් කරමු. කොහොමත් කරන්නේ ඒකනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බීජ වුණත් මන්ත්‍රීතුමා එක එක වර්ග කරපුවා. බීජ වුණත් එක එක වර්ගවල බීජ තියෙනවා එක එක ගණන් යටතේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** චමින්ද මන්ත්‍රීතුමාට මේ සම්බන්ධව අවබෝධයක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අදාළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන බීජ වර්ග ගන්න ඕන. ඔබතුමාගේ යෝජනාව හොඳයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** අපිට මේ භූමිය හරි හදා ගන්න පුළුවන් නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි උත්සාහයක් දරමු. ඒ යෝජනාව මම ස්ථිර කරනවා. ඒ සඳහා අපි ක්‍රියාමාර්ගයක් දරමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඒ යෝජනාව හොඳයි කවුරු මොනවා කිව්වත්. හැබැයි ඒ වගේම රමේෂ් පතිරණ අපේ ගරු අමාත්‍යතුමාව දැනුවත් කරන්න. ඕපාත යාය වැපුරුවාට ඉවරයි අද වෙන කොට. ඒ මොකද මෝය කටේ ප්‍රශ්නය තියෙන්නේ. මේ මෝය කටට ස්ථිර විසඳුමක් දෙන්න කියන්න. නැත්නම් මොනවා කරත් ශත පහක තේරුමක් නැහැ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු මන්ත්‍රීතුමා, මම ඒකට මේ ගමන්ම කියන්න ඕන. රමේෂ් ඇමතිතුමා හා මොහාන් ඇමතිතුමා සම්බන්ධ වෙලා මීට දින හතරකට කලින් වර්ෂාවේම මෝය කට කැපුවා. දැන් කපලා තියෙන්නේ. වතුර බහිනවා. මොන තරම් අපිට හදිසිය තිබුණත් වතුර බහිනවා. දවස් දෙකක් යනවා. මම ඒක ගැන ගොවි මහතුන් දැනුවත් කරා. මෝය කපලා තියෙන්නේ. දැන් මෝය කපන්න බැහැ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගිංතොට ප්‍රදේශයෙන් තමයි හැම වතුරම බහින්නේ. ගිංතොට පාලම ගාවින්. මහමෝදරිනුත් බහිනවා. නමුත් වැඩිපුර බහින්නේ ගිංතොටින්. ගඟක් අපිට අවශ්‍ය විදියට හරවන්න බැහැ. ඒක ස්වාභාවිකව යන විදියට ඉඩ දෙන්න ඕන. එතකොට ගිංතොට ස්වාභාවික මෝය කට කපනවාට පිටිවැල්ලේ කට්ටිය විරුද්ධයි. ඒ නිසා ඒක කැපුවා මේ පැත්තෙන්. දැන් බහින්නේ නෑ ගොඩ වෙනවා. එතන ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතන බෝට්ටු දාන නිසා කැමති නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කොහොමත් ඒ ජීවනෝපාය ගැන අපි හිතන්න ඕන. ඒ ධීවර එක වහාම හදලා දෙන්න පුළුවන්නේ. මේ වගාව කියන එකට ගේන එක සම්පූර්ණයෙන්ම වැඩක් නැති වෙනවා මේක මෙහෙම වුණොත්. දැන් අද වෙන කොට ඉන්දපු බීජ ටික ඔක්කොම ඉවරයි. ගහපු පෝර ටික ඉවරයි. ඒ නිසා ඇත්තටම ගරු සභාපතිතුමා මේකට දින වකවානු දා ගන්න. හෙට දවසේ ඉඳලා ක්‍රියාත්මක වෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද මේ ප්‍රාදේශීය සභාවේ අදහසක් විදියට මේක අදාළ ඇමතිවරු දෙපළට ඒ වගේම අදාළ ආයතන වෙත අපි යවමු. කොච්චර වී නිෂ්පාදනය කරත් වැඩක් නෑ මේ හේතුව නිසා බාධාවක් වෙනවා කියලා. ඇත්ත කතාව ඒක. හපුගල පන්සලේ පොඩි හාමුදුරුවරු මම හිතන්නේ එක මාසයක් විතර සිවුරු තියලා කැලේ ගාලා තමයි කුඹුර කරේ. එක වතුර පාරෙන් ඒක ඉවර වෙලා ගියා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක සම්පූර්ණයෙන් ඉවරයි. දැන් ඊට මෙහා එනකොට සේනානායක මහත්තයලාගේ ගෙදර ඉස්සරහ තියෙන කුඹුරේ තියෙනවා වතුර බැහැලා යන්න හදපු තැන මඤ්ඤොක්කා පේළිය හරි ලස්සනයි. ඇත්තටම බීජ වල හිඟයක් තියෙනවා. හොඳ බීජ නැති කමක් තියෙනවා. මේකට වියදම් කරන සල්ලිත් එක්ක කිසි ප්‍රශ්නයක් නැහැ. හොඳ බීජ ගන්න පුළුවන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගත්තහම. ඊළඟට පොහොර පිළිබඳ ප්‍රශ්නය තියෙනවා. පොහොර අපිට මොන්රෝවියා වත්තෙන් ගේන්න පුළුවන්. අද වෙනකොට ඇත්ත තත්ත්වය කුකුළු ෆාම් වල කුකුළු පොහොරවත් නැහැ. ඒක තමයි ඇත්තටම වෙලා තියෙන්නේ. කුකුළු පොහොර කොට්ට උරයක් රුපියල් 100කට 150කට ගත්තේ. මේකට දින වකවානු දා ගන්න. එක්කෝ මේකට කමිටුවක් දා ගන්න. මම හිතන්නේ මේකට විශේෂඥ දැනුම තියෙනවා මෙතුමාට. ඒකට කමිටුවක් දාලා ඒක ක්‍රියාත්මක කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ලියනගේ මන්ත්‍රීතුමා යෝජනා කරා වගේම ඔබතුමා මේ පිළිබඳව අවධානයෙන් ඉඳලා මේක කෙරෙන තත්ත්වයට ඔබතුමා මැදිහත් වෙලා පටන් ගන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේක හොඳ යෝජනාවක්. මේ මොහොතේ රජය ඉලක්ක කරලා තියෙනවා කොරෝනා ලෝක වසංගතයත් එක්ක දේශීය නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනංවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දේශීය නිෂ්පාදන මේ දවස්වල වැහි වැහලා හැම ජාතියෙන්ම.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ වෙනකොට අපි ඉලක්ක තියා ගන්න ඕන විශේෂයෙන්ම ආහාර අර්බුදයට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පළතුරු අර්බුදයකට මේ දවස්වල මුහුණ දීලා තියෙනවා. පළතුරු හිඟයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පළතුරු ඉදිලා වැඩිද, මෙතුමා පළතුරු ගැන හොඳට දන්නවා. මෙතුමා ඒ පැත්තේ පළතුරු ව්‍යාපාරයක් කරනවද දන්නේ නෑ.

මේක හොඳ යෝජනාවක්. මේක සභා බලප්‍රදේශයට බලපාන පරිදි කරන්න පුළුවන් නම් හොඳයි. මට පෞද්ගලික අත්දැකීමක් තියෙනවා බීජ ගැන. පහුගිය දවස්වල අපි ගනිපු ඒවා කිසි ප්‍රමිතියක් නැහැ. ඒවාගේ කිසිදු වගකීමක් නැහැ. මොන ආයතනයෙන්ද, මොකකින්ද නිකුත් කරන්නේ කියලා නැහැ. ලේබල් එකක් ගැහුවා, පින්තූරයක් ගැහුවා විකිණුවා. පැළ වෙන්නෙත් නැහැ. මම කඩවල් කිහිපයකින්ම ගත්තා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔතන මන්ත්‍රීතුමා අපිට කරන්න වෙන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිෂ්පාදිත බීජ විතරයි. ඒකත් 100% ක් මම එකඟ නෑ. අපි නිකං හරි හිතන්න ඕන මේ පිළිබඳව.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** විවේචනයක් හරි, චෝදනාවක් හරි ආවොත් වගකීමක් තියෙන්න ඕන. හොඳ යෝජනාවක්. කාබනික පොහොර දෙන්න ඕන. මම උදාහරණයක් කියන්නම්. වැලිගම කාබනික පොහොර නිෂ්පාදනාගාරයේ රුපියල් හැටේ කිලෝ එක ලබුදූවේ රුපියල් එකසිය පනහයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම කරමු මන්ත්‍රීතුමා. මේ ආයේ දිගින් දිගට යන්න බැහැ. අදාළ යෝජනාව තවම සාකච්ඡා වෙන්නේ. ඔබතුමා යෝජනාව කරා වගේම මගේ කිසිම බාධාවක් නැහැ මේකට. ඔබතුමා නායකත්වය අරගෙන මේකේ කටයුතු කරන්න. අපි කමිටුවක් පත්කරගෙන හරි මේක ඉදිරියට කරගෙන යමු. නමුත් මේක කරද්දි අර වගේම අඩුපාඩුකම් එන්න පුළුවන්. මිලදී ගැනීම් පිළිබඳව ආවොත් මෙච්චර ගැහුවා, පැළේකින් මෙච්චර ගැහුවා කියලා ඒක ගැනත් බලාගෙන ඕක ඔබතුමා කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ඒවා නඩත්තු කිරීමේදී සහ මැරෙන ඒවා වෙනම තියන්න වෙනවා. මාසයක් පතා තොගයක් අරගෙන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට ඔහොම අත්දැකීමක් තියෙනවා. ඒකත් මම කියන්නම්. හපුගල සණසේ සභාපතිධූරයේ ඉන්න කොට බේස් වලවල් දැම්මා. දානකොට දෙකේ දෙකේ ලී ගෙනාවා. ලී දාලා බේස් වලවල් දැම්මා. අන්තිමට කණුවලට ලී කපන්න වෙනවානේ. මාස ගාණකින් මහ සභාවේදී එක්කෙනෙක් යෝජනාවක් ගෙනාවා. මෙච්චර ලී ගෙනල්ලා තියෙනවා. දැන් තියෙන්නේ මෙච්චරයි. ඒකෙනුත් ගහලා කියලා. ඔන්න ඔය වගේ තත්ත්වයක් තියෙන්නේ. පැළ මේවා වුණොත් ගෙනාපු ඇට වලටත් වග කියන්න වෙනවා. මේ සභාව එහෙම සභාවක්. මේ ඇටේ පැළ වුණේ නෑ, මේ ගහ මැරිලා ගියා. ඒ සියලු ලේඛන තියෙන්න ඕන. ඒ කෙසේ වුණත් ඔබතුමාගේ යෝජනාව හොඳයි. ඔබතුමා මේක ක්‍රියාත්මක කරන්න කමිටුවක් හදාගෙන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාවේ වගකීම දීලා කෙනෙක්ව පත් කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට වගකීම දීලා පත්කරන්නම්. ඔබතුමා ඒ කමිටුව හදාගෙන කටයුතු කරන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** උප කාර්යාලයේ ඉන්නවා රෝහණ. එයාට භාර දෙන්න. එයා කරයි මේක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා දැන් කමිටුවක් හදා ගන්න. අපේ චමින්ද මන්ත්‍රීතුමත් හොඳයි. මම දකින දේ ඒක.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මන්ත්‍රීවරු එපා. මන්ත්‍රීවරු කරහම ගැහුවා කියාවි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කරන එක නෙමෙයි. මොකක් හරි කමිටුවක් පත් කරන්න ඕනනේ අධීක්ෂණය කරන්න. ඒකට කිහිප දෙනෙක් පත් කර ගන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** හැම පක්ෂයෙන්ම දෙන්නෙක් හරි එක්කෙනෙක් හරි දාන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමාව පත් කරානම් හරි අධීක්ෂණයට. කිසි ගැටළුවක් වෙන එකක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙන් ඕන නම් චන්දනව දාන්න පුළුවන්. අරහෙන් රෝහණව දාන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒ අයව දාලා එහෙම කරමු. මොකද පහුගිය දවස් වල කොම්පෝස්ට් පොහොර පැකට් වගයක් ගෙනත් තිබුණා. කිවුව ගමන් ඒ ටික ඔක්කොම ගෙනිච්චා. අපිට ඒ ටික මූලික වශයෙන් මොන්රෝවියා වත්තෙන් ගෙනල්ලා කරන්න පුළුවන් නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක හොඳ යෝජනාවක්. මට තියෙන ගැටලුව අරක. ඕකට නිලධාරීන්ට කියනවා අච්චර ගෙනාවා. මෙච්චර නැතෙයි කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** පැළ ලොකු වුණොත් මේ භූමියේම ඉන්දනවා. පොහොර ටික කරමු ඉස්සර වෙලා. කමිටුවක් මෙතනදීම පත් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියන්නම්. ලියනගේ මන්ත්‍රීතුමාගේ ප්‍රධානත්වයෙන් ඒකට මමත් සහභාගි වෙන්නම්. කිසි ප්‍රශ්නයක් නැහැ. චමින්ද මන්ත්‍රීතුමා, යසරත්න මන්ත්‍රීතුමා, සුගත් මන්ත්‍රීතුමා, ප්‍රියන්ත මන්ත්‍රීතුමා, ඉන්දික මන්ත්‍රීතුමා පත් කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නෑ මටත් එන්න ඕන ඒකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලියනගේ මන්ත්‍රීතුමා ඔයගොල්ලෝ බේර ගන්න. ඇට පරිස්සම් කර ගන්න. අන්තිමට මට නම් කියන්න එපා මේ ඇටේ නෑ අර ඇටේ නෑ කියලා.

ඔබතුමාලා ඒ ටික බේර ගන්න. මම ඒ කමිටුවට ඇත්තේම නැහැ. ලියනගේ මන්ත්‍රීතුමාගේ ප්‍රධානත්වයෙන් මිලදී ගැනීම් සියල්ලම කරගන්න කිසි ප්‍රශ්නයක් නෑ.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මටත් පොඩි අදහසක් දක්වන්න ඕන මේ සම්බන්ධව. අපි ව්‍යාපාරයක් ආරම්භ කරන කොට ව්‍යාපාරයේ වටපිටාව ටිකක් බලන්න ඕන. දැනට මේ කාර්යාලයේ මේක ආරම්භ කරාට විරුද්ධත්වයක් නැහැ. උප කාර්යාලයේ භූමිය තුළ ආරම්භ කිරීමේදී මට පොඩි ගැටලුවක් තියෙනවා. උප කාර්යාලයට හැරෙන තැන අලහකෝන් මහතාගේ ගෙදරත් පැළ තවානක් සිදු කරනවා. ඒ එක්කම අපි ඒ වටපිටාවේ පරිසරය බලන්න ඕන. තවත් මනුස්සයෙක් එතන පැළ තවානක් කරනවා. ඒ නිසා පැළ තවාන් නැතුව ඇට හා පොහොර වර්ග විතරක් උප කාර්යාලයට දෙන්න. අපි කරන්නේ ව්‍යාපාරයක්. ලාභ ලබන්නනේ කරන්නේ ඇත්තම කතාව ඒක. එහෙම කරන කොට වටපිටාව පොඩ්ඩක් නිරීක්ෂණය කරන්න. ඒක කමිටුවම නිරීක්ෂණය කරන්න. තව කෙනෙකුගේ රැකියාවක් අහිමි වෙන්න පුළුවන්. රජයේ ස්ථානයක් නිසා පාරිභෝගිකයන් යනවා වැඩියි. පෞද්ගලික තැනට වඩා රජයේ තැනට යනවා වැඩියි. ඒ නිසා එතනදී ඒ මිනිස්සු ගැන හිතන්න කියලා ගරු සභාවෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කමිටුව ඒ ගැන තීරණය කරලා, සාකච්ඡා කරලා ඒ ගැන කටයුතු කරන්න. ඒ අදහස, අදහසක් විදියට ගන්න. අනෙක් එක මම ඉල්ලා සිටිනවා විශේෂයෙන්ම කාගේවත් ව්‍යාපාර වලට මේකෙන් බාධා කරන්නේ නැතුව මේක සේවයක් විදියට කරන්න. මේකෙන් ලාභ ලබනවාට වැඩිය සභාවෙන් කරන තවත් සේවයක් විදියට සලකලා කරන්න කියලා මම ඉල්ලීම කරනවා. ඒක කමිටුව කැමති විදියක් තීරණය කරලා කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** සභාපතිතුමා දැන් මේ සම්බන්ධව මෙතුමා කියන එකෙත්, මහජන නියෝජිතයෙක් විදියට වගකීමක් තියෙනවා. කමිටුව අද ස්ථාපිත කරලා මේක ක්‍රියාත්මක කරන්න කමිටුවේ නියෝජිතයන්ට දෙන්න වටපිටාව නිරීක්ෂණය කරන්න. ඒ වාර්තාව අරගෙන මේක ක්‍රියාත්මක කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාලා, ලියනගේ මන්ත්‍රීතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කරලා මෙන්න කමිටුවේ තීරණය කියලා දෙන්න. හැබැයි මම මේක ඉල්ලා සිටිනවා. ඉස්සරහදී නම් කියන්න එපා මෙහෙම යෝජනාවක් ගෙනාවා ඒක මෙතනදිම ඉවර වුණා කියලා චෝදනාව කරන්න එපා. කමිටුවේ වැඩේ කරන්න කිසි ප්‍රශ්නයක් නැහැ. කමිටුවේ වැඩේ කරන්න බොහොම හොඳයි. හොඳ යෝජනාවක්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 12.** රත්නගිරිවත්ත වටරවුම් පාර එම්.පී.පි සිල්වා මහතාගේ ඉඩම අවසාන ස්ථානයේ මාර්ගයට කොන්ක්‍රීට් සිලින්ඩර් යොදා සකස් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මේ යෝජනාව සමඟ විශේෂ ස්තුතියක් කරන්න ඕන සභාපතිතුමා ඇතුළු සමස්ථ සභාවට. නරාවල කොහොඹනාදෙණිය ගිය අවුරුද්දේ ගංවතුර වෙලාවේදී යට වුණා. ඒකට සභාපතිතුමා එක්ක අපි මැදිහත් වෙලා සභාවත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවත් සම්බන්ධ වෙලා සභාවේ බැකෝ යන්ත්‍රයක් දාලා අපි ඒ ඇළ ශුද්ධ කරා. පෙරේදා දිනයේ මහ වැස්ස වෙලාවේ මම නිරීක්ෂණය කරා වතුර මට්ටම වෙනදා වගේ වැඩි වීමක් වෙලා තිබුණේ නැහැ. ඇළ පළල් කිරීමත් සමඟ ගංවතුර අවදානමක් ඇවිත් තිබුණේ නැහැ නරාවල ප්‍රදේශයට. ඊයේ දවසේත් කොහොඹනාදෙණිය ප්‍රදේශයේ මිනිස්සු එකතු වෙලා එන්න කියලා සභාපතිතුමාටත්, සභාවටත් ස්තුති කරා. සභාවෙන් ඒ කරපු කාර්යය ඇගයීමට ලක් කරා. ඒ වගේම තමයි ඒ ඇළ මාර්ගය සංවර්ධනය කිරීමේදී යම් කිසි ගැටලු කිහිපයක් මතු වුණා. මටත් පොලීසි යන්න සිදු වුණා. පෙරේදත් පොලීසියෙන් කතා කරා. මොකද ඇළ කපපු තැන, ඇළ ඉවුරේ ඉන්න මිනිස්සුන්ට හානියක් සිදු වුණා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා ඔබතුමා තවත් පොලීසි යන්න ඕන නැහැ. ඒ අයට කියන්න අවශ්‍යනම් අධිකරණයට යන්න කියලා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මම කිවුවා පොලිස් ස්ථානාධිපතිතුමාට අද පෙරවරු 10.30ට එවන්න කියලා සභාවට යෝජනාව දාලා තියෙනවා කියලා. අද දවසේ ඒ අය ඇවිත් නැහැ.

**13.** නරාවල, කොහොඹනාදෙණිය, කටු අත්ත ඇළ මාර්ගයේ දෙපස අයිතිය තහවුරු කර ඇළ දෙපස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මොකද ඇළ දෙපස අයිතියක් ඒ අයට නැහැ. එක්කෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුව කියන්න ඕන. ඒ අයට ඔප්පුවක් නැහැ. මේක මේ අයිතියක් නැති එකකට තමයි පැමිණිල්ලක් දාලා තියෙන්නේ. අයිතියක් නැති දේකට පැමිණිල්ලක් දාලා පොලීසිය ඒක විභාග කරන එක වැරදියි මම හිතන්නේ. එහෙම නම් තමන්ගේ කියලා අයිතියක් තියෙන්න එපැයි ඉඩමක. අයිතියක් නැති කෙනෙක් ඉඩමකට පැමිණිල්ලක් දැම්මහම පොලීසිය ඒක විභාග කරන එකත් වැරදියි. සභාව මැදිහත් වෙලා මේක විසඳලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා මින් ඉදිරියට පොලීසි යන්න එපා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** පොලීසියට ගියේ නෑ දෙසැරයේම. කෝල් කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කෝල් කරත් යන්න එපා. ඔබතුමා කියන්න සභාවට විරුද්ධව ඒ අයට අධිකරණයට යන්න කියලා. එතකොට අපි බේරගමු. ඔබතුමා තවත් යන්න එපා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගියේ නැහැ. මට විරුද්ධව කොහොමවත් මුකුත් කරන්න බැහැ මම යෝජනා කරා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අයට නඩුවක් දාලා බේරගන්න කියන්න. දැන් අපි වැඩ කරලා ඉවරයිනේ. ඔබතුමාගේ මැදිහත් වීම ගැන ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා සැහෙන්න කාර්යභාරයක් කරා එතනදී.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මේකට ගමේ මිනිස්සුන්ට ප්‍රශ්නයක් තියෙනවා මේවායේ අයිතිය කාටද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ගන්න ඕන. ඒකට ඉල්ලීමක් කරමු. වාරිමාර්ගෙන් ඉල්ලා යවපු ගමන් රිසවේෂන් එක මාර්ක් කරලා දෙනවා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

<u>ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා, මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. මේ මොහොත වෙන කොට ලෝක වසංගතයක් වෙලා තියෙන කොවිඩ් 19 වසංගතය අපේ රට ඇතුළෙත් බොහොම බලපෑමක් ඇති කරලා තියෙනවා. ඒ බලපෑම ඇති කරපු වෙලාවේ අපි රටක් විදියට ඒකට මුහුණ දීපු ආකාරය ගැන අපේ විවාදයක් නැහැ. මේ අවස්ථාවේ සෞඛ්‍ය අධ්‍යක්ෂක ජනරාල්තුමා ඇතුළුව සෞඛ්‍ය සේවයේ සියලුම නිලධාරීන් ඒ වගේම විශේෂයෙන්ම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු, හෙද හෙදි නිලධාරීන් ඇතුළු සියලුදෙනා කරපු කැප කිරීම අසීමිතයි මේ වසංගතය අපේ රටෙන් තුරන් කර ගැනීමට.

ඒ වගේම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා, ප්‍රාදේශීය ලේකම්තුමිය ඇතුළු සියලුදෙනා ලබා දුන්නු ඒ අසීමිත සහයෝගය නිසා, ඒ කැපකිරීම නිසා ඇත්තටම අපිට මේ වෛරසයට මේ ආකාරයෙන් මුහුණ දෙන්න පුළුවන් වුණා. හැබැයි තාම කොහේවත් නිශ්චිත වශයෙන් කියලා නැහැ මේ වෛරසය ඉවරයි කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක දන්නවා මන්ත්‍රීතුමා. ලෝක සෞඛ්‍ය සංවිධානය පවා කියනවා මේක තව වර්ෂ ගණනාවක් යනකම් තුරන් කරන්න හැකියාවක් නැහැ කියලා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මේ වෛරසය කා ගාව තියෙනවද, කොයි මොහොතේ හැදෙයිද කියන එක අපි දන්නේ නැහැ. ඒක තාම බෙහෙතක් හොයාගත්තේ නැති වෛරසයක්. ඒක නිසා අපි කියනවා අපේ පැත්තෙන් ඒ කරපු යෝජනාවත් එක්කම එන්නේ. මීට වඩා මහජනතාව ගානේ පරීක්ෂණ කරන්න. පී.සී.ආර්. පරීක්ෂණය මීට වඩා ජනතාවට කරන්න ඕන. ඇත්ත වශයෙන් බැලුවොත් දැනට 1800ක් වගේ තමයි දවසකට කරනවා කියන්නේ පරීක්ෂණ. හැබැයි ඒ ප්‍රමාණ වැඩි කරන්න. රටේ ජනතාවගේ අවශ්‍යතාවය තියෙන්නේ ජනතාව නිරෝගීව සිටීම තමයි. ඒක තමයි මූලික අරමුණ වෙන්න ඕන රටක. ඒ සඳහා එවැනි යෝජනා මේ සභාවේදී රජයට මතක් කරලා දෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නමුත් මන්ත්‍රීතුමා ඔබතුමා මෙතනදී සඳහන් කරන කාරණයක් තියෙනවා. ඔබතුමාගේ යෝජනාව එතරම් දුරට අනුමත කරන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මම එතනට එන්න තමයි මේ කියන්නේ. මම දාපු යෝජනාවෙන් කියන්නේ රජයක් විදියට ජන ජීවිතය නගා සිටුවීම ගැන. මම පළමුවෙන් කියන්නේ මේ කාර්යය සඳහා සහයෝගය ලබා දීපු ආරක්ෂක අංශ, සෞඛ්‍ය අංශ ඒ සියලුදෙනාට පක්ෂයක් විදියටත් මේ මොහොතේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් විදියටත් ගෞරවනීය ස්තුතිය පුද කරනවා. ඒ අසීමිත කැප කිරීම පිළිබඳව, ඒ සම්බන්ධතාවය එක්කම මම මේ ජන ජීවිතය ගැන කියන්නේ. දැන් මේ මොහොත වන විට මේ ප්‍රශ්නය අපේ රටට එන්නේ හරියට ගත්තෝතින් අපේ රටේ ආර්ථිකය හොඳම තැනක තියෙන කොට. මාර්තු හා අප්‍රේල් මාස කියන්නේ අපේ රටේ බහුතරයක් ජනතාව තමන්ගේ ආර්ථිකයේ මොනවා හරි දෙයක් හොයා ගන්න මාස දෙක. ගාල්ල ගත්තහම කඩවල වෙළඳාම හොඳටම තියෙන්නේ මේ මාස දෙකේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන එක හරි මන්ත්‍රීතුමා. ඕකෙම තව පැත්තක් හිතන්න ඕන මන්ත්‍රීතුමා පක්ෂ භේදයකින් තොරව. ඒවගේම තමයි රටත්. සියලු දේ අකර්මන්‍ය වෙලා තියෙනවා රටේ. රටේ ආදායම ලැබෙන සියලු තැන් අවහිර වෙලා තියෙනවා. සංචාරක ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම වැහිලා තියෙන්නේ. අපේ ප්‍රාදේශීය සභාව උදාහරණයකට ගත්තහම වරිපනම් ආදායම නෑ, රජයේ බැංකු වලින් ගනිපු ණය ගෙවන ඒවා සියල්ල නැවතිලා තියෙන්නේ. සියලුදේ දරා ගෙන රජය රුපියල් පන්දාහක් මිනිස්සුන්ට දී ගෙන යන ගමන ගැන ස්තුතිවන්ත වෙන්න ඕන. අඩුපාඩු තියෙන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඇත්තටම මේ රුපියල් පන්දාහ දෙන එක සාධාරණයි. ඒක අපි පිළිගන්නවා. මේක මම කොහේවත් කියලා නැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා මෙතනදී කියනවා ''රජය ගන්නා ක්‍රියාමාර්ග ඉතාම අල්ප බැවින් '' කියලා. අල්ප බැවින් කියලා වචනයක් ඔබතුමා මෙතනදී සඳහන් කරනවා. ඒකට එකඟ නැහැ. රජය ගන්න පුළුවන් ක්‍රියාමාර්ග අරගෙන තියෙනවා. අපේ ප්‍රාදේශීය සභාව ගන්නකෝ. අපිට තියෙන ආදායම් ඔක්කොම අපි නැවැත්තුවාණේ. අද සභා තීන්දුවකුත් අරගෙන නැවැත්තුවනේ. අපිට නැත්නම් මිනිස්සුන්ට ගිහිල්ලා කියන්න තිබුණානේ බිස්නස් නොකළාට මාසික කුලිය දෙන්න කියලා. වරිපනම් ටික ගෙවන්න කියන්න පුළුවන්නේ. සභාවක් විදියට අපි ඒවා දරාගෙන ඉන්නවා. ඒ දරාගෙන හිටියා කියලා අපි මිනිස්සුන්ට දීපු සහනාධාර අඩු කරලා නැහැ. අපි මිනිස්සුන්ගේ අතිකාල දීමනා නොදී ඉඳලා නැහැ. අන්න ඒ වගේ තමයි රටත්. ආදායම හම්බ වෙන්න ඕන මන්ත්‍රීතුමා වියදම් කරන්න. මේ රටේ මේ ආදායම හම්බ වෙන්නේ නැතුව වියදම් කරගෙන යන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මම දාපු යෝජනාවේ අල්ප කියන වචනය ඉල්ලා අස්කර ගත්තා කියන්නකෝ. මම කියනවා මේ මොහොතේ රුපියල් පන්දාහ දීපු එක සාධාරණයි. මම යෝජනාවක් හැටියට ඉස්සරහට කරන්නේ ඒ රුපියල් පන්දාහට වඩා පුළුවන්නම් තව රුපියල් පන්දාහක් හරි තව කීයක් හරි රජය මැදිහත්වෙලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව් ඒක අපිත් කියනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒ එක්කම තමයි මම කියන්නේ ජන ජීවිතය ගැන.

**රු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මේ මාසේ දීලා ලබන මාසෙත් දෙනවා රුපියල් පන්දාහ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒක හරි. ඒක හොඳයි. නරකයි කියලා කියන්නේ නැහැ. අපි හොඳ දේට හොඳයි කියනවා. නරක දේට නරකයි කියලා කියනවා. ඒක ඇත්ත. හැබැයි මම කියන්නේ කඩා වැටිච්ච ජන ජීවිතයක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන්නම් මන්ත්‍රීතුමා මම දකිනවා ඒක යම් තාක් දුරකට හරි ගිහිල්ලා. අද නැවත ඉදිකිරීම් ක්ෂේත්‍රය ආරම්භ වෙනවා. ඊට පස්සේ කඩවල් ටික ක්‍රමක්‍රමයෙන් ඇරෙනවා. දැන් අපිට කියන්න පුළුවන් ඒකෙම අනිත් පැත්ත. මුළු රටම එක පාර විවෘත කරොත් තව ප්‍රශ්නයක් එනවා. කොරෝනා වසංගතය නැවත මේක ඇතුළට රිංගුවොත් නැවත අපිට ඔය චෝදනාව අනිත් පැත්තට කරනවා. මේක මෙහෙම මෙච්චර හොඳට කරගෙන ආවා නැවත මේ රජය විනාශ කරා කියලා. අද සුරාසැල් ඇරලා කොයිතරම් චෝදනාවක් ලබනවාද ආණ්ඩුව. නමුත් දවසට කෝටි 50 යි ආදායම අහිමි වීම. කට්ටිය කොච්චර දුක් වින්දද.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ජනතාවගේ ජන ජීවිතය කඩාගෙන වැටිලා තියෙන්නේ. අපි කියන්නේ මීට වඩා මොන ක්‍රමයකින් හරි රජයක් හැටියට ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව තියෙන්න ඕන. දැන් අපි මේ කොවිඩ් වසංගතය පිළිබඳව අපි සහභාගි වුණ මුල්ම සාකච්ඡාවේදී කිවුවේ, අපේ පක්ෂය සහභාගි වුණ පළවෙනි සාකච්ඡාවේදීම කිවුවේ මේකට සියලු දේශපාලන පක්ෂ, සියලු සිවිල් සංවිධාන, සියලු ක්‍රියාකාරකයින් සම්බන්ධ කරලා ජාතික වැඩපිළිවෙලක් හදන්න රට ගොඩ නඟන්න. වසංගතය ඉවර වෙනවා එක්කම රටත් ගොඩ නැගෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔතනත් වෙලා තියෙන්නේ සභාවට වෙච්ච දේ නේ. දැන් සභාවත් ඔහොම හැදුනනේ මුලින්.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** එහෙම වැඩක් හැදුවේ නැහැනේ මුලින්. ජාතික වැඩපිළිවෙලක් හදලා, ජාතික ප්‍රතිපත්තියක් ඉදිරිපත් කරේ නැහැනේ. ඒක නිසා තමයි අපි කියන්නේ. සභාවේ වුණත් ඔබතුමාට චෝදනාව ආවේ ඒකයි. ඔබතුමා මෙතන පළවෙනි සාකච්ඡාව කරනවා, දෙවැනි සාකච්ඡාවට කිසිම කෙනෙක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** රට යන විදියට තමයි අපිත් යන්න ඕන.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** අන්න එහෙම ගියහම සභාපතිතුමා කවදාවත් ගොඩ එන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා දැන්වත් ඒක තේරුම් ගන්න. රට යන විදියට තමයි මන්ත්‍රීතුමා අපිත් යන්න ඕන.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** යන්න පුළුවන් තව ටික කාලයක්. මාස හයක් විතර යන්න පුලුවන්. මාස හයකට විතර පස්සේ තමයි තේරෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා මම මේක තේරුම් අරගෙන ඉන්නේ. මෙතන ඔබතුමාලා සමාජය වෙනස් කරන්න යනවා. අඩුම තරමේ ඔබතුමාලාගේ පක්ෂය ඇතුළේ තියෙන ප්‍රශ්නය නිරාකරණය කර ගන්න බැරි වුණා. පක්ෂයත් කැඩි කැඩී ගියා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒක ලොකු ප්‍රශ්නයක් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියන එක තේරුම් ගන්නකෝ. කුඩා පක්ෂයකටවත් තමන්ගේ පක්ෂය ආරක්ෂා කර ගන්න බැරුව රජයකට ඔබතුමන්ලා චෝදනා කරනවා. මෙතන මම නෙමෙයි අබේසේකර මන්ත්‍රීතුමා හිටියත්, බුදු හාමුදුරුවෝ මෙතන හිටියත් හැසිරෙන්නේ පක්ෂ දේශපාලනය එක්ක. ඇත්ත කතාව ඒක. ඒක බුද්ධිමත්ව තේරුම් ගන්න ඕන. ජනතා විමුක්ති පෙරමුණ මෙතන හිටියත් වෙන්නේ ඒක. ඔය කොච්චර ප්‍රජාතන්ත්‍රවාදය, සමාජවාදය තිබුණ ඔබතුමාලගේ සභාව තිබුණද තිස්සමහාරාමයේ. නෑ ඊළඟපාර පරාදයිනේ. සභාවත් නැතුව ගියා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒක උදුරා ගත්තා. සල්ලි ගෙනිහිල්ලා පොම්ප කරා. ඔබතුමා අද බලන්න ගිහින් තිස්සමහාරාමයේ එදා තිබුණ තත්ත්වයද අද තියෙන්නේ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පැරදුණා. මොන ක්‍රමයෙන් හරි එහෙම වුණා. මම කියන්නේ මන්ත්‍රීතුමා ඒකයි. නමුත් ජනතා විමුක්ති පෙරමුණට අද තිස්සමහාරාමයේ ඡන්ද නැහැ. ඒක තමයි දේශපාලනය කියන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒක දේශපාලනය නෙමෙයි. ඒක තිස්සමහාරාමයේ ඉන්න මිනිස්සුන්ගේ තියෙන අවාසනාව. ඒ මිනිස්සුන්ට ඒක හරියට කරගෙන යන්න දුන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ඔබතුමන්ලා කියන තවත් එක කතාවක්.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මට දැන් මගේ යෝජනාවවත් ඉදිරිපත් කර ගන්න බැරි වුණා. ඔබතුමා අපේ පක්ෂය කඩා ගෙන ගිය එක කතා කරනවා. ප්‍රශ්නයක් නැහැ කඩාගෙන ගියත්. අපෙන් ගිහිපු කිසිම කෙනෙක් ගත්තේ නැහැ. ගියානම් කනෙන් අල්ලලා දැම්මා එළියට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ගෙනාපු මේ යෝජනාවට අපි එකඟ නැහැ. රජය විදියට හොඳින්ම කොරෝනා මර්දනය කරන රටක් විදියට මේ ලංකාවට කීර්තියක් එද්දි ඔබතුමා මේක ගෙනාවහම අපේ සභාවෙන් නම් මේ යෝජනාව යවන්න කියන්න එපා. ඔබතුමාට ඕන නම් යෝජනා කරලා තියන්න.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** අපි කොහේ හරි කියලා තියෙනවාද රටක් විදියට ගනිපු ක්‍රියාමාර්ග වැරදියි කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ යෝජනාව එක්ක ඒක හැල්ලුවට ලක් වෙනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඔබතුමා තේරුම් ගනිපු ප්‍රමාණය ඒක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන එක මට තේරෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මම කියන දේ ඔබතුමා තේරුම් ගනිපු ප්‍රමාණය තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඔබතුමා කතා කරන්නේ වෙන දෙයක්. යෝජනාවේ අර්ථ දැක්වෙන්නේ වෙන දෙයක්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** විපක්ෂය සහයෝගය ලබා දුන්නා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙතුමා කියන්නේ වෙන දෙයක්. මේකේ තියෙන්නේ වෙන දෙයක්. මම කියන්නේ මේකේ තියෙන එක කියන්න.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මම ඒ යෝජනාව ඉදිරිපත් කරේ නැහැ. මම කරේ මගේ ස්තුතිය පළ කිරීමක් පටන් ගැන්ම විදියට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ස්තුති කරාට වෙන දෙයක් තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මම මගේ යෝජනාව කරන්න කලින් මේ සභාවට ස්තුතියක් කරන්න ගියේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** යෝජනාව කරලා ඒ පැහැදිලි කිරීම කරන්න.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒක තමයි. මට ඒක කරන්න දුන්නද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඔබතුමා වෙන දේවල්නේ කතා කරන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මම යෝජනාව ඉදිරිපත් කරේ නැනේ තාම. ඔබතුමානේ කියවන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන එක නෙමෙයි මේ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මම කියන්නේ තාම යෝජනාව නෙමෙයි. මම කියන දේ ඔබතුමා තේරුම් ගන්න. මම දැන් යෝජනාව කියවන්නද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හා කියවන්න.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ- 14.** කොවිඩ් 19 වසංගතය හේතුවෙන් අඩාල වී ඇති ජන ජීවිතය යළි යථා තත්වයට පත් කිරීමට රජයක් විදියට ගන්නා ක්‍රියාමාර්ග ඉතාමත් අල්ප

බැවින් ජන ජීවිතය නගා සිටුවීමට රජය මීට වඩා සක්‍රීයව මැදිහත් විය යුතු ලෙස ප්‍රාදේශීය මට්ටමෙන් රජයට යෝජනා කරන ලෙස සභාවට යෝජනා කරමි.

ඉතා අල්ප කියන වචනය මම ඉල්ලා අස්කර ගන්නවා රටට වැඩ කොටසක් කරපු නිසා. සෑහෙන්න වැඩ කොටසක් කරපු නිසා.

මම කියන්නේ දැන් මේ කඩා ගෙන වැටුණ ආර්ථිකයක් තියෙනවානේ මිනිස්සුන්ගේ. එදිනෙදා කුලී වැඩ කරපු, මේසන් වැඩ කරපු කඩවල වැඩ කරපු අය ඉන්නවා. අපි දන්නවා ගාල්ලේ කඩවල මැයි මාසේ පඩිය ගෙවපු විදිය ගැන. රෙදි කඩවලින් වැටුප් දීලා තියෙන්නේ ආපු දවස් 07 ට විතරයි. නමුත් මූලික වැටුප රු. 21,000/-

(ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාම හිතන්න මන්ත්‍රීතුමා ඒක ගැන.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** අපි කියන්නේ මේ ප්‍රශ්නය රටේ තියෙන දෙයක්. ඔබතුමාලට මේක අහගෙන ඉන්න බැරි ප්‍රශ්නයක් තියෙනවානේ. වෙන දෙයක් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනේ නැහැ කියන්න.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** එහෙම තත්ත්වයකට මේ රට කඩා වැටිලා තියෙනවා මේ මොහොතේ. සාමාන්‍ය කුලී වැඩ කරන මිනිස්සු, මේසන් වැඩ කරන මිනිස්සු, වඩු කර්මාන්තයේ යෙදෙන මිනිස්සු අසරණ වෙලා තියෙනවා මේ වෙලාවේ. රුපියල් පන්දාහක් දීපු එක හොඳයි. බැහැයි ඒ රුපියල් පන්දාහ මිනිස්සුන්ට මාසයක් ජීවත් වෙන්න මදියි. අපි කියන්නේ ඊට වඩා ප්‍රායෝගික මට්ටමින් රටේ සියලු මේ සම්බන්ධ කටයුතු කරන්න පුළුවන් සංවිධාන එකතු කරගෙන හරි මේ ජන ජීවිතය නඟා සිටුවීමට මාස දෙක තුනක හරි වැඩපිළිවෙලකට යන්න කියන යෝජනාව තමයි අපි කියන්නේ. ඒක සක්‍රීය කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** යෝජනා ඉවරද, නැත්නම් මම දැන් අදහස් දැක්වුවහම කියාවි මැදින් පැන්නා කියලා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** හරි දැන් ඔබතුමාගේ අදහස කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඔබතුමාලා දැක්කා ඇඳිරිනීතිය දැම්මහම එළියටවත් බහින්න බැරුව හිටියේ. සමහර කඩවල අවුරුද්දට ලක්ෂ ගණන්, කෝටි ගණන්වලින් ව්‍යාපාර කරා. එක රුපියල් සීයක ආදායමක් තිබුණේ නෑ ඔය රෙදි කඩවලට. ඉතිං ඒ මිනිස්සු ආපු දවස් හතට හරි ගෙවපු එක වටිනවා. මේ තිබුණ තත්ත්වය අපි කතා කරමු. යසරත්න මන්ත්‍රීතුමා ඔබතුමාට ගෙවන්න පුළුවන්ද ආදායම එන්නේ නැතුව.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** කරන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නමුත් දැන් මන්ත්‍රීතුමා ක්‍රමක්‍රමයෙන් ඒක යථා තත්ත්වයට පත් වෙනවා. අද යන්න බලන්න රිච් ලුක් එකට. අද යන්න බලන්න හෙමාරා එකට. අද යන්න බලන්න දොළොස්මහට. අද යම් කිසි මිනිස්සු ප්‍රමාණයක් එකතු වෙනවා. මේක ලිහිල් කරන කොට රජයට කොයිතරම් බැන්නද, බැන්න එක නෙමෙයි අද ඒක ලිහිල් නොකරම තිබුණානම් මොකද වෙන්නේ. මේ චෝදනාව අද එහෙමනම් මීට වඩා ලොකු විදියට කරනවා. නමුත් අද මේක යථා තත්ත්වයට පත් වෙලා තියෙනවා මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** හරි ඒක පුද්ගලික අංශයේනේ ඔබතුමා කියන්නේ. ඔබතුමා කියන්නේ පුද්ගලික අංශයට මේක දරා ගන්න බැහැ. දවස් පහක් වැඩ කරාම පඩියෙන් භාගයක් දෙන්න බැහැ. විදුලි බිල්පත්, ජල බිල්පත් සම්බන්ධව රජය කිව්වා මාස දෙකක බිල්පත් එකතු කරන්න එපා කියලා. දැන් බිල එන්නේ කොහොමද,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ටික ආවට පස්සේ කිවුවේ. ඒකට ක්‍රමවේදයක් හැදෙයි. මට හොඳට මතකයි බෙදුවට පස්සේ තමයි ආණ්ඩුව ඒ ප්‍රකාශය කරේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මොන මාසයේ බිලද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මාර්තු, අප්‍රේල් මාස දෙකේ බිල් දෙක.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** එතකොට තව එකක් තියෙනවා මේකේ. මේ බැංකුවලට ගෙවන්න තියෙන ණය සඳහා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට දැන් රජයේ මාධ්‍ය ප්‍රකාශක වෙන්න වෙලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** අපි දැන ගන්න එපැයි. රටේ දැනට සක්‍රීයව තියෙන එකම දේශපාලන ව්‍යුහය තමයි මේක. පාර්ලිමේන්තුව නෑ. ඔබතුමාලා හදාගනිපු තාවකාලික කැබිනට් මණ්ඩලයක් තියෙනවා අගමැතිවරයා, ජනාධිපතිවරයා එක්ක. ඊට අමතරව බිමට යන සක්‍රීයව තියෙන දේ තමයි මේ. මේකෙදිවත් අපි අහන්න එපැයි මේ ප්‍රශ්නයට උත්තර කොහෙන්ද කියලා. දැන් බැංකුවල ණය පහසුකම් මාස තුනකට අත් හිටෙව්වා. ලීසිං වලටත් ඒක ලබා දුන්නා. දැන් මේවා ක්‍රියාත්මක වෙනවාද,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව්.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මොන බැංකුවේද ක්‍රියාත්මක වෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ක්‍රියාත්මක වෙනවා. ක්‍රියාත්මක වෙන්නේ නැත්නම් ඒ පිළිබඳව ක්‍රියාමාර්ග ගන්නත් පුළුවන්. වතුර වලට, ලයිට් වලට ඊළඟ මාසයේදී සහන දෙනවා. මම දන්නේ නෑ ඉතිං ආණ්ඩුව කියන දේ කියන්නේ. ආණ්ඩුවේ ඔක්කොම කුණු ගොඩවල් මේ සභාවට ගන්න බැහැ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාවෙන් මම දැන් යනවා අර යෝජනාව සම්බන්ධව මගේ විරෝධතාවය ප්‍රකාශ කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හිටියොත් විතරයි පුළුවන්. එහෙම ප්‍රකාශ කරන්න බැහැ. විරුද්ධනම් ඉන්න අය වෙන්න ඕන. ඒක ඔබතුමා කිවුවා කියලා සඳහන් කරන්න බැහැ. ඉඳලා ඒ වෙලාවට උත්තර දෙන්න. අපි තාම දන්නෙත් නැහැ ඡන්දයකට යනවාද නැද්ද කියලා. ඒක ඒ වෙලාවට කරන්න. එහෙම බැහැ. මේකට අදාළ නැහැ ඒක. ගිහිල්ලා ඒ වැඩේ කරගෙන හරි ඒ වෙලාව වෙනකොට එන්න. හිටියොත් අපි ඒක බලමු.

(ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා, ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපි දැන් හරි මේ යෝජනා කරන්නේ අපිත් කැමතියි පක්ෂයක් විදියට මේ ආපු වසංගතයේදී අපිට මේ රටේ වසංගතය වෙනුවෙන් දෙයක් කරන්න ලැබීම ගැන. අපි පක්ෂයක් විදියට ඔයගොල්ලන්ට ඕනම වෙලාවක උදවු කරන්න කැමතියි. සාමාන්‍ය ජන ජීවිතය සම්බන්ධයෙන්, බඩු මල්ල බෙදීම සම්බන්ධයෙන් අදහසක් තියෙනවා. මම ස්තුති කිරීමක් කරනවා ගයාන් ගීතික මන්ත්‍රීතුමාටයි, සුමිත් ජයසේකර උපසභාපතිතුමාටයි. ඒ කොට්ඨාශ දෙක සම්බන්ධව කිසිම ගැටලුවක් මට තිබුණේ නැහැ. මම ඔබතුමාට දුරකථනයෙන් අමතනකොටත් සභාපතිතුමාව මම දැනුවත් කරා. ලියනගේ මන්ත්‍රීතුමාටත් මම නම් ටිකක් ලබා දුන්නා උළුවිටිකේ ප්‍රදේශයේ. ඒ කටයුත්තේදී ඒ දෙපළට මම ස්තුතිවන්ත වෙනවා. අපි ඒ ගෙනාපු නම් ටිකේ තිබුණෙත් ජනජීවිතය මේ මොහොතේ කඩා වැටුණ අයගේ. සමෘද්ධියවත් හම්බවෙන්නේ නැති, වැඩිහිටි දීමනාවත් හම්බ වෙන්නේ නැති, රජයේ සේවකයොත් නොවන විශ්‍රාම වැටුපක් නැති කිසිම දෙයක් කර ගන්න බැරි පිරිසක් හොයා ගෙනයි. මේ අපිට ඡන්දය දීපු මිනිස්සු නෙමෙයි, හොයාගෙන යනකොට අපිට හම්බ වෙච්ච මිනිස්සු. ඒ හම්බ වෙච්ච මිනිස්සුන්ගේ ලිස්ට් එකක් ගෙනල්ලා දුන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** අපේ ශාඛා සමිතියේ භාණ්ඩාගාරිකගේ ලැයිස්තුවත් එහෙන් ආවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒ ලිස්ට් එකත් මම දුන්නා. මම ගොඩකන්ද, කරාපිටිය ප්‍රදේශයේ ඉන්න අපේ පක්ෂ සංවිධායකවරුන්ට මම කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ තරමම අපි ක්‍රියාකාරී. හැම පැත්තටම යනවානේ. හැබැයි ඒකෙදි හොඳ ටිකක් තෝරා ගත්තා අපි.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මේ වගේ යෝජනාවලට පක්ෂයක් විදියට අපි පූර්ණ සහයෝගය ලබා දෙන්න සූදානම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මිනිස්සු හරි බුද්ධිමත්. පක්ෂ දෙක තුනම අල්ලගෙන තමන්ගේ වැඩේ කර ගන්නවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** අනිත් එක තමයි රටේ අසීමිත දුක් විඳපු ජනතාව ඇත්තටම නිරෝධායනය කාලේ තම තමන්ගේ කාර්යභාරය හරියට ඉෂ්ඨ කරා. විශේෂයෙන්ම බෝපෙ පෝද්දල ජනතාවට අපි ස්තුතිවන්ත වෙනවා. මෙවැනි වසංගතයක් වෙලාවේදී ස්වයංනිරෝධායන ක්‍රියාවලියට සහයෝගය දුන්නාට. ඇත්තටම අපි ඒක අගය කරනවා. එදිනෙදා වැඩ කරන බහුතරයක් ජනතාව තමයි මේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ඉන්නේ. දවස් කුලියට වැඩ කරන අය ස්වයංනිරෝධායනය ඉතා ගරු කොට සැලකුවා. අපි කියන්නේ මේ ජන ජීවිතයට මීට වඩා අල්ප කියන වචනය අල්ල ගන්නවට වඩා රජය හෝ පුද්ගලික අංශ මැදිහත්වෙලා වැඩ කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ වුණාට මන්ත්‍රීතුමා මේ එක වචනයෙන් යෝජනාවේම අර්ථය වෙනස් වුණා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒ ඔබතුමාලා දේශපාලන කෝණයෙන් බලන නිසානේ. දේශපාලන කෝණයෙන් බලන්න එපා. අල්ප වශයෙන් කියන වචනය මම ඉවත් කර ගත්තා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ පළවෙනි යෝජනාවටම විනාඩි 35ක් විතර ගියා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** නෑ ඉතිං පැය ගණන් කතා කරපු අය ඉන්නවානේ මේකේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තව යෝජනා දෙකක් තියෙනවානේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** කිසිම වැඩක් නැතුව කතා කරන දේවල් තියෙනවානේ. උදේ 9.30 ට පටන් ගත්ත එක 12.30 වෙනකම් බඩුමල්ලක් අල්ල ගෙන කෑ ගැහුවා. වැඩක් නැනේ පැය 03 ක්. රුපියල් 400 ක බඩු මල්ලට පැය 03 ක් කතා කරා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ලක්ෂ 40 ක් ඒක.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** අපි මේ කතා කරන්නේ සාමාන්‍ය ජන ජීවිතය ගැන. මේකට පැය නෙමෙයි දවස් ගාණක් කතා කරත් කමක් නැහැ. ජන ජීවිතය නගා සිටුවන්න දවස් ගාණක් කතා කරත් කමක් නැහැ. ඒක හින්දා කලබල වෙන්න එපා. මම දෙවැනි යෝජනාව ඉදිරිපත් කරන්නම්.

**15.** බැදිපාර මල් මාවතට හැරී මීටර් 50ක් පමණ දුරින් ඇති තුන්මංහන්දියට එකතුවන ජලය පාරෙන් අනෙක් පස ඇති කාණුවට හැරවීමට කුඩා සිලින්ඩර් දෙකක් දමා එම ජලය කාණුව දිගේ යාමට සලස්වන ලෙස සභාවට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒක මම හිතන්නේ ඇත්තටම උප සභාපතිතුමා දන්නවා. තුන් පැත්තකින් වතුර ඇවිල්ලා එක තැනකට එකතු වෙනවා. වරුසාව වෙලාවට යන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ- 16.** කපුහෙම්පල කිවුලදූව වත්ත මාර්ගයේ මීටර් 100ක පමණ ප්‍රමාණය මුළුමනින්ම අබලන් වී ඇති බැවින් එය ඉතා ඉක්මණින් සකස්කර දෙන ලෙසට සභාවට යෝජනා කරමි.

මේ පාර ගැන කියන්නම ඕන. මොකද දන්නවාද?, මම හිතන්නේ උපසභාපතිතුමාගේ කාලයේ තමයි පාරේ පටන් ගැන්ම දාන්නේ. පාරේ පටන්ගැන්ම දානවා. මම මේකේ පුද්ගලයාගේ නම සඳහන් කරේ නැහැ. ජගත් කන්නන්ගර කියන සමෘද්ධි නියාමකගේ ගේ ගාවට දානවා. යහපාලන ආණ්ඩුව ඇවිල්ලා ගම්පෙරළියෙන් අනිත් පැත්තෙන් පටන් අරගෙන මීටර් 100 ක් විතර ඉතුරු කරලා දානවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ මන්ත්‍රීතුමා මේකේ නඩුවක් තියෙනවා. ඒ සම්බන්ධව නඩුවක් තියෙනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** සභාව මැදිහත් වෙන්න එපැයි ඒවාට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවෙන් නඩුවට ඉදිරිපත් වෙනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මම කියන්නේ නඩුව පැත්තකින් තියමුකෝ. ඇත්තටම ඔබතුමාලා ගිහින් බලන්නකෝ ඒ පාරේ යන්න පුළුවන්ද කියලා. එතුමත් එක්ක කතා කරලා ඒ ප්‍රශ්නය විසඳගන්න පුළුවන්නේ එහෙම නම්.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒ කිවුලදූව පාර කාලයක් තිස්සේ හදන්න අත්‍යාවශ්‍ය පාරක්. ජගත් කන්නන්ගර මහත්තයලගේ ඉල්ලීමක් තිබුණා නඩු කටයුත්ත තිබුණ ප්‍රදේශය ඉවත් කරලා මේ පාර හදලා දෙන්න කියලා. ඒ නිසා ඒ පාරේ මීටර් 150ක් වගේ තමයි හැදුනේ. තව හැදෙන්න තිබුණා. නඩු කටයුත්ත තිබෙන කොටස හදන්න බැහැ. ඩික්සන් රාජා සභාපතිතුමාගේ කාලයේ ඒ පාර හදන්න ගිහිල්ලා ගැටුමක් ඇති වෙලා එක පාර්ශවයකට අසාධාරණයක් වුණා කියලා නඩුවක් යනවා. දැනට සභාවෙනුත් නඩුවට ඉදිරිපත් වෙනවා. ඒක ඉවර වෙච්ච දවසට අපි ඉතුරු ටික හදලා දෙමු. මේ පැත්තකින් කොටසකුත් අනිත් පැත්තෙන් එක කොටසකුත් අපි හැදුවා. නඩු කටයුත්ත තියෙන කොටස හදා ගන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අර ටිකට විතරයි නඩුව තියෙන්නේ. එතුමාගේ ගේ ඉදිරිපිට කොටසට විතරයි නඩුව තියෙන්නේ. නඩුවට ප්‍රාදේශීය සභාවෙනුත් ඉදිරිපත් වෙනවා. අපිට බැහැ ඊට වැඩිය දෙයක් කරන්න. අධිකරණයෙන් තමයි ඒ තීන්දුව ගන්න ඕන. අධිකරණ තීන්දුව ගත්තට පස්සේ ඉතුරු ටික සලකා බලමු.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මම විශ්වාස කරනවා නඩුව ඉවර වෙනකම් ඒ මිනිස්සුන්ට ඒ පාරේ යන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නඩුව දාලා තියෙන්නෙත් සභාවට විරුද්ධව පාර කැපුවා කියලා.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** නඩු දාන්නේ නැතුව බෑනේ. යූ. ඇන්. පී. සභාව කාලයේ එතුමාට ගල් ගහලා එතුමාගේ ගේ දොර කඩලා දාලා යද්දි එතුමා ගිහින් පිහිට පැතුවා අධිකරණයෙන් ඩික්සන් රාජා සභාපතිතුමාගේ කාලයේ. නඩු දැම්මා. කන්නන්ගර මහත්තයා සභාවට විරුද්ධව නඩු දැම්මා නෙමෙයි. එතුමාට වෙච්ච අසාධාරණයට අධිකරණයේ පිහිට පැතුවේ. එතුමාගේ ගේ දොරකොඩ මැදින් පාර කපනවාට විරුද්ධව ගියේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** එතුමාගේ ගේ දොර මැද්දෙන් පාර කැපුවේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඕක කතා කරන්න එපා. අධිකරණයේ නඩු කටයුත්තක් යනවා. අපි අධිකරණයෙන් ඕක විසඳගමුකෝ. මේ අධිකරණ කටයුත්ත ඉවර වුණහම අපි මේක සලකා බලමුකෝ.

<u>ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමාගේ යෝජනා</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒත් අර යෝජනාවමයි තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමාට බලතල තිබුණා එහෙමනම්, එකම යෝජනාව නම් ඉවත් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඒක කියන්න හිටියේ. මේක මතුවෙච්ච එක හොඳයි. කොහොමත් මම කලිනුත් කියලා තියෙනවා. ලේකම්තුමාට මම ඒ වගකීම පවරනවා. යෝජනා ටික වැඩ කරන දවස් 07කට කලින් දෙන්න. දුරකථනයෙන් දැනුම් දෙන්න බැහැ. එතන වැරැද්දක් තියෙනවා. වැඩ කරන දවස් 07කට කලින් ලේකම්වරයාට ලිඛිතව ලබා දිය යුතුයි. ලේකම්තුමා මාත් සමඟ සාකච්ඡා කරලා තමයි යෝජනා ටික බලලා දාන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපිට ඊ-මේල් එකක් එවන්න පුළුවන්ද,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොම හරි වැඩ කරන දවස් හතකට පෙර අත්සනින් යුතුව ලිඛිතව ඉදිරිපත් කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මම යෝජනාවක් කරනවා එකම පක්ෂයේ මන්ත්‍රීවරු එකම යෝජනාවක් කරනවානම් ඒ යෝජනා අවශ්‍යනම් වැදගත් නම් විතරක් න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොමත් න්‍යාය පත්‍රයට යෝජනා දැමීමේ බලය සභාපතිතුමාට තියෙන්නේ. අනවශ්‍යයි කියලා හැඟෙනවානම් යෝජනා න්‍යාය පත්‍රයෙන් ඉවත් කරන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි මෙතෙක් කල් සභාවේ යෝජනා කරන කොට සියලු යෝජනා අඩංගු වුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නිසි ක්‍රමවේදයට ඒක කරේ නැහැ. මෙතුමාගේ පහසුව උදෙසා ඒක එච්චර දුරට බැලුවේ නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මට ඉදිරිපත් කරන්න තිබුණේ ඒක නෙමෙයි මේකයි කියලා කියන්න පුළුවන්. පක්ෂ භේදයකින් තොරව මේකට අවස්ථාව සැලසිය යුතුයි. අදාළ නොවන අනවශ්‍ය ගැටුම්වලට යන්නේ නැතුව මේක කරන්න ඕන. අපි සභාවක් හැටියට මතවාද තිබුණත් යම් කිසි වැඩක් කරන කොට ගැටුම ඇතුළේ මතුවෙන කාරණයට මැදිහත් වීමේ හැකියාව තිබිය යුතුයි. මෙතෙක් අපි කරපු සම්ප්‍රදායේ සමහර දේවල් සාධනීයයි. මේක ඇතුළේ අඩුපාඩු තියෙන්න පුළුවන්. මම කියන්නේ මේ යෝජනාව ඇතුළේ සමානකම් තියෙන්න පුළුවන් ඉදිරිපත් කරපු යෝජනාවක් මාස හයක් ඇතුළත ආයේ කරන්නයි බැරි.

**17.** කොරෝනා ගෝලීය වසංගත තත්වය හමුවේ ප්‍රදේශයේ ජනතාව ඇතුළු සමස්ත ලෝකවාසීන් අනාරක්ෂිත සෞඛ්‍ය තත්වයකට මුහුණ පා ඇති මේ මොහොතේ සාමාන්‍ය ජන ජීවිතය පවත්වාගෙන යාම සඳහා රට විවෘත කිරීමට රජය තීරණය කර ඇත. එහිදී ප්‍රදේශයේ අත්‍යවශ්‍ය සේවා කටයුතු පවත්වාගෙන යාම සඳහා සක්‍රියව දායකවන ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයේ සෞඛ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රමුඛතාවය දී ඒ සඳහා වන උපකරණ, විෂබීජ නාශක හා අනෙකුත් අවශ්‍යතා ප්‍රමාණවත් ලෙස සපයන මෙන් මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මා මේ යෝජනාව කරද්දි මුලින්ම කියන්න ඕන මේ සභාව කොරෝනා වසංගතය සමාජය තුළ පැතිරෙනවා කියලා කතිකාවට ලක්වෙන මොහොතේම සක්‍රියව මැදිහත් වෙලා සභාව කැඳවලා අපි ගත්ත ක්‍රියාමාර්ග ගන්න කොට දිගින් දිගටම මේ කාර්ය මණ්ඩලය තමයි මේවට මුහුණදෙමින් වැඩ කරේ. එතකොට මේකට අමතරව ප්‍රශංසා කරා කසළ කම්කරුවන්ට හා අනෙකුත් කම්කරුවන්ට සක්‍රියව මේ වැඩේට තමන්ගේ ස්වකැමැත්තෙන් ඇවිල්ලා වැඩ කරාට තියෙන බාධක සලකන්නේ නැතුව. ප්‍රශංසාත්මක ලිපියක් ලබා දෙන්න පවා ඔබතුමා යෝජනා කරලා තිබුණා. ඒක හොඳ දෙයක්. සේවකයන් ඇගයීම ඉතාම හොඳයි. ඒකෙන් තමයි කෙනෙක්ගේ ආකල්ප වර්ධනය වෙලා තවත් ඉස්සරහට වැඩ කරන්න තියෙන හැකියාව දියුණු වෙන්නේ. ඒ නිසා ඒ යෝජනාව අනුමත කරාට මේකේ අඩුපාඩු තියෙනවානම්, විශේෂයෙන්ම සාමාන්‍ය සමාජය තුළින් අතපත ගාමින් වැඩ කරන සේවකයින්ගේ සෞඛ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රමුඛතාවය දෙන්න ඕන. ඒ අයගෙන් තමයි මේ රෝගය සම්ප්‍රේෂණය වීමට ඉඩකඩ තියෙන්නේ. ඒ නිසා ඒ යෝජනාව මම කරේ. ඒ වගේම මේ මොහොතේ මේ බලප්‍රදේශය ඇතුළේ කොරෝනා වසංගතය ව්‍යාප්ත වීම මැඩ පැවැත්වීම සඳහා සක්‍රියව දායක වෙමින් විශේෂයෙන්ම කටයුතු කරපු සෞඛ්‍ය කාර්ය මණ්ඩල, ඒ වගේම ආරක්ෂක අංශ, සභාවේ සමස්ත කාර්ය මණ්ඩලයට අමතරව විශේෂයෙන්ම පී. එච්. අයි. මහත්වරු, ඒ වගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හා අනෙකුත් කාර්යාලවල ක්ෂේත්‍ර නිලධාරීන් විශේෂයෙන්ම මේ අනාරක්ෂිත තත්ත්වය යටතේ ගෙයින් ගෙට යන ග්‍රාම නිලධාරීන් වැනි සියලු සමාජ ක්ෂේත්‍ර රටේ රාජ්‍ය යාන්ත්‍රණය තුළ කරපු දායකත්වයට අපේ ස්තුතිය, ප්‍රණාමය පුද කරන්න ඕන මූලිකවම. ඒ නිසා තමයි අපිට යම් ප්‍රමාණයකට මේ තත්ත්වය යටතේ මේ මොහොත දක්වා පාලනය කිරීමේ හැකියාව තියෙන්නේ. විශේෂ අවධානයක් අවශ්‍යයි ඒ අයගේ සෞඛ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන්. ඒ අය ආරක්ෂා වුණොත් තමයි මේ ජන ජීවිතය පවත්වා ගෙන යන්න පුළුවන් හැකියාව අපිට තියෙන්නේ. ඒ වෙනුවෙන් මම මගේ පළවෙනි යෝජනාව කරලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ගැන මන්ත්‍රීතුමා මම සඳහනක් කරන්න ඕන. ඇත්තටම මම හිතන්නේ අපේ සභාව තමයි මම කලින් කිවුවා වගේ මේ කොරෝනා වසංගතය පටන් ගැනීමත් සමඟම රටම ලොක් ඩවුන් කරපු වෙලාවේ පළවෙනියටම වියළි ආහාර බෙදා දීම කරේ. ඒකට මම ස්තුතිවන්ත වෙන්න ඕන. මම දැකපු විදයට ගාල්ල දිස්ත්‍රික්කයේ අපේ සභාව විතරයි අඩුපාඩු මොනවා තිබුණත්, ඒක කරේ. ඒක පළවෙනි කාරණාව.

දෙවැනි කාරණාව ඒ හා සමගාමීව එදා ඉඳන් විෂබීජහරණය සිදු කරා. බෝපෙ පෝද්දල තියෙන සියලුම ආයතන රජයේ ආයතන අපෙන් ඉල්ලීම් කරපු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගොවිජන සේවා මධ්‍යස්ථානය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව රජයේ ආයතන වලට අමතරව සමෘද්ධි බැංකු,

පුද්ගලික මළගෙවල් තිබුණ නිවාස පවා අපි විෂබීජහරණයට ලක් කරා. අපිට සභාව මගින් ඒ අයගේ ආරක්ෂාව වෙනුවෙන් කරන්න පුළුවන් සෑම දෙයක්ම කරා. අපිට පිටින් පරිභාහිරව ඇති දුම්රිය ස්ථානය පවා අපි විෂබීජහරණයට ලක් කරා. එතනදී මම ඇත්තටම තෘප්තිමත් වෙනවා. අපිට තියෙන සම්පත් වලින් අපිට කරන්න පුළුවන් හැමදේම අපි කරා. ඒකේ ගෞරවය ඇත්තටම මහජන නියෝජිතවරු හැටියට සියලුදෙනාට වගේම නිලධාරීන්ටත් තියෙනවා. මෙතුමන්ලාට තිබුණා රජයෙන් නිවාඩුයි, ඇඳිරිනීතියත් දාලා තියෙනවා අපි මොකටද එන්නේ කියලා අනිත් නිලධාරීන් වගේ නැවිල්ලා ඉන්න. ඒ සේවය හරියටම ඉෂ්ඨ කරා. ඒ පිළිබඳව මම සභාපතිවරයා විදියට ආඩම්බර වෙනවා මන්ත්‍රීතුමා. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි මණ්ඩලය අපිට උපකාර කරා. සෑහෙන්න කාර්යභාරයක් කරා. අපිට සමහර දේවල් ගන්න තැන් තිබුණේ නැහැ. මෙහෙත් නිරෝධායනයට ලක් කරපු ප්‍රදේශ තිබුණා. වටරැක ප්‍රදේශය එක වෙලාවක නිරෝධායනයට ලක් කරනවා. ගොඩකන්ද ප්‍රදේශය එක වෙලාවකට නිරෝධායනයට ලක් කරනවා. පෝද්දල ප්‍රදේශය එහෙන්, නරාවල ප්‍රදේශය එහෙන්. ඒක තුළ ඇත්තටම සෑහෙන්න කාර්යභාරයක් කරා. සෞඛ්‍ය කාර්ය මණ්ඩලය, විශේෂයෙන්ම ට්‍රැක්ටර්වල යන සේවකයෝ, අපි මොන විදියට චෝදනා කරත්, යම් යම් අවස්ථාවල කෙළින්ම ඒ නිරෝධායනයට ලක්වෙච්ච පුද්ගලික ගෙවල්වලට ගිහිල්ලා කසල බැහැර කිරීමට කටයුතු කරා ජීවිත හානි පවා නොසලකා. ඒකට මන්ත්‍රීතුමා අපි පහසුකම් දෙන්න පුළුවන් උපරිම ආකාරයෙන් ලබා දුන්නා. ඔබතුමා මේ යෝජනාව දැමීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ඒ පිළිබඳව සඳහන් කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ කාරණා සම්බන්ධව ඔබතුමා මතුකරපු කාරණා ඇත්ත. මම මතු කරන්න උත්සාහ කරෙත් මේ සමස්ත ක්‍රියාවලිය අපි කාගේවත් පෞද්ගලිකව එක එක්කෙනාගේ තනි තනි හැකියාවන් මත නෙමෙයි සාමූහික එකතුවේ ප්‍රතිඵලයක් තමයි අපි අද දකින්නේ. මේක කතා කරා වගේම කොරෝනා කියන්නේ අලුත් තත්ත්වයක්. අලුත් වෛරසයක්. සාර්ස්, ඉබෝලා ආපු පවුලෙන්ම ඇවිල්ලා අලුත්ම වසංගතයක් මේක. ව්‍යුහය වෙනස් නිසාම මේකට බෙහෙත් නැහැ. අපිට හිතා ගන්නත් බැහැ. ඒවා තාම පර්යේෂණ මට්ටමේ තියෙන්නේ. අපිට තවදුරටත් මේක ඇතුළේ අනාරක්ෂිත වීම අනිවාර්ය කාරණයක් බවට පත්වෙලා තියෙනවා. ජන ජීවිතය පවත්වා ගෙන යන ගමන් මේකෙන් සමාජය ආරක්ෂා කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තව දෙයක් තියෙනවා මන්ත්‍රීතුමා. ඒකත් කියන්න ඕන. මේ කාරණා ඔිවත් එක්කම කිව යුතුමයි. මොකද, අඩු පාඩුකම් තියෙන්න පුළුවන්. මේ කරපු වැඩපිළිවෙලේ අඩුපාඩුකම් නැහැ කියලා මම කොයිවෙලාවකවත් කියන්නේ නැහැ. නමුත් මම ගෞරවයෙන් සියලු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. අපි ඕන ප්‍රශ්නයකට කෙළ ගමු, ගහ මරා ගමු. නමුත් මෙතනදී මේ නිලධාරීන් මැදිහත් වුණා ලේකම්තුමාට තිබුණා කියන්න මට මේක අදාළ නැහැ බඩු බෙදලා චෝදනා එනවා කියලා කියන්න. ඒකට එතුමා සම්පූර්ණයෙන්ම මැදහත් වුණා අනිත් මන්ත්‍රීවරු දැනුවත්වම මෙතුමා විතරක් නිලධාරීන් එක්ක එකතු වෙලා මේක කරා නම් චෝදනා කරාට කමක් නැහැ. අනිත් මන්ත්‍රීවරුන්ගේ දැනුවත් වීම මත තමයි මෙතුමා මේක නායකත්වය අරගෙන කරේ. මිලදී ගැනීමේදී අනිත් මන්ත්‍රීවරු සියලුදෙනා ගිහින් බඩු මිල අඩු කරන්න සම්පූර්ණයෙන්ම වැඩ කටයුතු කරා. එතනදී මම ගෞරවයෙන් යුතුව ඉල්ලා සිටිනවා මේ කුණු ගොඩ නම් බෝපෙ පෝද්දලට ගාන්න එපා මෙතනදී. මම සියලු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලනවා. තම තමන්ගේ ශක්ති පරිමාණයෙන් හෘද සාක්ෂියට එකඟව වැඩ කරන්න. මේ මිනිස්සුන්ට දීපු දෙයින් ගසා කෑවා කියන එක නම් මම අනුමත කරන්නේ නැහැ. ඒක මම ඕන වෙලාවක ආරක්ෂා කරනවා. මෙතනදී හැමදාම බෝපෙ පෝද්දලට කුණු ගා ගන්න වෙලාවේ මේකට නම් මඩ ගා ගන්න එපා කියලා මම ඉල්ලා සිටිනවා සියලු මන්ත්‍රීවරුන්ගෙන්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, කොරෝනා වසංගතයට මුහුණ දීම සඳහා සක්‍රීයව දායක වෙච්ච සියලුම ක්ෂේත්‍රයන්ගේ රාජ්‍ය නිලධාරීන්, පුද්ගලික අංශයේ නිලධාරීන්, අනෙකුත් සාමාන්‍ය මහජනතාව පවා දැඩි කැප කිරීමක් කටයුතු කරා කියන එක අපි පිළිගන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පිට මිනිස්සු ඇවිල්ලා සෑහෙන්න කැප වුණා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කියන්නේ මේකෙන් මරණ බියට හෝ ආරක්ෂා වීම වැදගත් වුණා. මේක පැතිරෙනකොට මූලික වශයෙන්ම මට මතකයි මේක පටන් ගන්න මොහොතේම අපේ නිර්දේශය වුණේ මුඛ ආවරණ පැළඳිය යුතුයි කියලා. ඒ නිසා රාජ්‍ය ආයතන සියල්ල පොලීසිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වගේ තැන්වලට අපිට හැකි පමණින් බෙදා දෙන්න ඕන. කණගාටුවට කාරණයක් තියෙනවා මේ වෙලාවේ රජය විසින් පුන පුනා මතු කරන්න වුණා, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා, පබා පලිහවඩන වෛද්‍යතුමිය ප්‍රසිද්ධ මාධ්‍යයේ කිවුවේ මේක අත්‍යවශ්‍ය නැහැයි කියලා. මේක නෙමෙයි වෙන ක්‍රියාමාර්ග තියෙනවා කියලා කිවුවා. ඒකට උත්සාහ කරා. නමුත් අවසානයේ මේ වෙන කොට තීරණය වෙලා තියෙනවා මේක මැඩ පවත්වන්න හොඳම

විසඳුම මේක කියලා. මේක පැතිරෙන්නේම අපේ මුඛය හරහා, ආශ්වාස ප්‍රාශ්වාසයෙන් අපි කියන්නේ මීන් ඉස්සරහට මේ තියෙන අවදානම සලකා ගෙන අපි කටයුතු කළ යුතුයි. මේකට මැදිහත් වෙච්ච සියලුදෙනාම අපි පක්ෂයක් හැටියටත් මම මතක් කරන්න ඕන මේ වෙලාවේදී. රතු තරුව සහන සේවා බලකාය විශේෂ කාර්යභාරයක් මේ ප්‍රදේශයේ කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි ඊළඟ කාරණයට යමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමාට අපි සමහර දේවල් කියන කොට අමාරුයි තමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අමාරු නැහැ. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තියෙනවා. ඔබතුමා තමයි වැඩිම කාලයක් අරගත්ත මන්ත්‍රීවරයා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි මේ ප්‍රදේශයේ යම් යම් කටයුතුවලට, විශේෂයෙන්ම අර ප්‍රධාන වශයෙන් මහජනයා ගැවසෙන ස්ථානවල අත් සේදීම සඳහා වොෂ් බේසින් සවි කිරීම, ඒ වගේම විෂබීජනාෂක දියර ඉසීම, නරාවල ප්‍රදේශයේ කොරෝනා ආසාදන තත්ත්වයට ගොදුරු වෙච්ච නායක හමුදා සහෝදරයාගේ නිවස සහ ඒ ආශ්‍රිත නිවාස සියල්ලම විෂබීජහරණය කරන්න මැදිහත් වුණා. ඒ ආකාරයෙන් අපිට හැකි විදියට, පක්ෂයක් විදියට කරා. රාජ්‍ය යාන්ත්‍රණය විශාල වශයෙන් තියෙනවා. ඒක ඇතුළේ මැදිහත් වෙනවා. ඒක වෙනම කාරණයක්. අපි ඒ මැදිහත්වීම පවා කරමින් මේක ඇතුළේ දේශපාලනය පවා බලන්නේ නැතුව වැඩ කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නරාවල ප්‍රදේශයේ අපි සභාවෙනුත් වැඩ කරා. කඩවල්, වෙළඳසැල් හා තෝරා ගනිපු තැන් අපි සභාවෙන් විෂබීජහරණයට ලක් කරා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගොවිජන සේවා මධ්‍යස්ථානය ඇත්තටම සභාව මැදිහත් වෙලා කරා කිවුවා. එහෙම කරනවා. ඒ ගෞරවය තියෙනවා. ඒ ගෞරවය ප්‍රකාශ කරන අතරම, පක්ෂයක් හැටියට අපේ වගකීම අත් හැරියේ නැහැ. අපි දේශපාලන කුහකකම් බලබල හිටියේ නැහැ. ජනතාවගේ පැත්තෙන් ඒ මැදිහත්වීම අපි කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාලා දැන්නේ යෝජනා කරන්නේ. දැන් ඕකට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය එක්ක සාකච්ඡා කරලා මුලින්ම ඕක යෝජනා කරේ මම. ඔය විෂබීජහරණය දිස්ත්‍රික්කයෙන් මුලින්ම පටන් ගත්තේ බෝපෙ පෝද්දල. එතකොට කවුරුවත් හිතලාවත් තිබුණේ නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම යෝජනා කරේ කරපු කාර්යයේදී අපේ මැදිහත් වීම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාලගේ මට්ටමින් මැදිහත් වුණා. ඒක හරි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමාලා නොකරා, අපි කරා කියන විවේචනය කරනවා නෙමෙයි. ඒකට සක්‍රීයව මැදිහත් වෙච්ච සියලුම සේවකයන්ට ගෞරවය, ස්තුතිය පුද කරන්න ඕන මේ වෙලාවේ. ඒක ගැන සඳහන් කරේ පළවෙනි යෝජනාවෙන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ- 18.** ඉදිරි කාලයේදී ඇතිවන වැසි සහිත කාලගුණය හේතුවෙන් හිස එසවිය හැකි ඩෙංගු උවදුර මැඩලීමට ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හා සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත්, ජලය රැඳෙන පොදු ස්ථාන හා කාණු පද්ධති ජලය එක් රැස් නොවන පරිදි පවත්වාගෙන යාමටත්, මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනට ඒක පටන් අරගෙන තියෙන්නේ. ඒක කෙරෙනවා. මාස් පතා ඒක කෙරෙනවා. මාස් පතා සාකච්ඡා තියෙනවා. ඒ අය නම් කරන කොට මෙන්න මේ මේ කාණු අවහිර වෙලා තියෙනවා කියලා අපි ඊළඟ කමිටුව වෙනකොට ඒ ටික ඉවර කරලා තියෙනවා. ඒකට වැඩපිළිවෙලක් යනවා දැන් නම්. ඔබතුමා පෙන්වා දීම ගැන ස්තුතියි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයෙන් විමසුවා. මේ වෙන කොට අපේ ප්‍රදේශයේ ඩෙංගු රෝගීන් දෙන්නෙක් තමයි මතු වෙලා තියෙන්නේ. ඒකෙනුත් එක්කෙනෙක් පරිබාහිර රෝගියෙක්. බලප්‍රදේශය තුළම කරාපිටියෙන් තමයි එක්කෙනෙක් හමුවෙලා තියෙන්නේ. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය ඒක ක්‍රියාත්මක කරගෙන යනවා. සභාවේ මම යෝජනා කරනවා මේ යෝජනාවට අඩංගු කරන්න කියලා අපේ සභාව පැත්තෙන් වතුර රැඳෙන්න පුළුවන් පොලිතීන්, ප්ලාස්ටික් වැනි අපද්‍රව්‍ය එකතු කරන විදිය ගැන ජනතාව මීට වඩා දැනුවත්භාවයකට පත් කරන්න. පොදු ස්ථාන වලට මේවා එකතු නොවන විදියට එක්රැස් වෙන

ක්‍රමවේදයක් හදා ගන්න. ගරු සභාපතිතුමනි, පොලිතින් හා ප්ලාස්ටික් සභාවෙන් එකතු කරනවාද, ඒවා එකතු කරන නිශ්චිත දින පිළිබඳව ජනතාවට අවබෝධයක් නැති කමකුත් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ නිශ්චිත දින දීලා තියෙන්නේ. ඒක ඔබතුමා අපෙන් අහනවානම් කවදාද කියලා ඒක අපිට දෙන්න පුළුවන්. අනිත් එක මේ ක්‍රියාමාර්ගය අද නෙමෙයි මම පටන් ගනිපු මුල් කාලයේ අපි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය සමග සාකච්ඡා කරලා කමිටුවක් හදාගෙන මේ කටයුත්ත මේ දක්වා කෙරෙනවා. ලොකු ප්‍රචාරණයක් මේ සඳහා දීලා නැහැ. අපේ කටයුත්තක් සේ සලකලා, කෙරෙන්න ඕන කටයුත්තත් සේ සලකලා අපි මේක කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ප්‍රචාරණය දිය යුත්තේ ප්‍රචාරක වාසිය ලබා ගන්න නෙමෙයි. ඒ අයට කසළ එකතු කරලා දෙන්න පුළුවන්කම තියෙනවා එතකොට. ඒකයි ප්‍රචාරණය කිරීමේ වැදගත්කම තියෙන්නේ. මේකේ නිසි ගෞරවය ඔබතුමා ගත්තත් කමක් නැහැ. මේ කාර්ය ඉෂ්ඨ වෙනවා නම් ඒකෙ ගෞරවය ඔබතුමා ගත්තත් කමක් නැහැ. ඒක කිසි ගැටලුවක් නැහැ. මගේ දෙවැනි යෝජනාවේ තියෙන්නේ මේකට සක්‍රීය මැදිහත්වීමක් කරලා ඉදිරි කාලයේදී අවධානයෙන් වැඩ කරමු කියන එක.

**19.** වී.සී පාරේ පදිංචි එච්.එස්.පී ලක්ෂ්මන් කරුණාරත්න මහතාගේ නිවස අසලින් ජලය බැස යාමට ඇති කාණුව අවහිරවීම හේතුවෙන්, වැසි ජලය එක් රැස්වී නිවාස යටවීම හේතුවෙන් එකී නිවැසියන්ට දීර්ඝ කාලයක් තිස්සේ දැඩි අපහසුතාවයටත් පීඩාවටත් පත්ව ඇත. නේවාසික ප්‍රදේශ හරහා ඇති පොදු කාණු පද්ධති නඩත්තු කිරීම ප්‍රාදේශීය සභාවේ වගකීමකි. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 79,80,81 හා 84 වගන්ති ප්‍රකාරව එකී අධිකාරී බලය ගරු සභාපතිවරයා වෙත පැවරී ඇත. අදාල බලතල අනුව මේ ගැටලුව නිරාකරණය කරදීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, මේක කාලාන්තරයක් තිස්සේ ඔබතුමා පෞද්ගලිකව දන්න, මේ ප්‍රදේශයේ සියලු දෙනා දන්න, විශේෂයෙන්ම අපේ තිස්ස මන්ත්‍රීතුමා පෞද්ගලිකව දන්න එතුමාගේ බල ප්‍රදේශයේ මැදිහත් වෙච්ච කාරණයක්. ගරු සභාපතිතුමනි, මේ කාරණය ඔබතුමා පෞද්ගලිකවම දන්නවා. ඔබතුමා පෞද්ගලිකව මැදිහත් වෙලත් තියෙනවා. තිස්ස මන්ත්‍රීතුමත් එතුමාගේ බල ප්‍රදේශයේ නිසා මේ සම්බන්ධව හොඳාකාරවම දන්නවා. මේක මානුෂික ප්‍රශ්නයක්. සෞඛ්‍ය ප්‍රශ්නයක්. මානව හිමිකම් පිළිබඳ ප්‍රශ්නයක්. පොදු ජලය බැස යාම අවහිර වීමේ තත්ත්වයක් තියෙනවානම් ඒක නිරාකරණය කිරීම ඔබතුමාගේ වගකීමක්. පනත අනුවම පැවරිලා තියෙන වගකීමක්. ඒ නිසා ගරු සභාපතිතුමනි ඒක සම්බන්ධයෙන් මම බලාපොරොත්තු වෙනවා. ඔබතුමාගෙන් විමසුවම කිවුවා මේක කාලයක් තිස්සේ තියෙන ප්‍රශ්නයක් කියලා. මේක සම්බන්ධව ඔබතුමාට වගකීම තියෙනවා කියලා පිළිගන්නවා කියලා කිවුවා. වෙන ප්‍රශ්නයක් නිසා මේකට මැදිහත්වීම සඳහා කරන බලපෑමක් විදියට තමයි ඔබතුමාට මේක මතුවෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඕකට උත්තරයක් දෙන්නම්. මේක අවුරුදු 11ක් තිස්සේ තියෙන ගැටලුවක්. විවිධ සභාපතිවරු මේක විසඳන්න උත්සාහ දැරුවා. නමුත් දෙපාර්ශවයක තියෙන බරපතල ආරවුලක් තමයි ප්‍රධානම කාරණය. නමුත් මටත් හිතෙන්නේ හිටපු තත්ත්වයට වැඩිය වෙනසක් මෙතන තියෙනවා. මේ ලක්ෂ්මන් කරුණාරත්න කියන පාර්ශවය නෙමෙයි අනෙක් පාර්ශවය දැන් තර්කයක් ගොඩනගනවා මේ අය අපජලය තමයි මේ කාණුවෙන් බස්සවන්න උත්සාහ දරන්නේ කියලා. නමුත් මීට අවුරුදු ගාණකට කලින් වතුර බහින කාණු තිබුණේ මාර්ගයේ ඔය පැත්තෙන් නෙමෙයි අනෙක් පැත්තෙන් කියලා. මේ ලක්ෂ්මන් කරුණාරත්න කියන අය පාර හදා ගන්න කොට පහළට අර කාණු පද්ධතිය හා බෝක්කු ඔක්කොම ගලවලා කාණුව අපජලය බස්සවන්නත් එක්ක අනෙක් පැත්තට ගත්තා. ඒක තමයි ඒ අය තරයේ කියන මතය. සිකුරාදා නැත්නම් සෙනසුරාදා අදාළ පාර්ශව එක තැනකට කැඳෙව්වා. මේකට නැත්නම් විසඳුමක් ගන්න බැහැනේ. ඒ අදාළ ස්ථානයට මම එක පාරක් ගියා. ඔය කියන කාරණාව එවෙලේ මතු වුණේ නැහැ අදාළ පාර්ශවය එවෙලේ හිටියේ නැති නිසා. සෙනසුරාදා හරි ඉරිදා හරි ඒ ස්ථානයට ගිහිල්ලා ඒ අය කියන තැනින් වතුර බස්සවන්න පුළුවන්ද කියන එක මම බැලුවා. නමුත් ඔය කියන පුද්ගලයන් මේ ප්‍රශ්නය බේර ගන්නවාට වඩා අවුල් කර ගන්න එක තමයි මට පේන්නේ. ඊයේ වෙනකොට මට කතා නොකරපු කෙනෙක් නැහැ ඒ සම්බන්ධව. ඊයේ කතා කරා ජනාධිපති සම්බන්ධීකරණ ලේකම් සුනිල් දහනායක මහත්තයා. ඊයේ මට කතා කරා ඒ සම්බන්ධව. මේක එයාලටත් ඕන. ආවේගශීලීව අඬලා දොඩලා මේවා කර ගන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා මතුකරා වගේම මේක අවුරුදු 11 ක් තිස්සේ කැකෑරෙමින් තියෙන ප්‍රශ්නයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නමුත් මන්ත්‍රීතුමා අනෙක් පාර්ශවය ගේන තර්කය ටොයිලට් ඒවා ඔක්කොම මේ පැත්තට හරවා ගෙන කියන එක. ඒක අපි ගිහිල්ලා පරීක්ෂා කරන්න ඕන. තිබ්ච්ච කාණු මාර්ගයේ අනිත් පැත්තට ගැනීමට උත්සාහ කරනවා. කිසි ප්‍රශ්නයක් නැහැ මන්ත්‍රීතුමා මේක මගේ කාලයෙන් එහාට ගෙනියන්න දෙන්නේ නැහැ. මොන ක්‍රමයෙන් හරි තිබුණ පරණ කාණුව හරි මේ කාණුව හරි දෙකෙන් එකක් කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කියන්නේ ගරු සභාපතිතුමනි, කිසි ප්‍රශ්නයක් නැහැ අලුත් කාණුවක හරි වතුර බැස යනවානම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊළඟ සභාවේදී බලමු මෙතනින් එහාට මොකද වුණේ කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා ඒකට මැදිහත්වීමක් කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊළඟ සභාවේදී බලමු මොකද වෙන්නේ කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ- 20.** අකර්මණ්‍ය වූ ආර්ථික ක්‍රියාවලිය තුළ ප්‍රදේශයේ සාමාන්‍ය ජන ජීවිතය ඉතාම දැඩි ආර්ථික දුෂ්කරතාවයන්ට ගොදුරුව ඇත. ඒ සම්බන්ධයෙන් මෙම ගරු සභාව සක්‍රීයව දායක විය යුතු බවත්, දැනට රජය ගෙනයනු ලබන සහන වැඩපිළිවෙල ප්‍රමාණවත් හා ක්‍රමවත් නොවන බවත්, පොදු මහජන මුදල් ජනතා සුභ සාධනය සඳහා ප්‍රමාණවත් ලෙසත්, ක්‍රමවත් ලෙසත්, විනිවිදභාවයකින් යුතුව, දූෂණයෙන් තොරව යොදා ගන්නා මෙන් රජයට දන්වා යැවීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

මේක අපේ ප්‍රදේශයේ මහජනතාව වෙනුවෙන් කරන්නේ. මේක ක්‍රමවත් හා ප්‍රමාණවත් නෑ කියන එක මම යෝජනා කරන කාරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමනි, හේතු කිහිපයක් එක්ක. පළවෙනි කාරණය මේ සහනාධාර බෙදීමේ ක්‍රියාවලිය යෝජනා කරපු වෙලාවේම අපේ අදහස තිබුණා අපි සාකච්ඡා කරා. මේ සම්බන්ධයෙන් දැක්ම තිබුණේ පවුල් ඒකකයකට ආධාර දෙන්න. සහනාධාර දෙන්න රුපියල් පන්දාහ ගාණේ. නමුත් ඒකේ පොඩි ප්‍රශ්නයක් තිබුණා ගෘහ මූලිකය යටතේ එක්කෙනෙක් ලියාපදිංචි වුණත් රුපියල් පන්දාහක් ලැබෙනවා දහයක් හිටියත් රුපියල් පන්දාහ ලැබෙනවා. මේක සමනය කිරීම මීට වඩා නිවැරදි වෙනවා එක් පුද්ගලයෙක් සේ සලකලා ගණනය කරානම්. එක පවුලක එක්කෙනෙක් හිටියා නම් එකයි. පහක් හිටියා නම් පහයි. දහයක් හිටියානම් දහයයි කියලා ගියානම් හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ඒකෙ ක්‍රමවේදය දන්නේ නැහැ. අපිත් විරුද්ධ වුණා. එක පවුලකට එකක් දුන්නා නම් ඉවරයි කියලා කිවුවා. විවිධ කණ්ඩායම් හිටියා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පුද්ගලබද්ද කියලා මම කිවුවේ ඒකයි. පුද්ගලබද්ද අනුව බෙදන කොට පුද්ගලයෙකුට ඔබතුමා දැන් සඳහන් කරා වගේ ආබාධිත දීමනාව හම්බ වෙනවා. වකුගඩු දීමනාව හම්බ වෙනවා. වෙනත් දීමනා හම්බ වෙනවා. පුද්ගලබද්දට දුන්නා නම් ඒක ද්වීගණනක් වෙන්නේ නැහැ. ඊට පස්සේ පවුලේ ඉන්න ප්‍රමාණයට අනුපාතයට ලැබෙනවා. එක්කෙනාද, දෙන්නාද කියලා කිසි බේදයකින් තොරව. එවැනි ක්‍රියාමාර්ගයක් ගත්තා නම් තියෙන සමහර ප්‍රශ්න පැන නොනඟින්න තිබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** චුට්ටක් ඉන්න ඒක කියන්න. ඒක රජය දකින විදිය. ඒක අපේ රජයේ සුවිශේෂිතාවයක්. අපේ රජය කියන්නේ දෙන්න ඕන සියලුදෙනාටම දෙන්න ඕන කියලා. පවුලකට දීලා ආබාධිත කෙනෙකුට හම්බ වුණේ නැත්නම් ඒ ප්‍රතිලාභය හොඳ නෑ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඒක තමයි මමත් කියන්නේ. පුද්ගලබද්දට තීරණය කරානම් හැම කෙනාටම සාධාරණයක් ඒකෙන් ලැබෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නමුත් රජයක් විදියට ඒක අවාසියි. ඒක මන්ත්‍රීතුමා වෙලා තියෙන්නේ මේ ගෙදරට රුපියල් විසිදාහක් හම්බ වෙනවා නම් අනිත් ගෙදරට රුපියල් පන්දාහයි. ඉතිං දැන් රුපියල් පන්දාහ ගන්න මිනිහා දුක්වෙනවා. අර මිනිහා රුපියල් විසිදාහක් ගන්නවා අපිට රුපියල් පන්දාහයි කියලා. ඒකයි තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ආබාධිත දීමනාව, වැඩිහිටි දීමනාව හැමදාම දෙන එකක්. මේකත් එක්ක ඒක සම්බන්ධ කර ගන්න එපා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** ආබාධිත දීමනාව හැමදාම රුපියල් පන්දාහ ගාණේ දුන්නේ නැහැනේ. හැමදාම වැඩිහිටි දීමනාවට රුපියල් පන්දාහක් දුන්නේ නෑ. ඒක වෙනස් කර ගත්තේ මේ අලුත් තත්ත්වය යටතේ. ඒක වෙනස් වුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** මේ දැන් දිගින් දිගට ඔය රුපියල් පන්දාහ ගැන කතා වුණානේ. දැන් ඇති. මෙතන දූෂණය කියන වචනය නැතුව ඕන එකක්. දූෂණයක් කෙරෙන්නේ නැහැ රජයෙන්. ඒක කියන්න ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** මගේ යෝජනාව තියෙන්නේ එහෙම නැතුව කරන්න කියලා. එහෙම නැතුව කරනවානම් ප්‍රශ්නයක් නැහැ. ඒක තමයි යෝජනාව. එහෙම කරන්න එපා කියන එක වැරදියිද, මම කරන යෝජනාව ඇතුලේ තියෙන්නේ රජය දූෂණයක් කරනවා කියලා නෙමෙයි. නොකළ යුතුයි කියන එක. කරනවා කියලා නැහැ මෙතන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** හරි මන්ත්‍රීතුමා අපේ රජයෙන් ඔය දූෂණවලින් තොරව මේ කාර්යය නිලධාරීන් ප්‍රමුඛ කරගෙන කරා. දේශපාලන බලපෑම් කරේ නැහැනේ. නිලධාරීන් ප්‍රමුඛ කරගෙන මේ වැඩපිළිවෙල සාර්ථකව කරනවා. මම තව දෙයක් කියන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** ඔබතුමාලගේ නායකයා කියනවානම් කමක් නැහැ. බැසිල් රාජපක්ෂ මැතිතුමා මොන දේශපාලන තනතුරක් දරලද ඕක කරන්නේ.

(සභාව පැහැදලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** බැසිල් රාජපක්ෂ මැතිතුමාව ගැසට් එකකින් පත් කරලා තියෙන්නේ ජනාධිපති විශේෂ නියෝජිත විදියට හා කාර්යසාධන බලකායේ සභාපති විදියට. එතුමාට ලොකු දැක්මක් තියෙනවා. පහුගිය දිනක අපිව කැඳෙව්වා. සියලු සභාපතිවරු, උපසභාපතිවරු කැඳෙව්වා එවෙලේ සමහර සභාපතිවරු විරුද්ධ වුණා. දැන් කඩවල් ඇරලා තියෙන්නේ දැන් බිස්නස් කරගෙන යනවා. ගරු බැසිල් මැතිතුමනි ඒ අයට රුපියල් පන්දාහ දෙන්න එපා කිව්වා. බැසිල් ඇමතිතුමා කිව්වා ඔබතුමන්ලා, ඔබතුමියන්ලා දේශපාලඥයෝ විදියට ඔහොම ඒක ගැන කියපු එක ගැන මම කණගාටු වෙනවා. දෙන්න පුළුවන් වෙලාවේ මිනිස්සුන්ට කපන්න එපා දෙන එක දෙන්න පක්ෂ භේදයකින් තොරව කියලා එතුමා ඒ ප්‍රකාශය කරා අපේ සභාපතිවරු එහෙම කියන කොට. ඔබතුමා කියන්නේ ඕක නේ. අපේ ආණ්ඩුව බොහොම වගකීමෙන් දූෂණයෙන් තොරව මේ වැඩ කටයුත්ත කරනවා හරිනේ. අපි සභාවක් විදියට ඒ කටයුත්තට සහයෝගය ලබා දෙමු. එච්චරයි.

<u>ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ៖-** ගරු සභාපතිතුමනි, කරුණාකරලා මට බාධා කිරීමකින් තොරව ඉඩකඩක් ලබා දෙන්න. ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට නැවතත් එකක් තේරුම් කරලා කියනවා. අපි පහුගිය වියළි සලාකය දෙන්න යෝජනා කරන කොට මම එතන ඉඳගෙන ඉතා ප්‍රධානවම මේ දේ සම්පූර්ණයෙන්ම අනුමත කරමින් ඒක දෙන්න ඕන කියන මට්ටමේ සියලුම දේවල්වලට සහයෝගය දීලා වැඩ කරා. ඔබතුමා ඒක දන්නවා. හෘද සාක්ෂිය දන්නවා. මේ හැම දෙනෙක්ම දන්නවා. විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු පවා දන්නවා. මම අදත් කිව්වේ ඔබතුමන්ලා වක්‍රාකාරයෙන් ගිහිල්ලා ගෙනාව එක නිවැරදිව විනිවිදභාවයෙන් කරන්න කියලා. මේක දැන් ලස්සන නැද්ද, මේ හැම වෙලාවකම මේ ටෙල්සි මෙනෙවිය අපිට කතා කරන්නේ. ඔබතුමා දුරකථන අංක ටික දීලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** අබේසේකර මන්ත්‍රීතුමා ඔබතුමාගේ යෝජනාවලිය ඉදිරිපත් කරන්න. මෙතෙක් අපි කතා කරේ ඕකනේ. කරුණාකරලා යෝජනාවලිය ගැන කතා කරන්න. කට්ටිය නිවාඩු හිටියේ. මට ඒක කරන්න බැහැ ඒ වෙලාවේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ៖-** නමුත් එහෙම කරානම් නිවැරදියි. හෙට දවසත් කරනවා නම් නිවැරදිව කරන්න. කිසි ප්‍රශ්නයක් නැහැ. අපි ජනතාවට දෙන එකට එකඟයි. අපි කියන්නේ නිවැරදිව කරේ නැහැ කියලා. මේ මුදල් එක්ක යන්න ඕන නීති පද්ධතියක් තියෙනවා. ඒක කරේ නැහැ කියන එක කිව්වේ. ඒ නිසා විරුද්ධයි. ගරු සභාපතිතුමනි, ඊළඟට නිකං කිව්වොත් කවුරුත් කතා කරා කොවිඩ් 19, කොරෝනා පිළිබඳ ප්‍රශ්නය. ඇත්තටම ඒකෙදි ජනතාව හිටි ගමන් මගෙන් පවා අහනවා, කට්ටියගෙන් අහනවා මොකද මන්ත්‍රීතුමා වෙන්නේ. වැරදිලාවත් ඔබතුමාලාගේ පහුගිය ආණ්ඩුව තිබුණා නම් කියලා. ජනාධිපති හිටියේ සිරිසේන ජනාධිපතිතුමානේ. සංසන්දනය කිරිල්ලක්නේ කරන්නේ. මේ සභාපතිද, අර සභාපතිද, අහනවා කොහොමද මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා හිටියානම් කියලා. එහෙම නම් ලංකාවෙන් භාගයක් ඉවරයි නේද කියලා. අඩුපාඩු

සීයක් මැද්දැවේ උනත් අපි කියන්නේ මේක පාලනය කරා විශිෂ්ට විදියට. ඒක කියන්න ගියේ වෙන දෙයක් හින්දා නෙමෙයි ඇත්තටම ඔබතුමා කියන විදියට වැරැද්දක් කරහම ඒක කියන්නේ නැතිව හංගගෙන ඉන්න බැහැ.

මම යෝජනා ගණනාවක් ගෙනල්ලා තියෙනවා. ඒ අයගේ කරුණු ගණනාවක් තියෙනවා. දැන් අපි දේශගුණයට මුහුණ දීලා තියෙනවා. ඔබතුමා දන්නවා ඇති පෙරේදා නැත්නම් ඊට ඉස්සරින්දා විමල් මෝටර්ස් තැන අර තාප්පයක් කඩා ගෙන ගිහිල්ලා සම්පූර්ණයෙන්ම ඉවරයි වාහන දෙකක්. ඒ බිල්ඩින් එක පවා අනතුරක තියෙන්නේ. ඇත්තටම මම ඉල්ලා සිටිනවා කරුණාකරලා ඒවා අනුමත කරලද, නැද්ද තියෙන්නේ කියලා සම්පූර්ණ ලිපිගොනුව අපිට බලාගන්න සකස් කරන්න සභාව තියෙන දවසට. මොකද හේතුව මේ ප්‍රමිතියට නැතුවයින් වෙන දේවල් තමයි මේ තියෙන්නේ. ඔබතුමන්ලා අද යන්න බලන්න මවුන්ට් කැල්වරි එක ඉස්සරහට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා මම නැවතත් ඉල්ලනවා කරුණාකරලා න්‍යාය පත්‍රයට යන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ න්‍යාය පත්‍රයේ තමයි ඉන්නේ. මම එකින් එක කරගෙන යන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** යෝජනා කරන්න. ඕක ප්‍රගතියේදී කතා කරන්න. යෝජනා ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 21.** බල ප්‍රදේශයේ කරනු ලබන කර්මාන්ත සම්පූර්ණ ඇස්තමේන්තු මුදලට අදාළ ප්‍රදේශයේ ස්වේච්ඡා සංවිධානවලට ලබාදීමේ හැකියාව ඇති අතර, ස්වේච්ඡා සංවිධාන වෙනත් කෙනෙකුට කර්මාන්ත කිරීම සඳහා අවසර දෙන්නේ නම් එසේ දෙනු ලබන පුද්ගලයා හෝ ආයතනය සමග ගිවිසුම්ගත විය යුතු යැයි යෝජනා කරන අතර එම යෝජනා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කරන්න දෙයක් නෑ. ඕක වෙන්න ඕන දෙයක්. එහෙම දෙන්න බෑ. දෙනවානම් ඒක අනිවාර්යයෙන්ම වෙන්න ඕන දෙයක්. ඒක නොවී කරන හින්දා තමයි මම මේ යෝජනාව ගෙනල්ලා තියෙන්නේ. පුද්ගලයෙකුට දෙනවා. අන්තිමට වගකීම දරන්න කවුරුවත් නෑ. සමිතියට තමයි වගකීම දරන්න වෙන්නේ. ඒ නිසා ගෙනල්ලා තියෙන්නේ. මේක සම්බන්ධීකරණ කමිටුව දැනුවත් කරන්න. මමත් මගේ යෝජනාවක් විදියට සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මගේ මතයත් ඕකට කියන්න ඕන. ඔබතුමා ඒ යෝජනාව කරාට මගේ මතය නම් අපිට එහෙම නීත්‍යානුකූල හැකියාවක් නැහැ මන්ත්‍රීතුමා. අපි සමිතියත් එක්ක තමයි බැඳීම තියෙන්නේ. සමිතිය ඒ වගකීම දරන්න ඕන කාටහරි දෙනවා නම්. අපි කොයි වෙලාවෙත් ඉදිරිපත් වෙන්නේ සමිතිය නම් අපිට ඊට එහාට කරන්න දෙයක් නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක හරි නිවැරදියි. ඊට ඉස්සෙල්ලා කාලෙක ඇහුවානේ කේව්යට් එකේ කතාව. ඒ වගේ තමයි මේකත්. ඒ කියන්නේ අපි දැනුවත් කරන්න ඕන. ඒක කෙරිලා තියෙන්න ඕන. ඒ දෙන කෙනා අතර ගිවිසුමක් තියෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිත් එක්ක ඉදිරිපත් වෙන්නේ සමිතියනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සමිතිය බැඳෙනවා. සමිතියට බොහොම පැහැදිලිව දන්වලා තියෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ගිවිසුමක් ලබා දෙනවානේ අබේසේකර මන්ත්‍රීතුමා. ඒකේ තියෙනවානේ. ඒකේ තියෙනවා අතුරු බඳු දෙන්න බැහැ කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගිවිසුම්ගත වෙලා ඉවර වෙලා කරන්නේ සමිතිය නෙමෙයිනේ. ඒ නිසා ඒ අය දැනුවත් කරලා තියන්න ප්‍රශ්න එන්න පුළුවන් ඉස්සරහට ආවහම දැනුවත් කරලා තියන්න. ඔබතුමාලාගේ සමිතිය කාටහරි දෙනවා නම් ගිවිසුම්ගත වෙන්න කියන්න ඒ කෙනා එක්ක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි අබේසේකර මන්ත්‍රීතුමා. මෙහෙම දෙයක් තියෙනවා. ඔබතුමාලා මේ සියලුදෙනා දන්නවා මේකේ සමිතිය කියලා කවුරුවත් කොන්ත්‍රාත් කරන්නේ නැහැ. දැන් ඔබතුමා නින්දෙන් නැගිටලා වගේ ඕක ගේන්නේ සංවර්ධන වැඩපිළිවෙල

කඩාකප්පල් කරන්න. වෙන මොකකටවත් නෙමෙයි ඇත්තම කියනවානම්. මේකේ කොන්ත්‍රාත් කරන අය කිහිපදෙනෙක් ඉන්නේ. ඒ අය සමිතිත් එක්ක සම්බන්ධයි. සමිති එක්ක සම්බන්ධ වෙලා ඒ අය කොන්ත්‍රාත් එක කර ගන්නවා. අපිට වගකීම තියෙන්නේ සමිතියත් එක්ක. ඔබතුමා ඕක ගේන්නේ වෙන මුකුත් නිසා නෙමෙයි මේකේ කරන වැඩපිළිවෙල කඩාකප්පල් කරන්න. මේක කඩාකප්පල් කරලා, සමිති බය කරලා ඔය ගොල්ලෝ වෙන කාත් එක්කවත් කරන්න එපා ඔය ගොල්ලෝ කරන්න ඕන එහෙම.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එහෙම එකක් නැහැ. දෙනවා නම් පමණක් ගිවිසුම්ගත වෙන්න ඒ අය සමඟ. කාට දුන්නත් ගිවිසුමක් තියෙන්න එපැයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සම්බන්ධීකරණ කමිටුවට ගේන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක මගේ යෝජනාව. ඕන නම් ඒක පරාජය කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම මේ යෝජනාවට විරුද්ධයි. විරුද්ධ වෙන මුකුත් නිසා නෙමෙයි හේතුවත් මම කියන්නම්. මම සභාපතිවරයා විදියට මාත් එක්ක බැඳී ඉන්නේ සමිතිය. අපි මේ ගිවිසුම අත්සන් කරන කොට සමිතිය දැනුවත් කරනවා. එතනදී මට තුන්වන පාර්ශවයක් එක්ක බැඳෙන්න මේවා අනුමත කරන්න මගේ හෘද සාක්ෂියත් එක්ක බැහැ. ඒකට මම විරුද්ධයි.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා ඔබතුමා කියන්නේ මොකක්ද මේකෙන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සමිතියක් කාට හරි දෙනවා නම් ගිවිසුම්ගත වෙන්න ඕන ඒ අයත් එක්ක මෙයාට දෙනවා කියලා.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එහෙම දෙයක් අවශ්‍ය නැතේ අබේසේකර මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ මගේ යෝජනාව. මේක පරාජය කරන්න පුළුවන්නේ මන්ත්‍රීතුමා. පරාද කරහම ඉවරයි ඒක. සභාපතිතුමා මොකද කරන්නේ. ඔබතුමා විරුද්ධයි. මම යෝජනා කරලා තියෙනවා. ස්ථිර වෙලා තියෙනවා. ඡන්දයක් අරගෙන පරාජය කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ සම්බන්ධව මට ගැටළුවක් පැන නගිනවා. අපි යම් ආයතනයක් එක්ක ගිවිසුමක් අත්සන් කරනවා. ඒ ගිවිසුමේ වගන්තියක් අඩංගු වෙනවාද අතුරු බදු දෙන්න තහනම් කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මෙච්චර කල් නම් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තියෙනවා. ඒක මේ වගේ යෝජනාවක් මන්ත්‍රීතුමා. කෙනෙක් ණයක් ගන්නවා. අපි නැවත ඇපකරුට ලියුමක් යවනවා ඔබතුමාලා ඇප අත්සන් කිරීමේදී ප්‍රවේශම් වෙන්න මේකයි කියලා. නමුත් ඇපකාරයා කියන කෙනා තේරුම් ගන්න ඕන ණයකට අත්සන් කරන කොට. මේක ඒ වගේ එකක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක කියන්න ඕන නෑ. ඒකට බැඳිලා ඉන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ වගේ බාල තැනකට සභාව යනවාද, සමිතිය බැඳිලා ඉන්නවා අදාළ ගිවිසුම ක්‍රියාත්මක කරන්න. ඒක මේ අද ඊයේ දෙයක් නෙමෙයි. කාලයක් තිස්සේ ඔබතුමාලත් කොන්ත්‍රාත් කරපු සමිති මේ. එතකොට ඒ කාලේ කරන කොට ඔබතුමාලට හොඳයි. එතකොට ඕවා ආවේ නැතේ. ඔබතුමාලගේ කාලේ සමිතිවලින් කොන්ත්‍රාත් කරන කොට සද්භාවයෙන් ඔය අදහස ආවාද, බයිලා ගහන්න එපා අබේසේකර මන්ත්‍රීතුමා. මේ සංවර්ධන වැඩපිළිවෙල කඩාකප්පල් කරන්න හදන්නේ. සමිති බය කරලා කොන්ත්‍රාත් කරන කොට මෙහෙම දෙන්න කියන්නේ. අද ඊයේ නෙමෙයි අවුරුදු ගාණක් තිස්සේ ඔහොම ඇවිල්ලා තියෙන්නේ. මෙන්න මේ යෝජනාව කොන්ත්‍රාත්කාරයින්ට කියන්න ඕන මෙහෙම ගෙනාවා කියලා. ඇත්ත කතාව ඒක.

(ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ අහන්න මේක පරාද කරන්න එහෙමනම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගිවිසුමේ තියෙනවා අතුරු බදු දෙන්න බැහැ කියලා. තව මොනවද ලියුම් ගහන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඡන්දයක් අරගෙන පරාජය කරාහම ඉවරයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පරාද කරනවා තමයි. මම ඕකට විරුද්ධයි. එම යෝජනාව සම්මත කිරීම සඳහා බෙදීමකට යනවා.

ඉන්පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 02

විපක්ෂව - 10

ඡන්දය දීමෙන් වැළකී සිටි - 06

ඡන්ද විමසීම සිදු කරන විට සභා රැස්වීම් ශාලාවේ නොසිටි - 04

**යෝජනාව සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබාදුන් පිරිස**

01. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා

**යෝජනාව සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබාදුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
06. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
07. ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය
08. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
10. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා

**යෝජනාව සම්මත කිරීම සඳහා ඡන්දය දීමෙන් වැළකී සිටි පිරිස**

01. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
02. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
03. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
04. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
05. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
06. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**ඡන්ද විමසීම සිදු කරන විට සභා රැස්වීම් ශාලාවේ නොසිටි පිරිස**

01. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
04. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වැඩි ඡන්ද අටකින් එම යෝජනාව පරාජයට පත්විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 22.** රොස්වුඩ්වත්ත වතුර ටැංකිය පාර තරංගා ලෑන්ඩ් සේල් ආයතනය කරන ලද වෙන්දේසි ඉඩමේ ලිපිගොනුවේ සම්පූර්ණ පිටපත් නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබාගෙන සභාගත කරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මේක ගැන කියන්න ඕන. දිගින් දිගටම කියලා තියෙනවා කෙරෙන්නේ නැහැ මේක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කිසි ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා ඕන දෙයක් කරන්න ඒකට. ඒක නාගරික සංවර්ධන අධිකාරියෙන් ගෙන්න ගනිපු එකක්. ඒ ෆයිල් එක ගෙන්න ගන්න. පිටපතක් ගෙන්න ගන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ යෝජනාව මම ඊට කලිනුත් කරලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊළඟ සභාව වෙනකොට ඒක ගෙන්වලා තියා ගන්න.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 23.** රොස්වුඩ්වත්ත ඇක්සස් රියල් ස්ටේට් ඉඩමේ ප්‍රධාන පාරට මුහුණලා පිහිටි වෙන්දේසි නොකළ යුතු යැයි (නේවාසික භාවිතය සඳහා නුසුදුසු යැයි එන්.බී.ආර්.ඕ ආයතනය තීරණය කරන ලද) තීරණය කරන ලද අක්කර 04ක පමණ ප්‍රදේශයේ දැනට ඉදිකරනු ලබන නිවාස වල විස්තරාත්මක වාර්තාවක් (සැලසුම් කමිටුවට ලබාදී ඇති) සභාගත කරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ අය තීරණය කරලා බොහොම පැහැදිලිව මේක නුසුදුසුයි කියලා ආපු ලියුමක් තියෙනවා. ඒකේ තියෙනවා දාන්නේ පාර විතරයි කියලා. දැන් අද වෙනකොට ඒකෙ කැලි කඩලා වෙන්දේසි කරලා ගෙවල් පවා හදාගෙන යනවා. දැන් ඇත්තටම මේ ගෙවල් අනතුරක තියෙන්නේ. ඉතාම පැහැදිලියි. දැන් ඊළඟට නීතිවිරෝධී අන්දමින් කරන්නේ. මම මේක දිගින් දිගට ඉදිරිපත් කරලා තියෙනවා. ඒක ප්‍රගතියේදී අහන්න ඕන එකක්. අර තට්ටු තුනේ ගෙදර මම ඉල්ලලා තියෙනවා මේවා අනුමත කරන්න එන්.බී.ආර්.ඕ. සහතිකය අරගෙන තියෙනවාද, ඒ අය මේක ගැන වගකියනවද කියන එක. ඒ තත්ත්වය පැහැදිලි කර ගන්න ඕන. මේ පිළිබඳව මම ප්‍රගතියේදී අහන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අදාළ කාරණා දෙකම ඊළඟ සභාව වෙන කොට ඉදිරිපත් කරන්නම්. පළවෙනි එක නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉල්ලලා යවන්න අදාළ වෙන්දේසි ඉඩම පිළිබඳ ලිපිගොනුවේ පිටපතක් ලබා දෙන්න කියලා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 24.** රොස්වුඩ්වත්ත, සදර්න් කන්ස්ට්‍රක්ෂන්ස් ආයතනය කරනු ලබන ඉඩම සංවර්ධනය සඳහා සැලසුම් කමිටුව ලබාදී ඇති සංවර්ධන බලපත්‍රය සම්බන්ධ ලිපිගොනුවේ පිටපතක් සභාගත කරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක ඔබතුමා බලන්න. මම දන්නේ නැහැ එන්.බී.ආර්.ඕ. ආයතනය කොහොම මේවට අවසර දෙනවද කියලා. චමින්ද මන්ත්‍රීතුමා ඔබතුමාලා යන ගමන් මේවා බලාගෙන යන්න මොකද වෙලා තියෙන්නේ කියලා. එන්.බී.ආර්.ඕ. එක නොදී ඉන්නවා නම් ගොඩක් දේවල්වලට හරි. ඔබතුමා මේ ප්‍රශ්නය තේරුම් ගන්නේ නහැ. ඔබතුමාට ආපු ගමන්ම කිවුවා නිරීක්ෂණ චාරිකාවක යමු කියලා. මේකේ හිටපු සභාපතිතුමා ඇතුළු අපි කට්ටිය මේක දන්නවා. ඔබතුමා කියන්න රොස්වුඩ්වත්තේ එකට අවසර ගන්න ඕන නැත්නම් මධ්‍යම පරිසර අධිකාරියෙන් වෙන මොකකටවත් ඕන නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා මේ ලිපිගොනුව ඔබතුමා ඉදිරියේ පරීක්ෂා කරලා බලන්න. ඔබතුමාට ඒකට අවස්ථාව තියෙනවා. ඕන මන්ත්‍රීවරයෙකුට ලිපිගොනුව ලේකම්තුමා ඉදිරියේදී පරීක්ෂා කරලා බලන්න පුළුවන්. සභාවේ තියෙන ඕන ලිපිගොනුවක් ලේකම්තුමාගේ ඉදිරියේ පරීක්ෂා කරන්න පුළුවන්. සභාවට දාන්න අවශ්‍ය නැහැ. ඕන කෙනෙක් අහවල් ලිපි ගොනුව පරීක්ෂා කරන්න කියලා ඒක පරීක්ෂා කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊළඟට ගරු මන්ත්‍රීවරුනි, ඔබතුමන්ලා මේක තේරුම් ගනිපු නැති එකේ ප්‍රශ්නය තියෙන්නේ. මේකට අපි විරුද්ධ වුණා. මේවා කරා. මේක දුන්නේ එදා

නාගරික සංවර්ධන අධිකාරියෙන් යූ.ඩී. කමිටුව තියෙන කාලේ මෙහෙන් නෙමෙයි. සැලසුම් කමිටුව මෙහේ තියෙන කාලයේ නෙමෙයි දුන්නේ. ඒකට ගන්න ඕන නැත්නම් අවසරයක්, එහෙම නම් මේ බෝපෙ පෝද්දල ගන්න කිසිම තැනක් නැත. කිසිම තැනක් පරිසර අධිකාරියෙන් ගන්න ඕන නැහැ. ඊළඟට ඔබතුමා දන්නවාද ඒකෙ පහළ තියෙනවා වෙල් කැල්ලක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහේද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** රොස්වුඩ් එකේ වතුර ටැංකිය පාරේ පහළට ගියහම. ඒක මේවා කරලා දීලා තියෙනවා. ඒකට දීලා තියෙන උත්තරය මම කියලා තියෙනවා. ඒකයි මම කිවුවේ මේක ගෙන්න ගෙන සභාගත කරන්න කියලා. එතකොට ඒ වෙල් කැල්ලට දීලා තියෙන උත්තරය බැලුවහම ඒක සයිට් එකට ගිහින් බලලා නෙමෙයි අවසරය දීලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මගේ පුද්ගලික මතය ඒක වෙන්දේසියට සුදුසු ඉඩමක් නෙමෙයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඉතාම පැහැදිලිව ගරු සභාපතිතුමනි, අපේ චාර්ටඩ් ඉන්ජිනියර්ස්ලා දෙන සහතිකය තියෙනවානේද, ඒක බලු වටින්නේ නැහැනේ ඇත්තටම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නමුත් අබේසේකර මන්ත්‍රීතුමා අපිට ඒකට අභියෝග කරන්න බැහැ. ඒ චාර්ටඩ් ඉන්ජිනියර් කෙනෙක් තමන්ගේ වෘත්තියත් එක්ක දෙන සහතිකයක් ඒක

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒකට අභියෝගයක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඒකට අභියෝග කරන්න ගියොත් අපිට මේකේ කිසි එකක් කරන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා දන්නවානේ මේක දෙන විදිය. ඊරියගහ හන්දියේ වාසනාවට කැඩිලා ගියේ වෙන්දේසිය ඉවර වෙන්න ඉස්සර වෙලා. වෙන්දේසිය ඉවර වුණානම් මොකද වෙන්නේ සභාව අල්ල ගෙන කන්න හදනවා ඒ මිනිස්සු ඇවිල්ලා. සභාවෙන් එහෙට මෙහෙට බෝලෙ පාස් කරයි එහෙමනම්. වෙන මුකුත් වෙන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊළඟ කාරණයට යන්නකෝ අබේසේකර මන්ත්‍රීතුමා. ප්‍රගතියේදී ඔය කාරණා ටික ඉදිරිපත් කරන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 25.** අනවසර ඉදිකිරීම් සහ ගොඩකිරීම් සම්බන්ධව නීතිමය කටයුතු කිරීම සඳහා මෙතෙක් සභාවට ඉදිරිපත්කොට ඇති (අවුරුදු 05ක පමණ කාලයක් තිස්සේ) ඇති යෝජනා සම්බන්ධව නීතිමය පියවර ගන්නා තෙක් වෙනත් කිසිම අනවසර ඉදිකිරීමක් හෝ ගොඩකිරීමක් සම්බන්ධව නීතිමය පියවර නොගන්නා මෙන්ද, නීතිමය පියවර ගැනීම් සම්බන්ධව සභාව දැනුවත් කරන මෙන්ද යෝජනා කරමි.

මම මේක නම් වශයෙන් කියලා බොහොම පැහැදිලිව කරලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම ඔබතුමාට කියන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** චෝදනාවක් මේක. මම කරන්නේ බොහොම සාධාරණ චෝදනාවක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මේකටත් මම විරුද්ධයි. හේතුව වෙන මුකුත් නෙමෙයි. දැන් අපිට මේ කියන විදියට අනවසර ඉදිකිරීමක් හෙට සභා භූමියේ ඇවිල්ලා කරොත් අපිට ඒක වලක්වන්න බැහැ. සියලු මන්ත්‍රීවරු දැන ගන්න ඕන කාරණාවක් තියෙනවා. එක කාරණාවක් තියෙනවා මෙහෙම. මම ගනිපු ක්‍රියාමාර්ගය හරි වෙන්නත් පුළුවන්, වැරදි වෙන්නත් පුළුවන්. නමුත් අනිත් මන්ත්‍රීවරු විවෘතව අහගන්න මේ කාරණය. ඒකට නම් මම නඩු දානවාම තමයි. නැත්නම් මම මේකේ ඉන්න එක තේරුමක් නැහැ. ඒක කියලා තමයි මම මේ කාරණය කියන්නේ. ඔබතුමා කියන ඒවාටත් දැන් ඉල්ලලා තියෙන්නේ. දහනායක එකටත් ඉල්ලලා තියෙන්නේ. ඊට පස්සේ මෙතන සර්විස් සෙන්ටර් එකටත් ඉල්ලලා තියෙන්නේ. ඒ සියලු ඔබතුමා කියපු ඒවා ඉල්ලලා තියෙන්නේ. ඊරියගහ හන්දියේ හෝල්ට් එක ළඟ ඉදිකිරීමක් කරා. කොහොම හරි ඒ ඉඩමට තව හවුල්කාරයෝ දෙන්නෙක් ඉන්නවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මගේ ගෙදර පහළ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි මම මේ කියාගෙන යන්නේ. ඉදිකිරීමක් කරනවා කියලා ආරංචි වුණා. ඒ ගෙදරම අම්මගේ එක සහෝදරියක් ඉන්නවා උළුවිටිකේ. අනෙක් සහෝදරිය කපුහෙම්පල. මම බොහොම ගෞරව කරන කෙනෙක්ගේ අම්මා කෙනෙක්. මම කපුහෙම්පල කවුද කියලා කියන්නේ නැහැ. අපේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවට බොහොම සම්බන්ධ කෙනෙක්ගේ අම්මා කෙනෙක්. මම කපුහෙම්පල කවුද කියලා කියන්නේ නැහැ. අපේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවට බොහොම සම්බන්ධ කෙනෙක්ගේ අම්මා කෙනෙක්. මේක මන්ත්‍රීවරු ඔක්කොම අහගන්න. ඉතිං මේ ඉදිකිරීම කරගෙන යද්දි එක පාර්ශවයක් උළුවිටිකේ මෙහෙම අනවසර ඉදිකිරීමක් කරනවා මොකද කරන්නේ කියලා ඇහුවා. මම වහාම ඉදිකිරීම නැවැත්වුවා තාක්ෂණ නිලධාරි යවලා. මම කිව්වා වහාම අනුමැතිය අරගෙන ඉදිකිරීම් කටයුතු කරන්න කියලා. දැන් හොරෙන් හොරෙන් දවසින් දවස මේක කරනවා. ඒ පාර මම නැවත කිව්වා ඒ වැඩේ කරන්න එපා කියලා. තාක්ෂණ නිලධාරි තුන්පාරක් විතර යැව්වා. ඒ පාර අනිත් පාර්ශව දෙක ආවා. ඔය ඉදිකිරීම කරන පාර්ශවය මගෙන් ඉල්ලීමක් කරා මම කැමතියි අර දෙගොල්ලෝ එක්ක සාකච්ඡා කරලා එකඟතාවයකට එන්න. ඒ නිසා ඔබතුමා සාකච්ඡාවක් කැඳවන්න කියලා කිව්වා. ඇත්තටම මට ඒක අදාළ කාරණයක් නෙමෙයි. ඒ ප්‍රශ්නය බේරන්න ඕන හින්දා මම සභාවට තුන්ගොල්ලොම කැඳෙව්වා. ඉදිකිරීම කරන පාර්ශවයයි අනෙක් අයිතිවාසිකම් කියන පාර්ශව දෙකයි. ඇත්තටම මට එහෙම කැඳවන්න ඕනකම තිබුණේ නැහැ. මට ගැටලුව තිබුණේ අනවසර ඉදිකිරීම ගැන විතරයි. නමුත් මේක ප්‍රායෝගිකව, සාධාරණව කරන්න ඕන හින්දා තමයි මම තුන්ගොල්ලොම කැඳෙව්වේ. කැඳවපු වෙලාවේ මේ කොරෝනා ප්‍රශ්නය ආවා. මම මෑතක සති එකහමාරකට විතර කලින් කැඳෙව්වා. කැඳවන කොටත් අර අය ටිකක් දුරට හදලා ඉවරයි. ඉතිං මම කැඳවලා කිව්වා මේ ප්‍රශ්නය ඔය ගොල්ලෝ කවුරුත් දන්නවානේ මේක මට එන්න ඕන ප්‍රශ්නයක් නෙමෙයි මට මෙතන තියෙන ප්‍රශ්නය අනවසර ඉදිකිරීම විතරයි. මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්ද කියලා තමයි මම මේක කැඳෙව්වේ කියලා. එතකොට ඔය ඉදිකිරීම කරන කෙනා මට කිව්වා මේකේ මේ දෙන්නට අයිතියක් තියෙනවා කියලා. ඒ අය සභාවට ප්ලෑන් එක දැම්මෙත් අනුමැතියට අර දෙන්නගේ කොටස් දෙක අයින් කරලා. අර දෙන්නගේ පර්චස් 1.5 කොටස් දෙක අයින් කරලා තමයි සභාවේ අනුමැතියට දැම්මේ. ඒකෙදි මම වැඩි හොඳට තමයි ඒ අයව කැඳෙව්වේ. ප්‍රශ්නයක් නැහැ කියලා තමයි මමත් හිතුවේ. නමුත් සාකච්ඡාව එනකොට ඉදිකිරීම කරපු මනුස්සයා, කැඳවන්න කියපු මනුස්සයා කියනවා මට මේ අය එක්ක කතාවක් නැහැ කියලා. මේ කැඳවන්න කියපු මනුස්සයා. ඉදිකිරීම කරන මනුස්සයා. මේගොල්ලෝ එක්ක කතාවක් නැහැ කියනවා. මේ අයට මේකේ අයිතියක් නැහැ කියනවා. කැඳවපු කාරණය නෙමෙයි දැන් වෙනත් පරිබාහිර ප්‍රශ්නයක්. මම කිව්වා අයිතිය පිළිබඳව මට අදාළ නැහැ කියලා. ප්ලෑන් එක මෙහෙට දාලා තියෙනවා අරවා පිට කරලා. දැන් කියනවා එහෙම නෙමෙයි කියලා. වෙලාවට අපි අනුමැතිය දුන්නේ නැහැ. මම කිව්වා තාක්ෂණ නිලධාරිට මේකට අනුමැතිය ලබා දෙන්න එපා කියලා. ඒ ඉඩමේ පර්චස් ගාණ බලලා ඒක අයින් කරලා කරන්න කියලා කිව්වා. වෙලාවට ඒක නැවතුණා. දැන් කියනවා මේ අයට අයිති නැහැ කියලා. මම කිව්වා මේ කොරෝනා ප්‍රශ්නය ඉවර වෙලා මාස දෙකක කාලයක් දෙන්නම් අනිත් දෙගොල්ලොන්ට අධිකරණයට ගිහිල්ලා තමන්ගේ අයිතිය පිළිබඳව අධිකරණ තීන්දුවක් අරගන්න කියලා. මට අයිතිය පිළිබඳව අදාළ නැහැ. ඔය ගොල්ලෝ ඒ ලියකියවිලි ටික හදා ගන්න කිව්වා. ඔයගොල්ලෝ මාස දෙකක් යනකම් මේ ඉදිකිරීම කරන්න එපා කියලා මම කියලා ආවේ. එතකොට මට අර දෙපාර්ශවය බනිනවා මොකටද අත්සන් ගන්නේ කියලා. මම කිව්වා තුන්ගොල්ලෝ එකඟ වෙලා එක තැනකදී තීන්දුව ගන්න කියලා. මට බදාදා පොරොන්දු වුණා වැඩ කරන්නේ නැහැ කියලා. මට ඊට පස්සේ දවසක එක පාර්ශවයක් කතා කරලා කියනවා සභාපතිතුමා දැන් යන්න බලන්න තාක්ෂණ නිලධාරීන් යවලා වැඩක් නැහැ කියලා. මම තාක්ෂණ නිලධාරීට ගත්තා ගත්තා දුරකථනය වැඩ කරේ නැහැ. ඒ අය යවලා වැඩක් නැහැ ඔබතුමා දැන් යන්න කිව්වා. එයා බද්දේගම ගිහින් එන ගමන් දැක්කා කිව්වා වැඩ කරනවා. මම ගියා බලන්න ඊට පස්සේ දවසේ. මම බලන්න ගියහම බාස්ලා තුන්දෙනෙක් දාලා වැඩ මේ අනවසර ඉදිකිරීමේ. මෙතන ඇවිත් එකඟතාවයකට ඇවිල්ලා පොරොන්දු වෙලා ගියා වැඩ කරන්නේ නැහැ කියලා මාස දෙකක් යනකම්. මෙන්න බොලේ ඉතිරි වැඩ කරනවා. මොකක්ද මම කරන්න ඕන. මම නැතත් මේ සභාපති තනතුරේ ගෞරවය ආරක්ෂා කරන්න ඕන. මේ අනවසර ඉදිකිරීමට කවුරුවත් බාධා කරන්න එපා. ඒක මම නෙමෙයි මෙතන කවුරු හිටියත් තනතුරේ ගෞරවය ආරක්ෂා කරන්න දෙන්න. ඒකට නම් නඩු දානවාම තමයි. ඒකට මට කවුරුවත් බලපෑම් කරන්න එපා. අනිත් ඒවාටත් නඩු නොදා ඉන්නේ නැහැ. ඒවා කියන්න ඒවාටත් නඩු දානවා. ලේස්ති කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් ඔය කතාව ආව නිසා කතා කරන්නේ. දැන් ටෙක්ලා මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරා සෙන්ට්‍රිටාස් එකට හැරෙන තැන බිල්ඩින් එකක්. දැන් හදලා ඉවරයි. දැන් දහනායක එකේ ගෙනල්ලා දාලා ඉවර වෙලා පස් දාලා ගොඩ කරලත් ඉවරයි. හැමදාම දානවා. මේවා ගැන බලන්නේ නැත්තේ ඇයි. ඕවට දාන එක ගැන ප්‍රශ්නයක් නැහැ. මම මේ දාන්න

එපා කියලා එකක් නෙමෙයි කිවුවේ. මට තියෙන්නේ ඕක ආවහම ප්‍රශ්නයක්. මගේ ගෙවල් පහළ හරියට මම නිකං මිනිස්සු ගෙයක් හදා ගන්නවාට විරුද්ධයි වගේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තාක්ෂණ නිලධාරීන් ගිහින් බැලුවට මේ මිනිස්සු ඇඟිල්ල දික් කරලා කෙළින්ම කියන්නේ මේ නිලධාරීන් ක්‍රියාත්මක වෙලා නෑ කියලා. අපි මෙතන කරන්නේ තීන්දු තීරණ ගන්න එක විතරයි. අදාළ නිලධාරීන් දැන ගන්න ඕන. මම දිනූෂ මහත්තයාට දිගින් දිගට ඕකට යැව්වා. තුන්පාරක් විතර යැව්වා. යවලත් මිනිස්සු හැසිරෙන්නේ මෙහෙමයි. මම තාක්ෂණ නිලධාරීන් තුන්දෙනාටම කියන්නේ එක දෙයකටවත් මුහුණ බලන්න එපා. ඉදිකිරීම අනවසර නම් එවෙලේම අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නකෝ. කවුරුවත් බලපෑම් කරලා නෑනේ. ඒකේදි මිනිස්සුන්ට තියෙන ආකල්පය තමයි මේක කියලා වැඩක් නැහැ මේක කිවුවට වැඩක් නෑ කියලා. ඇත්ත කතාව ඒක.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගොඩකන්දේ ඒ අනවසරයෙන් කරලා කාණුවත් අවහිර කරලා තියෙන එක ගැන අපි කතා කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම නම් කියන්නේ මෙහෙමයි. ඒක පෝලිමකට දාන්නකෝ. හොයලා බලපු ඔක්කොටම දාන්නකෝ. තව එකක් තියෙනවා තීන්දුව ලැබිලා තියෙනවා කඩා ඉවත් කරන්න. ඩඩ්ලි මන්ත්‍රීතුමාලගේ ගෙවල්වලට යන පාරේ ඉසුරු පෙදෙසේ තියෙන එක කඩා ඉවත් කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊළඟට ඔබතුමත් දන්නවා ඔබතුමාලා අපි එක තැනක ඉඳගෙන තමයි මේවාට ෆයිට් කරේ. ගොවිජන සේවා එකෙන් හැමදාම දාපු නඩු පරාදයි. පරාද වෙන්න තමයි දාන්නේ. ඉතිං ඒක හින්දා පරාද වෙන්න දාන්නේ ඉඩකඩ තියලා. ඉතිං ඒක හින්දා කරුණාකරලා සභාපතිතුමා දැන් මේ ප්‍රශ්නය භාර දීපු නීතිඥයෝ ඉන්නවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇත්තටම ඉක්මනට මේවා සිද්ධ වෙනවා. අරලිය ලී මෝලේ තීන්දුවත් 16 වෙනිදට හම්බ වෙයි. ගොඩක් දේවල් ක්‍රියාත්මක වෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අර ඉදිරිපත් කරපුවා හදාගෙන යනවා. පොලීසිය හොඳටම දන්නවානේ මේවාට අවසර නැහැ කියලා. දැන් ටෙක්ලා මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරපු එක ඔක්කොම හදලා ඉවරයි. දැන් අර ඉස්සරහ කඩලා දාලා ඇතුල්වෙන එක විතරයි තියෙන්නේ. එතකොට අපි ගියා වක්වැල්ලේ එක බලන්න. ඒ ටික අපි ප්‍රගතියේදී කතා කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න බැහැ. ඒකට මම විරුද්ධයි. ඕන නම් ඡන්දයකට යමු. මම ඒකට විරුද්ධයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම මේ යෝජනාව ගෙනාවේ වෙන හේතුවක් උඩ නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකේ වෙනමම දෙයක් තියෙනවා. දැන් මම කියපු උදාහරණය බලන්න. ඒකට නඩු දාන්නත් බැහැ. පරණ දේවල් ගැන හිත හිතා හිටියොත්. මට මේ පෙනී පෙනී ඉදිකිරීමක් කරොත් නඩු දාන්න බැහැ මේක සම්මත වුණොත්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දාන්න එපා කියන එක නෙමෙයි කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිත් ඒවාට දාන්න එපා කියලා තියෙන්නේ. ඔබතුමා කියලා තියෙන්නේ එහෙම. ''වෙනත් කිසිම අනවසර ඉදිකිරීමක් හෝ ගොඩකිරීමක් සම්බන්ධව නිතීමය පියවර නොගන්නා මෙන්'' එහෙම කරන්න බැහැ. මම කලින් සභාපතිවරු වගේ හංගගෙන වැඩ කරපු මිනිහෙක් නෙමෙයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම ඒ යෝජනාව පැත්තකට කර ගන්නවා. මේ තාක්ෂණ නිලධාරීන්ට කියන්න ඊළඟ සභාව වෙන කොට මේකේ සම්පූර්ණ ප්‍රගතිය දෙන්න කියලා. ඒවගේම එකක් තියෙනවා මේ නඩු දිනන්න ඕන පරාද වෙන්න බැහැ. සිසිර නීතීඥතුමාටනේ භාර දීලා තියෙන්නේ. එතුමා දක්ෂයි ඉතාම හොඳයි. ප්‍රසිද්ධ කෙනෙකුත් අල්ලන්න ප්‍රශිතා වගේ. මොකද හේතුව මේ නඩු දිනන්න ඕන. කෝටි ගණන් එන්න තියෙන නඩු මේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මේ අනවසර ඉදිකිරීම් සම්බන්ධව මෙතන කතා කළ නිසා කතා කරන්න ඕන. ඔබතුමාගෙන් නමක් කියවුණා දහනායක කියලා. මේ දින කිහිපය ඇතුළේ එතුමා විතරක් නෙමෙයි බොහෝ ප්‍රදේශවල නිරීක්ෂණය කරලා බලන්න අනවසර ඉදිකිරීම් බොහොම වේගයෙන් කරා. දහනායක මහා පරිමාණයෙන් මේ කාලය

ඇතුළත සම්පූර්ණ වෙනස්කම් කරා. පාරෙන් වතුර මේ පැත්තට නිතරම එන තැනක් එතන. ඔබතුමා නිතර දෙවේලේ යන තැනක් ඒ. ඔබතුමාගේ සභාපතිධූරයටත් නොසලකා හැරීමක් තමයි එයා දැනුවත් කිරීමක් කරලා තියෙද්දිත් කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි මන්ත්‍රීතුමා මෙහෙමයි. ඒක මගේ කාලයේ සිද්ධ වෙච්ච දෙයක් නෙමෙයි. නමුත් ඒ පිළිබඳව දැන් කටයුතු කරගෙන යනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** දැනුවත් කරලා තියෙද්දිත් වේගෙන් කරගෙන යනවානේ. කෙසේ වෙතත් මොන මත ගැටුම් තිබුණත් මගේ මතය අනුව ඔබතුමා ඒක මෙතනදී කියපු එක ගැන මගේ ප්‍රශංසාව හිමි කරනවා මම පෞද්ගලිකව. මූණු බලන්නේ නැතුව, කවුද කියලා බලන්නේ නැතුව නීතිය හරියට ක්‍රියාත්මක කරන්න. මේ සභාපතිධූරයේ ගෞරවය රකින්න මම ඕන වෙලාවක ඉන්නවා. අනවසර ඉදිකිරීමක් සම්බන්ධ ගැටලුවක් අපේ ගමේද කොහේද එන්නේ ඔබතුමාට මැදිහත් වෙන්න වුණොත් මම පෞද්ගලිකව ඒකට සහභාගි වෙනවා. නීතිය අකුරටම ක්‍රියාත්මක වෙන්න ඕන. අපි නීතිගරුක මිනිස්සු. සභාවක මන්ත්‍රීධූරයේ ඉඳලා ඉහල පාර්ලිමේන්තුව දක්වා වෙලා තියෙන්නේ එක්කෙනෙක් දෙන්නෙක් කරන නොහොඹිනාකම් නිසා සමස්ත මන්ත්‍රීවරුන්ටම අද කටක් අරින්න බැහැ පාරක, තැනකට ගිහිල්ලා. දැන් අද උදේ ඉඳන් වාදවිවාද වුණේ ඒකයි. හෙල්මට් එකට පවා රුපියල් විසිපන්දාහක් දාගත්තා කියලා චෝදනාවලට ලක්වෙන්නේ අපි විසින්ම කර ගනිපු අවනම්බු හින්දා. මේක දුරදිග ගෙනියනවා නෙමෙයි. ඔබතුමාට ශක්තියක් වෙන්න මේ කරුණු ටික ඉදිරිපත් කරේ. සභාවේ කටයුතු ඉදිරියට කරගෙන යන්න මම යෝජනා කරනවා.

<u>ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මා හිතවත් මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලා ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි. වියළි ආහාර පාර්සල් බෙදා හැරීමේදී මට පාර්සල් 650ක් හම්බ වුණා. මට දැන ගන්න ලැබුණා කලේගාන දකුණ ප්‍රදේශයේ තව බෙදුවා කියලා. ඒක ගැන මට දැන ගන්න අවශ්‍යයි. ඒක මම ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමා ගෙදර ගෙනිච්චේ නැහැ. බෝපෙ පෝද්දල ජනතාවට ඒ වෙලාවේ කරේ. කීමට කියනවා වගේ පොඩි සේලයින් එකක් දුන්නේ. පොඩි ප්‍රාතිහාරයක් කරේ. ඒක ඉතාම වටිනවා අපේ කොට්ඨාශයට ගියහම. වෙනත් සභාවල් බැලුවහම ඒ සභා අතරෙයි, අපේ සභාව අතරෙයි අපිට හොඳ නමක් ඇවිල්ලා තියෙනවා. ගරු සභාපතිතුමා අපි ඒ කමිටුවේ හිටියා. අපි ඔබතුමා වෙනුවෙන් හිර ගෙදරට යන්න වුණත් සූදානම්. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා මට ලිස්ට් එකක් ලබා දුන්නා. මට කියන්න ඒ ලිස්ට් එකේ අයට බඩු හම්බ වුණේ නැත්නම්. මම පක්ෂ භේද, ජාති භේද, කුල භේද කිසිම දෙයක් හොයන්නේ නැතුව ඒ පාර්සල් 650 බෙදුවා. මම කිසිම දෙයක් කියන්නේ නැහැ. මගේ කොට්ඨාශයේ මම නියම විදියට ඒ දේ කරා. බොහොම ස්තුතියි.

**26.** වටරැක නැගෙනහිරට අයත් කොහොඹන්වත්තට යන කොන්ක්‍රීට් පාරේ දකුණු පැත්ත පස් කණ්ඩිය කඩා වැටීමෙන් යම්කිසි වේලාවක හානියක් වෙතොත් පාර කැඩීයාමේ අවදානම ඇත. එබැවින් පැති බැම්මක් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 27.** වයිනේරු කන්ද වම් පැත්තට ආරක්ෂිත වැටක් ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ඊයේ ගිය නිසා යන කොට දකින්න ඇති. මේ පැත්තෙන් නගින කොට වම් පැත්තෙන් බෑවුම තියෙනවා. එතනට ආරක්ෂක වැටක් යොදන්න යෝජනා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 28.** වී.සී පාරෙන් ගලා බසින වතුර පාර දෙණියවත්ත පාරට වැටීමෙන් ගෙවල් කිහිපයක් යටවේ. එම වතුර ගැලීම වැලැක්වීම සඳහා පාර හරහා කාණුවක් කපා යකඩ දැලක් දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 29.** වටරක නැගෙනහිර, පහළ ගෙදර වත්ත යන ලිපිනයේ පදිංචි එන්.ඩබ්.ඒ දිමුතු ගයාන් යන අය කම්කරුවෙකු වශයෙන් බඳවා ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තිස්ස මන්ත්‍රීතුමා මේ වෙලාවේ කරන්න හැකියාවක් නැහැ. මොකද මැතිවරණ කාලයක් යන්නේ. බඳවා ගැනීම් කරන්න බැහැ. පස්සෙ වෙලාවක බලමු.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 30.** වීදි ලාම්පු කට්ටල 15ක් මිලදී ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

ඊළඟට මගේ අත ඇරපු යෝජනාව ඉදිරිපත් කරනවා.

**01.** කොරෝනා වෛරසය ව්‍යාප්තවීම නිසා ඇඳිරි නීතිය පැනවීම හේතුවෙන් අසරණ වූ බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී ජනතාවට වියළි ආහාර නොමිලේ බෙදාදී සහන සැලසීම සඳහා සහ බල ප්‍රදේශය හා කාර්යාල පරිශ්‍රය විෂබීජහරණ කටයුතු සඳහා මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව පහත කාර්යයන් සිදුකර තිබීම අනුමත කරන මෙන් යෝජනා කරමි.

**I.** මේ සඳහා රු. 4,050,000.00 උපරිමයක් දක්වා මුදලක් සහා අරමුදලින් වියදම් දැරීම සඳහා ලේකම් වෙත බලය පැවරීම. (වියළි ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම, ඇසිරීම, බෙදා හැරීම සඳහා හා විෂබීජහරණ කටයුතු සඳහා)

**II.** මේ සඳහා වියළි අහාර ද්‍රව්‍ය හා ඇසුරුම් මිලදී ගැනීමේ කටයුතු සඳහා ගරු සභාපති දිල්රුක් එන්. අබේකොන් මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා හා ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද ඇතුළත්ව විශේෂ කමිටුවක් පත්කර තිබීම.

**III.** නාගරික සංවර්ධන ගිණුමෙන් (ගි.අ 0075833867) පොදු ගිණුමට (ගි.අ 000400935) රු.1,950,000.00 ක මුදලක් මාරු කර තිබීම.

**IV.** වියළි ආහාර ද්‍රව්‍ය හා ඇසුරුම් මිලදී ගැනීම වෙනුවෙන් අබේවික්‍රම සුපර් සිටි ආයතනය වෙත රු. 244,080.00ක මුදලක් ගෙවීම, විජිත ෆුඩ්සිටි (පුද්) සමාගම වෙත රු. 2,000,000.00 ක අත්තිකාරම් මුදලක් ගෙවීම, විජිත ෆුඩ්සිටි (පුද්) සමාගම වෙත රු. 1,703,352.00 ක් වන ඉතිරි මුදල් ගෙවීම, ඇසුරුම් මිලදී ගැනීම වෙනුවෙන් විජිත ෆුඩ්සිටි (පුද්) සමාගම වෙත රු. 41,700.00ක මුදලක් ගෙවීම.

**සංශෝධන ඃ- II.** මේ සඳහා වියළි අහාර ද්‍රව්‍ය හා ඇසුරුම් මිලදී ගැනීමේ කටයුතු සඳහා ගරු සභාපති දිල්රුක් එන්. අබේකොන් මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා, <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා</u> හා ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද ඇතුළත්ව විශේෂ කමිටුවක් පත්කර තිබීම ලෙස සංශෝධනය විය යුතුයි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව හා සංශෝධනය මම ස්ථිර කරනවා.

ඔබතුමාලට ලබා දීලා තියෙනවා ඒ ලේඛන. ඉදිරි සභාවේදී නැවතත් මේ පිළිබඳව පුළුල්ව ලිපිගොනුව උනත් පරීක්ෂා කරන්න පුළුවන් කිසි ගැටලුවක් නැහැ. මම විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා යසරත්න මන්ත්‍රීතුමා මේ පිළිබඳව තියෙන ලිපිගොනුව පරීක්ෂා කරලා බලලා මිලදී ගැනීම් පිළිබඳව කියන්න. අනිත් දේවල් වලට මම එකගතාවය පළ කරනවා යම්කිසි අඩුපාඩුවක් වෙන්න ඇති කියලා. මිලදී ගැනීම් පිළිබඳව අඩුපාඩුවක් තියෙනවා නම් ඔබතුමා මට පුද්ගලිකව හරි, ඊළඟ සභාවේදී හරි ඒක කියන්න. ලේකම්තුමා ගාව සම්පූර්ණ ලිපිගොනුව තියෙනවා. ඕන මන්ත්‍රීවරයෙකුට බලන්න පුළුවන්. විනිවිදභාවයෙන් අපි වැඩ කරලා තියෙනවා. කවදාවත් අහිංසක මිනිස්සුන්ගේ තුට්ටු දෙකට ගහන්න තරම් පහත් තත්ත්වයට මමවත් මන්ත්‍රීවරුන්වත් මේ නිලධාරීන්වත් වැටෙන්නේ නැහැ කියලා මම මේ අවස්ථාවේදී කියන්න ඕන.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ෂොපින් බෑග් මිලදී ගැනීමේදී රු. 22,960.00 ක ඉස්සෙල්ලා මිලදී ගෙන තියෙනවා. රු. 7,380.00 ක අරගෙන තියෙනවා. ආයේම අරගෙන තියෙනවා රු.33,600.00 කයි. රුපියල් 8,100.00 යි. රු. 71,000 ක් ඇසුරුම්වලට ගිහින් තියෙනවා. වාර්තාවේ තියෙන දේවල් එක්ක මම කතා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම දෙයක් තියෙනවා. කලින් 4000 ක් විතර පාර්සල් කරලා තිබුණා. ඒවා ගැට ගහලා තිබුණේ. ඒවා කඩන්නත් සිද්ධ වුණා දෙකට බෙදද්දි. මොකද මේවා ගැට ගහලා තමයි දාලා තිබුණේ. ඔබතුමාලා ගියපු දේවල් බලන්න. ඕක බලන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** බෑග් 20,000 ක් අරගෙන තියෙනවා. පහේ බෑග් 20,000 ක් අරගෙන තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තනි බෑග් තිබුණ ඒවා ඩබල් කරා හාල් වලට කඩා ගෙන වැටෙන නිසා. ඒක ඕන වෙලාවක කියන්න පුළුවන්. බෑග් දෙකක් දාලා තිබුණා. මට උනත් හිතා ගන්න බැහැ තව මාසයක් යද්දි ඕක අමතක වේවි. ප්‍රායෝගිකව ඕක බැලුවහම තේරෙන්නේ නැහැ ඔච්චර ගාණක් ගියාද කියලා ෂොපින් බෑග්වලට.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි මෙම වියළි සලාක බෙදාදීමේ කමිටුවේ සාමාජිකයෙකු හැටියට නිරන්තරයෙන් එහි ආරම්භයේ සිට අවසානයේ බඩු බෙදාහැරීම දක්වාම මම රැඳී සිටියා. අපේ කමිටුවේ මන්ත්‍රීවරු රැඳී සිටියා. මෙතන මතු වුණ ගැටලුවලට මට පුළුවන් ආකාරයට පැහැදිලි කරන්න විනාඩි කිහිපයක් ලබා දෙන්න. මේ සම්පූර්ණ ක්‍රියාවලිය අපේ මන්ත්‍රීවරු හය හත් දෙනෙක් සමඟ ලේකම්තුමාත් අබේවික්‍රම ෆුඩ් සිටියට හා විජිත ෆුඩ් සිටියට ගියා. ගිහිල්ලා මිල ගණන් වෙන වෙනම සඳහන් කර ගත්තා. ඒ අනුව වඩාත් මිල අඩු ස්ථානයෙන් මිලදී ගත්තේ. අපි ටී.කේ.ජී. ට්‍රේඩර්ස් එකෙනුත් මිල ගණන් ගෙන්න ගත්තා. අපිට කොයි තරම් හිතවත්කම් තිබුණත් අඩු මිල ගණන් දැක්කේ විජිත ෆුඩ් සිටියේ නිසා අබේවික්‍රම ෆුඩ් සිටියෙන් භාණ්ඩ මිලදී නොගෙන රුපියල් දෙකේ අඩුවට පවා විජිත ෆුඩ් සිටියෙන් භාණ්ඩ මිලදී ගන්න තීරණය කරා. නැත්නම් අපිට තිබුණ හිතවත්කම් අනුව අබේවික්‍රම ෆුඩ් සිටියෙන් මිලදී ගන්න තිබුණා. නමුත් අපි කිසි කෙනෙක් ඒ ගැන කතා කරේ නැහැ. සම්පූර්ණ විනිවිදභාවයෙන් තමයි මේ මිල ගණන් ලබා ගත්තේ එවලේම. ආයෙත් පස්සට එවන්න කියලා කතා කරේ නැහැ. ඒ නිසා මේකෙදි අපි හොඳින්ම දන්නවා කිසිදු රුපියලකවත් අඩුපාඩුවක් වුණේ නැහැ. එතනදී යසරත්න මන්ත්‍රීතුමා මතුකරපු ප්‍රශ්නය පැහැදිලි කරන්න ඕන.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** බැලූ බැල්මට ඔබතුමාගේ යෝජනාවේ දාලා තියෙන්නේ රු. 41,700.00 යි. මේ වාර්තාව අනුව රු. 71,000.00 ක් වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතන ගැටලුවක් තියෙනවා. රු. 71,000.00 ක් වියදම් වෙලා අපි අනුමත කර ගන්නේ රු. 41,700.00 යි නම් ඒක ගැටලුවක්. එතන ප්‍රශ්නයක් තියෙනවා. මෙතන අනුමත කරන ගාණට වැඩිනම් එතන වැරැද්දක්.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මෙකෙදි ෂොපින් බෑග් ගෙනල්ලා පාර්සල් 800ක් හාල් කිලෝ 5 බැගින් පාර්සල් කරා මුලදී. ඒ පාර්සල් 800 පුස්තකාල ශාලාවේ තිබ්බේ. ඊට පස්සේ නැවත හාල් කිලෝ දෙකහමාර ගාණේ වෙන් කරන්න ඕන වුණහම ඒ බෑග් නැවත ගැට ගහපු විදියෙන් ලිහලා ගත්තේ. රුපියල් පහේ බෑග් පාර්සල් ප්‍රමාණයට වඩා වැඩි වීමක් වුණා. ඊට පස්සේ ලූණු, සීනි සහ පරිප්පු එම භාණ්ඩ පාර්සල් කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** රුපියල් දාහත් ලක්ෂ තුන්දහස් තුන්සිය විසි හතේ බිලේ තියෙනවා ටිකක්. බැලූ බැල්මට පේන්නේ රු. 41,700යි කියලා. මේක දාන්න තිබුණේ බඩුවලට මෙච්චරයි ඇසුරුම්වලට මෙච්චරයි කියලා. රුපියල් දාහත් ලක්ෂ තුන්දහස් තුන්සිය විසි හතේ වවුචරයට ඇසුරුම් සහිතව විජිත ෆුඩ් සිටි සමාගම වෙත ගෙව්වා කියලා නිවැරදි වෙන්න ඕන. යසරත්න මන්ත්‍රීතුමා පෙන්නා දීපු එක හරි. මේක බැලූ බැල්මට පේන්නේ රු. 41,700 ඇසුරුම් වලට කියලා. ඒක නිවැරදි වෙන්න ඕන. ඒක ඒ විදියට සංශෝධනය වෙන්න ඕන.

**සංශෝධන ඃ-IV.** වියළි ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් අබේවික්‍රම සුපර් සිටි ආයතනය වෙත රු. 244,080.00ක මුදලක් ගෙවීම, වියළි ආහාර ද්‍රව්‍ය හා ඇසුරුම් මිලදී ගැනීම වෙනුවෙන් විජිත ෆුඩ්සිටි (පුද්) සමාගම වෙත රු. 2,000,000.00ක අත්තිකාරම් මුදලක් ගෙවීම, වියළි ආහාර ද්‍රව්‍ය හා ඇසුරුම් මිලදී ගැනීම වෙනුවෙන් විජිත ෆුඩ්සිටි (පුද්) සමාගම වෙත රු. 1,703,352.00 ක් වන ඉතිරි මුදල් ගෙවීම, ඇසුරුම් මිලදී ගැනීම වෙනුවෙන් විජිත ෆුඩ්සිටි (පුද්) සමාගම වෙත රු. 41,700.00ක මුදලක් ගෙවීම ලෙස සංශෝධනය විය යුතුයි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම සංශෝධනය මම ස්ථිර කරනවා.

මේ පිළිබඳවත් අදහස් දක්වන්න ඕන. ඔබ බලයි මේ නාගරික සංවර්ධන අධිකාරියේ ගිණුමෙන් පොදු ගිණුමට රුපියල් දහනම ලක්ෂ පනස් දාහක් මාරු කරපු එකේ තේරුම මොකක්ද කියලා. ඒකෙදි

ඇත්තටම අපිට මුදලින් තිබුණේ රුපියල් විසිතුන් ලක්ෂයක මුදලක්. ඉතුරු ගාණ අපිට ණය මුදලක් විදියට දිගට තියා ගන්න බැහැ. ගොඩනැගිලිවලට අය කරන දඩ මුදල් යන්නේ නාගරික සංවර්ධන අධිකාරියේ ගිණුමට. ඒ ගිණුමක් මෙහේ තියෙනවා. ඒකෙන් අරමුදල් ප්‍රතිපූර්ණය කරා අරගෙන. නැවත අපි ඒවා දාන්න ඕන නාගරික සංවර්ධන අධිකාරියේ ගිණුමට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි මේ යෝජනාවට විරුද්ධයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව සම්මත කිරීම සඳහා බෙදීමකට යනවා.

ඉන්පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 11

විපක්ෂව - 09

ඡන්ද විමසීම සිදු කරන විට සභා රැස්වීම් ශාලාවේ නොසිටි - 02

**යෝජනාව සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබාදුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
07. ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
08. ගරු මන්ත්‍රිනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය
09. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
10. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
11. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා

**යෝජනාව සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබාදුන් පිරිස**

01. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
03. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
04. ගරු මන්ත්‍රිනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
05. ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
06. ගරු මන්ත්‍රිනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
07. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
08. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
09. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**ඡන්ද විමසීම සිදු කරන විට සභා රැස්වීම් ශාලාවේ නොසිටි පිරිස**

01. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වැඩි ඡන්ද දෙකකින් එම යෝජනාව සභා සම්මත විය.

නිවැරදි දේ දැකලා පක්ෂව සහයෝගය ලබාදීපු සියලුදෙනාට ස්තුතිවන්ත වෙනවා. මේ සියලුදෙනාට ස්තුතිවන්ත වෙනවා. මේ සියලු කාරණාවලදී අඩුපාඩු පෙන්වලා දෙමින් ළඟ ඉඳලා ඔක්කොම කරලා විරුද්ධවීම පිළිබඳවත් කණගාටුවෙනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** අපිට ලිස්ට් ගෙනත් දුන්නා. අපි ඒ ලිස්ට්වලටත් බඩු දුන්නා. ඒ නම්වලටත් විරුද්ධ වුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මන්ත්‍රීතුමා කියන්න දෙයක් නැහැ. මේ අදාළ අය හැම එකටම විරුද්ධයි. ඒක අදාළ අය භාරගන්න.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** මේක නිවැරදි විදියට ආවා නම් සම්මත කරන්න තිබුණා. වැරැද්ද පෙන්වලා දීලා, වැරැද්ද එහෙමම තියෙද්දී සම්මත කරන්න බැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සංශෝධනයෙන් නිවැරදිකරානේ. බිල් ටික තියෙනවා. ඕන කෙනෙකුට බලන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. දැන් අනවශ්‍යයි. ඔබතුමාට අවස්ථාව ලබා දුන්නා. දැන් හේතු එපා. ඔබතුමාලට මෙතෙක් කාලය ලබා දුන්නා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** රජය පාලන මිලක් දාලා තිබුණා. ඒ පාලන මිලට පරිබාහිරව මිලදීගැනීම් කරලා තිබුණා. මට ඒවා අනුමත කරන්න බැහැ. ඒවා හරියට සඳහන් වෙන්න ඕන. ඒවා කලින් මතු කරා. ඒක නිවැරදි කරලා ලබන සභාවට දාන්නම් කිව්වා. ඒක දැන් හදිසියේ ගෙන්න ගත්තා. දැන් වග කියන්න බැහැ. කුහකකම්වලට කරා කියන්න එපා. වෙන කතා කියන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කරුණාකරලා වාඩිවෙන්න. ඔබතුමා අදහස් දැක්වූවා. ඔබතුමා මෙතෙක් පක්ෂ වෙච්ච දේවල් නැහැනේ. දැන් බලනකොට එකගතාවයෙන් වැඩ කරගෙන යන්න ගියාම ඔබතුමාලා පක්ෂ වෙච්ච තැන් නැහැ. ආයේමත් ඔබතුමාට අවස්ථාව දෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එකතුවෙලා ගෙනාවත් විරුද්ධයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වැඩි ඡන්ද දෙකකින් සම්මත වුණා. බෝපෙ පෝද්දල ජනතාව මේක දැනගන්න ඕන. පක්ෂ වෙච්ච මන්ත්‍රීවරු, විරුද්ධ වෙච්ච මන්ත්‍රීවරු දැනගන්න ඕන. අපි ඕනම දේකට ලැහැස්තියි. ඉතින් බොහොම ස්තූතියි පක්ෂව ඡන්දය දීපු මන්ත්‍රීවරුන්ට.

<u>**(ඊ) කාරක සභාවල වාර්තා ඃ-**</u> නැත

<u>**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-**</u>

<u>**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ**</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2020 වර්ෂයේ මාර්තු මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** II. 2020 වර්ෂයේ අප්‍රේල් මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2020 වර්ෂයේ මාර්තු මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- II.** 2020 වර්ෂයේ අප්‍රේල් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- I.** 2020 වර්ෂයේ මාර්තු මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- II.** 2020 වර්ෂයේ අප්‍රේල් මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**04. වෙනත් ලේඛන** ඃ- නැත

**(ඉ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා**

**පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ මැයි මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය

ප්‍රගතිය අවස්ථාව තියෙනවා ඒ වගේම සභාවේ කාලය වෙන් කර ගැනීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමන්ලා දහ දෙනෙක් ලියුමක් අත්සන් කරලා දීලා තියෙනවා මම මින් ඉදිරියට ලබන සභාවේ ඉඳගෙන ඒ විදියට තමයි ක්‍රියාත්මක වෙන්නේ.

(ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා, ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා, ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය, ගරු මන්ත්‍රිනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය සහා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ප්‍රගතියේදී මට කරුණු කිහිපයක් කතා කරන්න තිබුණත් අත්‍යාවශ්‍ය කරුණු කිහිපය පමණක් ගරු සභාවේදී කතා කරන්නේ. කපුහෙම්පල ෆිනෑන්ස් ඉඩමක් සම්බන්ධව ඔබතුමත්, මමත්, තාක්ෂණ නිලධාරීතුමත් ගිහින් බැලුවා. තාම ඒ පැති බැම්ම ඉදිකරලා තියෙනවා. ඊයෙත් ධාරානිපාත වැස්සට ඒ කාණුව බ්ලොක් වෙලා. ඒ බෝක්කුව තව වෙනතුරු සකස් වුණේ නැහැ. ඒක කඩා ඉවත් කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ පෙට්ටි බෝක්කුව දාලා අපි කියපු විදියට කටයුතු කරන්න ඕන.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒ විදියට කටයුතු කෙරෙන්නේ නෑ වගේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට අනුමැතිය දෙන්නේ නැහැ.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගමේ කට්ටියගේ ලොකු විරෝධයක් තියෙනවා. සිලින්ඩරයෙන් වතුර බැස යන්න බැහැ. ඒ නිසා කරුණාකරලා අවශ්‍ය පෙට්ටි බෝක්කුව සකස් කරලා දෙන්න. අවශ්‍ය සංවර්ධන කටයුතු ටික විතරක් ඉතුරු කරලා අනිත් ඒවා කරද්දි මිනිස්සුන්ට ප්‍රශ්නයක් තියෙනවා මේක කෙරෙන්නේ නැහැ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** උප සභාපතිතුමා මෙහෙන් අනුමැතිය දෙනකම් අපිව විශ්වාස කරන්න. ඕවා නිවැරදි කරනකම් අනුමැතිය දෙන්නේ නැහැ.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** අනිවාර්යයෙන් ඒක කඩන්න. වහින වෙලාවට එතනින් බ්ලොක් වෙනවා. ගෙවල් තුනක් යට වෙනවා. සභාපතිතුමා ඒ ගැන පොඩ්ඩක් බලන්න.

දෙවැනි කාරණය තමයි කපුහෙම්පල සායන ගොඩනැගිල්ලේ විසිදෙවෙනිදා සායන කටයුතු පටන් ගන්නවා. ඒකට තාම වතුර ටැංකිය නැහැ. ඔබතුමා නැවත කියන්නත් එපා කිවුවා සභාවේදී. නැවත කතා කරන්න වුණානේ සභාපතිතුමා සභාවේ. විසිදෙවෙනිදා සායන කටයුතු පටන් ගන්නවා. ඊට ඉස්සර වෙලා ඒක කරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම නැවත කියන්නත් එපා කිවුවා. ඒ වගේ දේවල්වත්, ප්‍රමුඛව කියන දේවල්වත් කරන්නේ නැහැනේ. කියන්නෙත් සීමිත කාරණාවල් නේ ප්‍රමුඛව කරන්න කියලා. මේ එන ප්‍රශ්නවලට මම උත්තර දෙන්න එපැයි.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒක විසිදෙවෙනිදාට කලින් සවිකරලා දෙන්න පුළුවන්නම් හොඳයි. වෛද්‍යතුමා පවා කතා කරලා කිවුවා. සෙනඟ වැඩි වෙනවා කිවුවා ගොඩකන්දට. ඒක නිසා කපුහෙම්පල සායන කටයුතු පටන් ගන්න ඕන කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට කියන්න බැහැ දින වකවානු. පුළුවන් තරම් ඉක්මනට ඒක ඉවර කරන්න ඕන. කමිටු දාන්නත් වේවි සමහර විට.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** අඩු ගාණේ ටැංකියක් ස්ලැබ් එක උඩින් තියලා හරි ලයින් එක අරන් දෙන්න අත හෝදන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකට චෝදනාවක් ආවොත් මම නිලධාරීන් පිට තමයි දාන්නේ. මට චෝදනා කරන්න එපා ඒ ගැන.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** අඹගහ වත්තේ සල්ගහ උයනේ දැන් මාර්ග පද්ධතිය සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තියෙන්නේ. පහුගිය දවස්වල වතුර දීලා කොටසක් විනාශ වුණා. ඒ ගිවිසුම් කාලසීමාව ඉකුත් වෙන්න කිට්ටුයි. ගමේ කට්ටිය හදලා දෙන්න ඕන කියලා කියලා තියෙනවා. සභාවටත් ඉල්ලීම කරාලු. පද්මසේන සභාපතිතුමා ඉන්න කාලයේ නඩුවකුත් තිබුණා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ වගේමයි ඊරියගහ දූව පාර.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මෙහෙම දෙයක් තියෙනවා. අවුරුදු පහට කිට්ටු ෆයිල් ටික අරගෙන අපි යමු ඒ ටික බලන්න. අපිත් සමඟ ගිවිසුම්වලට එළඹිච්ච ෆයිල් 50ක් 60ක් නෑනේ. අවුරුදු 05ට අඩු ෆයිල් ටික ගන්නකෝ. අපි ගිහින් බලමු.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** සභාව විදියට හදන්නත් බෑ. ගිවිසුම් කාලය තියෙන නිසා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක බලමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** යනකොට අපිවත් දැනුවත් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊට පස්සේ ඒ අයගේ තව ඉඩම් වෙන්දේසියක් යනවා නම් ඒකට අවසර නොදී ඉන්න පුළුවන් මේක ඉවර කරනකම්. ඒ වාසිය අපිට ගන්න පුලුවන්.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඊළඟට ගරු සභාපතිතුමනි තව එක කාරණයක් තමයි ඔබතුමාට මීට පෙර කිවුවා කුරුන්දකන්දේ සොහොන්පිටිය මැදින් යන පාර ගැන. ඒක නැවතත් ඉදිකරලා තියෙනවා. තොටගොඩ තරුණයෙකුගේ හදිසි වියෝවක් සිදු වුණා. එතකොට ඒ ආදාහන කටයුතු කරෙත් එතන. නැවත ඒ පාර ඒ විදියටම කපලා. ඊළඟට ප්‍රාදේශීය ලේකම්තුමියගෙන් විමසීම් කරා. ප්‍රාදේශීය ලේකම්තුමිය කියන්නේ මේ සොහොන් පිටියේ අයිතිය සභාව සතුයි කියලා. මේක ලිඛිතව දෙන්න කියලා සම්බන්ධීකරණ කමිටුවේදී යෝජනා වුණාලු. ඒක ආවේ නෑ. ප්‍රාදේශීය ලේකම්තුමිය කියන්නේ මේක සභාව සතු දේපලක් කියලා. එක් පුද්ගලයෙක්, කසිප්පුකාරයෙක්, කුඩුකාරයෙක් එයාගේ පරිහරණයට, එයාගේ කැමැත්තට ඒ පාර සකස් කරලා තියෙනවා. පැවරුම් කටයුතු වෙනතුරු සභාවට බලය දෙන්න බැරිද, තව වෙනතුරු ඒ කටයුත්ත සිදු වෙලා නෑනේ. අපි එහෙම කරා කියන එක නෙමෙයි, ගෙපල කපලා එනකොට ආපස්සට හදනවා නම් පැමිණිල්ලක් දාලා පොලීසියේ කුදලන් යන්න එපැයි. මේක සභාවෙන් විය යුතු දේ. සභාවේ දේපලක් මේ. මිනිස්සු මිහිදන් වෙන තැන.

(ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා, ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා,ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා, ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා, ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පොලිස් ආරක්ෂාව ඇතුව අපි ඒක කරමු පැමිණිල්ලක් දාලා. මේ අය හානි කරොත් පොලීසියේ නැවත පැමිණිල්ලක් දාලා අධිකරණයට යන්න කටයුතු කරමු. මොන දේ නැතත් අපේ උපසභාපතිතුමාගේ ගෞරවය ආරක්ෂා කරන්න ඕන. මේකට මැදිහත් වෙමු.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** බොහොම ස්තුතියි සභාපතිතුමනි, තව එක කාරණයක් තියෙනවා. මේ වෙලාවේ තද සුළං තියෙනවා. අද උදෙත් ගහක් කඩන් වැටිලා ඒකත් පොඩ්ඩක් බලලා ආවේ. පුද්ගලයෙක් කැමැත්ත දුන්නා ඒක කපලා ඉවත් කරන්නම් කියලා. නඩු කටයුතු තියෙන ගස් තියෙනවා ගරු සභාපතිතුමනි. අනතුර ඉවත් කරලා දෙන්නවත් හැකියාව තියෙනවාද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නඩු කටයුතු තියෙනවා නම් මොකද කරන්න ඕන කියලා මම හොයලා බැලුවා. ඒකට අපිට කැඳවන්න ඕන නැහැ. අපිට පුලුවන් මෝෂන් එකක් මාර්ගයෙන් ඉදිරිපත් වෙලා ගහ අනතුරුයි කියලා කටයුතු කරන්න. අපි කරන්නේ අධිකරණයට දාලා උත්තර එනකම් බලාගෙන ඉන්න එක. නමුත් ඒක නෙමෙයි විය යුත්තේ. ඒක මම හොයා ගත්තා. අපේ වැරැද්දක් තියෙනවා. මෝෂන් එකක් දාලා ඉදිරිපත් වුණහම එවෙලේම දෙනවා ගහ කපන්න කියලා. නැත්නම් අපිට පුළුවන් අදාළ මනුස්සයාට ලියුමකින් දුන්නහම මෙන්න මෙයාගේ නිවසට හානියක් තියෙනවා අධිකරණයේ නඩුව තියෙන නිසා අපිට මේකට මැදිහත් වෙන්න බෑ කියලා. එතකොට කෙලින්ම නියෝගයක් දෙනවලු ගහ කපන්න කියලා. අපි කරන්නේ මොකක්ද එකක් කරනවා වගේ වැඩක්. අපි බෝලය පාස් කරනවා අරහෙට. අපි අදාළ පුද්ගලයා ගෙනල්ලා එයාට අපි ලියුමක් දෙනවා මේ ගහෙන් හානියක් තියෙනවා කියලා. ඒක ගෙනිච්චට පස්සේ එයා නීතිඥ කෙනෙක් කතා කර ගන්නවා. එයා කතා කරහම එවෙලෙම දෙනවා අධිකරණයෙන් මේ ගහ කපලා ඉවත් කරන්න කියලා. අපි හිත හදා ගන්නවා මේක අධිකරණයට දාලා තියෙනවා ඒවි කියලා. අපි එහෙම මිනිස්සුන්ට එන්න කියලා දෙමු. අපි මන්ත්‍රීවරයට කිවුවහම මන්ත්‍රීවරයා ඒ සම්බන්ධීකරණය කරාවි.

අපි නොදන්න දෙයක් මෙතන තියෙනවා. නඩුවක් තියෙන කොට අදාළ පුද්ගලයා ඒ නඩුවට පාර්ශවයක් විදියට ඉදිරිපත් වෙනවා. එයාට නීතිඥ කෙනෙක් ඉන්නවා. ඒ නීතිඥවරයාගේ කටයුත්තක් තමයි මේ අනතුර ඉවත් කිරීම. අපිට අධිකරණයෙන් ඉල්ල ඉල්ල ඉන්න දෙයක් නැහැ මේක එවන්න කියලා. මේක ක්‍රමවත් වෙන්න ඕන. අපි ලියුමක් ගහලා අර මනුස්සයව කැඳවලා ඒ මනුස්සයාට දෙනවා මෙන්න ඔයාගේ අනතුර ඉවත් කර ගන්න නීතිඥතුමා එක්ක කතා කරලා වැඩේ කර ගන්න කියලා. මම කියන්නේ ඒක ලේසියි. මම ඊයේ තමයි මේ ක්‍රමය හොයා ගත්තේ. අදාළ පුද්ගලයාට එන්න කියලා අපි ලියුමක් දෙන්නම්. එයාට කියන්න එයාගේ නීතිඥතුමා හරහා ඉල්ලීමක් කරන්න කියලා. එතකොට අධිකරණයෙන් තීන්දුව දුන්නට පස්සේ අපිට ඉදිරි ක්‍රියාමාර්ග වලට යන්න පුළුවන්.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** අවසාන ගැටලුව සභාපතිතුමනි, තොටගොඩ සුගුණ මාවතේ සිලින්ඩර් තාම පාර අයිනේ. කපුහෙම්පලත් එහෙම දෙපලක් තියෙනවා. ඉදිරියේදීවත් බැකෝ එක අපිට ලබා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හෙට ලියනගේ මන්ත්‍රීතුමාගේ වැඩේ නැත්නම් ඔබතුමා ඒක ගන්න. හෙටයි අනිද්දයි ඔයාලා දෙන්නා ඒ වැඩේ කතා කර ගන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම දැන් අනවසර ඉදිකිරීම් ගොඩකිරීම් පිළිබඳව කතා කරන්න යන්නේ නැහැ. මොකද අපි එකඟතාවයකට ආවා ඒක දාන්න ඕන කියලා. විශේෂයෙන්ම අද දවසේ ටෙක්ලා මන්ත්‍රීතුමිය කතා කරපු එක, දහනායක එක, මේ ටිකට පියවරක් ගන්න. අපි ඔබතුමා එක්ක ඉන්නවා. ඒ වගේම පොඩි අවසරයක් දෙන්න අපි මේ මහජනතාවට මොකක් හරි කරන කොට විරුද්ධ මිනිස්සු නෙමෙයි. මේ ක්‍රමවේදයේ වැරැද්දක් තියෙනවා. ඒක අපි පිළි අරගෙන අවංකවම ගියහම මීට වඩා දෙයක් කරන්න ඇහැකි. ඔබතුමා හෙට දවසේත් මේ ප්‍රදේශයේ ජනතාවට දෙන්න දෙයක් ලැස්ති කරන්න ඊට වඩා ක්‍රමවත්ව අපි ඒකට ඉන්නවා.

(ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට තියෙන ප්‍රශ්නය මේකයි. ඇත්තටම අපි ඒකට ප්‍රවිශ්ටයක් ගත්තනේ. නමුත් ඔය ගොල්ලෝ ඇවිල්ලා මෙතන වෙන දේ ගැන බලලා වැඩේ තමන්ගේ අතට ගන්න තිබුණා. මෙතන අඩුපාඩුව මේක තමයි. ඒක කරේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු. ඒ අය මෙතනට ඇවිල්ලා වැඩේ ගත්තා තමන්ගේ අතට. ඔයගොල්ලන්ටත් ඇවිල්ලා සද්භාවයෙන් ඒක අවශ්‍යනම් වැඩේ අතට ගන්න තිබුණා මෙතන පාර්සල් කරනවාට උදවු කරලා නිලධාරීන් එක්ක. අනිල් බන්දුතිලක මන්ත්‍රීතුමා ඇවිල්ලා මෙතන පාර්සල් ගැහුවා. ඉන්දික මන්ත්‍රීතුමා ඇවිල්ලා මෙතන පාර්සල් ගැහුවා. වැඩිය කාටවත් කිවුවේ නැහැ. මෙතනට ඇවිල්ලා කට්ටිය ඒකට ඉදිරිපත් වුණා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම මෙතනට ඇවිල්ලා ගියා. කිවුවද නිකං හරි මෙදා මේවා කරනවා කියලා. මම චමින්ද මන්ත්‍රීතුමාට කිවුවා. ඇත්තටම එකක් තියෙනවා මේකේ පාඩුව විතරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමාට එහෙම තිබුණද දන්නේ නෑ. මට නම් ඒක තිබුණේ නැහැ. අනිත් පක්ෂවල මන්ත්‍රීවරුන්ව ගෙන්වලා මේක කරන්න මට වුවමනාවක් තිබුණේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ වැඩේ හරියට කරානම් හරි විදියට, මේ 22ත් එක්කම ඔබතුමා ගම්මානවලට ගියානම් මේකේ ඉන්න නායකයා විදියට ඔබතුමාට තමයි ගෞරවය එන්නේ. ඒක පෞද්ගලිකව දීලා ගත්ත දෙයක් නෙමෙයි. අපිට උත්තරය දුන්නත්, නොදුන්නත් හෘද සාක්ෂියක් තියෙනවා ඒකෙදී දන්නවා ඇති ඇත්තටම කැඳවීමක් කරාද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතන වුණේ අර දේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** කොහොමද අනුමත කරන්නේ, අපේ පැන්ෂන් එකවත් බේර ගන්න ඕන අපි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** උළුවිටිකේ විමල් මෝටර්ස් එකේ අර කඩලා ගිහිල්ලා වාහන දෙකක් ඉවරයි. මේ ප්‍රමිතියකින් තොරව මේවා අනුමත කරලා දීපු නිසා. දැන් ඒ වැරැද්දට කවුද වග කියන්නේ ජීවිත හානියක් වුණානම් කවුද වග කියන්නේ. ඒක ඕන කෙනෙකුට පේනවා. සභාපතිතුමා එතනට යන්න. ඒකට තාක්ෂණික දැනුමක් ඕන නැහැ. විශේෂඥ දැනුමක් ඕන නැහැ. සාමාන්‍ය පුද්ගලයෙකුට පේනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකේ සැලැස්ම අනුමත කරලද දන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක අපිට බලාගන්න ඕන.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** වජිර ඇමතිතුමාලගේ ගෙවල් ඉස්සරහම.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** තේ දළු ගන්න තැන උඩ. තට්ටු හතරක විතර ගේ. ඒ ගේ යනවා. ලියලා තියා ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකේ ඉඩමවත් අනුමත කරේ නැහැ මම හිතන්නේ. ඒකේ මොකක් හරි ප්‍රශ්නයක් වුණා. ඒක බලන්නම් මොකක්ද කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා, ඊළඟට අර මවුන්ට් කැල්වරි එක ඉස්සරහ එකට එන්.බී.ආර්.ඕ. එකෙන් අවසර දීලද, කොහොමද දීලා තියෙන්නේ කියලා බලන්න ඒ ෆයිල් එක පොඩ්ඩක් දෙන්න කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි ඒකේ ෆයිල් එක බලන්න ලේකම්තුමා එක්ක.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ෆයිල් එක බලන්න ඕන කොහොමද එහෙම අවසර දෙන්නේ කියලා.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. මම විශේෂ ගෞරවණීය ස්තුතියක් පුද කරන්න කැමතියි මේ අවස්ථාවේ ගරු සභාපතිතුමාට. මගේ පියාණන්ගේ වියෝව වෙලාවේදී ඉක්මනින් මට ආදාහනාගාරය ලබා දුන්නට. පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මගේ පියාණන්ගේ අවමගුල් උත්සවයට සහභාගි වුණ සියලු දෙනාටත්, නන් අයුරින් මට මුදල් ආධාර දීලා මට සහයෝගය දීපු සියලු දෙනාටම මම ස්තුතිවන්ත

වෙනවා. ඒ වගේම පක්ෂ විපක්ෂ භේදයකින් තොරව පැමිණි මැති, ඇමතිවරු සියලු දෙනාටම මේ අවස්ථාවේ ස්තූතිවන්ත වෙනවා.

ඒ වගේම මම කියන්න කැමතියි ගරු සභාපතිතුමනි, සභාවක් විදියට මේකේ විනයක් තියෙන්න ඕන. ඔබතුමාටත් මේක අගෞරවයක්. අපි බලන් ඉඳලා තමයි කතා කරන්නේ. අපිට කතා කරන්න අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. මෙහෙම වෙන්නේ නැහැ කිසිම තැනක. නැගිට නැගිට මෙහෙම යන්නේ නැහැ. අපි පාසල් ගිහින් තියෙනවා. පාසල්වල පන්ති නායිකාවට, පන්ති නායකයාට මීට වඩා ගෞරව කරනවා මම දන්නේ නැහැ ඔබතුමා එකඟ වෙනවද නැද්ද කියලා. මේ වගේ අත්‍යාවශ්‍ය කාරණාවකට ඔබතුමාට කිසි ගෞරවයක් නැති විදියක් මට හැඟෙන්නේ. අපි නම් ගෞරව කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මම ප්‍රතික්ෂේප කරනවා. ඒ මන්ත්‍රීවරු දහ දෙනාම ලිඛිතව ලබා දීලා තියෙනවා. මමත් එකඟ වෙන්නේ නැහැ මන්ත්‍රීවරු වැඩිපුර කාලය ගන්නවාට. එයාලට කතා කරන්න කාලයක් නැහැ කියලා විරෝධතාවය දක්වන්න තමයි යන්න ඇත්තේ. නමුත් මම ඉදිරියට, ලබන සභාවේ සිට ඒක හදනවා. මන්ත්‍රීවරුන්ට අදාළ කාලය ලැබෙන විදියට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හතර පහ වෙනකම් වුණත් අපි ඉන්නවා. අපිට කතා කරන්න ඕන. අනිත් අය කතා නොකර හිටියා කියලා අපි පලි නැහැ.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ඒ වගේම මම ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා මගේ කොට්ඨාශයේ කිසිම අක්‍රමිකතාවයකින් තොරව බඩු බෙදාදීම කරා. ඉතිං ඔබතුමා මේක සංශෝධනය කරලා ගේන්න. මම ඇත්තටම දැක්කා කරන හැටි. ඔබතුමාගෙන් මම සමාව භජනය කරනවා. මට කරන්න දෙයක් නැහැ. කිසිම අක්‍රමිකතාවයක් සිදු වුණේ නැහැ. මේක සංශෝධනය කරලා ගේන්න. මෙතන පොඩි වැරදීමක් තියෙනවා. ඒ වැරදීම හදලා ගේන්න. අපි ඊළඟට බලන්නම් මොකක්ද කරන්න පුළුවන් කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක සංශෝධනය කරා නේ. මෙතන වැරැද්දක් තියෙනවා ඒකත් කියන්න ඕන. රුපියල් දහහත් ලක්ෂ තුන් දහස් තුන්සිය පනස් දෙක යටතේ ඇසුරුම් මිලදී ගෙන තියෙනවා. වවුචර් දෙකකින් ගිහින් තියෙන්නේ. ඒ ඒ වවුචර් වශයෙන් තමයි මෙතන දාලා තියෙන්නේ. ඒක සංශෝධනය වුණා විජිත ෆුඩ් සිටි පුද්ගලික සමාගම වෙත ඇසුරුම් සහිතව රුපියල් දහහත් ලක්ෂ තුන් දහස් තුන්සිය පනස් දෙකක ඉතිරි මුදල ගෙවීම කියලා.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ගරු සභාපතිතුමනි, ඒ වගේම මට කියන්න තියෙනවා මෙතන කවුරුවත් නැති වුණත් ඇත්තටම ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා රණවිරුවෙක්. ඒ වගේම අපි රණවිරුවන්ට උපහාර තිබ්බට වැඩක් නැහැ. උපහාර නම් ඕන තරම් තියෙනවා මේ රටේ. රණවිරුවන්ට වෙච්ච දෙයක් නැහැ. මම රණවිරුවන් වෙනුවෙන් කතා කරන්න කැමතියි. බොරුවට උපහාර තිබ්බට වැඩක් නැහැ. ඒ රණවිරුවන්ට 2020 වර්ෂයේ ලැබෙන්න තිබුණ මුදලවත් තාම ලැබිලා නැහැ. ගිය ආණ්ඩුවෙන් රුපියල් දොළොස්දහසක මුදලක් වැඩි කරා. ඔබතුමා ඉල්ලීමක් කරන්න රණවිරුවන් වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විදියට මේ මුදල පොඩ්ඩක් වැඩි කරලා ඒ අයට සාධාරණයක් කරන්න කියලා. ඒක මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට මට උත්තර දීමට නොහැකියි මම ඒ ගැන නොදන්න නිසා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා අද මම ප්‍රමාද වෙන්න හේතුව තමයි අධිකරණ කටයුත්තකට සහභාගි වෙන්න සිදු වීම. මම ගරු සභාපතිතුමාව දැනුවත් කරා. ප්‍රියන්ත මන්ත්‍රීතුමාවත් දැනුවත් කරා. එතුමා ඒ බව උදේ සභාවේදී සඳහන් කළ බව කිවුවා. ලබන සභාව කවදද වැටෙන්නේ සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ජුනි 16 වෙනිදා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ජුනි 16 වෙනිදටම තමයි ඊළඟ නඩු වාරය කල් ගියේ. කලුතර උසාවියට සහභාගි වෙන්න ඕන. ඒ නිසා එදාට මට මගඅරින්න බැහැ අධිකරණ කටයුත්තක් නිසා. ඒක නිසා මට එහෙට සහභාගි වෙලා තමයි ගරු සභාපතිතුමනි එන්න වෙන්නේ. ඒ ගැන කියන්න ඕන.

තව දෙයක් තියෙනවා. අර ආධාර බෙදා දීම පිළිබඳව විරුද්ධ වීමට හේතුව මම ප්‍රකාශ කරන්නම්. මම ඒකට විරුද්ධ වුණේ බඩු බෙදාදීමේ ගැටළුවකට. බඩු ලබා ගැනීමේදී මුදල් සම්බන්ධ ගැටළුවකට නෙමෙයි බඩු බෙදාදීමේදී යම් කිසි කාරණයක් වුණා. මොකද ශාඛා සමිති සභාපතිවරුන්ගේ

ගෙවල්වල තමයි බඩු බෙදාදීම සිදු වුණේ. ඒ බඩු පාර්සල් සමහර පවුල්වලට ලැබිලා තිබුණේ නැහැ. ඒකට මගේ බලවත් කණගාටුව ප්‍රකාශ කරනවා. සමහර දිළිඳු පවුල්වලට ලැබිය යුතු වියළි සලාකයවත් ඒ අයට ලැබිලා තිබුණේ නැහැ. ඒ අය මගෙන් ඇහුවා. මම කිවුවා ලියනගේ මන්ත්‍රීතුමා එක්ක සාකච්ඡා කරලා ඒ ගැන විමසන්න කියලා. ඉතිං පොඩි පොඩි අඩුපාඩුකම් සිදුවුණා. ඒ ගැන මගේ විරෝධතාවය තමයි ප්‍රකාශ කරේ.

ඒ වගේම තමයි මතක් කරන්න ඕන කොරෝනා වසංගතය නිසා අපේ රටේ වෙච්ච උවදුර මැඩලීමට අපේ ජනාධිපතිතුමා ප්‍රමුඛ සියලු දෙනා ගනිපු ක්‍රියාමාර්ග අගය කරන්න ඕන. රජයේ නිලධාරීන්, පොලීසිය, ත්‍රිවිධ හමුදාව, ආරක්ෂක අංශ ඒ සියලු දෙනා ගනිපු ක්‍රියාමාර්ග වලට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව වශයෙන්, මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන් වශයෙන් අපි සියලු දෙනාගේම ගෞරවණීය ස්තුතිය රට වෙනුවෙන් මේ අවස්ථාවේදී පුද කරනවා. ඇමෙරිකාව, ඉතාලිය වගේ රටවල දහස් ගණන් මිය යද්දි ලංකාවේ ඇත්තටම අද වෙනකම් මිය ගියේ 9 දෙනෙක් විතරයි. ඒක ඇත්තටම අපි අගය කරන්න ඕන. මේ සඳහා කැපවෙච්ච ඒ සියලුම දෙනාට අපි මේ මොහොතේ හිස නමා ආචාර කරමින් පිළිගන්වනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ටෙක්ලා මන්ත්‍රීතුමිය කියපු එක නිවැරදි කරන්න ඕන. 03/2016 චක්‍රලේඛනයක් නිකුත් කරලා තියෙනවා. අර හිඟ වැටුප් චක්‍රලේඛනය තමයි ඒ. ඒක 2020න් ඉවරයි. ඒක 2020 දක්වා තමයි වැටුප් වර්ධක ගණන් හදලා අවුරුදු හතරකින් ඉවර කරලා තියෙන්නේ. රණවිරුවන්ට විතරක් නෙමෙයි සියලුම රාජ්‍ය සේවකයන්ට 2020 වෙනකොට ඒක අවසන් කරලා තියෙන්නේ. ඒකෙදි නැවත වැටුප් වැඩිවීමක් නෙමෙයි වෙන්නේ. ඒක අවසන් වීමක්. ඒක සියලුම රාජ්‍ය සේවකයන්ට පොදුයි. රණවිරුවන්ට වෙච්ච දෙයක් නෙමෙයි. මූලික වැටුපට ඒක එකතු වෙලා තියෙන්නේ. නැවත දීමනාවක් විදියට එකතු වෙන්නේ නැහැ.

හරි බොහොම ස්තුතියි. සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කරනවා. රට තුළ මොකක් හරි විශේෂ තත්ත්වයක් ඇති නොවුණොත් ජුනි 16 වෙනිදා මහා සභා රැස්වීම පැවැත්වෙනවා.

**<u>සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.</u>**

මීළඟ මහා සභා රැස්වීම 2020.06.16 වන අඟහරුවාදා දින පෙ.ව 09.30ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.